# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017** පෙබරවාරි **07** වන අඟහරුවාදා
2017 மாசி 07 செவ்வாய்க் கிழமை
Tuesday 07th February 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.40 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.40 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.40 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# විගණකාධිපති වාර්තාව : 2015
## AUDITOR GENERAL'S REPORT : 2015

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුකාර ලේකම් විසින් අංක GOS/FIN/1/123 හා 2017.01.24 දිනැති ලිපිය මගින් සභා ලේකම් වෙත දන්වා ඇති පරිදි, විගණකාධිපතිගේ අංක WNP1/CB/B/WPC/ 3/15/28(ii) හා 2016.08.16 දිනැති වාර්තාව ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානයට යොමු කර තිබෙනවා. එම විගණකාධිපති වාර්තාව මෙම පළාත් සභාවට ඉදිරිපත් කරනවා. එම විගණකාධිපති වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා තිබෙනවා.

කාර්ය පටිපාටි රීති අංක 96(1) හි විධිවිධාන අනුව එම විගණකාධිපති වාර්තාව, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරනවා.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017.01.17 හා 2017.01.18 දිනවල පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තා මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

# පෙත්සම්
## PETITIONS

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, පොල්ගස්ඕවිට, සියඹලාගොඩ, කුරුළු උයන, අංක 185/ඒ/32 හි පදිංචි එම්.එච්. ටිරෝෂා රසංගිකා ද සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, පිළියන්දල, දැල්තර, සැන්මිවල් පාර, අංක 155 හි පදිංචි කරුණාරත්න පීරිස් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. හෝමාගම, පනාගොඩ, 772 හි පී. විජේතුංග යන අයගේ පෙත්සම හා,

ii. අතුරුගිරිය, ඔරුවල්පිටිය, අංක 169/1 හි පදිංචි වරක ජයෙන්ද්‍ර සේනාරත්න හා අතුරුගිරිය, ඔරුවල් පිටිය, අංක 167/3 හි පදිංචි චමින්ද සංජීව පෙරේරා යන අයගේ පෙත්සම.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, රාගම, මහබාගේ පාර, අංක 54 හි පදිංචි ඇන්ටනී අලහකෝන් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, කළුතර දකුණ, ශ්‍රෙගරි පාර, අංක 40 හි එම්.ඒ.පී. මහතන්තිල ජයනී අචිලා මහතන්තිල යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, කළුතර, නාගොඩ, රණවිරු සුපුන් සදේශ් මාවත, අංක 15 හි පදිංචි ඩබ්ලිව්.සී.එච්. ද ඉසඩ් ගුණසේකර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, කැලණිය, පෙතියාගොඩ, බියගම පාර, අංක 381/1, එම්.කේ. අයිරාංගනී යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

ගරු සභාපතිතුමනි, පොල්ගස්ඕවිට, සියඹලාගොඩ, කුරුළු උයන, අංක 185/ඒ/32 හි පදිංචි එම්.එච්. ටිරෝෂා රසංගිකා ද සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

* [*කල් ගන්නා ලද ප්‍රශ්නය* ]
[ Adjourned Question]

**01.**

**ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/16/121)**

අ. i. බේරුවල ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයෙහි නිලධාරීන් පිරිසක් පැමිණීමේ ලේඛනයේ පිටවීම රාත්‍රී වන තුරු අත්සන් කර අයථා ලෙස අතිකාල දීමනා ලබා ගන්නා බව ඔබතුමා දන්නේද?

ii. එසේ නම් ඒ සම්බන්ධව ඔබතුමා ගන්නා පියවර කුමක්ද?

ආ. i. බේරුවල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම නිසි පරිදි සිදු නොවන බව ඔබතුමා දන්නේද?

ii. සේවකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම හා වැටුප් වර්ධක ලබා දීම නිසි කලට සිදු නොවන බව ඔබතුමා දන්නේද?

iii. සේවකයෝ මුහුණ දෙන මෙම ගැටළු සම්බන්ධව ලේකම්වරිය කිසිදු තැකීමක් නොකර ඔවුන්ව පීඩනයට පත් කරමින් ක්‍රියා කරන බව ඔබතුමා දන්නේද?

iv. ලේකම්වරිය හමුවීමට සේවකයන්ට මෙන්ම ප්‍රදේශයේ සේවාලාභීන්ට අවස්ථාවන් අහුරා ඇති බව ඔබතුමා දන්නේද?

v. මෙම ලේකම්වරියව අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ රැස්වීම් සඳහා නිරතුරුවම කැඳවනු ලබන්නේද?

vi. නොඑසේ නම්, ඇය හමුවීමට සේවකයන් ගිය විට කාර්යාලයේ නොසිටින්නේ කුමන හේතූන් මතද?

ඇ. i. ඉහත කරුණු අනුව, ලේකම්වරිය විසින් අක්‍රමිකතා සිදු කර ඇත්දැයි විමර්ශනය කිරීම සඳහා ඔබතුමා පියවර ගන්නේද?

ii. නොඑසේනම් ඒ මොනවාද?

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

අ. i. අවිධිමත් ලෙස අතිකාල දීමනා ලබා ගෙන ඇති බව වාර්තා වී ඇත.

ii. අතිකාල සීමා කිරීමට දැනටමත් ක්‍රියා කර ඇති අතර, අවිධිමත් ලෙස ක්‍රියා කර ඇති නිලධාරීන්ට අදාළව මූලික විමර්ශන ආරම්භ කර ඇත.

ආ. i. පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් අඩුපාඩු පවතින බවට කරුණු වාර්තා වී ඇත.

ii. සේවකයන්ගේ හා පරිපාලනයෙහි දුර්වලතා හේතු කර ගෙන සේවය ස්ථිර කිරීම හා වැටුප් වර්ධක ලබා දීම නිසි ආකාරයෙන් සිදු නොවුණු අවස්ථා වාර්තා වී ඇත.

iii. සේවකයන් වෙතින් නිශ්චිතව එවැනි පැමිණිල්ලක් මෙතෙක් ඉදිරිපත් වී නොමැති වුවත්, සේවකයින්ට අදාළ පරිපාලනමය ගැටළු විසඳීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ලේකම් වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

iv. එවැනි තත්ත්වයක් අනාවරණය වී නොමැත.

v. රාජකාරීමය අවශ්‍යතා මත කැඳවීම් කරනු ලබයි.

vi. නිශ්චිතව අවස්ථා හඳුනාගැනීමකින් තොරව හේතුන් අනාවරණය කර ගත නොහැක.

ඇ. i. දැනටමත් විමර්ශනය ආරම්භ කර ඇත.

ii. පැන නොනගී.

## පසුබිම් වාර්තාව

ප්‍රශ්න අංක 06 (7)

(අ) 2009.04.16.දිනැති අංක9/2009 දරණ රා.ප.ව.ලේඛ ප්‍රකාරව කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ පැමණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතයට කටයුතු කරන ලෙස බේරුවල ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත උපදෙස් ලබා දී ඇති නමුත් මෙතෙක් එම කාර්ය සම්පූර්ණ කිරීම ප්‍රමාද වී ඇති බැවින් දෛනික පැමිණීම් හා පිටවීම් ලේඛනය ආශ්‍රයෙන් පැමිණීම් හා පිටවීම් සටහන් කරනු ලැබේ.

අත්සන් ලේඛනය පරීක්ෂා කිරීමේදී කාර්ය මණ්ඩලයේ ඇතැම් අය රාත්‍රී 22.45 පමණ වන තුරු රාජකාරියේ යෙදී ඇති බව නිරීක්ෂණය වී ඇත. 2016 වර්ෂයේ අතිකාල දීමනා සඳහා වැය කල මුළු මුදල රු.1624400.77ක් වේ.

2017.01.19 දින බේරුවල ප්‍රාදේශීය සභාවේ පැවති කාර්යාල නිරීක්ෂණ වැඩසටහනේදි නිරීක්ෂණය වූ පරිදි ඇඟිලි සළකුණු යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව මගින් පුවත්පත් දැන්වීම් පලකර ටෙන්ඩර් කැඳවා ඇත. ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කරන තෙක් අත්‍යවශ්‍ය රාජකාරි සඳහා අතිකාල සේවයේ යෙදවීම සතියේ දිනයන්හිදී දිනකට උපරිම පැය 01කට සීමා කරන ලෙස ලේකම් හා කාර්ය මණ්ලය වෙත උපදෙස් ලබා දි ඇත. තව දුරටත් 2016 වර්ෂයේ අතිකාල දීමනා ගෙවීම සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණයක් සිදු කරනු ලැබේ.

(ආ) බේරුවල ප්‍රාදේශීය සභාවේ පවතින පෞද්ගලික ලිපිගොණු 244 අතුරින් අහඹු ලෙස තෝරාගත් පෞද්ගලික ලිපිගොනු 20ක නියැදියක් පරීක්ෂා කිරීමේදී දීර්ග කාලීයක් තිස්සේ පවතින පහත අඩුපාඩු නිරීක්ෂණය වී ඇත.

- චර්යා සටහන් යාවත් කාලීන කර නොමැති වීම
- කාර්යක්ෂමතා කඩයිම් නොපැවැත්වීම මත පත්වීම් ස්ථිර නොකර සිටීම
- වැන්දඹු හා අනත්දරු වශ්‍රාම වැටුපු අංක ලබාදීමට කටයුතු නොකර සිටීම
- වැටුප් වර්ධක ලබා දීම ප්‍රමාද වීම

මෙම අඩුපාඩු නිවැරදි කිරීම සඳහා වර්තමානයේ කටයුතු කරමින් පවතින අතර 2017.01.19 දින පැවති කාර්යාල නිරීක්ෂණ වැඩසටහනේදී මාස 02ක් තුල මෙම කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත බව විෂය භාර නිළධාරි හා ලේකම් විසින් දැනුම් දී ඇත.

2016 වසරේ ධාවන සටහන් අනුව ලේකම් විසින් ඉදිරිපත් කර ඇති රාජකාරි සඳහා බැහැර යාම පිලිබඳ විස්තර ප්‍රකාශය ඇමුණුම 01 ලෙස අමුණා ඇත. රාජකාරි සඳහා බැහැර යාමේදි බැහැර යාමේ ලේඛනයක් නඩත්තු කරන ලෙසද කාර්යාලයට පැමිනෙන සේවා ලාභීන් සඳහා ලේකම් නොමැති අවස්ථාවල ප්‍රධාන කළමනාකරණ සහකාර විසින් අදාල අංශ සමග සම්බන්ධීකරණය කර අවශ්‍ය කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

* [*කල් ගන්නා ලද ප්‍රශ්නය* ]
[ *Adjourned Question*]

**02.**

**ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)16/122)**

අ. බේරුවල ප්‍රාදේශීය සභාවේ මහජන සුහසාධන සේවා නිසි පරිදි ඉටු නොවන බව ඔබතුමා දන්නේද?

ආ. i. අලුත්ගම හා මාලේවන්බද්ද උප කාර්යාලවලට අයත් ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන වැසී යාමේ තර්ජනයකට මුහුණ දී ඇති බව ඔබතුමා දන්නේද?

ii. 2016 වසරේදී එම ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා බෙහෙත් නිකුත් කර තිබේද?

iii. එසේ නම් නිකුත් කළ දිනය, බෙහෙත් වර්ග හා වටිනාකම යනාදී විස්තර ඉදිරිපත් කරන්නේද?

iv. මෙම මධ්‍යස්ථාන ආරම්භ කර ඇත්තේ කවදාද?

v. මෙම මධ්‍යස්ථාන ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබේද?

ඇ. i. පයාගල උප කාර්යාලයට අයත් පාලයන්ගොඩ පුස්තකාලයේ 2015 වසර තුළ සාමාජික මුදල් හා දඩ මුදල් 2015.12.31 දිනට පෙර සභා අරමුදලට බැර කර තිබේද?

ii. ලැබී ඇති මුදල් ගිණුම්ගත කර ඇති මුදල් වෙන් වෙන්ව කොපමණද?

iii. මෙම මුදල් ගිණුම්ගත කිරීමේදී වංචාවන් සිදුව ඇත්ද?

iv. ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද?

v. ප්‍රජා සංවර්ධන නිලධාරී හා පුස්තකාලයාධිපති විසින් පුස්තකාලය පරීක්ෂාවට ලක් කර තිබේද?

vi. මෙම පුස්තකාලයේ සිදුව ඇති මෙම අක්‍රමිකතා හිතාමතාම යටපත් කිරීමට ලේකම්වරිය කටයුතු කර ඇති බව ඔබතුමා දන්නේද?

vii. මේ පිළිබඳව ඔබතුමා ගන්නා පියවර කවරේද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. බේරුවල ප්‍රාදේශීය සභාව විසින් දැනට පවත්වාගෙන යනු ලබන මහජන සුහසාධන සේවාවන් සම්බන්ධ තොරතුරු ඇමුණුම් 01[1] වශයෙන් ලේඛනයකට ඇතුළත් කර මේ සමඟ ඉදිරිපත් කරන බවත්, එම සේවාවන් නිසි ආකාරයෙන් ඉටු නොවන බවට කරුණු වාර්තා වී නොමැත.

ආ. i. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන වැසී යාමේ තර්ජනයකට මුහුණ දී ඇති බවට කරුණු අනාවරණය වී නොමැත.

ii. ඔව්.

iii. ආයුර්වේද මධ්‍යස්ථාන දෙක සඳහා නිකුත් කරන ලද බෙහෙත් වර්ගයන් හා වටිනාකම් පිළිබඳ විස්තර ඇමුණුම් 01[2] වශයෙන් සඳහන් කර ඉදිරිපත් කරමි.

iv. අලුත්ගම - 1955 වර්ෂයේදී පමණ
මාලේවන්බද්ද - 2012.02.19

v. අලුත්ගම ආයුර්වේද මධ්‍යස්ථානය ලියාපදිංචි කර ඇති අතර, මාලේවන්බද්ද ආයුර්වේද මධ්‍යස්ථානය ලියාපදිංචි කිරීමට කටයුතු සිදු කරමින් පවතී.

ඇ. i. සාමාජික මුදල් හා දඩ මුදල් වශයෙන් රු. 3110.00 ක් හැර සෙසු සාමාජික මුදල් හා දඩ මුදල් 2015 වසර තුළ සභා අරමුදලට බැර කර ඇත.

ii. 2015 වර්ෂයේ ලැබී ඇති මුදල රු. 4,260.00
2015 වර්ෂයේ ගිණුම් ගත කර ඇති මුදල රු. 1,150.00

---

[1] පිළිතුර අවසානයේ පළ කර ඇත.
[2] - එම -

iii. මෙම මුදල් ගිණුම්ගත කිරීමේදී රු. 3110.00 ක මුදලක් 2015 වර්ෂය තුළ ගිණුම්ගත නොකිරීම තුළින් විෂමාචාරයක් සිදු වී ඇත.

iv. ගිණුම්ගත කර නොමැති මුදල හා එම මුදලට 25% ක අතිරේක දඩ මුදලක් පයාගල උප කාර්යාලයේ කාර්යභාර නිලධාරී වෙතින් අය කර ගැනීමටත්, ඇය පොතුවිල මහජන පුස්තකාලය වෙත මාරු කිරීමටත් ක්‍රියා කර ඇත.

v. ඔව්.

vi. ලේකම් විසින් නිසි ක්‍රියා පටිපාටිය අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය වේ.

vii. කරුණ හා සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදු කර විධිමත් ක්‍රියාමාර්ග ගන්නා ලෙස පළාත් පාලන කොමසාරිස් වෙත උපදෙස් දී ඇත.

පසුබිම් වාර්තාව

ප්‍රශ්ණ අංක: 07

(අ) බේරුවල ප්‍රාදේශීය සභාව මඟින් පවත්වාගෙන යන ආයුර්වේද, පුස්තකාල හා ළඳරු පාසැල්වල තොරතුරු පහත පරිදිවේ

**පුස්තකාල සහ කියවීම් ශාලා**

| | පුස්තකාලය | අයිති උපකාර්යාලය | පාඨක සංඛ්‍යාව 2015 | 2016 |
|---|---|---|---|---|
| 01 | අළුත්ගම මහජන පුස්තකාලය | අළුත්ගම උප කාර්යාලය | 1327 | 1370 |
| 02 | දර්ගාටවුන් මහජන පුස්තකාලය | දර්ගාටවුන් උප කාර්යාලය | 1201 | 1305 |
| 03 | වරාපිටිය මහජන පුස්තකාලය | මාලේවන්බද්ද උප කාර්යාලය | 555 | 586 |
| 04 | හල්කඳවිල මහජන පුස්තකාලය | හල්කඳවිල උප කාර්යාලය | - | 36 |
| 05 | පයාගල මහජන පුස්තකාලය | පයාගල උප කාර්යාලය | 643 | 661 |
| 06 | පොතුවිල මහජන පුස්තකාලය | පයාගල උප කාර්යාලය | 687 | 774 |
| 07 | පාලයන්ගොඩ මහජන පුස්තකාල | පයාගල උප කාර්යාලය | 930 | 960 |
| 08 | හෙම්බරවිල මහජන පුස්තකාලය | පයාගල උප කාර්යාලය | 695 | 725 |
| | | | | |
| | **කියවීම් ශාලා** | | | |
| 01 | ගොරකදෙනිය කියවීම් ශාලාව | පයාගල උප කාර්යාලය | 109 | 109 |
| 02 | පාදගොඩ කියවීම් ශාලාව | මාලේවන්බද්ද උපකාර්යාලය | පුවත්පත් බැලීමේ පහසුකම් ඇත. | |
| 03 | කළුවාමෝදර කියවීම් ශාලාව | මාලේවන්බද්ද උපකාර්යාලය | -එම - | |

__පෙර පාසැල්__

| අනු අංකය | පෙර පාසැලේ නම | අයත් උප කාර්යාලය | ගුරුවරුන් සංඛ්‍යාව | ළමුන් සංඛ්‍යා | ලියාපදිංචි |
|---|---|---|---|---|---|
| 01 | පාලයන්ගොඩ පෙර පාසැල | පයාගල උප කාර්යාලය | ස්ථිර 01<br>ව්‍යාපෘති 01 | 26 | ලියාපදිංචිවී ඇත. |
| 02 | පාදගොඩ පෙර පාසැල | මාලවන්බද්ද උපකාර්යාලය | ව්‍යාපෘති 01<br>වැඩ කම්කරු 01 | 47 | ලියාපදිංචිවී ඇත. |
| 03 | දර්ගාටවුන්පෙර පාසැල | දර්ගාටවුන් උපකාර්යාල | ව්‍යාපෘති 01<br>සෞඛකම්කරු 01 | 47 | 2017 වර්ෂයේ ලියාපදිංචි කටයුතු සිදු කරයි |
| 04 | වරාපිටිය කන්දලගොඩ පෙර පාසැල | මාලවන්බද්ද උප කාර්යාලය | ස්ථිර 01<br>ව්‍යාපෘති 03<br>සෞඛ්‍ය කම්කරු 01<br>ව්‍යාපාති 01 | 69 | ලියාපදිංචිවී ඇත. |

ආයුර්වේද

1955 වසරේ ආරම්භ කල අළුත්ගම ආයුර්වේදය 2014 වසරේනවීකරණය කර ආයුර්වේ
වෛද්‍යවරු දෙදෙනෙකුගේ සේවය සලසන අතර, මෙය ලියාපදිංචි කල ආයුර්වේදයක්වේ.

2012.02.19 දින ආරම්භ කරන ලද මාලේවන්බද්ද ආයුර්වේදය ආදේශක වෛද්‍යවරයෙකුගෙ
සේවය ලබාගෙන ඇති අතර, අළුත්ගම ආයුර්වේදය වෙතින් ස්ථිර වෛද්‍යවරයෙකු අනුයුක්ත ක
ඉදිරියේදී ලියාපදිංචි කිරීමට කටයුතු කරමින් පවතී.

| වර්ෂය | රෝගීන් සංඛ්‍යාව | | වර්ෂය තුලදී නිකුත් කරන ලද ඖෂධවල වටිනාකම (රු:) | |
|---|---|---|---|---|
| | අළුත්ගම | මාලේවන්බද්ද | අළුත්ගම | මාලේවන්බද්ද |
| 2012 | 1616 | 1150 | 101606 | 50000 |
| 2013 | 2242 | 2914 | 157356 | 175000 |
| 2014 | 3018 | 3597 | 213371 | 254590 |
| 2015 | 1294 | 3024 | 122760 | 275740 |
| 2016 | 2886 | 1756 | 278730 | 29700 |

2017 අයවැය මගින් ඖෂධ නිකුත් කිරිම සඳහා 203-3 වැය ශීර්ෂය යටතේ රු:1,000,000 ක
ප්‍රමාණයක් වෙන්කර ඇති බැවින්, මෙම ආයුර්වේද පවත්වාගෙන යාමේ හැකියාව සභාව සතුබ
නිරීක්ෂණයවේ.

(ආ) පයාගල උප කාර්යාලයට අයත් පාලයන්ගොඩ පුස්තකාලයේ,

2015 වර්ෂයේ සාමාජික මුදල් ලැබිම

| කාලසීමාව | මුදල (රු:) |
|---|---|
| 2015.01.01-2015.01.21 | 370 |
| 2015.01.21-2015.08.07 | 780 |
| 2015.08.07-2015.12.31 | 3110 |
| එකතුව | 4260 |

2015 වර්ෂයේ අයකර ඇති මුදල

| ලදුපත් අංකය | දිනය | මුදල (රු:) |
|---|---|---|
| 185358 | 2015.05.06 | 370 |
| 187387 | 2015.09.02 | 780 |
| එකතුව | | 1150 |

ඉහත 2015.08.07-2015.12.31 කාලයට අදාළ රු:3110/= ක මුදල 2015 වර්ෂය තුල ගිණුම්ගත
කර නොමැත. පයාගල උප කාර්යාලයේ කාර්යභාර නිලධාරිගේ 2016 .09. 28 දිනැති ලිපියෙ
සඳහන් පරිදි 2015 හා 2016 වර්ෂවලට අදාලව එකතු කල නමුත්, සභා අරමුදලට ගෙවීමට කටයුතු
කර නොමැති රු:4270/= ක මුදල 25%ක දඩ මුදලක් සමඟ රු:5337.50 ක් පුස්තකාල කම්කරු
පී.වි.විජේමාන්න මිය වෙත ගෙවන ලෙස දන්වා ඇත.

අංක193285,193286 හා 193287දරණ ලදුපත් මඟින් පිළිවෙලින් රු:4847.50,රු:400/=රු:90/=ක් ලෙස එම මුදල සහා අරමුදලටඅයකරගෙන ඇත. පයාගල කාර්යභාර නිලධාරි හා පුස්කාලයාධිපති ඇමතු බේරුවල ප්‍රා දේශීය සභා ලේකම්ගේ 2010.08.31 දිනැති ලිපිය මඟින් නැවත මෙවැනි කටයුතු සිදුනොවීමට වගබලා ගන්නා ලෙසත් සියළුම අංශ අධීක්ෂණය කරන ලෙසත් දැනුම්දී ඇත. 2016.08.31 දිනැති ලේකම්ගේ ලිපිය මඟින් විජේමාන්න මිය පොතුවිල මහජන පුස්තකාලය වෙත දඩුවමක් ලෙස ස්ථානමාරු කර ඇත.

ප්‍රජා සංවර්ධන නිලධාරි, පුස්තකාලයාධිපති විසින් වරින් වර පුස්තකාලය පරීක්ෂා කරනු ලැබේ.

**<u>හිස් බෝතල් ලබා දීම වෙනුවෙන් බේරුවල ප්‍රාදේශීය සභාවේ</u>**
**<u>අලුත්ගම ආයුර්වේදයට ලැබුණු ඖෂධ</u>**

ලැබුනු දිනය - 2016.11.02

| අනු අංකය | ඖෂධ වර්ගය | ඒකකය | ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|---|---|
| 01 | ජීවාලේප | 10g බෝතල්. | 14 | 980.00 |
| 02 | ජීවාලේප | 15g බෝතල්. | 01 | 95.00 |
| 03 | ඇසුරුම් ද්‍රව්‍ය | | | 1.00 |
| | එකතුව | | | **1076.00** |

* [*කල් ගන්නා ලද ප්‍රශ්නය* ]
*[ Adjourned Question]*

**03.**

**ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)16/123)**

අ. i. බේරුවල ප්‍රාදේශීය සභාවේ අළුත්ගම පිහිටා ඇති නැණසල මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ කුමක්ද?

ii. එය ආරම්භ කරන ලද්දේ කවදාද?

iii. මෙතෙක් එම මධ්‍යස්ථානයෙන් ජනතාවට අපේක්ෂිත සේවාවන් ලබා දී නොමැති බව ඔබතුමා පිළිගන්නේද?

iv. ජනතා සේවයන් ලබා නොදී මෙම මධ්‍යස්ථානයේ දුරකථන හා විදුලි බිල්පත් සහා අරමුදලින් ගෙවීම මුදල් නාස්ති කිරීමක් බව ඔබතුමා පිළිගන්නේද?

v. එසේනම් ඒ සම්බන්ධව ඔබතුමා ගන්නා පියවර කවරේද?

ආ. i. බේරුවල ප්‍රාදේශීය සභාවේ මග්ගොන පොදු වෙළඳපොල එළහරක් මස් කඩය බදු දීම සඳහා 2016 හා 2017 වසර වලට අදාළව නියම කරන ලද අවම ලංසුව වෙන් වෙන්ව කොපමණද?

ii. 2016 වසරට වඩා 2017 වසරට අදාළව නියම කරන ලද ලංසු මුදල අඩු වීමට හේතුව කවරේද?

iii. එම හේතුවෙන් ප්‍රාදේශීය සභාවට පාඩුවක් සිදු වී තිබේද?

iv. ඊට වගකිවයුත්තන් කවරහුද?

v. ඔවුනට එරෙහිව ගන්නා පියවර කවරේද?

**ගරු ඉසුරු දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. i. තොරතුරු සන්නිවේදන තාක්ෂණ ව්‍යාප්තිය හා භාවිතය සහා බල ප්‍රදේශයේ ජනතාව අතර ව්‍යාප්ති කිරීම.

ii. මෙතෙක් නිල වශයෙන් ආරම්භ කර නැත.

iii. ඔව්.

iv. බේරුවල ප්‍රාදේශීය සභාවේ කියවීම් ශාලාවක් දැනට ස්ථාපනය කර තිබීම හේතුකොටගෙන විදුලිය හා දුරකථන බිල්පත් ගෙවීමට සිදු වී ඇත.

v. කඩිනමින් නැණසල මධ්‍යස්ථානය ආරම්භ කරන ලෙසට බේරුවල ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත උපදෙස් ලබා දෙමි.

ආ. i. 2016 - රු. 126,000.00
2017 - රු. 138,600.00

ii. 2016 වසරට අදාළ ලංසු මුදල රුපියල් එක් ලක්ෂ විසි හය දහසක් වන අතර, 2017 වසරෙහි එම මුදල එක් ලක්ෂ තිස් අට දහස් හයසියයක් වන බැවින් ලංසු වටිනාකම වැඩි වී ඇත.

iii. පාඩුවක් සිදු වී නොමැති බව නිරීක්ෂණය වෙයි.

iv. අදාළ නොවේ.

v. අදාළ නොවේ.

<u>**පසුබිම් වාර්තාව**</u>

<u>**ප්‍රශ්න අංක - 08**</u>

08.(අ) තොරතුරු තාක්ෂණ ආයතන මගින් බල ප්‍රදේශයේ ජනතාව වෙත පහත සඳහන් සේවා ලබා දීමේ අරමුණින් යුතුව නැණසලක් පිහිටුවීම සඳහා බේරුවල ප්‍රාදේශීය සභාවේ අළුත්ගම පුස්තකාලය තෝරාගෙන ඇත.

- අන්තර්ජාල පහසුකම්
- ඊමේල් සේවාව
- ලේඛණ සියුම් ලෙස පරීක්ෂා කිරීම
- පරිගණක සේවා
- තොරතුරු තාක්ෂණ පුහුණු
- දේශීය හා ජාත්‍යන්තර දුරකථන සබඳතා
- තොරතුරු සේවාවන් ප්‍රචාරය කිරීම
- රජයේ තොරතුරු ලබාදීම

එම ගොඩනැගිල්ලේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2015 නොවැම්බර් මස 12 වන දින කළුවාමෝදර කියවීම් ශාලාව තුළ නැණසල ස්ථාපනය කිරීම සඳහා අදාළ පරිගණක හා උපාංග කියවීම් ශාලාවේ භාරකරු වෙත ලබා දී ඇත.

ජලය හා වැසිකිළි පහසුකම් ප්‍රමාණවත් නොවීම මත බාහිර ප්‍රජාව වෙත මෙම සේවාවන් සැලසීම දුෂ්කර වී ඇති අතර පයාගල පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ ගුරුවරිය දින 03ක් සඳහා මෙම ස්ථානයේ සේවයේ යොදවා කාර්යාලයේ කාර්ය මණ්ඩලය වෙත පුහුණුව ලබා දීමට කටයුතු කර ඇත. 2009 වසරේ සිට මෙම ස්ථානයේ පවත්වාගෙන යනු ලබන කියවීම් ශාලාව මගින් සතියේ දින 05 තුළ ප්‍රජාවට සේවය සපයා ඇති අතර දුරකථන හා විදුලි බිල්පත් සභාව විසින් ගෙවීමට කටයුතු සිදු කර ඇත.

2016 වසරේදී ජල පහසුකම් හා වැසිකිළි පහසුකම් ලබා දී ඇති බැවින් 2017 වසරේ සිට බාහිර ප්‍රජාව වෙත නැණසල මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත සේවාවන් සැලැස්වීම සඳහා අය කිරීමට අපේක්ෂිත ගාස්තු පිළිබඳ ලේකම් විසින් 2016.12.23 දිනැති ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කර ඇත. කාර්යාලයේ නිලධාරීන් 02ක් වෙත තොරතුරු තාක්ෂණ ආයතනය වෙතින් පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව මෙම කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කරවන ලෙස ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත.

08.(ආ) බේරුවල ප්‍රාදේශීය සභාවේ මග්ගොන පොදු වෙළඳපොළ, එළ හරක් මස් කඩය බදු දීම සඳහා 2016 වසරේ අවම ලන්සුව රු:126,000.00 ක්ද 2017 වසරේ අවම ලන්සුව රු:138,600.00 ක්ද ලෙස තීරණය කර ඇති බැවින් 2017 වර්ෂය සඳහා ලන්සු මුදලේ අඩුවීමක් නිරීක්ෂණය වී නැත.

2017 වර්ෂයට අදාළව 2016.09.30 දින ටෙන්ඩර් පත් විවෘත කිරීමේ දී ලැබී ඇති ටෙන්ඩර් පත් ප්‍රමාණය 01ක් වන අතර අවම ලන්සුවට වඩා වැඩි අගයක් වන රු: 140,000.00කට ඉල්ලුම් කර ඇති බැවින් මෙම ටෙන්ඩර් පිළිගැනීමට තීරණය කර ඇත.

## 04.

**පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/17/01)**

අ. පාලින්ද නුවර හා අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙක සඳහා පශු වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු අවශ්‍ය බව ඔබතුමා පිළිගන්නේද?

ආ. පිළිතුර ඔව් නම් අගලවත්තට පශු වෛද්‍ය නිලධාරීවරයෙකු පත් කරන්නේද?

ඇ. මෙම ප්‍රාදේශීය කාර්යාල දෙකටම වෙන වෙනම කුකුල් පැටව්, සවල්, බූට්ස්, විල්බැරෝ 2016 වසරේ කොපමණ ලබා දී ඇත්ද?

ඈ. ලබා දී ඇත්නම් එසේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ග්‍රාම නිලධාරී, වසම්වල බෙදා දුන් අයගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්නේද?

ඉ. මෙම බෙදා දීම සත්ව පාලනයට සම්බන්ධ අයටම ලැබුණේ යැයි ඔබතුමා සෑහීමකට පත් වන්නේද?

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)

Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

අ. ඔව්.

ආ. දැනට අගලවත්ත හා පාලින්දනුවර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙක සඳහාම එක් පශු වෛද්‍ය කාර්යාලයක් පමණක් ඇති අතර ඉදිරියේදී



අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා වෙනම පශු වෛද්‍ය කාර්යාලයක් ස්ථාපනය කිරීමටත්, වෛද්‍ය නිලධාරියෙකු ඇතුළු අනෙකුත් කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීමටත් යෝජිතය. කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීම සඳහා අදාළ අයදුම්පත්‍ර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අදාළ කටයුතු සිදු කෙරෙමින් පවතී. කාර්ය මණ්ඩලය අනුමත වූ වහාම අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙත පශු වෛද්‍ය නිලධාරීවරයෙකු අනුයුක්ත කිරීමට කටයුතු කරමි. එතෙක් පාලින්දනුවර (වලල්ලාවිට) පශු වෛද්‍ය කාර්යාලය වෙත පශු වෛද්‍ය නිලධාරියෙකු අනුයුක්ත කර ඇත.

ඇ. අගලවත්ත හා පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා 2016 වර්ෂයේ දෙන ලද කුකුල් පැටවු, බූට්ස්, විල්බැරෝ ඇමුණුම 01 මගින් දක්වා ඇත. 2016 වර්ෂයේදී සවල් ලබා දී නොමැත.

ඇමුණුම 01

| | | | උපකරණ | |
|---|---|---|---|---|
| අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | කුකුළු පැටවු | විල් බැරෝ | ගම් බූට්ස් ජෝඩු |
| 01. | අගලවත්ත | 225 | 01 | 08 |
| 02. | පාලින්ද නුවර | 330 | 04 | 22 |
| | **එකතුව** | **555** | **05** | **30** |

ඈ. ඔව්. ඇමුණුම 02[3] යටතේ දක්වා ඇත.

ඉ. ඔව්. අදාළ කොට්ඨාශයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් ඒ බව සනාථ කර ඇත.

[3] පිළිතුර අවසානයේ පළ කර ඇත.

ඇමුණුම **02**

/ක් ප්‍රතිලාභියකුට ලිංග නොකරන ලද මසක් වයසැති කුකුළු පැටවුන් 15 බැගින් බෙදා දී ඇත.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභියාගේ නම | ලිපිනය | ග්‍රාම නිළධාරි කොට්ඨාශය | එක් අයෙකුට ලබාදුන් කුකුළු පැටවුන් ගණන | |
|---|---|---|---|---|---|
| පාලින්ද නුවර | ඩබ්. සුමිත් නිශාන්ත | කෙළින්කන්ද,කන්දෙවත්ත | 836 J ,බාම්පාර | 15 | |
| | පී .නයනා ශ්‍රියානි | මීදලන,මොරපිටිය | 837 ,මීදලන | 15 | |
| | ඩබ්. ඒ. පත්ම රුවන් | බොල්ලුන්න,හැඩිගල්ල ජනපදය | 836 A"බටහේන | 15 | |
| | ජී .කේ .ඉනෝකා නිශාන්ති | 101,ජී.එස් මාවත,බදුරලිය | 839 ,බදුරලිය | 15 | |
| | ඒ. ඒ .අබේරත්න | අස්වෙල්වත්ත,බදුරලිය | 836 F" ගලහිටිය | 15 | |
| | ජී. ඩී. නිශාන්ත ප්‍රේමකුමාර | ප්‍රදීපාල,මොරපිටිය | 836 H,මොරපිටිය උතුර | 15 | |
| | පී .නන්දසේන මීදලන | තිරිවානගොඩල,බදුරලිය | 837 A" මීදලන | 15 | |
| | එළයතම්බි කණකසබේ | මොහමදිවත්ත,පැළෑද කොටස,බදුරලිය | 835,පැලද බටහිර | 15 | |
| | එම්. තනුජා නිලන්ති | අත්වැල්තොට,මොරපිටිය | 836 D,අත්වැල්තොට | 15 | |
| | අයි. එච්. කාන්ති | කඹුරාවල,බදුරලිය | 839 B,කඹුරාවල | 15 | |
| | ඩබ්. එච් .මාටින් | අත්වැල්තොට,දිගන්න,මොරපිටිය | 836 N,දිගන්න | 15 | |
| | ඒ. එච්. එම්.නලීම් | පන්සල පාර,පැළෑද | 836 ,පැලෑද | 15 | |
| | එච්. කේ .ප්‍රේමජයන්ත | බොරගොඩ,මතුගම | 842, බොරළුගොඩ | 15 | |
| | ටී. හපුහෙට්ටි | බොරගොඩ,මතුගම | 842, බොරළුගොඩ | 15 | |
| | පී. එච්. රෙජිප්‍රිය සරත් කුමාර | බොරගොඩ,මතුගම | 842, බොරළුගොඩ | 15 | |
| සංවර්ධන ව්‍යාපෘති යටතේ කිකිළි පැටවි ලබා දීම (ගරු පළාත් සභා මන්ත්‍රී ප්‍රසන්න සංජීව මැතිතුමා) | කේ. සමන් කුමාර | මීණිකන්දල,මොරපිටිය | 836 H,මොරපිටිය උතුර | 15 | |
| | කේ. ඒ. අතුල ප්‍රදීප් කුමාර | මීණිකන්දල,මොරපිටිය | 836 H,මොරපිටිය උතුර | 15 | |
| | ඒ. මහේෂ් සංජය | මීණිකන්දල,මොරපිටිය | 836 H,මොරපිටිය උතුර | 15 | |
| | කේ .කේ. ඩී. ජානක ප්‍රසාද් | කෙලින් කන්ද ජනපදය,කෙලින් කන්ද | 836 I ,කෙළින්කන්ද ජනපදය | 15 | |
| | යූ. ඒ. ඩී. ලලිත් කුමාර | කෙලින් කන්ද ජනපදය,කෙලින් කන්ද | 836 H,මොරපිටිය උතුර | 15 | |
| | මාලක කන්න්ගර | සීල දොල මොරපිටිය | 836 H,මොරපිටිය උතුර | 15 | |
| | රොසලින් සුවදආරච්චි | සීල දොල මොරපිටිය | 836 H,මොරපිටිය උතුර | 15 | |
| එකතුව | | | | | 3 |
| අගලවත්ත | එන්. ජී.එස්. එදිරිසිංහ | කොහිලදෙණිය ,පොල්ගම්පල | 845A,හරන්කහපත,පොල්ගම්පල. | 15 | |
| | එම්. ඒ. ඩී. රූපරත්න සමරවීර | අඹේමුල්ල,යටියන ,අගලවත්ත | 830 B ,වදුරළුව | 15 | |
| | එච්. ඒ. අනුර උදය කුමාර | පයිලකන්ද,කිතුල්ගොඩ,අගලවත්ත | 833, කිතුල්ගොඩ | 15 | |
| | එන්. ඩී. සුනිල් කාන්ත | කිතුල්ගොඩ,අගලවත්ත | 828 B,ගොරකගොඩ | 15 | |
| | කේ. ඒ. ප්‍රදීප් දිමුතු | ගොඩැල්ල,රත්මලේ,පොල්ගම්පල | 844, රත්මලේ | 15 | |
| | එච්. ඒ. අතුල සිරිතුංග | කිතුල්ගොඩ,අගලවත්ත | 833, කිතුල්ගොඩ | 15 | |
| | ටී .කේ. සුජීව හේමන්ත | පොල්වත්තගොඩ,කිතුල්ගොඩ,අගලවත්ත | 833, කිතුල්ගොඩ | 15 | |
| | බී .වී. නිලානි සුමිත්‍රා | ඇතල්ගහතැන්න, කිතුල්ගොඩ,අගලවත්ත | 830 A"යටියන | 15 | |
| | මාලා කාන්ති | කිතුල්ගොඩ,අගලවත්ත | 830 A"යටියන | 15 | |
| | ඩබ්. ඒ .පියවතී | කිතුල්ගොඩ,අගලවත්ත | 830 A"යටියන | 15 | |
| | කේ .ජී. තිලකසිරි | මාක්ස්වත්ත,යටියන ,අගලවත්ත | 830 A"යටියන | 15 | |
| | ඩබ්. ඒ. චන්ද්‍රලතා | යටියන ,අගලවත්ත | 830 A"යටියන | 15 | |
| | ආර්. ඒ. ශාන්ති පුෂ්ප කුමාරි | යටියන ,අගලවත්ත | 830 A"යටියන | 15 | |
| | සම්පත් විජේවන්න | කිතුල්ගොඩ,රත්මලේ,පොල්ගම්පල | 844,රත්මලේ | 15 | |
| | නදීශා එදිරිසිංහ | පල්ලිගොඩ,පොල්ගම්පල | 844 D" පොල්ගම්පල | 15 | |
| එකතුව | | | | | |
| මුළු එකතුව | | | | | |

ඇමුණුම 02

## ල් බැරෝ ලබා දීම

එක් ප්‍රතිලාභියකුට එක් උපකරණය බැගින් ලබා දී ඇත.

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභියාගේ නම | ලිපිනය | ග්‍රාම නිළධාරි කොට්ඨාශය | වීල් බැරෝ |
|---|---|---|---|---|
| පාලින්ද නුවර | කේ .එච් මහීපාල | හල්දොරපාර,බෙල්ලන | 834/A,බෙල්ලන | 01 |
| | ඒ. ඒ. අබේරත්න | අස්වෙලිවත්ත,බදුරලිය | 836/F,ගලහිටිය | 01 |
| | කේ ඒ අජිත් රණදේව | ලත්පදුර,කන්දෙවත්ත | 835/ලත්පදුර | 01 |
| | කේ සුබ්‍රමනියම් | පැලැදවත්ත,බදුරලිය | 835/මොරගහදෙණිය | 01 |
| අගලවත්ත | කේ ජී තිලකසිරි | මාක්ස්වත්ත,යටියන | 830/A,යටියන | 01 |
| එකතුව | | | | 05 |

## ගම් බූට්ස් ලබා දීම

එක් ප්‍රතිලාභියකුට එක් උපකරණය බැගින් ලබා දී ඇත.

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභියාගේ නම | ලිපිනය | ග්‍රාම නිළධාරි කොට්ඨාශය | ගම් බූට්ස් ගණන |
|---|---|---|---|---|
| පාලින්ද නුවර | අතුල සරත්ද අල්විස් | පාළුවත්ත,ලත්පදුර | 835/B,ලත්පදුර | 01 |
| | පී එච් ගුණදාස | පතුරානමැදපාර,බදුරලිය | 839/ බදුරලිය | 01 |
| | කේ එච් මහීපාල | හල්දොලපාර,බෙල්ලන | 834/A බෙල්ලන | 01 |
| | බී වී මණතුංග | බෙල්ලන,එගොඩවත්ත | 834/C,විහාරගම | 01 |
| | රංජිත් කුලතුංග | ලැමැදගොඩ,කිතුල්ගල්වල | 835/A,ඉලුක්පොත | 01 |
| | අයි එච් සම්පත් | අක්කර20,පැලැද | 836/, පැලැද | 01 |
| | එම් එඩ්වර්ඩ් | මොහොමදිවත්ත | 835/C,මාරගහහන්දිය | 01 |
| | එම් ඒ ප්‍රදීප් අශෝක | සිංහරාජඋද්‍යානය,යට්ටපාත | 842/A,තිනියාවල | 01 |
| | කපිල කුමාර ගමඇතිගේ | අන්හාල්ලගොඩ,බදුරලිය | 839/ බදුරලිය | 01 |
| | අයි එච් විමලවතී | ගලහිටිය,මෝල්කාව | 836/F,ගලහිටිය | 01 |
| | පී ඒ ඩී සුජිත් නිරෝෂන් | දේවාලපාර.ලත්පදුර | 835/B,ලත්පදුර | 01 |
| | ඩී රෝහණ විජේනායක | දේවාලපාර.ලත්පදුර | 835/B, ලත්පදුර | 01 |
| | ජී ඩී සුගත් නිලන්ත | දේවාලපාර.ලත්පදුර | 835/B ලත්පදුර | 01 |
| | බී යූ ජයවර්ධන | දේවාලපාර.ලත්පදුර | 835/B ලත්පදුර | 01 |
| | ඩබ් ඒ රුවන් ලලන්ත | මගුරපාර, බදුරලිය | 839/D මගුර නැ. | 01 |
| | එස් ඒ ඩී ඉන්දික මහීපාල | කෝවිලගොඩ, බදුරලිය | 839D,මගුර නැ | 01 |
| | කේ ඒ ඩී නිලාන් ධනුෂ්ක | ලත්පදුර, බදුරලිය | 835/,ලත්පදුර | 01 |
| | එස් ඩී නිලංක ප්‍රසාද් මහීපාල | කෝවිලගොඩ, බදුරලිය | 839/D,මගුර නැ | 01 |
| | කුසුම් ප්‍රදීප් | සිංහරාජඋද්‍යානය,යට්ටපාත | 842/A,තිනියාවල | 01 |
| | මානෙල් බුලත්සිංහල | මීදලන,මොරපිටිය | 837/,මීදලන | 01 |
| | කේ ඒ ඩී සමරවීර | හැඩිගල්ල,ගුරුළුබැද්ද | 838/,හැඩිගල්ල | 01 |
| | එස් ඩී නිහල් සිල්වා | කොත්හේන,මොරපිටිය | 836/A,මොරපිටිය | 01 |
| අගලවත්ත | රෝහනගමගේ ඇතිගේ | මහකළුපාන ,මතුගම | 847/කළුපහන | 01 |
| | එස් ඒ අතුල ප්‍රේමකුමාර | ඉහළගම.ඕමත්ත | 828/A,ඇවරිවත්ත | 01 |
| | කේ එම් යූ ජයන්ති පෙරේරා | පූවක්ගහවිට,කන්දපාර,ඕමත්ත | 828/A, ඇවරිවත්ත | 01 |
| | නයනා ප්‍රිතිකා | ඉහළගම.ඕමත්ත | 828/A ඇවරිවත්ත | 01 |
| | ජී ඩී චන්න මධුෂංක | කිතුල්ගොඩ අගලවත්ත | 833/A,කිතුල්ගොඩ | 01 |
| | ඩී වී ගුණදාස සමරසිංහ | කුරුපිට,පොල්ගම්පල | 845/කුරුපිට | 01 |
| | කේ ඒ කුමාරරත්න | වල්පිටවත්ත,පින්නගොඩ | 832/පින්නගොඩ | 01 |
| | අමරපාල කන්නන්ගර | දියපත්තුගම,පොල්ගම්පල | 844/Dපොල්ගම්පල | 01 |
| එකතුව | | | | 30 |

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, අගලවත්තට කෙනෙක් නැත්තේ, කවුරු හරි කෙනෙකුගේ සතෙකුට පැටියෙකු ලැබෙන්න ආවාම, පාලින්දනුවර කෙනා අගලවත්තේ ගියා කියනවා. අගලවත්තේ කෙනෙක් ආවොත් අරෙහේ කියනවා. ඒ නිසා දැනට පැටව් මැරිලා තිබෙනවා. එළදෙනුන් මැරිලා තිබෙනවා. ඉක්මණින් මේකට පිළියමක් යොදන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේ ළඟදී එහෙම පැමිණිලි ගොඩක් ආවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒ කලට වේලාවට යන්න බැරි වුණු නිසා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

කලට වේලාවට යන්නේ නැහැ. මොකද, අගලවත්තේ -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, දැන් දීර්ඝ කාලයක් තිස්සේ අපට ප්‍රශ්නයක් තිබුණා. පශු වෛද්‍යවරුන්ගේ හිඟකමක් තිබුණා. අපට මධ්‍යම ආණ්ඩුවෙන් පශු වෛද්‍යවරු 35 දෙනෙකු හම්බ වුණා. ලොකු වාසනාවක්. ඒ 35 දෙනාගෙන් 32 දෙනෙක් වැඩ භාර ගත්තා. අපට දැන් පශු වෛද්‍ය කාර්යාලයකට පශු වෛද්‍යවරු දෙන්නා බැගින් දාන්න පුළුවන්. දැන් මේ ප්‍රශ්නය යථා කාලයේදී ඉතාමත්ම ඉක්මණින් විසඳගන්න පුළුවන්කම ලැබෙනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අගලවත්තට වඩා පාලින්දනුවර විශාලයි. අගලවත්තට දවස් දෙකකුයි පාලින්ද නුවරට දවස් තුනකුයි වෙන් කරලා දෙන්නය කියලා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒ ගැන මම බලන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 05 යටතේ නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**06.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/17/03)**

අ. පිළි/අංක 1 කනිෂ්ඨ විද්‍යාලයේ 2017 වසරේ පවත්නා පළමු ශ්‍රේණියේ පන්ති ගණන කීයද?

ආ. ඒ අනුව ඇතුළත් කර ගන්නා මුළු ළමුන් ගණන කීයද?

ඇ. මේ වන විට ඇතුළත් කර ගෙන ඇති ළමුන් ගණන, ඒ ඒ ගණයට අනුව මුළු ගණන කීයද?

ඈ. ඇතුළත් කර ගෙන ඇති ළමුන්ගේ නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම ලෙස වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

ඉ. ඇතුළත් කර ගන්නා ලද ළමුන් ගණනට අනුව මේ වන විට මුළු පුරප්පාඩු ගණන කීයද?

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ හා ස්ථාන මාරු ලැබ එන නිලධාරීන්ගේ ළමුන්ගේ ගණයට ඇතුළත් කර ගැනීමට පුරප්පාඩු ලෙස වෙන් කළ ගණන කීයද?

උ. පාසලට ඇතුළත් කර නොගත් පොරොත්තු ලේඛනයේ සිටින ඒ ඒ ගණයට අනුව නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම යන තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. පන්ති 07 කි.

ආ. ළමුන් 273 යි.

ඇ. පාසලට ආසන්න - 113

| | | |
|---|---|---|
| ආදි ශිෂ්‍ය | - | 59 |
| සහෝදර | - | 36 |
| අධ්‍යාපන | - | 12 |
| ස්ථාන මාරු | - | 06 |
| විදේශ | - | 01 |
| ක්‍රියාන්විත | - | 17 |
| එකතුව | - | 244 |

ඈ. ඔව්. ඇමුණුම 01[4] හි දක්වා ඇත.

ඉ. ළමුන් 29 යි.

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ ළමුන් 35
ස්ථාන මාරු ලැබ එන නිලධාරීන්ගේ ළමුන් 10

උ. ඔව්. ඇමුණුම 02 හි[5] සඳහන් කර ඇත. මේ ටික සභාගත කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මම මේ ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ ලකුණු නොවෙයි. මම අහලා තිබෙන්නේ ගන්න ළමයි සංඛ්‍යාව කීයද කියලා. ඔබතුමා කියන්නේ ඒකේ ලකුණු කීයද කියලයි. අවශ්‍ය දේ තමයි -

[4] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[5] -එම-



**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒ කියන්නේ කී වෙනි ප්‍රශ්නයද විමසන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දැන් මෙහෙමයි. 'ආ' ප්‍රශ්නයෙන් අහන්නේ, ඒ අනුව ඇතුළත් කර ගන්නා මුළු ළමයින් ගණන කීයද? මට ඕනෑ ළමයි ගණන.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

244 යි. අනික් එක මම මේක සභාගත කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. ඔබතුමා ලකුණු වගයක් කියෙව්වා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. ලකුණු නොවෙයි. ඒ කිව්වේ ළමුන් කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ළමුන් කියලා. ඔබතුමාට ඇහිලා නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හැබැයි. මම ඉල්ලීමක් කරනවා. වටගල මන්ත්‍රීතුමාගෙන් උපදෙස් ගන්න එපා. ඔබතුමා කෙළින්ම මගෙන් අහන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරි ඒ වාර්තාවත් එක්ක මම ඉතිරි ටික අහන්නම්.

## 07.

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/17/04)**

අ. පිළි/සෝමවීර චන්ද්‍රසිරි විද්‍යාලයේ 2017 වසරේ පවත්නා පළමු ශ්‍රේණියේ පන්ති ගණන කීයද?

ආ. ඒ අනුව ඇතුළත් කර ගන්නා මුළු ළමුන් ගණන කීයද?

ඇ. මේ වන විට ඇතුළත් කර ගෙන ඇති ළමුන් ගණන, ඒ ඒ ගණයට අනුව මුළු ගණන කීයද?

ඈ. ඇතුළත් කර ගෙන ඇති ළමුන්ගේ නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම ලෙස වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

ඉ. ඇතුළත් කර ගන්නා ලද ළමුන් ගණනට අනුව මේ වන විට මුළු පුරප්පාඩු ගණන කීයද?

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ හා ස්ථාන මාරු ලැබ එන නිලධාරීන්ගේ ළමුන්ගේ ගණයට ඇතුළත් කර ගැනීමට පුරප්පාඩු ලෙස වෙන් කළ ගණන කීයද?

උ. පාසලට ඇතුළත් කර නොගත් පොරොත්තු ලේඛනයේ සිටින ඒ ඒ ගණයට අනුව නම, ගණය, ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු, අභියාචනා හා විරෝධතා පරීක්ෂණයට අනුව ලකුණු, ස්ථිර පදිංචි ලිපිනය, භාරකරුගේ නම යන තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. පන්ති 08 කි.

ආ. ළමුන් 312 යි.

ඇ.

| | | |
|---|---|---|
| පාසලට ආසන්න | - | 133 |
| ආදි ශිෂ්‍ය | - | 66 |
| සහෝදර | - | 39 |
| අධ්‍යාපන | - | 11 |
| ස්ථාන මාරු | - | 07 |
| විදේශ | - | 02 |
| ක්‍රියාන්විත | - | 07 |
| **එකතුව** | **-** | **265** |

ඈ. ඔව්. ඇමුණුම 01[6] හි සඳහන් කොට ඉදිරිපත් කරමි.

ඉ. ළමුන් 15 යි.

ඊ. ආරක්ෂක අංශවල සේවයේ නියුතු වූවන්ගේ ළමුන් 40 යි.

උ. ඔව්. ඇමුණුම 02[7] හි සඳහන් කර ඇත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දැන් ඉතිරි ටික අරගෙන ඉවර කරන්නේ කවදාද කියන එක ගැන ඔබතුමාට අදහසක් තිබෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අපි 90% ක් විතර මේ දවස්වල තොරතුරු රැස් කරමින් ඉන්නවා, ගරු මන්ත්‍රීතුමා. මොකද, අර ක්‍රියාන්විත සේවයේ පැමිණීම්, ඒ වගකීම් විදුහල්පතිවරුන්ගෙන් දැනට ඉටු වෙලා තිබෙනවා. සමහර පාසල්වල තවමත් අපට පුංචි පුංචි ප්‍රශ්න තිබෙනවා. ඒවා දැන් ඉක්මණින් විසඳගෙන යනවා. මම උත්සාහ කරනවා, මේ සැරේ නම් මේ මාසේ ඉවර වෙන්න ඉස්සෙල්ලා මේ ප්‍රශ්නය විසඳන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එතකොට ඒ ක්‍රියාන්විතයෙන් අරගෙන ඉතිරි ළමයි ටික පොරොත්තු ලේඛනය අනුව - මම මේ ගත්ත තොරතුරුවල වැදගත්කම තිබෙන්නේ ඒකයි. අන්න ඒ පොරොත්තු ලේඛනයට අනුව ඉතිරි ළමයින් ටික ගැනීමට ඔබතුමා පියවර ගන්නේද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමාගේ අදහසට ගරු කරලා, ඒ ගැන අපේ නිලධාරීන් එක්ක සාකච්ඡා කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. නිලධාරීන් නොවෙයි. ඔබතුමාට අදහසක් තිබෙන්න එපැයි.

---

[6] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[7] -එම -

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නීත්‍යානුකූල ස්වරූපයට මම කැමැති ඇමතිවරයෙක්. ඔබතුමා දන්නවා නේ? ඒ නිසා දැනට අර තොරතුරු ආවාට පස්සේ, අපි තවත් ලැයිස්තුවක් ක්‍රියාන්විත සේවයෙන් පැමිණ තිබෙනවා කියලා දැන ගන්නට ලැබුණා. ක්‍රියාන්විත සේවයේ ලැයිස්තු දෙකක් එනවා. මේ ගැන තර්කයක් තිබෙනවා. ක්‍රියාන්විත සේවයේ ලැයිස්තු දෙකක් එව්වාම සැබවින්ම ක්‍රියාන්විත සේවයේද කියලත් අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසාවෙන් මේ පිළිබඳව යළි විමසීමක් කරන්නත් බලාපොරොත්තු වෙනවා. මේ දෙවැනි ලැයිස්තුවත් එවනවා. එතකොට අපට තව ප්‍රශ්නයක් තිබෙනවා. මේ ආසන්නතාවයේ ඉන්න ළමයි. ඒ නිසා මේ පිළිබඳව විධිමත් සාකච්ඡාවකින් ඔබතුමාගේ හෘද සාක්ෂියට ආමන්ත්‍රණය කරන්න බලාපොරොත්තු වෙනවා.

**කාර්ය පටිපාටි රීති 31(අ) 1 අනුව පිළිතුරු දීමට කල් ගන්නා ලද ප්‍රශ්නය :**

**08.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.01.17 දින සභාව කල් තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/17/ADG-01)**

අ. හෝමාගම, හොරගල, ඉද්දගල මිටි බෑවුම සහිත කඳු ප්‍රදේශයේ මහා පරිමාණ ගල් කොරියක් නිසා ජනතාවට හානිකර තත්ත්වයක් ගැන ඔබතුමා දන්නේද?

ආ. භූගත ජලය සිඳී යාම, අවට නිවාස ඉරිතලා යාම ඇතුළු පරිසර හානි පිළිබඳව මෙම ගල්කොරියට විරුද්ධව මහජන උද්ඝෝෂණ පැන නැගී ඇති බව දන්නේද?

ඇ. පළාත් පරිසර, නීතිය හා සාමය යන විෂයයන් භාර අමාත්‍යවරයා ලෙස මහජනතාව මුහුණ දෙන මෙම ගැටළු පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග කවරේද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. අදාළ ව්‍යාපෘතිය මධ්‍යම පරිසර අධිකාරියෙහි බලපත්‍ර අධිකාරී බලය යටතට අදාළ ව්‍යාපෘතියක් බැවින් හා අදාළ කැණීම් සම්බන්ධයෙන් භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයෙහි අනුමැතිය ලැබී ඇති හෙයින් පවත්නා තත්ත්වය පිළිබඳව එම ආයතනය දැනුවත් කිරීමට කටයුතු කරමි.

<u>පසුබිම් වාර්තාව</u>

හෝමාගම ප්‍රදේශිය සභා බල සිමාවේ කොරගල ඉද්දගල ප්‍රදේශයේ පිහිටි බෑවුම් සහිත ප්‍රදේශයක මහා පරිමාන ගල් කොරියක් පවත්වාගෙන යනු ලැබේ.

අක්කර දෙකකට අධික ප්‍රදේශයක විහිදී ඇති මෙම ගල් කොරියට ප්‍රධාන මාර්ගයෙන් හැරී කිලෝ මිටර් 2 ක් පමණ රබර් සහ ලඳු කැලෑ සහිත ප්‍රදේශයක් හරහා ගමන්කර පිවිසිය යුතුය.

මෙම ප්‍රදේශය පුරාම ව්‍යාපෘතියට විරුද්ධව සකස් කර ඇති විරෝධතා පුවරු ප්‍රදර්ශනය කර ඇත.

මේ වන විට ඉදිකරමින් පවතින පෝට් සිටි ව්‍යාපෘතිය සඳහා මෙම ගල් ප්‍රවාහනය කරනු ලබයි.

2016 / 09 / 13 වන දින සිට 2017 / 09 / 12 දින දක්වා මධ්‍යම පරිසර අධිකාරිය විසින් බල පත්‍ර අංක 032789 දරණ බල පත්‍රය යටතේ භූ විද්‍යා හා පතල් කැනිමේ කාර්යාංශය මගින් 2016 / 09 / 08 දින සිට 2017 / 09 / 07 දක්වා අංක අයි.එම්.එල්/ඒ/එච්.ඕ./3942/එල්.ආර්./4 යටතේ ද මෙම කටයුතුත සඳහා අනුමැතිය ලබා දී ඇත.

හෝමාගම ප්‍රදේශිය සභාව මගින් 2016 වසර සඳහා වෙළඳ බල පත්‍රය ලබාගෙන ඇතත් 2017 වසර සඳහා මේ දක්වා වෙළඳ බල පත්‍රය ලබාගෙන නැත.

මෙම කටයුත්ත වලකාලමින් අංක 14410 යටත් අවිස්සාවේල්ල අධිකරණයෙන් තහනම් නියෝගයක් ප්‍රදේශවාසින් ලබා ගෙන ඇතත් 2012 / 08 / 12 වන දිනැතිව නැවත සියළු කරුණු සලකා බලා ගල් කොරිය පවත්වාගෙන යාමට අධිකරණය අවසර ලබා දී ඇත.

දෛනිකව මෙම ගල් කොරියේ පිපිරිම භූ විද්‍යා හා පතල් කැනිමේ කාර්යංශයට අනුබද්ධ GSMD TEXCHNICAL HGRVICES Pvt. Ltd ආයතනය විසින් පරික්ෂා කරන අතර ස්ථානිය පරික්ෂනය සිදුකල දිනය වූ 2017 / 01 / 31 දින ද පිපිරිම් ඇසිමට ලැබි ඇත.

විශාල ටිපර් රථ මගින් ගල් ප්‍රවාහනය සිදු කරනු ලබන අතර ගල් ප්‍රවාහන මාර්ගයේ දූවිලි අවම කිරිම සඳහා ජලය ඉසිනු ද දැකිය හැකිය මෙම වයාපෘතිය හේතුවෙන් ජල මූලාශ්‍ර සිඳී ගොස් ඇති බවද නිවාස ඉරි තැලි ඇති බවද ප්‍රදේශවාසින් පවසන අතර එහි සත්‍යතාවයක් බව ද නිරික්ෂනය විය.

ඊට අමතරව ගල් ප්‍රවාහනය කරන ටිපර් රථ ඉතා වේගයෙන් ගමන් කිරිම නිසා මාර්ගයේ දූවිලි අවුස්සමින් ගමන් කිරිම මහජනාවගේ විරෝධයට හේතු [illegible] බව නිරික්ෂනය විය.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු මහ ඇමතිතුමනි, දැන් මේ ප්‍රශ්නයේදී ඔබතුමා කියන විධියට කලින් අනුමැතිය දීලා ඇති. නමුත් ප්‍රායෝගිකව ඒවා ක්‍රියාත්මක කරන්න ගියාට පස්සේ දැන් ප්‍රදේශයේ විශාල පරිසර හානියක් තිබෙනවා. ඒ කියන්නේ ගෙවල් පුපුරලා එහෙම ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමාට පරිසර විෂය තිබෙන නිසා පළාත් සභාවට ඒ නිසා විශේෂ වගකීමක් තිබෙනවා. ඒ නිසා අවශ්‍ය පියවර ගන්න කියන ඉල්ලීම තමයි කියන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අර විධියට යමු අපි. අර වැඩේට.

**කාර්ය පටිපාටි රීති 31(අ) 1 අනුව පිළිතුරු දීමට කල් ගන්නා ලද ප්‍රශ්නය :**

**09.**

**සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.01.17 දින සභාව කල් තබන අවස්ථාවේදී අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/VI(1)/17/ADG-02)**

අ. ඉහත සඳහන් විෂයන් භාර අමාත්‍යවරයා හා ප්‍රධාන අමාත්‍යවරයා වන ඔබතුමාගේ කාර්ය මණ්ඩලයේ උපදේශකවරුන් සිටීද?

ආ. ඔවුන් කොපමණ පිරිසක්ද? ඔවුන් කවර විෂය ක්ෂේත්‍ර හා සම්බන්ධව කටයුතු කරන්නේද?

ඇ. ඔබතුමාගේ කාර්ය මණ්ඩලයේ සේවය කරන උපදේශකවරුන්ගේ නම් සහාගත කළ හැකිද?

ඈ. ඔබතුමා ප්‍රධාන අමාත්‍යවරයා ලෙස පත්වීමෙන් පසුව නම් කළ උපදේශකවරුන් කවරෙකු හෝ පසුව ඉවත් කළේද? ඉවත්ව ගියේද? ඔවුන් නම් කළ හැකිද?

ඉ. ඔබතුමා මහ ඇමතිවරයා ලෙස පත්වීමෙන් පසුව නම් කළ උපදේශකවරුන්ගෙන් කවරෙකුට හෝ විදේශ විනිමය, මූල්‍ය හෝ වෙනත් සම්පත් අවභාවිත කිරීම පිළිබඳ කිසියම් චෝදනාවක් එල්ල වූයේද? එසේ නම් ඔවුන්ගේ නම් සහාගත කළ හැකිද? නොහැකි නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. නැත.

ආ. අදාළ නොවේ.

ඇ. අදාළ නොවේ.

ඈ. ආණ්ඩුකාරතුමාගේ අංක 1/2/7/1(111)(S) සහ 2015.09.15 දිනැති ලිපියෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වශයෙන් සේවය කර විශ්‍රාම ලැබූ ඒ.එච්. ගමගේ මහතා 2015.09.11 දින සිට වසරක කාල පරිච්ඡේදයක් සඳහා ප්‍රධාන අමාත්‍ය උපදේශක වශයෙන් පත් කර තිබුණි. එසේ වෙතත් 2015.09.16 දින පැවැත්වූ රජයේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගරු අමාත්‍යවරුන් සඳහා උපදේශකවරුන් පත් කිරීම සම්බන්ධයෙන් අංක 15/0180/613/008 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් එළැඹි තීරණය අනුව ඒ.එච්. ගමගේ මහතා ප්‍රධාන අමාත්‍ය උපදේශක තනතුරෙන් ඉවත්ව යන ලදී.

ඉ. නැත. අදාළ නොවේ.

<u>**පසුබිම් වාර්තාව.**</u>

ප්‍රධාන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා උපදේශකවරයෙකු පත්කර ගැනීමට ලබාදී තිබූ අවස්ථාව අනුව ප්‍රධාන අමාත්‍යවරයා විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත 2015.09.11 දිනැතිව කරන ලද නිර්දේශය මත ආණ්ඩුකාරතුමාගේ අංක 1/2/7/1(111)(S) සහ 2015.09.15 දිනැති ලිපියෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යේෂ්ඨ නිලධාරියෙකු වශයෙන් සේවය කර විශ්‍රාම ලැබූ ඒ.එච්.ගමගේ මහතා 2015.09.11 දින සිට වසරක කාල පරිච්ඡේදයක් සඳහා ප්‍රධාන අමාත්‍ය උපදේශක වශයෙන් පත්කර තිබුණි.

එසේ වුවද 2015.09.16 දින පැවැත්වූ රජයේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගරු අමාත්‍යවරුන් සඳහා උපදේශක වරුන් පත්කිරීම සම්බන්ධයෙන් අංක 15/0180/613/008 දරණ අමාත්‍යමණ්ඩල සංදේශයෙන් එලඹි තීරණය අනුව ඒ.එච්.ගමගේ මහතා ප්‍රධාන අමාත්‍ය උපදේශක තනතුරෙන් ඉවත්ව යන ලදී.

0227

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මීට මාසයකට පමණ ඉහතදී ගුවන්තොටුපලට ආවා එක්තරා පුද්ගලයෙක්, රටින් පිට වෙන්නය කියලා. ඔහු රේගුවේදී ඩොලර් 50,000 ක් සමඟ අත්අඩංගුවට ගන්නවා. මේ මුදල් කොහෙන්ද කියලා ඔහුට පැහැදිලි කරන්න බැරි වෙනවා. එතකොට ඒ අවස්ථාවේදී - මොහුගේ නම කියන්න මට ප්‍රශ්නයක් නැහැ. මොහුගේ නම තුසිත. ඔහු ඒ අවස්ථාවේදී ප්‍රකාශ කරලා තිබෙනවා, මම මහ ඇමතිතුමාගේ උපදේශකයෙක් කියලා. හැබැයි, එතුමා මහ ඇමතිතුමාගේ උපදේශකයෙකු නොවෙන්න පුළුවන්. මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අහන්නේ, තුසිත කියලා උපදේශකවරයෙක් ඔබතුමා යටතේ හිටියාද? ඉන්නවාද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු මන්ත්‍රීතුමා, ඒ සම්පූර්ණ නම කිව්වා නම් අපට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔහුගේ නම තුසිත හල්ලොලුව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට වාර්තා වෙලා නැහැලු එහෙම නමක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හොඳයි. ඊළඟට ගරු සභාපතිතුමනි, මම එතුමාට කියනවා, මේක පොඩ්ඩක් අවධානය යොමු කරන්නය කියලා. දෙවැනි කාරණය තමයි, ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයට පත් කළාද ඔබතුමා භාෂ්වර නමැති කෙනෙක්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම ප්‍රශ්න අහන්න බැහැ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතුමා කිසියම් මූල්‍ය වංචාවකට අහු වුණාද කියලා මම දැන ගන්න කැමැතියි.

0228

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම ප්‍රශ්න අහන්න බැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අහලා තිබෙන්නේ උපදේශකවරු.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක තමයි. මම අහන්නේ, උපදේශකවරයෙකු හැටියට භාෂ්වර හිටියාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

භාෂ්වර කියන්නේ වෙන චරිතයක් නේ ඒක.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

උපදේශකවරයෙකු හැටියට භාෂ්වර නමැත්තෙකු සිටියා ද කියලයි මම අහන්නේ ගරු සභාපතිතුමනි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ නේ ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අහපු ප්‍රශ්නවලට බාහිරව මේ ප්‍රශ්න අහන්නේ. මට ඔබතුමාට කාලය දෙන්න පුළුවන් මේ අහපු ප්‍රශ්නය ආකාරයෙන් අතුරු ප්‍රශ්න අහන්නයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අන්තිම ප්‍රශ්නය. භාෂ්වර නමැත්තෙකු ඔබතුමා ළඟ සේවය කළාද? ඔහු කියනවා, - මහ ඇමතිතුමා කියන්නේ උපදේශකවරු හිටියේ නැහැයි කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

භාෂ්වර කියන්නේ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍යාංශයේ සභාපති නේ? උපදේශක නොවේ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ සභාපති හැටියට. හරි. මට මේකට අදාළ නොවෙයි කියලා ඔබතුමා කියයි. හැබැයි, එතුමා යම්කිසි වංචාවකට අහු වුණාද කියලයි මට දැන ගන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඒක අහන්න බැරිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. මෙතැනට අදාළ වෙන්නේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අදාළ වෙන්නේ නැහැ. බොහොම ස්තුතියි.

ගරු සභාපතිතුමනි, ඒ වාගේම 36(1) යටතේ මට වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් කියන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, පසුගිය සභාවේදී මා ප්‍රකාශයක් කළා. මාළඹේ රාහුල බාලිකා විද්‍යාලයේ ශිෂ්‍යාවකට විඳීමට සිදු වූ අතවරය පිළිබඳව. ඒ දැරිය පාසල් නොඑවීමට විදුහල්පතිනිය බලපෑම් කළාය කියන එක මම පැහැදිලි කළා. හැබැයි, මගේ ප්‍රවෘත්තියට පදනම වුණේ, කාරණා දෙකක්. එකක් තමයි ලංකාදීප පුවත්පතේ පළ වූ පුවත් වාර්තාව. දෙවැනි එක තමයි, දැරියගේ පියා ජනාධිපතිතුමාට සහ අගමැතිතුමාට යවා මා වෙත ද පිටපතක් එවනු ලැබූ ඒ ලිපිය. ඒ දෙක පදනම් කර ගෙන තමයි මම මේ ප්‍රකාශය කළේ. හැබැයි, ඊට පස්සේ එකී මෙකී කාලය තුළ ඔබතුමාට මම ලිපියක් යොමු කළා. දැන් මේ විදුහල්පතිතුමිය පන්ති කව රැස්වීම් පවත්වමින්, ගුරුවරුන්ගේ රැස්වීම් පවත්වමින්, දෙමව්පියන් කැඳවමින් කිඳෙල්පිටිය මන්ත්‍රීවරයා කළ ප්‍රකාශය දැඩි ලෙස විවේචනය කරමින්, සභාවේ කටයුතු විවේචනය කරමින්, වරප්‍රසාද කඩ වන විධියට ගරු සභාපතිතුමනි, වැඩ කරලා තිබෙනවා. එතකොට මම වගකීම් විරහිත ප්‍රකාශයක් කළේ නැහැ.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් මේ වෙලාවේ ඉල්ලනවා, මේ සියලුම වාර්තා මා ළඟ තිබෙනවා. විදුහල්පතිනිය දරුවා පාසලට එවීම වැළැක් වූ බවට මෙන්න සාක්ෂි තිබෙනවා. හඬ පටය. විදුහල්පතිතුමිය සහ දැරියගේ මව අතර සිදු වූ දුරකථන සංවාදය. ඒ හඬ පටය තිබෙනවා. විදුහල්පතිනිය රැස්වීමකදී මාව විවේචනය කළ බවට හඬ පටය මෙතැන තිබෙනවා. කට් වන්. කට් වූ කියලා. ඊළඟට ලිපියක් ලියනවා. මට විරුද්ධව ජනාධිපතිතුමාට, අගමැතිතුමාට, අධ්‍යාපන ඇමතිතුමාට ලිපියක් ලියනවා. ඔබතුමාටයි එවන්නේ, මේ ලිපිය. ගරු සභාපතිතුමනි, ඔබතුමා මේ ලිපිය හොඳින් කියෙව්වොත් ඔබතුමාට තේරෙනවා, මන්ත්‍රීවරයෙකු විධියට මගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙනවා කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා. මේකට සම්බන්ධ දේශපාලඥයොත් ඉන්න පුළුවන්. මේ ලිපිය හදන්නේ විදුහල්පතිනිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය මට දැන් පැහැදිලියි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම වගකීමෙන් කියන්නේ. ගරු සභාපතිතුමනි, මේ ගැන පරීක්ෂණයක් කරන්න. මම ඔබතුමා හරහා අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. වහාම මේ ගැන සොයා බලන්න. මගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙනවා. සියලුම විස්තර සහිතව ඇමුණුම් සහිතව ඔබතුමාට. මේක මම ඔප්පු කරනවා. මේ විදුහල්පතිනිය දරුවා පාසලට එවීම වැළැක් වූ බව මම ඔප්පු කරලා තිබෙනවා. ඒ වාගේම මගේ වරප්‍රසාද කඩ කිරීම ගැන ඔබතුමා පරීක්ෂණයක් පවත්වන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අධ්‍යාපන ඇමතිතුමා සභාවේ ඉන්නවා. එදත් මේ ප්‍රශ්නය යොමු කරපු වෙලාවේ මම කිව්වා, මේ කාරණාව බරපතළ කාරණාවක්. මොකද, දරුවෙකු සම්බන්ධ ප්‍රශ්නයක් නේ? නමුත් ඔබතුමාට එදා මම උපදෙස් දුන්නා වාර්තාවක් ලබා දෙන්නය කියලා. දැන් දවස් 14 කට වඩා ගියා. ඔබතුමා ඒ ගැන පරීක්ෂණයක් කළාද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අපට මේ පාසල විතරක් නොවෙයි. පාසල් කිහිපයක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නොවෙයි. පාසල් තිබෙන එක හරි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේකෙන් පැනලා යන්න හදන්න එපා ගරු ඇමතිතුමා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා මට නියෝගයක් දුන්නාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම එදා ඔබතුමාට පැහැදිලිව කිව්වා, ඒ සම්බන්ධව වහාම පරීක්ෂණයක් පවත්වලා මටත් වාර්තාව එවන්නය කියලා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඊළඟ සති දෙකේ මේ සභාව පැවැත්වෙන්න කලින් ඔබතුමාට ඒ සම්බන්ධව වාර්තාවක් මම ලබා දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඊළඟ කාරණාව තමයි එතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කළා. එතුමාගේ නම සඳහන් කරලා එතුමාව දැඩි ලෙස විවේචනය කරනවා කියලා. පාසල තුළ. දෙමව්පියන් ඉස්සරහා පිට. ඒ ගැනත් ඔබතුමා -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

හඬ පටයකුත් තිබෙනවාලු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හඬ පටයකුත් තිබෙනවා. ඉතින් එතුමා -



**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඒ සම්බන්ධවත් ගරු සභාපතිතුමාගේ නියෝගය පරිදි ඊළඟ සති දෙකට කලින් සභාපතිතුමාගේ අතට ඒ වාර්තාව පත් කරනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය දවසක වෙබ් අඩවියක රාහුල බාලිකා විද්‍යාලයේ මෙතුමා සඳහන් කරපු දැරිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඔබතුමාට මොකක් හරි ප්‍රශ්නයක් වෙලා තිබෙනවාද?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒක නේ මේ කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩ වෙලා තිබෙනවාද?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, 36(1) කිව්වාට පස්සේ මම මේ කියන කාරණාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කෙටියෙන් කියන්න. මම ඇහුම්කන් දෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

කෙටියෙන් කොහොමද? මෙතුමාට පැය ගණනක් දීලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. එතුමාට පැය ගණනක් ගියේ නැහැ. විනාඩි -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

දිගට කියනවාද? කෙටියෙන් කියනවාද කියලා තමුන්නාන්සේ කොහොමද දන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට වරප්‍රසාද ප්‍රශ්නය කෙටියෙන් කියන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඊයේ පෙරෙයිදා එක්තරා වෙබ් අඩවියක සඳහන් කරලා තිබුණා, රාහුල බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනියව ආරක්ෂා කරන්නේ හෙක්ටර් බෙත්මගේ. මේජර් ප්‍රදීප් උඳුගොඩ පළාත් සභා මන්ත්‍රීතුමා. ජගත් කුමාර පළාත් සභා මන්ත්‍රීතුමා කියලා. මේක මඩ ගැසීමේ චේතනාවෙන්. රාහුල බාලිකා විද්‍යාලය තිබෙන්නේ කඩුවෙල ආසනයේ, මාළඹේ. මේක ඉතාමත්ම ජනප්‍රිය, ඉතාමත්ම හොඳින් පවත්වාගෙන යන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක් නේ? ඔබතුමාට මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා නම් මට කියන්න. ඔබතුමා මේ වෙන ඒවානේ කියන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මට දෙන්න කෝ වරප්‍රසාද අහිමි වුණු හැටි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් කියන්න ඔබතුමාට මොකක්ද වුණේ කියලා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

තමුන්නාන්සේට දිගට කියලත් තේරෙන්නේ නැත්නම් කෙටියෙන් කිව්වාම කොහෙමද තේරෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට හොඳට තේරෙනවා. ඔබතුමාට තේරෙන්නේ නැහැ. ඔබතුමා ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. හිටපු ඇමතිවරයෙක්. ඔබතුමාට තේරෙන්නේ නැහැ නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, සමාවෙන්න. හැමදාම ජ්‍යෙෂ්ට ජ්‍යෙෂ්ට කියලා අපව බොළඳ තත්ත්වයට දාන්න එපා. ඔය ජ්‍යෙෂ්ට කැල්ල ගලවලා දාන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජ්‍යෙෂ්ට නම් ඇමතිකමක් දෙන්න එපැයි. නැද්ද?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ජ්‍යෙෂ්ට නම් මම මහ ඇමති කරන්න එපැයි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඉතින් පක්ෂයේ නායකයින්ට කියන්න. ඒක මට අදාළ වෙන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අන්න බළලා එළියට පැන්නා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. මේ හොඳට පවත්වාගෙන යන බස්නාහිර පළාතේ අධ්‍යාපන සේවය එක එක්කෙනාට ඕනෑ විධියට තමන්ගේ ජනප්‍රියතාවය සඳහා හැල්ලු කරන්න එපා. ඒ සඳහා වෙබ් අඩවිවලට වැරදි තොරතුරු, පත්තරවලට වැරදි තොරතුරු, ඒ වාගේම දුරකථන සංවාද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, තවම මට ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කිව්වේ නැහැ නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජොෂ්ට කියලා ගෙදර රැස්වීමකුත් තිබ්බා, එතුමා මහ ඇමති කියලා. නමුත් හම්බ වුණේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙයා තමයි ආරක්ෂා කරන්නේ. ඔන්න දැන් කිව්වා. මෙතුමා විදුහල්පතිනියව ආරක්ෂා කරනවා. දරුවන්ගේ අනාගතය ආරක්ෂා කරන්න -

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා ජොෂ්ට කියලා ගෙදර රැස්වීමකුත් තිබ්බා. මහ ඇමති වෙන්න බැරිව ගියා.

## නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුනි, *"විජිත් ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමාට මාස තුනක නිවාඩු අනුමත කරන ලෙස"* ඉල්ලා සිටිනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, *"තුෂාර පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලකක් නිවාඩු අනුමත කර දෙන ලෙස"* ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාත් මට දැනුම් දුන්නා එතුමාට මාසයක කාලයක් නිවාඩු දෙන්නය කියලා. අසනීපයෙන් ඉන්නවාය කියලා.

***ප්‍රශ්න විමසන ලදින්, සභා සම්මත විය.***
*Questions put and agreed to.*

## අමාත්‍යාංශ නිවේදන/ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, පොඩි කාරුණික දැනුම් දීමක් තිබෙනවා. මේ පිළිබඳව මම සභාවේ අමාත්‍යතුමන්ලා ප්‍රමුඛ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ සඳහා බල කිරීමක් නැහැ. ඔබතුමන්ලාගේ කැමැත්තක් තිබෙනවා නම් මේ සඳහා සහභාගී වෙන්නය කියලා දැනුම් දෙනවා. මම මේ ලිපිය පොඩ්ඩක් කියවන්නම්.

*"මධ්‍යම පර්යන්ත සබඳතා අනුකාරක සභා වාර්තාව පිළිබඳ සාකච්ඡා කිරීම සම්බන්ධවයි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන කාර්ය සඳහා පත් කළ මධ්‍යම පර්යන්ත සබඳතා අනුකාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද අනුකමිටු වාර්තාව හා පළාත් සභා මහ ඇමතිවරුන් විසින් පළාත් සභා බලය පිළිබඳ ලබා දුන් වාර්තාව පිළිබඳව පළාත් සභා නියෝජිතයින් සමඟ සාකච්ඡා කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් දන්වා ඇත.*

*02. මේ වන විට පළාත් සභා 7 ක් සමඟ එම ආයතනය විසින් සාකච්ඡා කර ඇති බැවින් අවසන් වාර්තාව සැකසීම සඳහා බස්නාහිර පළාත් සභාවේ නියෝජිතයන්ගේද අදහස් වැදගත් වනු ඇතැයි මම අපේක්ෂා කරමි. ඒ අනුව පහත සඳහන් පරිදි මේ පිළිබඳව සාකච්ඡාවක් සූදානම් කරන ලදී.*

*03. මේ සමඟ අමුණා ඇති "පාර්ලිමේන්තුව සහ පළාත් සභා අතර සබඳතා පිළිබඳව සොයා බැලීම සඳහා මෙහෙයුම් කමිටුව විසින් පත් කරන ලද තත්කාර්ය අනුකමිටුවෙහි වාර්තාව" පිළිබඳ අධ්‍යයනය කර, ඔබගේ යෝජනා හා අදහස් ද සමඟින් එම සාකච්ඡාව සඳහා සහභාගී වන මෙන් ගෞරවයෙන් ඉල්ලමි.*

සභා කටයුතු කාරක සභාව මේක අවශ්‍ය නැහැයි කියලා ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. මම හිතන්නේ, උතුරු පළාත් සභාවත් ඒක අවශ්‍ය නැහැයි කියලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දකුණත් කියලා තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දකුණත් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. තමුන්නාන්සේලාගෙන් කවුරු හරි මේ සඳහා අදහස් ප්‍රකාශ කරන්න කැමැති කෙනෙක් ඉන්නවා නම්, අද සවස 3.00 ට ප්‍රධාන ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයට පැමිණ ඔබගේ අදහස් ප්‍රකාශ කරන්නය කියලා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බලකිරීමක් නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු මහ ඇමතිතුමා, ඔබතුමා ඕකට ගිහිල්ලා අදහස් ප්‍රකාශ කළාද නැද්ද? කලින් ඔබතුමා අදහස් ප්‍රකාශ කළාද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි දුන්නා නේ ඔක්කොම.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

පළාත් සභා කීයද? මේකයි උතුර -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. සියලු මහ ඇමතිවරු මේ සඳහා -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

දෙන්නයි දීලා තිබෙන්නේ. ඔබතුමායි උතුරු මැදයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මොකක්ද?

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

සාක්ෂි දීලා තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. ලියුම කිව්වා වැරදියි. මේක සියලුම මහ ඇමතිවරු කමිටුවට උපදෙස් දීලා තිබෙනවා. නමුත් මේකේ දකුණ දීලා නැහැ. මේ කියන කාරණාව සම්බන්ධයෙන්. දකුණයි උතුරයි දීලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීමා, මේක රාජ්‍ය ආයතනයක් නොවෙයි. මේක NGO –

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, අපි දැන ගන්න කැමැතියි. මේ ආයතනයට, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කියන ආයතනයට මොකක්ද තිබෙන උවමනාව, රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් මේ පළාත් සභාවල ඉන්න මහජන නියෝජිතයන් දැනුවත් කරන්න. ඒ අයට තිබෙන විශේෂ රුදාව, කැක්කුම මොකක්ද කියලා දැන ගන්න කැමැතියි. මේ වාගේ එකක් කොහොමද ඒ අය සභාවට එවන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මහ ඇමතිතුමාත් මමත් එක්තරා අවස්ථාවකදී ඔය වාගේ වැඩමුළුවකට සහභාගී වුණා. මෙතුමා කියපු කාරණය එක්ක. දැන් මෙහෙමයි. රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන කොට, රටේ පාලකයෝ බලාපොරොත්තු වෙනවා, ජනතාවගෙන්, ප්‍රජාවගෙන් මොකක්ද මේකට ලැබෙන පිටිවහල, සහාය කියන එක දැන ගන්න. එතකොට සමහර වෙලාවට ඒගොල්ලෝ කියනවා. ආණ්ඩුවම ප්‍රකාශයට පත් කරනවා. ජනතාවට ඇවිල්ලා අදහස් දෙන්න. විවිධ කණ්ඩායම්වලට, ජන කණ්ඩායම්වලට හරි, එහෙම නැත්නම් පාර්ශවවලට ඇවිල්ලා මේකට උදව් කරන්නය කියලා. හැබැයි, මම හිතන්නේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට - මම දන්නේ නැහැ. ඒකේ NGO කතන්දර නොවෙයි, ගරු සභාපතිතුමනි. ඒගොල්ලෝ ජනතාවගේ - මේ නියෝජිතයින්ගේ අදහස් වෙන කොහෙන්වත් යන්නේ නැහැ. අපි ගිහිල්ලා කියන්නේ නැහැ. පළාත් සභාවේ වැඩ පිළිවෙළක් නැහැ,

මේ අදහස් ටික අරගෙන ගිහිල්ලා කියන්න. හැබැයි, ඒගොල්ලෝ අපේ අදහස් ටික එකතු කර ගෙන ගිහිල්ලා ආණ්ඩුවට කියනවා. මම හිතන්නේ නැහැ, ඒකේ වැරැද්දක් තිබෙනවාය කියලා. ඒ නිසා මේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයද කවුද කියන එක නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට අවශ්‍ය නම්, ඒක ප්‍රතික්ෂේප කරන්න පුළුවන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මහ ඇමතිතුමා කියපු කාරණය සම්බන්ධයෙන්. ඒ නිසා කවුරු හරි අපේ අදහස් ගිහිල්ලා කියනවා නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමා කිව්වේ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඒක හොඳ දෙයක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කැමැති අයට යන්න කියලා එතුමා කිව්වේ. ඒ නිසා කැමැති අය -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අපේ අදහස් ටික යනවා නම් එතැනට හොඳයි නේ? නියෝජිතයෝ හැටියට. ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමා පැහැදිලිව ඒ සඳහා කැමැත්තක් දක්වන අයට එන්න කියලයි ආරාධනා කළේ. එපමණයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රධාන ලේකම් කාර්යාලයේ මෙවැන්නක් පවත්වන්න කියලා කවුද අවසර දුන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මම හිතන්නේ විෂය භාර ඇමතිතුමා වශයෙන් මහ ඇමතිතුමා -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කවුද විෂය භාර ඇමතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමතිතුමා නීතිය හා සාමය, පළාත් පාලන -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීම සම්බන්ධයෙන් -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ ලියුම කියවන කොටත් මම කිව්වේ, මේකට කැමති අය ඉන්නවා නම් සහභාගී වෙන්න. කවුරු හරි ආයතනයක් අපෙන් ඉල්ලීමක් කළාම - සමහර විට මේ ගැන උනන්දුවක් තිබෙන මේ සභාවේ මන්ත්‍රීවරයෙක් මගෙන් නැගිටලා ඇහුවොත් එහෙම, ඇයි? අපට එක අවස්ථාවක් ලබා දුන්නේ නැත්තේ කියලා. ඒකට මම උත්තර දෙන්න බැඳී සිටිනවා. අපි ඔක්කොම ජාතිවාදීන්. මේ එක්කෙනෙක් නොවෙයි ජාතිවාදී. අපි ඔක්කොම ජාතිවාදී ගරු සභාපතිතුමනි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අපි ජාතිවාදී නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔය හයිබ්‍රිඩ් ඒවාට අපි කොහොමත් විරුද්ධයි. නමුත් කවුරු හරි අපෙන් ඉල්ලීමක් කළාම මම මහ ඇමතිවරයා හැටියට ඒකට අවස්ථාව දෙන්න ඕනෑ. ඒක ප්‍රජාතන්ත්‍රවාදය. තමුන්ට අකමැති නම් නොගිහින් ඉන්න පුළුවන්. මමත් සහභාගී වෙන්නේ නැහැ මේකට. මටත් සහභාගී වෙන්න බැහැ. තමුන්නාන්සේලාට මම මේක පටන් ගන්න කොටම කිව්වේ, කැමැති නම් සහභාගී වෙන්න කියලයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, දැන් මේ අවස්ථාව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට අනවශ්‍ය සංවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ අවස්ථාවට අපි සහභාගී වෙන්න කැමැතියි. නමුත් අපට මේ වාගේ මේ කෙටි දැනුම් දීමකින් කොහොමද මේකට සහභාගී වෙන්නේ? අද හවස අපට තිබෙනවා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව. මේ වාගේ කෙටි දැනුම් දීමකින් කොහොමද සහභාගී වෙන්නේ? ඒක වැරදියි. අපි කැමැතියි මේ කට්ටිය මොකක්ද කියන්නේ කියලා ගිහිල්ලා දැන ගන්න. ඉතින් අපට ඒ අවස්ථාව අහිමි වෙනවා මේ වාගේ කෙටි දැනුම් දීමකින්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එහෙම නම් කථා කරලා කල් දා ගන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කරුණාකරලා අපි ඉල්ලන්නේ, වෙන දවසක් මේ ගැන කථා කරන්න ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ ඉල්ලීමටත් ඇහුම්කන් දීලා වෙන දිනයක් ඉල්ලනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරනවා, රීති අංක 35(7) කෙරෙහි. ඒ යටතේ අද මම කරන පෞද්ගලික ප්‍රකාශය සම්බන්ධයෙන් සෞඛ්‍ය ඇමතිවරයාට කිසියම් පැහැදිලි කිරීමට හැකියාවක් තිබෙනවා, අමාත්‍යාංශ විෂය පථයට අදාළ කාරණයක් නිසා. මම රීතිය කියවන්නම් ඔබතුමාගේ දැන ගැනීම සඳහා. "*යම් අමාත්‍යාංශයක විෂය පථයට අදාළව පෞද්ගලික ප්‍රකාශයක් ඉදිරිපත් වූ කරුණක් සම්බන්ධව පැහැදිලි කිරීමක් එකී පෞද්ගලික ප්‍රකාශය අවසානයේදී ඉදිරිපත් කිරීමට සභාපතිවරයාගේ අනුමැතිය පරිදි අමාත්‍යවරයෙකුට හැකියාව ඇත*" කියලා. ඒ අනුව ගරු සභාපතිතුමනි, මම සෞඛ්‍ය ඇමතිවරයාගෙන් මේ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම කියන්න කැමැතියි. මේ අවස්ථාවේ බස්නාහිර පළාත් සභාවේ ආයුර්වේද කොමසාරිස් ධූරය සම්බන්ධයෙන් දැන් එහි ඇබෑර්තුවක් ඇති වෙලා තිබෙනවා. එතකොට ගරු සභාපතිතුමනි, පැහැදිලිවම කොමසාරිස් ධූරය - බස්නාහිර පළාත් සභාවට අයිති බල ප්‍රදේශය තුළ විතරක් නොවෙයි, සමස්ථ රටේම පළාත් සභාවල ආයුර්වේද වෛද්‍යවරුන්ව පත් කිරීම, මාරු කිරීම, උසස් කිරීම් ආදිය සියල්ල අයිති වෙලා තිබෙන්නේ, මධ්‍යම රජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට. එතකොට රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් තමයි මේ සියලු කටයුතු කරන්නේ. ගරු සභාපතිතුමනි, එම අවස්ථාව තිබෙද්දී පෙරේදා රාත්‍රියේ ආණ්ඩුකාරවරයාගේ වෙබ් අඩවියේ තිබෙනවා. බස්නාහිර පළාතේ පළාත් සභාවේ පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා පුරප්පාඩු පිරවීමට අයදුම්පත් කැඳවීම කියලා.

ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පැහැදිලිවම පටහැනි තත්ත්වයක්. විශේෂයෙන්ම ඔබතුමාගේ ගරු අවධානයට යොමු කරනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරිය මගේ කටහඬ අහගෙන ඉන්නවා නම්, මේක අවධානයට ගන්නය කියලා මම කියනවා. විශේෂයෙන්ම ආයුර්වේද වෛද්‍යවරුන්ව පත් කිරීම හා මාරු කිරීම යන සියල්ල අයිති වන්නේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කියලා නීතිපතිවරයා විසින් එවන ලද අර්ථ නිරූපනයක් තිබෙනවා. ඒ අර්ථ නිරූපනය මා සතුව තිබෙනවා. අවශ්‍ය නම් සභාගත කරන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, එහෙම තිබෙද්දී තමයි මේ ආයුර්වේද කොමසාරිස් ධූරය, දැන් ආණ්ඩුකාරවරයා මේ ගැසට් කරලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, පැහැදිලිවම ඔබතුමාගේ අවධානයට ලක් කරනවා. ජී.එම්. මාලා පෙරේරා කියලා මහත්මියක් ඉන්නවා. ඇය අධි ශ්‍රේණියේ උසස්වීම් ලද ආයුර්වේද

වෛද්‍යාවරියක්. ඇය තමයි බස්නාහිර පළාතේ දැනට ඒ මට්ටමේ ඉන්න එකම තැනැත්තිය. ඇයට පත් වීම් ලිපියක් නිකුත් කරලා තිබෙනවා. මේ අධි ශ්‍රේණියට පත් වුණු මේ තැනැත්තියව, මේ පුරප්පාඩු වූ ආයුර්වේද කොමසාරිස් ධූරයට පත් කරන්න පුළුවන්. පැහැදිලිවම පත් කරන්න පුළුවන්. ඒ අනුව ගරු සභාපතිතුමනි, මධ්‍යම රජයේ ආයුර්වේද කොමසාරිස්, ඒ.එච්. තිලකරත්න මහත්තයා 2016.12.24 දින ලිපියක් නිකුත් කරලා තිබෙනවා, ප්‍රධාන ලේකම් මගින්, පළාත් ආයුර්වේද කොමසාරිස්, බස්නාහිර පළාත් සභාවට. එලෙස ලිපියක් නිකුත් කරලා ඇයව පත් කරලා තිබෙනවා. ඇයව පත් කරලා තිබෙද්දී තමයි මේ ආණ්ඩුකාරවරයා නැවත වතාවක් ආයුර්වේද කොමසාරිස් ධූරය සඳහා අයදුම්පත් කැඳවන්නේ. මේක පෙරෙයිදා ආණ්ඩුකාර වෙබ් අඩවියේ තිබුණේ. මේක අත්සන් කරලා තිබෙන්නේ, ආණ්ඩුකාරවරයාගේ ලේකම්වරයා. මම හිතන්නේ, මේ වාගේ විහිළු සහගත ක්‍රියා කරන්න එපාය කියලා අපි බස්නාහිර පළාත් සභාවේ අදාළ බලධාරීන්ට කියනවා. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යවරයාගේ අවධානයට ලක් කරලා, ඔබතුමා ආණ්ඩුකාරවරයාව දැනුවත් කරලා, නිකම් විහිළු සහගත ක්‍රියා කරන්නේ නැතිව, මේ දැනට තේරී පත් වෙලා ඉන්න - මේ ඔබතුමන්ලාගේ මධ්‍යම රජයේ ආයුර්වේද කොමසාරිස් විසින් පත් වීම් කරන ලද පත්වීම් ලිපිය. එහෙම තිබෙද්දී තමයි, මේ ආණ්ඩුකාරවරයා නැවත වතාවක් ආයුර්වේද කොමසාරිස් ධූරයට අයදුම්පත් කැඳවන්නේ. ඒ නිසා මගේ කටහඬ අහගෙන ඉන්න ලේකම්තුමියගේ විශේෂ අවධානයට ලක් කරලා, මේ තත්ත්වය වහාම වළක්වන්නය කියන ඉල්ලීම මම මේ වෙලාවේ කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මුලින්ම කියපු රීති අංකය මොකක්ද? මට ඒක පැහැදිලි නැහැ. කොයි පොතේද තිබෙන්නේ ඒක.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

පෞද්ගලික ප්‍රකාශ යටතේ 35(7) රීතියට. ගරු සභාපතිතුමනි, 35(7) හි කියනවා මෙහෙම. "*යම් අමාත්‍යාංශයක විෂය පථයට අදාළව පෞද්ගලික ප්‍රකාශයක් කිරීමේදී ඉදිරිපත් වූ කරුණක් සම්බන්ධව පැහැදිලි කිරීමක් එකී පෞද්ගලික ප්‍රකාශය අවසානයේදී ඉදිරිපත් කිරීමට -*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමාට වැරදි අවබෝධයක් ලැබිලා තිබෙන්නේ. 35(7) කියලා එකක් අපේ රීතිවල නැහැ. 35 විතරයි තිබෙන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ තිබෙන්නේ. කාර්ය පටිපාටි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අලුත් පොත. තවම ඒක ආවේ නැහැ. තව ඉස්සරහාට එන්නේ. අපි ඕක තවම හදාගෙන යනවා. ඔබතුමාට ඒක කවුද දුන්නේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ තිබෙන්නේ. මට දීපු පොතේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් මුල් පිටුව කියවන්න කෝ. මුල් පිටුවේ යටින් කොටසක් තිබෙනවා. ඒක කියවන්න කෝ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේකේ 2005 – 2006 කියලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, තවම ඕක සංශෝධනය කරමින් පවතිනවා. තවම සභාවට දැම්මෙත් නැහැ. තවම සභාවේ සාකච්ඡා වුණේ නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේක තිබෙන්නේ 2005 ඉඳන්. එහෙම නම් හරි පොතක් අපට දෙන්න එපැයි. ගරු සභාපතිතුමනි, මේක ඇත්තෙන්ම, මම පාවිච්චි කරන පොත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමාට පොතක් දෙන්නම්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේකේ තිබෙන්නේ - මේකේ කොහේවත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි තවම රීති පොත හදාගෙන යනවා. දැන් ඉවරයි. අපි ඉක්මනටම ඒ පොත දෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේකේ සඳහන් වෙලා නැහැ. දැන් කහපාට පොතක් පෙන්වලා හරියන්නේ නැහැ. මගේ ළඟ තිබෙන එක මම කියන්නේ. මම අභියෝග කරනවා. මම ළඟ තිබෙන පොතේ පුළුවන් නම් පෙන්වන්න ඒ වචනය. කොහේද තිබෙන්නේ කියලා. දැන් පෙන්වන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔය ජී.එල්. ගේ පරණ පොතක්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේක පරණ පොතක් වෙන්නේ කොහොමද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේක 1999.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේක 1999. දැන් තමුන්නාන්සේට මේක මම දෙන්නෙත් නැහැ. මේක නේ මට - (බාධා කිරීම්)

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔය කුඨ ලේඛන.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔය පක්ෂයේ හැටි. හැමදාම වැරදි පොතක් කියවන්නේ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳව පොඩි උත්තරයක් තිබෙනවා. දැන් ගරු මන්ත්‍රීතුමා, ආයුර්වේද කොමසාරිස්වරිය පැන්ෂන් ගිහිල්ලා කියලා කිව්වා නේ? තවම ඉන්නවා. ඉතින් කොහොමද පත් කරලා ලියුම් එවන්නේ. තවම එතුමිය සේවයේ ඉන්නවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඉතින් තමුන්නාන්සේට මම මේ -

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒක තමයි සොයන්න ඕනෑ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

තමුන්නාන්සේ දන්නෙත් නැහැ. තමුන්නාන්සේට හොරෙන් පත් කරලා. මේ තියෙන්නේ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒක තමයි සොයන්න ඕනෑ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

සොයලා කියන්න. ඔබතුමා දන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා දන්නේ නැහැ, අපි කියන කල්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

එහෙම පත්වීමක් කරලාත් නැහැ. ඇබෑර්තුවක් ඇති වෙලත් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

නැහැ. ගැසට් කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, පෞද්ගලික පැහැදිලි කිරීම්වලට කාලය දෙන්න බැහැ. උත්තර දෙන්නත් බැහැ. ඒවාට ඔබතුමා උත්තර දෙන්න ලැහැස්ති වෙන්න එපා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒක අපි නීත්‍යානුකූලව කටයුතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා. මොකද, අපි 2005 – 2006 රීති හදලා, අපේ රීති පොත අතිගරු ජනාධිපතිතුමාට යොමු කළා. මේකේ එතුමාගේ අදහස ගන්න. නමුත් ඒක අපට වෙලාවට ලැබුණේ නැහැ. ඊට පසු අපි නැවත වතාවක් ඒ රීති පොතම නැවත සංශෝධනය කරනවා. 2016 අපි පටන් ගත්තේ. තවම ඉවර නැහැ. ඒ නිසා -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, සභා ලේකම් කාර්යාලයෙන් එහෙම නම් ඕක දෙන්න එපෑ. මම සභා ලේකම් කාර්යාලයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි මේක සභාවේ බෙදුවා. ජනාධිපතිතුමාට අපි රීති පොත පිළිගන්වන අවස්ථාවේදී මන්ත්‍රීතුමන්ලාටත් අපි පිටපතක් දුන්නා. ඒක තමයි ඔබතුමා ළඟ තිබෙන්නේ. මේක නොවෙයි නියම රීති පොත. අපි ඉක්මනටම ඔබතුමාට ලැබෙන්නට සලස්වනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

තව පොතක් ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව පොතක් තිබෙනවා. ඔබතුමාට ඕනෑ නම් ගන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ පොත නොව. තව පොතක් ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ එක්තරා පාසලක 2017.01.07 දින සිට විදුහල්පතිවරයා අහිමි වෙනවා. ඔහු විශ්‍රාම යනවා. එතකොට මාස දෙකකට පෙර කලාපවලට දැනුම් දෙනවා, විදුහල්පතිවරුන් සඳහා අයදුම් කරන්න කියලා. එතකොට අයදුම්පත් හතරක්, පහක් එනවා. දැන් මේකට අයදුම් කරන එක විදුහල්පතිවරයෙක් 2009 ත් 2013 ත් අතර මේ විදුහලේ හිටපුම විදුහල්පතිවරයා. එතකොට හිටපු මහ ඇමතිතුමා එතුමාව අරගෙන යනවා කොළඹ පාසලකට. දැන් කොළඹ පාසලේ සිට එතුමා නැවත බලනවා, මේ පාසලට එන්න. එහෙම බලන කොට එතුමාට තිබෙනවා, මාර විධියේ ලොකු වාර්තාවක්. මොකද, එතුමාට සුදුසුකම්, එක එක සම්මාන තිබෙනවා. විදුහල්පති ප්‍රණාම. ගුරු සේවා සම්මාන. ප්‍රශංසා. ප්‍රශංසාව මොකක්ද? 2013 වර්ෂයේ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව උසස් පෙළට සුදුසුකම්ලත් ප්‍රතිශතය 83% රඳවා ගැනීම. ඊළඟට 2012 දී උසස් පෙළ ප්‍රතිඵල 86% දක්වා ඉහළ නැංවීම. මේ වාගේ සම්මාන විවිධ දරපු මේ විදුහල්පතිවරයා මේ සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙනවා.

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

ගරු සභාපතිතුමනි, මේ සම්මුඛ පරීක්ෂණය තියන්නේ, 2017.01.17 වැනිදා. සම්මුඛ පරීක්ෂණය තිබ්බාට පස්සේ, අපට ආරංචි විධියට මේ මම කියන එකී ගුරුවරයා, අපේ කථා නායකයා පළමුවැනි තැනට තේරෙනවා. හැබැයි, තේරුණාට පස්සේ හදිස්සියේ එතුමා ඉන්න කලාපය නොවෙයි. එතුමා යන්න ඉන්න කලාපයේ කලාප අධ්‍යක්ෂතුමිය රහස්‍ය වාර්තාවක් ඉල්ලනවා. ගරු සභාපතිතුමනි, සාමාන්‍ය ක්‍රමවේදය නම්, චක්‍රලේඛ ප්‍රකාරව නම් කොහොමද වෙන්න ඕනෑ. විදුහල්පතිවරුන්ව සම්මුඛ පරීක්ෂණය කරන කොට ඒගොල්ලන්ගේ හොඳ නරක, වැරදි අඩුපාඩු, ඒගොල්ලන්ගේ දක්ෂතා සියල්ල කලින් ඇගයීමට ලක් කරලයි සම්මුඛ පරීක්ෂණයට ගේන්න ඕනෑ. රහස්‍ය වාර්තාවක් කැඳවනවා නම්, එතුමාට විරුද්ධව චෝදනා තිබෙනවා නම්, ඒ චෝදනා කලින් දැන ගෙන ඉන්න ඕනෑ. එහෙම නම් එයාව සම්මුඛ පරීක්ෂණයට කැඳවන්නේ නැතිව ඉන්න ඕනෑ. මෙන්න මේ දෝෂ නිසා, මේ හේතු නිසා මෙතුමාව අපි සම්මුඛ පරීක්ෂණයට කැඳවන්නේ නැහැ. එතකොට ඒගොල්ලන්ට සාධාරණීකරණය කරන්න කාරණා තිබෙනවා. රහස්‍ය වාර්තා කැඳවලා, සීඅයිඩී වාර්තා කැඳවලා මොනවා හරි වාර්තා කැඳවලා මේක කරන්න ඕනෑ. හැබැයි, එහෙම කරනවා වෙනුවට - මම දන්නේ නැහැ. අධ්‍යාපන ඇමතිතුමාද දන්නේ නැහැ මේක කළේ. මම දන්නේ නැහැ, එතුමා මේක දන්නවාද කියලාවත්. හැබැයි, මම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාට කථා කළා. ලේකම්තුමාට කථා කළාම - මගේ ළඟ තිබෙනවා ඒකෙත් ඕනෑ නම් හඬ පටය දෙන්න පුළුවන්. හඬ පටය තිබෙනවා. ලේකම්තුමා මේක සාධාරණීකරණය කරන්න හදනවා.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු සභාපතිතුමනි, අති භයානකයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම දේශපාලඥයෙක් විධියට මගේ ප්‍රශ්න නොවෙයි තිබෙන්නේ. නිලධාරීන් එක්ක වැඩ කරන්න ගියාම හරි අමාරුයි. ඒ නිසා මම ලේකම්තුමාට කිව්වා, ලේකම්තුමා ක්‍රමවේදය කල්පනා කරන්න. මෙතුමාගේ ලේකම්තුමාට කථා කළේ. රහස්‍ය වාර්තා කැඳවන්නේ වෙන කෙනෙක්. ඇයි ඒ? පළමුවැනියට පත් වුණු විදුහල්පතිවරයා ගැන අපට වෙනම ප්‍රශ්නයක් තිබෙනවා. ඒ පළමුවැනියට පත් වුණු විදුහල්පතිවරයා ඉන්දැද්දී ඊළඟට පත් වන විදුහල්පතිවරයා. ඊළඟට ඉන්නේ කවුද? ඊළඟට ඉන්නේ අපට ආරංචි විධියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සේවක සංගමයක සභාපතිවරයෙක්. මහරගම පැත්තේ. එතුමාව ගන්න බලනවා. අර සුදුසුකම් ලැබූ පුද්ගලයා - ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. එතුමාව ගෙන්වන එක නොවෙයි. මේ රහස්‍ය වාර්තාව කැඳවන්න තිබුණේ, සම්මුඛ පරීක්ෂණයට කලින්. අඩුපාඩු, සුදුසුකම් තිබෙනවා නම්, ඒවා පරීක්ෂා කරලා තමයි අවසාන සම්මුඛ පරීක්ෂණ කැඳවන්නේ. මේකෙන් කරන්නේ මොකක්ද? කීර්තිමත් විද්‍යාලයක ඉන්න විදුහල්පතිවරයෙක්. එතුමාගේ අඩුපාඩු තිබෙන්න පුළුවන්. හැබැයි, එතුමාගේ ගෞරවය සහ අභිමානය නැති කරන්න එපා. විදුහල්පතිවරුන්ගේ.

ගරු සභාපතිතුමනි, විදුහල්පතිවරු පත් කරන කොට ඔබතුමා හරහා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලලා තිබෙනවා, නියම ක්‍රමවේදය අනුගමනය කළේ නැත්නම් - අපට මතකයි. මාළඹේ රාහුල විද්‍යාලයේ බරණගේ විදුහල්පතිතුමිය පත් කරන වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. එතැනත් ප්‍රශ්න තිබුණා. ඒ ගරු සභාපතිතුමනි, ඔබතුමා හරහා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ක්‍රමවේදයට වැඩ කරන්න. නැත්නම් අපට පෞද්ගලිකව ප්‍රශ්න තිබෙනවා ඒ විදුහල්පතිතුමා ගැන. මේ විධියේ දේශපාලන වැඩ කරන්න ගියොත් ඊට විරුද්ධව අපි කටයුතු කරනවාය කියන එක කියනවා. බොහොම ස්තුතියි.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ප්‍රදේශයේ පාසල්වල විදුහල්පතිවරු ගැන කථා කළේ. ඒ නිසා මටත් වරප්‍රසාද - මොකද, අපේ ළමයිනුත් යනවා ඔය ඉස්කෝලවලට. මගේ ළමයි යන නිසා මගේ වරප්‍රසාදයක් කඩ වෙනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අනවශ්‍ය - 36(1) වෙනුවෙන් කාලය ගන්න එපා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඒ නිසා ගරු සභාපතිතුමනි, මගේ වරප්‍රසාද කඩ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔය විධියට කාලය දෙන්න බැහැ. ඔබතුමා 36(1) කියලා ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියන්න.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

ඇයි? මගේ ළමයි යනකොට මගේ වරප්‍රසාද කඩ වෙන්නේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ළමයි මොන ඉස්කෝලෙටද යන්නේ?

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මහරගම ධර්මාශෝක කනිෂ්ට විද්‍යාලයේ විදුහල්පති නැහැ. ධර්මපාලේ නැහැ. කරුණාකරලා මේ සම්මුඛ පරීක්ෂණයට තියපු කට්ටිය දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, 36(1) කිය කියා, අනවශ්‍ය ප්‍රශ්න කථා කරන්න එපා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

36(1) වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ ළමයි යන ඉස්කෝලේ විදුහල්පති නැති එක මට ප්‍රශ්නයක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද බලපාන්නේ මන්ත්‍රීවරයාගේ විතරයි. දරුවන්ට බලපාන්නේ නැහැ.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

විදුහල්පති පත් කරන්න සම්මුඛ පරීක්ෂණයට හිටපු අය. පිටින් දාන්නේ නැතිව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාමත්ම ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, මේ 36(1) කියලා අනවශ්‍ය දේවල් කථා කරන්න එපා. 36(1) පැහැදිලිව තිබෙන්නේ, මන්ත්‍රීවරයාට. දරුවන්ට නොවෙයි තිබෙන්නේ ඒක. දරුවන්ට කොහේද 36(1) තිබෙන්නේ?

මීළඟට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දීම ගැන. අපේ යහපාලන ආණ්ඩුව ජනවාරි 08 වැනිදා මේ දින 100 වැඩ සටහන යටතේ ප්‍රකාශයක් කරලා, මේ රටේ තිබුණු ආණ්ඩුව පරාජය කරලා රාජ්‍ය සේවය නිලධාරීන්ට සලකන හැටි ගැන මේ දින 100 වැඩ සටහනේ තිබෙනවා. දැන් මේ දින 100 වැඩ සටහන යටතේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම්තුමියට වන් ෂොට් කියලා හාදයෙක් ඉන්නවා. මේ පත්තරවල තිබෙනවා. මේ වන් ෂොට් කියන මනුස්සයා පිස්තෝලයක් අරන් චිත්‍රපටයක රඟපෑවාට මේ දේශපාලන ක්ෂේත්‍රය ගැන ගැන දැනුමක් තිබිලා නැහැ. මෙයා නළුවෙක් වුණාට. එතැන පස් කැපීමේ සිද්ධියක් සම්බන්ධව මෙයා පරීක්ෂණයකට ගිහිල්ලා, ඒ ප්‍රාදේශීය ලේකම්තුමියට දුරකථනයෙන් කථා කරලා, ඒ දුරකථනයෙන් කථා කරපු විලාශය. හොරා. උඹ පලයන්. එතකොට මොනවාද - උඹට හෙණ ගහනවා. ඒ රාජ්‍ය නිලධාරීන් - (බාධා කිරීම්)

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බොරු කියන්නේ නැතිව ඉන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කිසි දෙයක් පැහැදිලි නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පාර්ලිමේන්තුවේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කඹවලින් බැන්දේ නැද්ද? ගස් බැන්දේ කවුද?

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මතකද ගස් බැන්ද කාලේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මේකාට පිස්සු. මොළේ හොඳ නැහැ. කොහොමද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකුගේ චර්යාව පිළිබඳව කථා කරන්නේ? එහෙම කථා කරන්න බැහැ. එහෙම නම් අර හොරා මහින්ද ගැන කොපමණ තිබෙනවාද කථා කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගස් බැඳලා දිවුරුම් ප්‍රකාශයකුත් ගත්තා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු මන්ත්‍රීතුමා කථා කරන්නේ නිලධාරියෙකුට. ඉස්සෙල්ලා නිලධාරීන්ට කථා කරන්න ඉගෙන ගන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පළාත් සභාවේ අපට එතකොට ඒ ප්‍රාදේශීය ලේකම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම සඳහන් කරන්න එපා ඔබතුමා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපේ තිබෙන පනතේ විෂය මාලාවේ ඒ සම්බන්ධයෙන් අපට අයිතියක් තිබෙනවා. 13 වන සංශෝධනය යටතේ අපට තිබෙන අයිතියක් ඒ ගැන කථා කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

කිඹුල් කඳුළු හලන්න එපා. ඔයා අම්මාට කියලා බණින්නේ. ඔයා නිකම් ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

විශ්ව විද්‍යාලයෙන් පරිපාලන සේවයට ගිහිල්ලා, පරිපාලන සේවයෙන් උගත්කම අරගෙන ඉන්න අපේ රාජ්‍ය නිලධාරීන් වාගේ ඒ උගත්කම ගත්ත නිලධාරියෙකුට කථා කරන්න, ඒ විධියට හැසිරෙන්න පුළුවන්ද? බැහැ. දැන් ඒ විතරක්ද? දැන් බලන්න. අපේ විගණකාධිපතිතුමාව ගන්න. විගණකාධිපතිතුමාව ගත්තාම අපේ රවි කරුණානායක මුදල් ඇමති විගණකාධිපති - සෙන්ට්‍රල් බැංකුවේ තිබුණු අර්ජුන් මහේන්ද්‍රන්ගේ තිබුණු මේ ප්‍රශ්නය සම්බන්ධව ගත්තාම විගණකාධිපතිට බණිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අපහාස කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට පළාත් පාලන ඇමති. පළාත් පාලන ඇමති ගත්තාම මැතිවරණ කොට්ඨාශ කාරක සභාවේ. ඒ කාරක සභාවේ ඉන්න සභාපතිතුමාට බණිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ රාජ්‍ය නිලධාරීන්ට, මේ ඇමතිවරු, මේ යහපාලනයේ ගැති හැත්ත, යහපාලනයේ බූරුවෝ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

යහපාලනේ ඉන්න මේ වාගේ මහා සක්කිලියෝ ටික, යහපාලනයේ සක්කිලි රට කෑවා විතරක් නොවෙයි, රට විනාශ කළා විතරක් නොවෙයි. රාජ්‍ය නිලධාරීන්ට කථා කරන්න දන්නේ නැති පිරිසක් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, අපේ බස්නාහිර පළාත් සභාවේ අපේ ආණ්ඩු පක්ෂය හැටියට මේ කරපු ප්‍රකාශය සම්පූර්ණයෙන්ම අපේ විරෝධය පානවාය කියලා මේ අවස්ථාවේදී අපි ප්‍රකාශ කරනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, ඉස්සෙල්ලාම දැන ගන්න කැමැතියි මේ කා ගැනද කථා කළේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දන්නේ නැහැ. මට තේරුණෙත් නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කා ගැන ද කථා කළේ? ඒක අපට කියන්න. පුද්ගලයෙකුගේ නමක් තිබෙන්න ඕනෑ. කා ගැනද කථා කළේ? කරුණාකරලා කියන්න කා ගැනද කථා කළේ කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට තේරුණෙත් නැහැ. මම දන්නෙත් නැහැ. මීළඟට ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, මේ සභාවේ අමාත්‍යාංශ සියල්ලම මේ ප්‍රදේශයේ ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන අමාත්‍යාංශයන්. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේ සභාවේ ඉන්න ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුත්, ඒ වාගේම ගරු විපක්ෂ නායකතුමා ප්‍රමුඛ විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුත් තමන්ගේ සමාජ මෙහෙවර ඉෂ්ට කිරීමේදී, ඒ කටයුතුවලදී සහයෝගය ලබා දීම, සාමාන්‍යයෙන් අමාත්‍ය මණ්ඩලයේ කාර්යභාරයයි. මේ පිළිබඳව අලුතෙන් ඔබතුමාට පැහැදිලි කරන්න අවශ්‍යතාවයක් නැහැ, ඔබතුමා ඉතාම අත්දැකීම් බහුල පළාත් සභා නියෝජිතයෙක් වශයෙන්. ගරු සභාපතිතුමනි, මම අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති සම්පාදකයෙක් නොවෙයි. අධ්‍යාපන අමාත්‍යාංශය සහ රේඛීය අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවලදී පළාත් සභා මන්ත්‍රීවරයෙකු හැටියට අපේ කාර්යභාරය වුණේ පළාත් සභාව සහ මධ්‍යම රජය මැදිහත් වෙලා ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවලට අපේ අනුග්‍රහය, සහයෝගය දැක්වීම. ඒ අනුව තමයි පසුගිය රජය චකවානුවේ ද්විතියික පාසල් දහසක් රට තුළ නිර්මාණය වෙන්නේ. ඒ ද්විතියික පාසල් සංකල්පය ඉදිරිපත් වුණු වෙලාවේ, අපේ ප්‍රදේශවල නම් කර තිබුණු පාසල්වලට අපි ඉදිරිපත් වෙලා, සහයෝගය දීලා ඒ කටයුත්ත ක්‍රියාත්මක කළා. අපි පැහැදිලිවම දන්නවා. මම විතරක් නොවෙයි. අපේ නිමල් චන්ද්‍රරත්න

[ගරු ජගත් අංගගේ]

ගරු මන්ත්‍රීතුමාත් බණ්ඩාරගම ආසනයේ පාසල් විශාල ප්‍රමාණයක් හදන්න මැදිහත් වුණා. අපිත් මැදිහත් වුණා. ගරු සභාපතිතුමනි, මට පමණක් නොවෙයි. මේ ආණ්ඩු පක්ෂය ද විපක්ෂය ද කියලා මන්ත්‍රීවරුන්ගේ තිබෙන වරප්‍රසාද සහ ගරුත්වය එක හා සමානයි. තමන්ගේ රාජකාරී අවස්ථාවේදී. පසුගිය වකවානුවේ මේ රජය වෙනස් වුණාට පස්සේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආණ්ඩුව වෙනස් වුණාට පස්සේ, පාර්ලිමේන්තු මැතිවරණයෙන් පරාජයට පත් වුණාට පස්සේ හිටපු ගමන්ම තල්පිටිය කනිෂ්ඨ විද්‍යාලයේ මහා විශාල උද්ඝෝෂණයක් පැවැත්වුණා. පැවතුනේ, මේ වාද්දුව ධර්මපාල විද්‍යාලය ද්විතියික පාසලට මිශ්‍ර පාසලක් හැටියට පැවතියේ තල්පිටිය කනිෂ්ඨ විද්‍යාලය. මේ වෙලාවේ මම ස්තුතිවන්ත වෙනවා, විජිත් ප්‍රියන්ත එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීතුමා මේ පිකටිං එක කරපු තැනට ගිහිල්ලා දෙමව්පියන්ට කියලා තිබුණා, මේක ජගත් අංගගේගෙවත්, මගේවත් වැඩක් නොවෙයි. මේක අධ්‍යාපන ප්‍රතිපත්තියක්. මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම තුළ මෙතැන පිකටිං කරලා වැඩක් නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයේ බලධාරීන්ට කියලා පැහැදිලි කරන්නය කියලා. ඒ අනුව ඒ විරෝධතාකරුවන් ඒ ස්ථානයෙන් විසිර ගියා.

ගරු සභාපතිතුමනි, දිගින් දිගටම මේ පාසලේ විදුහල්පතිවරිය ද්විතීයික පාසලට පහ වසරෙන් පස්සේ යවන්න තිබෙන ශිෂ්‍යයන් යැවීමේ කටයුතුවලට බාධා කළා. මේ වර්ෂයේ අද වනතුරුත් මේ පාසලට ශිෂ්‍යයින් යොමු කරන්න මේ විදුහල්පතිවරිය කටයුතු කරන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, ඊයේ පෙරේදා තවත් උද්ඝෝෂණයක් සංවිධානය වුණා. මේ උද්ඝෝෂණය සංවිධානය වෙන්න ඉස්සෙල්ලා බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***

*[Expunged on the order of the chair]*

ගරු මන්ත්‍රීතුමා සහ නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමා පෙරටුව කණ්ඩායමක් එක්කරගෙන එනවා. එක්කරගෙන ඇවිල්ලා එතැනදී කරුණු පැහැදිලි කරනවා. මේ ස්ථානයේ නොසිටියත් මම ගරු ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා කියලා තිබෙනවා මම නොවෙයි මේ ප්‍රතිපත්ති සම්පාදනය කරලා ක්‍රියාත්මක කරන්නේ. මේක ක්‍රියාත්මක කරපු පාසල් දැන් මෙපමණ දුර ගිහිල්ලා තිබෙනවා. මට මේවා එක පාරට වෙනස් කරන්න බැහැයි කියලා. මේ බැහැයි කියන කොට අධ්‍යාපන අමාත්‍යාංශයේ විතරක් නොවෙයි. හැම තැනම ඉන්නවා ගරු සභාපතිතුමනි, අපේ ඉඳන් කණ කන අය. කොහොම හරි අහ කරන එවුන් ඉන්නවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන ඇමැතිතුමා මේ නියෝගය දුන්නාට පස්සේ එළියට එනකොට, මේ විරෝධතාවයට ඉදිරිපත් වෙලා තිබෙන්නේ මට ඥාතීත්වයක් තිබෙන මිනිස්සු. එක ළමයෙක් කියනවා, "අපි එන්න කියලා ආවා සර්. අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යාලයේ හිටපු සුදු, මහත, උඩු රැවුල තියෙන මහත්තයෙක් කථා කරලා කිව්වා ආපහු පොඩි උද්ඝෝෂණයක් කරන්න. අපි දාලා බලමු. ආපහු මේක ද්විතීයික පාසල් කාණ්ඩයෙන් ඉවත් කර ගන්න පුළුවන්ද" කියලා. උද්ඝෝෂණයක් කරලා ඒකේ තොරතුරුත් අරගෙන එන්න කිව්වාලු.

දැන් ගමට ඇවිල්ලා ආපහු උද්ඝෝෂණ සංවිධානය වෙනවා. උද්ඝෝෂණ සංවිධානය කරලා, ඒකේ නායකත්වය අරගෙන මගේ ළඟ ඒකේ වීඩියෝ ඔක්කෝම තිබෙනවා ගරු සභාපතිතුමනි. ජගත් අංගගේ කියලා ගමේ ඉන්නවා පළාත් සභා මන්ත්‍රීවරු. ඒ මන්ත්‍රීවරු තමයි තමුන්නාන්සේලාට විරුද්ධව මේ කටයුත්ත කරන්නේ. ගරු සභාපතිතුමනි, සමහර පක්ෂවල අද ඡන්ද පදනමක් නැති වුණාම මේ අය අසූචි ගොඩේ තිබෙන තඹ සල්ලියත් දිවෙන් ගන්න හදනවා. ඒක තමයි මේකේ තේරුම. දැන් නලින්ද ජයතිස්ස වෛද්‍යතුමා මම බොහොම ගරු කරලා සලකපු චරිතයක්. නමුත් එතුමාගේ ප්‍රකාශනය දැක්කාම මට හිතුනා මේ අය දේශපාලනය කරන්නේ - දැන් මෙතැන අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා ළමයින් දාන හැටි කථා කළා. ළමයි දාන්නේ කොහොමද? පොරොත්තු ලේඛනයට ඇතුළත් වෙන්නේ කොහොමද? ක්‍රියාන්විතය කොහොමද යන්නේ? දැන් මෙහෙම අහලා මගේ ගමේ මගේ දරුවෝ ටික දාන්න මම ලක්ෂ කෝටි ගණන් වියදම් කරලා, ද්විතීයික පාසල් ගොඩ නඟන කොට ඒ පාසල කඩලා බිඳලා දාන්න පිකටිං සංවිධානය කරලා මහ ලොකුවට කෑගහනවා. මෙතැන එකක්. ගමට ගියාම තව එකක්. මිනිස්සු දහ දෙනෙක් දැක්කාට පස්සේ ඒ දහ දෙනා කියන්නේ හරි වුණත් කමක් නැහැ. වැරදි වුණත් කමක් නැහැ. මනාප 10 ක් නේ? මනාප 10 ට කහිනවා. මේක

තමයි ගරු සභාපතිතුමනි, මේ රටේ කිසිම දෙයක් ක්‍රියාත්මක කරන්න බැරි වෙලා තිබෙන්නේ.

දැන් අද වෙලා තියෙන්නේ මොකක්ද? අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන ඇමැතිතුමාගේ කණ කන මොකෙක් හරි එකෙක් ඉන්නවා. පැහැදිලිව කියන්නේ. එයා තමයි ආපහු මේ උද්ඝෝෂණය කරන්න මානසිකත්වය හදලා අමාත්‍යාංශයෙන් එළියට යැව්වේ. මමත් හොයනවා. මම කොයි වෙලාවක හරි අරි ගෑණු දරුවාව ඔය අමාත්‍යාංශයට එක්කරගෙන ඇවිල්ලා හොයා ගන්නවා, කවුද අහ කන එකා කියලා. ඒ මදිවාට ගරු සභාපතිතුමනි, අද වනකොට - කාවන්තිස්ස රජතුමාට ගැමුණු කුමාරයා කාන්තාවක් බරට ආභරණ රෙද්දක් ඇරියා කියනවා නේ? ඒ කියන්නේ මේ රට බේරා ගන්න ඉදිරිපත් නොවෙන එකට තිබෙන වේදනාව.

ගරු සභාපතිතුමනි, දැන් මේ විදුහල්පතිතුමිය මට එවනවා Transfer Application එකක්. ඒ Application එකේ කලාප අධ්‍යක්ෂගේ නිර්දේශ කාගේවත් නිර්දේශ නැහැ. එයා පුරවලා මට තැපෑලෙන් එවනවා මම යන්න ලැහැස්තියි කියලා. ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ මන්ත්‍රීවරු වන අපව අද එතැනට තමයි වැටිලා තිබෙන්නේ. අපි අද නපුංසකයෝ ගණනට වැටිලා තිබෙන්නේ. ඇයි අපි මොන වැරැද්දක් කළාටද මෙහෙම වෙන්නේ? ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ වෙන්න පුළුවන් තමුන්නාන්සේලා අපි කවුරුත්. පුරා වසර 2 ½ ක්. මගේ ගමේ මගේ ගෙදරට මීටර් 15 ක් 20 ක් ඈතින් තිබෙන පාසලට මට යන්න විධියක් නැහැ. මේ වේදනාව කියන්නේ. මේ පිළිබඳව මේ සභාවේ ඕනෑතරම් කථා කළා. ඒ තරම් නිහීන විධියට මට ලියුමක් එවන්න තරමට නිර්භීත වෙලා තිබෙනවා. මොකක්ද කරපු වැරැද්ද? එකම වැරැද්ද රටේ ක්‍රියාත්මක වන අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහයෝගය දීම. මම වෙන මොන අපරාධයක් කරලාද? හොරකමක්, දූෂණයක්, වංචාවක් මේ පළාත් සභාවේ ගරුත්ව කෙලෙසෙන විධියට මම යමක් කරලා තිබෙනවාද? කරලා තිබෙනවා නම් තමුන්නාන්සේලා මට චෝදනා කළාට වැරැද්දක් නැහැ.

ගරු සභාපතිතුමනි, මම හරි හිත් වේදනාවෙන් කථා කරන්නේ. මට මේ විශේෂ වරප්‍රසාද කිසි දෙයක් වැඩක් නැහැ. මන්ත්‍රීවරයෙක් හැටියට මට හිමි හිමිකම් ආරක්ෂා කරලා දෙන්න. මන්ත්‍රීවරයෙක් හැටියට මට ගමට ගිහිල්ලා වැඩ කරන්න තිබෙන මගේ අයිතිවාසිකම් ආරක්ෂා කරලා දෙන්න. අද මට ඒවා සම්පූර්ණයෙන් අහිමි වෙලා තිබෙන්නේ. මේ වර්ෂයේ ධර්මපාලන විද්‍යාලයේ 6 වන වසරට යොමු කරන්න තිබෙන දරුවෝ ටික තවම යොමු කළේ නැහැ. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ කිසිම බලධාරියෙක් ඇයට විරුද්ධව ක්‍රියාත්මක වෙන්නෙත් නැහැ. මොකක්ද තිබෙන හයිය. විදුහල්පති මෙනෙවියක් ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ අණට කීකරු වෙනවා. දිගින් දිගට, දිගින් දිගට මේ කන්නලව්ව කරනවා. ගරු සභාපතිතුමනි, අපේ ජීවිතවලදී අපි කවදාවත් වැරදි වැඩ කරලා හිර ගෙවල්වල ගිහිල්ලා නැහැ. අපිව ඒවාට තල්ලු කරන්න හදන්නේ අපේ මිනිස්සු. මම මේක හැන්සාඩ් වන බව දන්නවා. දැන දැන කථා කරන්නේ. ඒ නිසා කරුණාකරලා මේ අවාසනාවන්ත තත්ත්වයෙන් නිදහස් කරලා දෙන්න කියලා තමුන්නාන්සේගෙන් ඉතා ගෞරවයෙන් මා ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මෙතුමාගේ සංවේදී කථාව හැන්සාඩ් එකේ තිබුණාට කමක් නැහැ. හැබැයි නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. එතුමාගේ නම සඳහන් කළා. ඒක ඉවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක ඉවත් කරලා දාමු.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, නලින්ද ජයතිස්ස මහත්තයා ගැන කියපු කතන්දරේ අයින් කරලා දාන්න. හැබැයි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් අපට ඇවිල්ලා ඕනෑම කුපාඩිකමක් කළාම කට වහගෙන ඉන්නත් ලැහැස්ති නැහැ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ඒක හරි. ඔබතුමාගේ අයිතිය තිබෙනවා. මම කිව්වේ රීතිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම්වල විවාදවලට යන්න මට කාලය දෙන්න බැහැ. හැබැයි එතුමා බොහොම සංවේදී කථාවක් කළේ. එතුමා මේ පළාත් සභාවේ හිටපු ඇමැතිවරයෙක්. හිටපු සභාපතිවරයෙක්. ගරු ඇමැතිතුමා ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරලා එතුමාට සාධාරණයක් කරලා දෙන්න. එතුමා මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය සභාපතිවරයෙක්, සභාපතිවරයෙක්, ඇමැතිවරයෙක්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ ඉල්ලීම අපි උපරිම විධියට ඉෂ්ට කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉක්මණට කරලා දෙන්න ගරු ඇමැතිතුමා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ මම වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා මගේ නම කියපු නිසා. අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ විදුහල්පතිතුමිය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. මේ ව්‍යාපෘතිය පිළිබඳව හරි අධ්‍යයනයක් කරලා ඒ පාසල්වලට මැදිහත් වෙන්න කියලා. ඒ කඩා වැටීම සම්බන්ධයෙන් තිබෙන ගැටළුව, දෙමව්පියෝ ඉල්ලන ඉල්ලීම් පිළිබඳව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පසුගිය දින කිහිපයේම ඩෙංගු සම්බන්ධව පත්තරවල Headline. හෝමාගම ප්‍රදේශයේ විතරක් 2500 යි. කොළඹ නගර ප්‍රදේශයේ 4500 යි. ඩෙංගු මදුරුවා විදලා තිබෙන ප්‍රමාණය. මේ පත්තරවලින් කියන ගණන. දැන් අපේ බස්නාහිර පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය පාසල් 61 ක ඩෙංගු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පාසල් 40 ක ඩෙංගු. මේ පත්තරවල තිබෙන්නේ. එතකොට දැන් අපි පළාත් සභාවක් හැටියට දැන් මේ ඩෙංගු මදුරුවා නිසා මිය යන ප්‍රමාණය - පළාත් පාලන ආයතන ඔක්කෝම විසුරුවා දාලා. දැන් පළාත් පාලන ආයතන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට තේරෙන්නේ නැහැ ඔබතුමා කියන දේවල්ව. ඇහෙන්නෙත් නැහැ. තේරෙන්නෙත් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකරාශී වෙලා මේ ඩෙංගු මර්දන වැඩ සටහනක් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමා යෝජනාවක් දාලා කථා කරන්න කෝ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා, යහපාලනයේ නායකතුමා ඩෙංගු මර්දනය සම්බන්ධව කියනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මදුරුවන්ගේ වරප්‍රසාද කථා කරන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔබතුමියටත් හෙට අනිද්දා මේ මදුරුවා විදිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාවේ විහිළු කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ ඩෙංගු මදුරුවා විදිනවා මේ රටට කරන හෙණය නිසා. ඒ නිසා සෞඛ්‍ය ඇමැතිතුමාගෙන් ඉල්ලනවා ඉක්මණින් ඩෙංගු මදුරුවා මර්දනය කර ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඩෙංගු මදුරුවාත් වරප්‍රසාද ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. ඔබතුමා අද සවස 02.00 ට එන්න. ඇමැතිතුමාගේ උපදේශක කාරක සභාව තිබෙනවා. ඕවා එතැනදී කථා කරන්න. සභාවේ කථා කරන්න දෙයක් නැහැ. විහිළු කරන්න එපා. කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමා දිගින් දිගටම මේ සභාව හැල්ලුවට පත් කරනවා. ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න. සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව 02.00 ට තිබෙනවා. ඔබතුමා ඔය පත්තර ටිකත් අරගෙන එතැනට යන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අපි ගෞරවයෙන් ඉල්ලනවා මේ සභාවට ආවට පස්සේ අපේ වරප්‍රසාද ආරක්ෂා කරන්න කියලා. එක්කෙනෙක් දෙන්නෙක් හැමදාම බණ කියනවා වාගේ බොරු කියනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, අපව මේ පළාත් සභාවට එවලා තිබෙන්නේ ඡන්ද 50,000 ක් දීලා. එතකොට අපි පළාත වෙනුවෙන් කථා කරන්න එවලා තිබෙන්නේ. අපි මේ පළාත් සභාවට ඇවිල්ලා, වාඩි වෙලා, කාලා බීලා උසාවියට ගිහිල්ලා නඩු කථා කරන්න නොවෙයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වාඩි වෙන්න කෝ? න්‍යාය පත්‍රයක් තියෙන්නේ මොකටද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

උසාවියක නඩු කථා කරලා -

[සභාවේ ඝෝෂා]

ඒ නිසා තමයි මහජන අයිතිවාසිකම් වෙනුවෙන් කථා කරන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් අධ්‍යාපනයේ ගැටළු පිළිබඳව පැහැදිලි කිරීමට එස්. කුහවර්ධන් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**எஸ். குஹவரதன்**
ගරු එස්. කුහවරදන්

மதிப்பிற்குரிய தவிசாளர் அவர்களே, இன்று இந் நாட்டிலே "யஹபாலனை" என்று சொல்லப்படுகின்ற நல்லாட்சி நடைபெற்றுக் கொண்டிருக்கின்றது. இந் நல்லாட்சியின் முக்கிய நோக்கம் இன, மத, மொழி, பேதமற்ற ஒரு நாட்டை, ஒரு பிரதேசத்தை, ஒரு மாவட்டத்தை உருவாக்க வேண்டும் என்பது.

ගරු සභාපතිතුමනි, මයික්‍රෆෝනය වැඩ කරන්නේ නැහැ. මට අවස්ථාව දෙන්න. දැන් වැඩ කරනවා.

மதிப்பிற்குரிய தவிசாளர் அவர்களே இச் சந்தர்ப்பத்தை எனக்கு வழங்கியமைக்கு முதற் கண் நன்றியைத் தெரிவித்துக் கொள்வதோடு இந் நாட்டின் மேல் மாகாணத்திலே, கொழும்பு மாவட்டத்தில் நல்லாட்சியின் கீழ் நாம் அனைவரும் இன, மத மொழி பேதமின்றி

[எஸ். குஹவரதன்]

ஒற்றுமையாக வாழ்வதற்கு மூன்று விடயங்கள் காணப்படுகின்றன. ஒன்று கலை, இசை என்பதில் மொழி பேதம் இன்றி நாங்கள் அனைவரும் ஒன்றுபடுகின்றோம். அதேபோல் விளையாட்டிலும் நாம் அனைவரும் ஒன்று படுகின்றோம். அதேபோல் முக்கியமானது மாகாண சபைக்கே உரிய அதிகாரத்தின் கீழ் இருக்கின்ற கல்வி, அக் கல்வி விடயத்திலே யாராவது அரசியல் செல்வாக்கை அல்லது அக் கல்வி விடயத்திலே யாராவது தனிப்பட்ட ரீதியில் பாதால உலகத் தலைவர் போல் செயற்படுபவர்களாக இருந்தால் அந்த இடத்திலே இன, மத, மொழி பேதமின்றி நாங்கள் அனைவரும் கொதித்தெழுவோம் என்பதனை கூறிக் கொள்ள விரும்புகின்றேன். அதன் அடிப்படையில் மேல் மாகாண கல்வி அமைச்சர் அவர்கள் தமிழ் கல்விக்கும், சகல கல்வி நடை முறைக்கும் மிகவும் அதிகமாக ஒத்துழைத்து வருகின்றமை இந்த இடத்திலே குறிப்பிட விரும்புகின்றேன். அப்படி இருந்த பொழுதும் கடந்த சில காலப் பகுதிக்குள்ளே கொழும்பு கல்வி வலயத்திற்கு பொருப்பாக இருக்கின்ற பொருப்பதிகாரி ஜயந்த விக்கிரமனாயக அவர்கள் பாடசாலை கல்வியிலே அரசியல் வாதிகளுக்கு அப்பால் சென்று தனது கைங்கரியத்தைக் காட்டிக் கொண்டு இருப்பது பாடாசாலை கல்வி விடயத்திலே எந்தவொரு அரசியல் செல்வாக்கும் இருக்கக் கூடாது என்பதில் நாங்கள் உருதியாக இருக்கின்றோம் அவர் ஆசிரிய இடமாற்றமாக இருந்தாலும் சரி அல்லது அதிபர்களின் இடமாற்றமாக இருந்தாலும் சரி அல்லது மாணவர்களின் கல்வி செயற்பாடுகலாக இருந்தாலும் சரி தனக்கே உரித்தான ஒரு அரசியல் கட்டமைப்பை வைத்துக் கொண்டு, ஒரு வலையமைப்பை (Network) உருவாக்கிக் கொண்டு தனிப்பட்ட ரீதியில் செயற்படுவதை நான் வண்மையாக கண்டிக்கின்றேன். கௌரவ முதலமைச்சர் அவர்களும், கௌரவ கல்வி அமைச்சர் அவர்களும் உடனடியாக இதற்கு தகுந்த நடவடிக்கை எடுத்து அவரை அந்த இடத்தில் இருந்து அப்புறப்படுத்தி கொழும்பு மாவட்ட கல்வியைக் காப்பாற்ற வேண்டும் என்று கூறிக் கொள்ள விரும்புகின்றேன்.

ஹோமாகமை கல்வி வலயம் மற்றும் பிலியந்தலை கல்வி வலயம் சிறப்பாக செயற்படுகின்றது என்பதனை குறிப்பிடுவதுடன், கொழும்பு கல்வி வலயத்தில் இருக்கின்ற இந்த அதிகாரியின் செயற்பாடுகள் உடனடியாக நிருத்தப்பட வேண்டும் எனவும், அவருக்கு எதிரான ஊழல் குற்றச் சாட்டுகள், அவருக்கு எதிரான கடுமையான குற்றச் சாட்டுகளை நாங்கள் ஆதாரபூர்வமாக நிரூபிப்பதற்கு தயாராக இருக்கின்றோம். என்று கூறி விடைபெறுகின்றேன் நன்றி வணக்கம்.

## තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය : දෙවනවර කියැවීම
INFORMATION TECHNOLOGY RESOURCES DEVELOPMENT AUTHORITY STATUTE : SECOND READING

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, *"2016 අංක ...... දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය"* [8] දෙවනවර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධව 2016.11.08 සහ 2016.11.22 යන දිනවල ප්‍රඥප්ති හා නීති කාරක සභාව රැස් වෙලා මේ පිළිබඳව සාකච්ඡාව කළා. ඒ නිසා මම හිතනවා ගරු මන්ත්‍රීවරුන්ට අලුත් අදහස් දැක්වීමට අවශ්‍ය වෙන්නේ නැහැ නේද? ඒ අනුව ප්‍රඥප්ති හා නීති කාරක සභාවෙන් ඉදිරිපත් වූ සංශෝධනයන්ට[9] යටත්ව එකඟතාවය විමසනවා.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ විරෝධතාවයක් නොමැති නිසා ප්‍රඥප්තිය තෙවනවර කියැවීම සඳහා අවස්ථාව.

---
[8] අද දින වැඩ කටයුතු අවසානයේ පළ කර ඇත.
[9] - එම -

## තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය : තෙවනවර කියැවීම
INFORMATION TECHNOLOGY RESOURCES DEVELOPMENT AUTHORITY STATUTE : THIRD READING

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, *"2016 අංක ...... දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තිය"* තෙවනවර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Amended, Question put and agreed to*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ අනුව ඉහත ප්‍රඥප්තිය මේ අවස්ථාවේදී සභා සම්මත වූ බව ප්‍රකාශ කර සිටිනවා. න්‍යාය පත්‍රයට අනුව මීළඟට තිබෙන්නේ, පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු. නමුත් මට අද උදේ මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 107 යටතේ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ අනුව මම ගරු මන්ත්‍රීතුමාට ආරාධනා කරනවා, රීති අත්හිටුවීමේ යෝජනාව සහ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉදිරිපත් කරන ලෙසට.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, ඊට පෙර ඔබතුමාගේ අවසර ඉල්ලා සිටිනවා මම කලින් සභාවේදී 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. අමාත්‍යාංශ උපදේශක කාරක සභා සම්බන්ධව. අද සවස සෞඛ්‍ය අමාත්‍යාංශ උපදේශක කාරක සභාව තිබෙනවා. මේ වනකොට මාව සෞඛ්‍ය අමාත්‍යාංශයටවත්, අධ්‍යාපන අමාත්‍යාංශයටවත් දෙකටම කැඳවන්නේ නැහැ. මම අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරගෙන ආවේ. මේ වනකොට මම අපේ පාසල අපේ දැතින් සුරකිමු කියන ව්‍යාපෘතියට 2016 වර්ෂය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් යොදවලා තිබෙනවා. මම දිගින් දිගටම කිව්වා මගේ අනුදැනුමකින් තොරව මගේ අමාත්‍යාංශ උපදේශක කාරක සභාව වෙනස් කරලා තිබෙනවා. ඒක නිවැරැදි කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සහභාගී වෙන්න. අපි ඒක අනිවාර්යයෙන්ම සභා කටයුතු කාරක සභාවේදී සාකච්ඡා කරලා ඔබතුමාට නිවැරැදි කිරීමක් කරලා දෙන්නම්. අද ඔබතුමා සෞඛ්‍ය අමාත්‍යාංශයට සහභාගී වෙන්න. සමාවෙන්න. අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා විසින් කටාන, දිවුලපිටිය ජනතාවට සිදුව ඇති අසාධාරණයක් සම්බන්ධයෙන් පෞද්ගලික පැහැදිලි කිරීමක් ඉල්ලා තිබෙනවා. එතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ නම් සඳහන් නොකර ඔබතුමා කථා කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම ගැන ස්තුතියි. මෙ ළඟදී දවසක දිවුලපිටිය, කටාන ප්‍රදේශයේ යම් අර්බුදයක් සිදු වුණා. ඒ අර්බුදයේදී යම් සාධාරණ පැති ඇති. ඒ අදාළ මන්ත්‍රීවරයා කථා කරපු එකේ. නමුත් ගරු සභාපතිතුමනි, ඒ ප්‍රදේශයේ ටිපර් රථ, ලොරි රථ 1000 කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒ ප්‍රදේශයේ ජනතාව ජීවත් වෙන්නේ, ඒ රස්සාවෙන්. ටිපර් රථයේ ඩ්‍රයිවර් ජීවත් වෙන්නේ, ඒ රස්සාවෙන්. සහායකයන් ජීවත් වෙන්නේ, ඒ රස්සාවෙන්. ඊළඟට ඒ ගෙන එන ආදායමෙන් ගෙදර ජීවත් වනකොට සහ ප්‍රදේශයේ ගම්බිම් සහ කඩ ජීවත් වෙන්නේ ඒ ආදායමෙන්. හදිසියේම පරිසර අධිකාරිය, භූ විද්‍යා පතල් කැනීම් කාර්යාංශය සෑම ආයතනයකින්ම අවසර දීලා තමයි ඔය ආයතන පටන් අරගෙන තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මම එක අපැහැදිලි තැනක් පෙන්වා දෙන්න කැමැතියි. ඒ පතල් හා කැනීම් කාර්යාංශයෙන් මාසයකට පර්මිට් එක දෙන්නේ, කියුබ් 540 කට. මාසයකට කියුබ් 540 ක් කපන්න ලක්ෂ 100 ක මැෂින් එකක් ගේන්න ඕනෑ. ඒ මැෂින් එක එතැනට ගෙන එන්න රුපියල් 50,000 ක් වියදම් කරන්න ඕනෑ. ඊළඟට ඒ මැෂින් එකෙන් කියුබ් 540 කපලා පස් ගෙනියන්න ලක්ෂ 40 ක ටිපර් එකක් ගේන්න ඕනෑ. දවසකට කියුබ් 20 යි කපන්න පුළුවන්. එක ටිපර් එකක් දවසකට ලෝඩ් 5 ක් 6 ක් ගියාම ඒ ලෝඩ් එක ගෙනිහිල්ලා බාලා එනකල් අර ලක්ෂ 100 මැෂින් එක එතැන තියෙන්න ඕනෑ. එහෙම නැත්නම් තව පර්මිට් එකක් දෙනවා, අයි.එම්.එල්.ඒ. කියලා. ඒක ගන්න ඉතින් ළමයෙක් හම්බ

[ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා]

වෙනවා හා සමාන කර්තව්‍යයක්. සාමාන්‍යයෙන් ඒවා හම්බ වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මේ නීති හැදිලා තිබෙන්නේ මහජන සුභසිද්ධියට. මහජන පීඩාවට නොවෙයි. ව්‍යාපාරයක් කරන්න පුළුවන් ආකාරයට නීති හැදෙන්න ඕනෑ. එක්කෝ දෙන්න ඕනෑ. නැත්නම් නොදී ඉන්න ඕනෑ. ඒක ලබා ගැනීමේ අමාරු කර්තව්‍යයක් මත 540 පර්මිට් එකට ලබා දෙන කට්ටිය අයථා විධියට 540 ට 5040 ක් කපනවා. එතකොට වරද කාගේද? වරද රජයේ. කපන කෙනා මොනවා කරන්නද? ලක්ෂ 100 ක මැෂින් එකක් ගෙනැල්ලා දවසකට කියුබ් 20 ක් කපලා මොනවා කරන්නද? ගරු සභාපතිතුමනි, මේවා නිවැරැදි වෙන්න ඕනෑ. කාට හරි ලෙහෙසියි ඕතැන ඇවිල්ලා විරෝධතාවය ප්‍රකාශ කරන්න. නමුත් ඒ තුළින් ජීවත්වන ජනතාව, ඒකෙන් ජීවත් වන පිරිස. දැන් බලන්න ගරු සභාපතිතුමනි, දැනට මාස ගණනකට ඉස්සෙල්ලා කියුබ් තුනේ ටිපර් එකක් රුපියල් 27,000 යි ගෙනැල්ලා බාන්න. දැන් 50,000 යි. වැලි ලෝඩ් එකක්. ගරු සභාපතිතුමනි, වැලි ලෝඩ් එකක් රුපියල් 50,000 ට අරගෙන කොහොමද වැඩ කරන්නේ? ඒ ලාභය එනකල් මිනිස්සු බලාගෙන ඉන්නවා. ඒ මිනිස්සු බලාගෙන ඉන්නවා. මේසන් බාස් ගෙදර ඉන්නවා. මේසන් බාස් ගෙදර ඉන්න කොට ගෝලයාත් ගෙදර ඉන්නවා. බිත්ති නැති වුණාම වහළ ගැහෙන්නේ නැහැ. වඩු බාස් නිකන් ඉන්නවා. ගෝලයාත් නිකන් ඉන්නවා. එතකොට වඩු බාස් වහළ ගහන්නේ නැහැයි කියන්නේ, අරෙහේ ලී විකිණෙන්නේ නැහැ. හාඩ්වෙයාර් එකට බඩු ගේන්නේ නැහැ. මේ යාන්ත්‍රණය ගරා වැටිලා.

ගරු සභාපතිතුමනි, මම ඔබතුමා හරහා ඒ අදාළ ආයතනවලට දැනුම් දෙන්නේ මහජන සුභ සිද්ධියට මේ නීති සම්පාදනය කරන්න. එහෙම නැත්නම් මේ නිලධාරීන් ඕනෑ විධියට, හිතු මනාපයට නීති හදලා - මේ නීති ආවේ උදැල්ලෙන්, සවලෙන්, ගල්කටුවෙන් පස් කපන කාලේ. ඒකට 540 ක් හරි අද මැෂින්වලින් කපන්නේ. මේවා නිවැරැදි වෙන්න ඕනෑ.

ඊළඟට අර අපේ ඇමැතිවරයෙක් ආවා. මම හිතන්නේ එයා වන්ෂොට් වෙන්න ඇති. ඇවිල්ලා හෙණ ගහන්න කියනවා. නිලධාරියෙක් විධියට පස් කපන්න යන්නේ නැහැ. ජනතාවට හෙණ ගහන්න කියනවා. දැන් අපේ පැත්තේ අය කියනවා ලොරිකාරයාට කන්න නැහැ. ටිපර්කාරයාට කන්න නැහැ. ඩ්‍රයිවර්ට කන්න නැහැ. පවුල හිඟා කනවා. කඩකාරයාට බිස්නස් නැහැ. දැන් ඔක්කෝම කියනවා වන්ෂෝට්ට හෙණ ගහන්න කියලා. මේ වන්ෂෝට් තියාගෙන ඉන්න යහපාලන ආණ්ඩුවට හෙණ ගහන්න කියලාත් කියනවා. ගරු සභාපතිතුමනි, එතකොට මම ඒ වන්ෂෝට්ගෙන් අහනවා. මේ පස් කපලා පරිසරය විනාශ වෙනවා නම්, අර හයිවේ එක හදන්න පස් නොවෙයිද කපන්නේ? එතකොට පරිසරය විනාශ වෙන්නේ නැද්ද? අපේ පැතිවල ගෙපැලක් කපා ගන්නේ කොහොමද? ගරු සභාපතිතුමනි, එතකොට හම්බන්තොට අක්කර 15,000 ක් දෙනවා. ඒ අක්කර 15,000 ගස් කපලා චීනයට දෙන්නේ, ව්‍යාපාර පටන් ගන්න නොවෙයිද? ගරු සභාපතිතුමනි, ඒක නිසා මේවා මාධ්‍යයට ගෙනාපු අයට කථා කරන්න එපා කියන්න. මේවා බොහොම සාධාරණව කථා කළ යුතු දේවල්. සංවේදී කාරණයක්. මේ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියත්, මමත් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔය ගැන අපි ජනාධිපතිතුමාත් එක්ක කථා කරන්න ඉල්ලලා තිබෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

සාධාරණ පිළිතුරක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

# රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

ගරු සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය*

*පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි"* යෝජනා කරනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

*[විසින් ස්ථිර කරන ලදී. ]*
*[Seconded]*

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*Question put and agreed to.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## පළාත් පාලන ආයතනවල බලතල පවරා ගැනීම සම්බන්ධ නාගරික සංවර්ධන අධිකාරියේ තීරණය ප්‍රතික්ෂේප කිරීම
REJECTING THE DECISION OF URBAN DEVELOPMENT AUTHORITY TO ACQUIRE THE POWERS OF LOCAL GOVERNMENTS

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

ගරු සභාපතිතුමනි, *"නාගරික සංවර්ධන අධිකාරිය විසින් පළාත් පාලන ආයතන වෙත 1985 මාර්තු මස 01 වන දින සිට පවරා දී තිබූ බලතල හා ක්‍රියාකාරකම්වලින් වැඩි කොටසක් මහ නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති නාගරික සංවර්ධන අධිකාරියේ අංක DDG(P)01/11 සහ 2017 ජනවාරි මස 23 වන දිනැති ලිපිය මගින් ආපසු පවරා ගැනීමට කටයුතු කර ඇත. බලතල ආපසු පවරා ගැනීම සිදු කිරීමට කටයුතු කර ඇත්තේ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන් නොමැති අවස්ථාවකය. මෙමඟින් අදාළ ප්‍රදේශයේ ජනතාවට පළාත් පාලන ආයතනයකින් සේවය ලබා ගැනීමට තිබූ පහසු හැකියාව නැති වන අතර, එය පළාත් පාලන ආයතනවල ආදායම් අඩු වීමට ද හේතුවක් වනු ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලය බෙදීමේ මූලික සිද්ධාන්තය පිළිගෙන ඇති අතර, දශක තුනකට ආසන්න කාලයක් ඒ අනුව ක්‍රියාත්මක වී ඇත.*

*බලය බෙදීමේ මූලික සිද්ධාන්තයට පටහැනි ඉහතින් සඳහන් කරන්නට යෙදුනු නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ අංක DDG(P)01/11 සහ 2017 ජනවාරි මස 23 වන දිනැති ලිපියෙන් දැනුම් දී ඇති එම අධිකාරියේ තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අරමුණට පටහැනි බැවින් එය ප්‍රතික්ෂේප කළ යුතු බැව් මෙම සභාව යෝජනා කරන්නීය."*

ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරිය විසින් පළාත් පාලන ආයතන වෙත විමධ්‍යගත කර ඇති බලතලවලින් කොටසක් ආපසු නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට විරුද්ධ බව ප්‍රකාශ කරනවා. අධිකාරී කළමනාකරණ මණ්ඩලය විසින් 2016.12.16 වන දින අනුමත කර ගන්නා ලද 21/2016 කළමනාකරණ මණ්ඩලයේ තීරණය පරිදි මහ නගර සභා සහ බස්නාහිර සංවර්ධන ගරු ඇමැතිතුමාගේ නියෝගය පරිදි පළාත් පාලන ආයතන වෙත පවරා ඇති බලතල නාගරික සංවර්ධන අධිකාරී බලතලවලින් පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා බලතල 2017.02.01 දින සිට අධිකාරිය වෙත යළි පවරා ගැනීමේ කටයුතු කර තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ වනවිට මම හිතන්නේ පෙබරවාරි මාසයේ 01 වැනිදා සිට ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්කවලට බලපාන පරිදි සියලුම පළාත් පාලන ආයතන නාගරික සංවර්ධන අධිකාරියේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් සමාවෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරළගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වනකොට මේ පනත මගින් නගර සභා සහ ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දී තිබූ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනාව ස්ථිර වුණේ නැහැ නේ?

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

යෝජනාව ස්ථිර වුණා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නැහැ, නැහැ. ඒ රීති අත්හිටුවීමේ යෝජනාව ස්ථිර වුණේ. තවම මේ යෝජනාව ස්ථිර වුණේ නැහැ. ඔබතුමා යෝජනාව ස්ථිර කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

*[විසින් ස්ථිර කරන ලදී. ]*
*[Seconded]*

[පූ.භා. 11.10]

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අනුව පළාත් පාලන ආයතන වෙත ලබා දී තිබූ තාවකාලික අනුමත කර ගැනීමේ වරප්‍රසාද අනුව මේ වනකොට නගර සභා, පළාත් පාලන ආයතන වෙත ලබා දී තිබූ සංවර්ධන සැලසුම් යෝජනාවල, පර්චස් 40 ට වැඩි ඒ වාගේ තට්ටු මහල්, ඒ කියන්නේ G Plus 3 කිව්වොත් තට්ටු මහල් 4 ට වැඩි, ඒ වාගේම වර්ග අඩි 4000 ට වැඩි ඒ වාගේම Commercial Purpose - වෙළඳ ස්වභාවයෙන් යුත්, අපි කිව්වොත් එහෙම වෙළඳාම් සඳහා අනුමැතිය ලබා ගන්න ව්‍යාපෘතිවලට, ඒ සියලුම ව්‍යාපෘතිවලට අනුමැති ලබා ගැනීමට, නාගරික සංවර්ධන අධිකාරියෙන් අවසර ලබා ගැනීමට සිදු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දන්නවා. මේ වනකොට ලංකාවේ සියලුම දිස්ත්‍රික්කවලට මම හිතන්නේ ආයතන 23 කට විතරයි මේ පහසුකම සැපයීමේ අයිතිය තිබෙන්නේ. ලංකාවේ පළාත් පාලන ආයතන 333 ක් තිබෙනවා. මම හිතන්නේ, එළැඹෙන ඡන්දයේදී තවත් පළාත් පාලන ආයතන දෙක තුනක් වැඩි වීමට නියමිත වුණත් මේ වන විට අපි උදාහරණයට ගත්තොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන අවසාන ආසනය ගත්තොත් අවිස්සාවේල්ල ප්‍රදේශයේ නාගරික සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කර ගැනීමට ඔවුන්ට බත්තරමුල්ල නාගරික සංවර්ධන අධිකාරියට එන්න ඕනෑ. සමහර වෙලාවට සීතාවක ප්‍රදේශයේ, අවිස්සාවේල්ලේ පළාත් පාලන ආයතන වෙත ගිහිල්ලා සුමානයකින්, දෙකකින් කර ගන්න වැඩේ මම හිතන්නේ කිලෝ මීටර් විස්සක් විසි පහක් දුරට ඇවිල්ලා නාගරික සංවර්ධන අධිකාරියට යොමු කරලා, ඒ තුළින් මම හිතන්නේ ඒ සඳහා ජනතාවගේ සැහෙන මුදලක් වියදම් කරන්න ඕනෑ. ඒ නිසා පොදුවේ මේ සභාව වශයෙන් මම යෝජනාවක් කරනවා. මේ කාරණා කටයුතු හිතලා අපේ නගර සභාවලට, පළාත් පාලන ආයතනවලට නැවතත් ඒ බලතල ලබා දීමට ගරු නියෝජ්‍ය සභාපතිතුමා මඟින් කටයුතු කරයි කියලා හිතනවා. ඒ විතරක් නොවෙයි. දැන් මේවායෙන් ලැබෙන ආදායමින් තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රදේශවල සංවර්ධන කටයුතුවලට මුදල් ලබා ගත්තේ. නමුත් මේවායෙන් අය වන මුදල් නාගරික සංවර්ධන අධිකාරියට ලැබීම තුළින් ඒ පළාත් පාලන ආයතනවලින් ලැබෙන මුදල්වල ප්‍රමාණය අඩුපාඩුවක් වෙන්න පුළුවන්. ඊට පස්සේ මේවායේ ඉඩම් කට්ටියක් කැඩීමේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා දන්නවා පොදු පහසුකමක් ඉඩම් - ඒ ප්‍රදේශයට උචිතනා විධියට නොවෙයි පොදු පහසුකම් ඉඩම් ලැබෙන්නේ. ඒ ප්‍රදේශය නියෝජනය කරමින් ඒ ප්‍රදේශය තුළ ඉන්න ප්‍රජාව තමයි ඒ පොදු පහසුකම් සඳහා අවශ්‍ය ඉඩම ගැන මනා අවබෝධයක් තිබෙන්නේ. එතකොට නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් විසින් මේ බිම් කට්ටි කැඩීමේදී ඉතුරු වන යම්කිසි ඉඩමක් අතට හසුවන විධියට දීමෙන් මම හිතන්නේ, ඒ ප්‍රදේශයේ ප්‍රජාවට නිසි ආකාරයෙන් කළමනාකරණය කර ගැනීම සඳහා ඉඩමේ තිබෙන වටිනාකම ලැබෙන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. මේවායෙන් නඩත්තු වන මුදල් නොලැබීමෙන් ප්‍රදේශයේ තිබෙන කසළ කළමනාකරණය, විදුලිය මේ සියලුම දේවල් කඩා වැටිලා, මම හිතන්නේ, පළාත් පාලන ආයතනවලින් වන සේවාව නිසි ලෙස ලබා ගැනීමේ හැකියාවක් ඉදිරියේදී නැති වෙලා යන්න පුළුවන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ වාගේම ඉඩම් කට්ටි කැඩීම විතරක් නොවෙයි. ගොඩනැගිලි සීමාව මේ තුළ දක්වලා නැහැ. ඒ විතරක් නොවෙයි. මම දැක්කා. මේ යෝජනාවේ කොටස් 11 කින් මම ප්‍රධාන කොටස් හතරක් තමයි දැන්වූයේ. දැන් සභාගත කරපු නාගරික සංවර්ධන අධිකාරියේ යෝජනාවේ යෝජනා 18 ක් තිබෙනවා. ඒ අනුව අධිවේගී මාර්ග ආරක්ෂිත කලාපවල යෝජිත සංවර්ධන කටයුතු වාගේ සමහර දේවල් නාගරික සංවර්ධන අධිකාරියට ලබා ගත්තාට කමක් නැහැ. නමුත් නගරයේ සාමාන්‍යයෙන් වර්ග අඩි 4000 ක ගෙයක්

කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොළඹ නාගරික ප්‍රදේශවල සාමාන්‍ය ගෙයක්. මම හිතන්නේ තට්ටු දෙකක් විතර යනකොට අනිවාර්යෙන්ම ඒ ගෙයින් වර්ග අඩි 4000 ක් තිබෙනවා. ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගැන ඔබතුමා සොයා බලා කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු රීති අත්හිටුවීමේ යෝජනාව - මේ අවස්ථාවේ ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ බහුතර මන්ත්‍රීවරුත්, පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුත් බොහෝ පිරිසක් ඉන්නේ පළාත් පාලන ආයතනවලින් බිහි වුණු අය. දැන් පළාත් පාලනවල නියෝජිතයෝ නැති වෙලාවේ මේ කරන කර්තව්‍ය පිළිබඳව හැම මන්ත්‍රීවරයෙකුම සානුකම්පිතව කථා කරයි කියලා මම විශ්වාසා කරනවා. මීළඟට නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 11.15]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව මම හිතන්නේ මේ වනකොට එළියට ඇවිල්ලා තිබෙන්නේ වසර ගණනක් පුරා පළාත් පාලන ආයතන පිළිබඳව දිගින් දිගටම මතු වුණු විරෝධතා සහ පැමිණිලි හේතු කොට ගෙන. ඔබතුමා කිව්වා වාගේ පාර්ලිමේන්තුවේ බහුතරයක් මන්ත්‍රීවරු ඉල්ලා සිටියා, මේ පළාත් පාලන ආයතන සතු බලතල නැවතත් නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගන්න කියලා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

බොරු.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මන්ත්‍රීවරු එදා පාර්ලිමේන්තුවේ අයවැය විවාදයේදී ඉල්ලා සිටියා. ඒ නිසා මම ඔබතුමාට කියන්නේ මේ ප්‍රශ්නය දිහා දෙයාකාරයකින් බලන්න ඕනෑ. අපි දන්නවා, සමහර නගර සභාව ඇතුළේ සමහර සභාපතිවරුගේ පියන්ලා ඉන්නවා. ටයි එකක් දාගත්තු මහත්තයෙක් ආපු ගමන් ගිහිල්ලා බදාගෙන එක්කරගෙන යනවා සභාපති ළඟට. හිතන්නේ ෆිනෑන්ස් කම්පැණියක් කියලා. ඉඩම් කට්ටි කඩන කම්පැණියක් කියලා. බලාගෙන ගියාම ඒ මනුස්සයා ඇවිල්ලා තිබෙන්නේ, තමන්ගේ පර්චස් හයේ බ්ලොක් එක අනුමත කර ගන්න. ටයි කාරයෙකුට යන්න බැහැ. ඒ වාගේම මේ රටේ ඉඩම් නගර සභා යටතේ, මම බොහොම හොඳින්ම දන්නවා. සමහර ආයතනවල අධික දූෂණ වෙලා තිබෙනවා. අක්කර 2 ½ ට වැඩි ඉඩම්වල කාණු බඳින්නේ නැතුව ඉඩම් අනුමත කරලා තිබුණා. හැබැයි එහෙම කියලා නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකුට ඒකේ ඇඟිල්ල දික් කරන්න බැහැ. ඒ හැම සැලැස්මකම නාගරික සංවර්ධන අධිකාරියත් අත්සන් කරලා තිබෙනවා. ඒ නිසා නාගරික සංවර්ධන අධිකාරියටත් බැහැ ඉතිහාසයේ වුණු වැරැදිවලින් බැහැර වෙලා යන්න. දැන් ළඟදී මම මතු කළා පිළියන්දල ප්‍රදේශයේ, කැස්බෑව නගර සභා බල ප්‍රදේශයේ මම පැහැදිලිවම මේක අනුමත කරන්න එපා කියලා කියද්දී නාගරික සංවර්ධන අධිකාරියයි, නගර සභාවේ ලේකම්නුයි එකතු වෙලා බිස්නස් ඩීල් එක ගැහුවා. වෙනත් නිවාස සංකීර්ණයක් මැද්දෙන් තවත් නිවාස සංකීර්ණයකට යන්න පාරක් දානවා. නාගරික සංවර්ධන අධිකාරිය මොකක්ද කියන්නේ? අන්තිමේදී මම සංවර්ධන කමිටුවේදී අහනවා, ඔබ අනුමත කළේ කුමන නිර්ණායක මතදැයි අපව දැනුවත් කරන්න කියලා. අදත් දැනුවත් කරන්නේ නැහැ. ඒ නිසා ජරාව කන එක දෙගොල්ලොම කෑවා. නගර සභාව විතරක් නොවෙයි. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා නොවෙයි. UDA එකත් ඉතිහාසය පුරා කනවා. තවමත් කනවා. අදත් කනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

TO ලා හරහා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

නැහැ UDA Officer. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉන්න තැන නොවෙයි ඉන්නේ. මේ වැලි ගැන නොවෙයි කථා කරන්නේ. පස් ගැනත් නොවෙයි. මේ කථා කරන්නේ වෙන එකක් ගැන. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා හරහා කියන්නේ

[ගරු නිරෝෂන් පාදුක්ක]

මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. හැබැයි මම අහන්නේ, නාගරික සංවර්ධන අධිකාරියට බලතල තිබෙනවාද ගොඩනැගිල්ලක් කඩා ඉවත් කරන්න? අනවසර ඉදි කිරීමක්. ඒක ඇතුළේ තිබුණා. නමුත් වෙලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හොඳටම දන්නවා. දෙහිවල නගර සභා බල ප්‍රද්ශයේ පසුගිය කාලයේ අඛණ්ඩව සිදු වුණු වංචා සහ දූෂණ මේක ගේන්න වඩාත් ඉක්මන් වුණාය කියලා මම විශ්වාස කරනවා. දෙහිවල - ගල්කිස්ස නගර සභා බල ප්‍රදේශයේ බිලියන් ගණන්වලින්, මිලියන ගණන්වලින් ගණුදෙනු ගියේ. ඒ නිසා තමයි මෙහෙම කරන්න වුණේ. හැබැයි, තව ප්‍රශ්නයක් තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ පනත ගෙන එන්නේ ජාතික වැදගත්කමකින් යුතුව වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දෙන්න නම් ඒවා පිළිබඳව අපේ විරෝධයක් නැහැ.

හැබැයි මෙතැන තිබෙන බරපතළම අර්බුදය සභාපතිවරයා අත්සන් කිරීම නොවෙයි. නගරාධිපති අත්සන් කිරීම නොවෙයි. අදාළ පළාත් පාලන ආයතනවල ආදායම් කඩා වැටීම. මේවායෙන් ලැබෙන්න තිබෙන ආදායම අදාළ පළාත් පාලන ආයතනවලට අහිමි වෙනවා නම් ඒක ප්‍රශ්නයක්. දැන් පළාත් පාලන ආයතනවලට බස්නාහිර පළාතේ ඉඩම් කට්ටි කඩන්න නැහැ. කඩලා ඉවරයි. දැන් ආදායම් නැහැ. පළාත් පාලන ආයතනවලට තිබෙන ප්‍රධාන ආදායම තමයි දැන් ඉදිරියේදී ගෙන එන්න වෙන්නේ. කඩ කාමර බදු දීලා ගේන ආදායම. ඉඩම් කට්ටි කඩන්නේ නැහැ. දැන් නගර සභාව වුණාට පස්සේ සමහර ආයතනවලට උසාවියේ දඩ මුදල් එන්නේ නැහැ. මේ පළාත් පාලන ආයතනවලට තමන්ගේ ස්වශක්තියෙන් නැඟී සිටින්න තිබුණු ආදායම රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා මේ 15 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා පළාත් පාලන ආයතනවලට දීපු ආදායම් මාර්ග තමයි මේ ක්‍රම ක්‍රමයෙන් අඩු වෙමින් යන්නේ. ඒ නිසා මේ යෝජනාව ගෙනාපු නාගරික සංවර්ධන අධිකාරියෙන් අපි ඉල්ලා සිටිනවා. මේ හරහා ලබන ආදායම්වලින් 70% ක්වත් නැවතත් ඒ ආදාළ පළාත් පාලන ආයතන වෙත ලබා දිය යුතුයි කියලා. තීන්දු තීරණ ගැනීමේ අයිතිය ඒ අය තියා ගනියි. හැබැයි මේකේ අපට ඕනෑ, UDA එක වරදක් කළොත් UDA එකට දඬුවම් දෙන ක්‍රමයක්. නාගරික සංවර්ධන අධිකාරිය විතරක් තනියම වගකීම් අරගෙන අනුමත කරලා දෙන්න බැහැ. ඔවුන් පිළිබඳව ඉතිහාසයේ අපට වැරැදි අත්දැකීම් තිබෙනවා. ඔවුන් කරපුවා තිබෙනවා ගරු සභාපතිතුමනි. තවමත් මට උත්තරයක් දුන්නේ නැහැ නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා. ඔහුගෙන් මම ඇහුවාම ඔහුට වෙලාව නැහැයි කියනවා අපත් එක්ක කථා කරන්න. පැහැදිලිවම ෆිනෑන්ස් සමාගමකට දුන්නා. මම රට යනකොට සංවර්ධන කමිටුවේදී කියලා ගියා මේක අනුමත කරන්න එපා. මේක වැරැදියි කියලා. නමුත් අනුමත කළා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා හරහා ඉල්ලන්නේ මේ රටේ සේවාවන් කාර්යක්ෂම කරන්න. මෙතුමා කියනවා, පර්චස් 40 ට අඩු ඒවා නගර සභාවේ. 40 ට වැඩි ඒවා UDA එකේ. මේක අපැහැදිලියි. හයත් ගන්න. මොකද, හය විතරක් නගර සභාවට දෙන්න එපා. ඊට පස්සේ කියයි 5.5 ට අනුමත කරනවා කියලා. මේ රටේ මිනිස්සු වැඩියෙන්ම ආදරේ කරන්නේ නගර සභා ක්‍රමයට. ඒ තමයි උප්පත්තියේ සිට විපත දක්වා සෑම කොට්ඨාශයක්ම නියෝජනය වන ක්‍රියාදාමය සිදු වෙන්නේ, නගර සභා සහ ප්‍රාදේශීය සභා හරහා. පළාත් සභා මන්ත්‍රී ජනතාවගෙන් ඈත් වෙන්නේ ඒකයි. පාර්ලිමේන්තු මන්ත්‍රී ඈත් වෙලා නාගරික මන්ත්‍රී, ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමේ ජීවත් වන පුද්ගලයා. අවංකව ගිය මිනිස්සු. අපේ නිවාස සැලැස්ම තිබෙනවා, අනුමත කරලා දෙන්න කියලා. ගණන කපපු එක අපි දන්නවා. සභාපතිවරු දන්නවා. ඈත එනකොට ෆිනෑන්ස් කම්පැණි එක උස්සගෙන යන්නේ. ඉතින් ඒවා තිබෙනවා. නගර සභාව සම්පූර්ණයෙන්ම වැරැදියි. ප්‍රාදේශීය සභාවල වංචාව, දූෂණය ඉහ වහා ගියා. ඒක තමයි මේකට ඉඩ ගියේ. නමුත් මට තිබෙන ප්‍රශ්නය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතනවලට මේවායෙන් ලබන ආදායම් නැවතත් ලබා දිය යුතුයි. නැත්නම් පළාත් පාලන ආයතන අකාර්යක්ෂම වෙනවා. අදාළ බල ප්‍රදේශයේ ඉඩම්වලටයි මේ තීන්දු ගන්න දෙන්නේ. තීන්දුව ගන්න. පරිපාලනමය බලය ගන්න. හැබැයි ඒවායෙන් ලැබෙන මූල්‍යමය ආදායම ආදළ ප්‍රාදේශීය සභා සහ නගර සභාවලට ලබා දෙන්න කියන ඉල්ලීම මේ යෝජනාව හරහා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපව යොමු කරද්දී ලබා දෙන්න කියලා.

ඊට අමතරව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ විවිධ දේවල් කියනවා. පූජා භූමි. නගර සභා යන්නේ නැහැ පූජා භූමි අල්ලන්න. ඒ නිසා මේකෙන් නගර සභාවලට

ප්‍රශ්නයක් නැහැ. හැබැයි දැන් සමහර දේපළ පිළිබඳව - නගර සභාවට මේ කමිටුවෙන් කවුරුත් ඇතුළත් වෙනවාද? මේ අනුමත කරන කමිටුවලට. ඒවා පිළිබඳව අපි දන්නේ නැහැ. පළාත් පාලන ආයතනයෙන් කවුරු හරි - නාගරික සංවර්ධන අධිකාරිය මේ බලය ගන්න කොට ජනතාව විසින් නගර සභාවට පත් කරපු පුද්ගලයාට මේ පිළිබඳව කථා කරන්න අයිතියක් නැද්ද? එතකොට මේ තාක්ෂණික කමිටුව කවුද? ඒකට නගර සභාවෙන් කිසිවෙකු නැද්ද? මේවා පිළිබඳව අපට පැහැදිලි කිරීමක් ඕනෑ. ඒ නිසා ඔබතුමා හරහා මේ පනත ගෙනාපු එකේදී අපි ඉල්ලා සිටිනවා, පර්චස් 40 ට වැඩි, අක්කර 2 ½ ට වැඩි ඉඩම්වල ක්‍රමයක් තිබෙනවා, 10% ක භූමි ප්‍රමාණයක් පොදු කටයුතු සඳහා තියන්න ඕනෑ කියලා. එතකොට මේ පොදු කටයුතු නඩත්තු කරන්නේ UDA එකද? නගර සභාවද? පසුගිය කාලයේ සමහර ඒවාට අභියෝග කරන්න බැහැ නාගරික සංවර්ධන අධිකාරියට. අද නොවෙයි. අවුරුදු 10 ක් 15 ක්. දැන් නාගරික සංවර්ධන අධිකාරිය කියනවා, අක්කර 2 ½ ට වැඩි ඉඩම්වල ගෙවල් හදනවා. ඒ මිනිස්සු මරණාධාර සමිතියක් පිහිටුවනවා. හැබැයි පොදු කටයුතු කැල්ලේ මරණාධාර සමිතිය හදන්න UDA එකෙන් දෙන්නේ නැහැ. එතකොට UDA එකේ Chairman ගේ ගෙදරද පුටු ටික තියන්නේ? UDA එකේ Chairman ගේ ගෙදරද හට් එක තියන්නේ? ඒ නිසා මේවා පිළිබඳව කරීකාවක් ඕනෑ. අනුමැතිය පිළිබඳ කාර්යය ගන්න. නගර සභාව හොරකම් කරනවා නම්, ප්‍රාදේශීය සභාව හොරකම් කරනවා නම් ඒක ගන්න.

හැබැයි එතැනට අවශ්‍ය වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දෙන්න කටයුතු කරන්න. හැබැයි UDA එකට දුන්නා කියලා ඒකේ විනිවිදභාවය පේන්න තිබෙන්න ඕනෑ. හැබැයි එහෙම නොවුණොත්, අනාගතයේ නගර සභා මේවා අභියෝග කරයි. නාගරික මන්ත්‍රීවරුත් පාරට එයි. UDA එකත් මෙන්න මේ වැඩේම කළා කියලා. එතකොට සමහර ආයතන තිබෙනවා පරිසර අධිකාරියේ අනුමැතිය ඕනෑ. එතකොට දැන් මේ අනුමැතිය දෙනකොට PHI වාර්තාවට මොකද වෙන්නේ? ඊට අමතරව විවිධ ආයතනවල අනුමැතිය ගේන්න කියයි. අපි හිතනවා, BOI ව්‍යාපෘතියක් යටතේ එනවා අනුමැතියක්. එතකොට ඉඩම් ගොඩ කිරීමේ දෙපාර්තමේන්තුව. විවිධ ආයතන තිබෙනවා. එතකොට මේවායේ අනුමැතිය තනිකරම ගන්නේ, UDA එක හරහාද? එතකොට නගර සභාවට කිසිම කාර්ය භාරයක් නැද්ද? කවුද මේකේ පසුවිපරම කරන්නේ? එතකොට නගර සභාවේ TO ඉන්න ඕනෑ ජනේලෙයි, පිටිපස්සේ දොරයි අතර 7.5 බලන්න විතරද? මේවා පිළිබඳව ඕනෑ. එතකොට අපි හැමදාම UDA නිලධාරියා නගර සභාවට ගෙන එනවාට ගෙවීමක් කළා. හිටපු සභාපතිවරු දන්නවා ඇති. UDA නිලධාරියා මේ පනත හරහා - ඉතිහාසයේ සභාපතිට දුන්නේ UDA එක සතු බලතල. පහත්බිම් එක සතු බලතල. ඒවා තමයි දීලා තිබෙන්නේ. ඒක නිසා සභාපතිවරු ඉතිහාසයේ කළ වැරදි නිසා තමයි නැවතත් මේවා UDA එකට අත් කර ගන්න උත්සාහ කරන්නේ. නමුත් එදා රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ සංකල්පය වුණේ වෙනත් දෙයක්. නමුත් ඒ සංකල්පය අද අභියෝගයට ලක් වෙලා, වංචනික සහ දූෂිත නගරාධිපතිවරුන් සහ සභාපතිවරුන් නිසා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා හරහා මම ඉල්ලන්නේ වඩාත් කාර්යක්ෂම සේවාවක් සඳහා මේ ක්‍රමය වඩාත් වැදගත් වේවි කියලා මම විශ්වාස කරනවා. හැබැයි ඒ තුළ ග්‍රාමීය, අදාළ පළාත් පාලන ආයතනයටත් යම්කිසි වගකීමක් භාර දිය යුතුයි කියන යෝජනාව මම ඔබතුමා හරහා ඉදිරිපත් කරනවා. ඒ නිසා මේකේ ගත්තාම යුනෙස්කෝ ආයතනය සම්බන්ධයෙන් නගර සභාවට වැඩක් නැහැ. සමහර අය මේකේදී හැම දේටම කියන්නේ, නගර සභාවක් කිව්වාම ලංකාවේ මිනිස්සුන්ට මතක් වෙන්නේ මොනවාද? මිනිස්සු නගර සභාවකින් ඉඩම් කට්ටි අනුමත කර ගන්න යනවා. හැබැයි මේ නගර සභාවල මාස ගණන් රස්තියාදු වෙන මිනිස්සු ඉන්නවා. සමහර වෙලාවට බදාදාට විතරයි UDA Officer එන්නේ. සතියට එක දවසයි. UDA Officer නැති වුණාම නිවාඩු දාලා ආපු මනුස්සයාට ආයිත් රස්සාවට යන්න බැහැ. එතකොට දැන් මේ අනුමැතින් පිළිබඳ ප්‍රශ්නයේදී පිළියන්දල බටකැත්තර මනුස්සයෙකුගේම පර්චස් 44 ක ප්ලෑන් එකක් Reject කළාම ඔහු නිවාඩුවක් දාලා UDA එකට යනවා. නැත්නම් UDA එක මේ බලතල අරගෙන නගර සභාව ඇතුළේද මේ අනුමැතීන් ක්‍රියාත්මක කරන්නේ? මේවා පිළිබඳව පැහැදිලි කිරීමක් ඕනෑ. මේ කමිටුව කොහේද තියෙන්නේ? Servey Plan එක අඳින්නේ කවුද?

දැන් ඊළඟට තව ප්‍රශ්නයක් එනවා. රජය ඉඩම්වලට බිම් සවිය Plan ඇදගෙන යනවා. එතකොට බිම් සවියද පිළිගන්නේ? ලංකාවේ නීත්‍යානුකූල Servey කෙනෙක් ඇඳපු ප්ලෑන් එකද පිළිගන්නේ? පරම්පරාවෙන් ආපු සමහර ඉඩම් තිබෙනවා. සර්වේ Plan එකේ තිබෙන්නේ, එක බිම්

[ගරු නිරෝෂන් පාදුක්ක]

ප්‍රමාණයක්. රජයෙන් දෙන ප්ලෑන් එකේ තිබෙන්නේ තව එකක්. කොයිකද අනුමත කරන්නේ? තවමත් UDA එක අනුමත කරන්නේ නැහැ රජයෙන් දෙන බිම් කට්ටි සැලැස්ම. බිම් සවිය. ඒ නිසා මේ වාගේ ප්‍රායෝගික ප්‍රශ්න මේ තිරය යට තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේවා පිළිබඳව මම වඩාත් විශ්වාස කරනවා, වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දෙන්න නාගරික සංවර්ධන අධිකාරිය මේ බලතල ගත්තත්, මේක ක්‍රියාත්මක කරන ස්ථානය නගර සභාව, ප්‍රාදේශීය සභාව විය යුතුයි. නැත්නම් ජනතාවට UDA එකට යන්න වෙනවා. ජනතාවට UDA එකට යන්න බැහැ. ඒ සඳහා පළාත් පාලන ආයතනය හරහා සියලු බලතල ගන්නවා නම්, අරගෙන කරන කොට නිර්ණායක පිළිබඳව තීන්දු කිරීමේදී ප්‍රදේශයට දෙන්න. සමහර තැන් තිබෙනවා කාණු පද්ධතියක් ඕනෑ. කාණු පද්ධතිය සම්බන්ධ කරන්න තැනක් නැහැ. ඒක වෙල් යායට ගෙනියන්න ඕනෑ. වෙළට ගෙනිය කොට කුඹුරු අයිතිකරුවන් විරුද්ධ වෙනවා. එතකොට මේවා පිළිබඳව නිර්ණායක, තීන්දු ගන්න ජනතාවට වඩාත් කාර්යක්ෂම වෙන්නේ කොහොමද? මෙන්න මේ කාරණා පිළිබඳව අපි දැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඒ නිසා යෝජනාව හොඳයි. තාත්විකයි. ප්‍රායෝගිකයි. වංචාව, දූෂණය අඩු කිරීම සම්බන්ධයෙන් නම් වඩාත් හොඳයි. මේ රටේ ආයෝජන එන්න ඕනෑ. වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දීමට නම් මේක හොඳයි. හැබැයි, ඒත් එක්කම නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරිගෙයි, පරිසර අධිකාරියේ නිලධාරිගෙයි Tax File අල්ලන්න කිව්වොත් නම් ඉතිහාසයේ ලොකු Tax File ටිකක් අල්ලන්න වෙනවා. බයිසිකලේ ආපු UDA Officer ගෙදර ගියේ මර්සිඩීස් හරහා. එවැනි ඉතිහාසයක් අතීතයේ ලංකාව පුරා තිබෙනවා. මේකෙන් නිලධාරී වාදය උඩට දානවා නම්, ඒකටත් අපි කැමැති නැහැ. මේකෙන් නිලධාරීන්ට බලය ගිහිල්ලා ජනතාවට ඇහුම්කන් දෙන්නේ නැති ආයතනයක් බවට මේක පත් වෙනවා නම්, ඒක බරපතළයි. මේකේ තිබෙන අවධානම් තත්ත්වය සහ මේකේ තිබෙන සුභදායී තත්ත්වය දෙකම පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඔබතුමා හරහා අදාළ අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.29]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. රසික මංජුල බුද්ධදාස මැතිතුමා, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධන) පනතෙන් පවරු බලතල බොහොම හොඳට භුක්ති විඳපු, කඩුවෙල මහ නගර සභාවේ හිටපු නගරාධිපතිතුමාගේ ආදරණීය පුත්‍ර රත්නය මංජුල බුද්ධදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරපු යෝජනාවට අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම කනගාටු වෙනවා පළාත් පාලන ආයතනයක හිටපු නියෝජිතයෙක් විධියට නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කථාව පිළිබඳව. එතුමා තරමක් කැමැතියි වාගේ මේක UDA එකට ගන්නවාට. හැබැයි අපි නම් එහෙම කැමැති නැහැ. ඒක මුලින්ම කියන්න ඕනෑ. එතුමා කථා කළේ, මේකෙන් නගර සභා ඇතුළේ හොරු බිහි වෙලා තිබෙනවා. ප්‍රාදේශීය සභා ඇතුළේ හොරු බිහි වෙලා තිබෙනවා කියලා. ඉතින් මේක හොරු අල්ලන ආණ්ඩුවක්. හොරු අල්ලන්න පුළුවන්. ඒ නිසා මේ සරල කාරණය ගන්නේ නැතුව මේකේ ගැඹුරු කාරණය අරගෙන සාකච්ඡා කළොත් තමයි මේ ප්‍රශ්නයට උත්තරය සොයා ගන්න වෙන්නේ කියන කාරණය මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි හැමෝම දන්නවා 1970 බලයට ආපු සමගි පෙරමුණු ආණ්ඩුව පංච මහ බලය ගැන විශ්වාසය තියලා තමයි ඉස්සරහාට ආවේ. ඇවිල්ලා ඒ ආණ්ඩුව ක්‍රියාත්මක වුණේ සංවෘත්ත ආර්ථිකයක් සහිතව. මිනිස්සු හැමෝම කිව්වා, දේශීය චින්තනයක් යටතේ, දේශීය කර්මාන්තකාරයන්ට මුල්තැන දීලා, දේශීය ආයෝජකයෝ ගැන හිතලා, දේශීය ව්‍යවසායකයෝ ගැන හිතලා, දේශීයත්වය මුල් කරගෙන තමයි රටේ පාලනය ගෙන ගියේ. සමහරු කිව්වා, මේක රට ඉස්සරහාට යන්න තිබෙන බාධාවක් කියලා. රටේ සංවර්ධනය තරමක් ඇණ හිටලා තිබෙන්නේ කියලා. ඒ නිසා 1977 දී රටේ මිනිස්සු හයෙන් පහක බලයක් දීලා, දැවැන්ත බලයක් සහිත ආණ්ඩුවක් බිහි කළා. ඒ ආණ්ඩුවට දැවැන්ත බලයක් තිබුණා. හයෙන් පහක බලයක් තිබුණා. 78 ආණ්ඩුව බලයට ආවට පස්සේ ඒ ආණ්ඩුව මේ රටේ ආර්ථිකය, නිදහස් ආර්ථිකයක් බවට පත් කළා. මේ රටේ ආර්ථික

විවෘත කළා. විවෘත ආර්ථිකයක් බවට පත් වුණා. මේ විවෘත ආර්ථික රටාව ඇතුළේ මේ රටට ආයෝජනය ගෙන එන්න, ඒ ආයෝජන මේ රට ඇතුළේ ක්‍රියාත්මක කරන්න, ඒ ආයෝජනවලට ඉඩම් පවරා ගන්න, ඒ ඉඩම්වල කර්මාන්ත ඇති කරන්න තිබුණු විවිධ බාධක අතහැරලා දාන්න තමයි ජාතික රාජ්‍ය සභාවට 1978 අංක 41 කියන නාගරික සංවර්ධන අධිකාරී පනත ගෙන ආවේ. මේ පනත ගෙන ආවාට පස්සේ එවකට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ පළාත් පාලන සහ නාගරික සංවර්ධන ඇමැතිවරයා වෙලා හිටපු රණසිංහ ප්‍රේමදාස මැතිතුමා, එතුමාට ඉතිහාසයේ දීලා තිබෙන තැන කුමක් වුවත්, එතුමා නාගරික සංවර්ධනය වාගේම පළාත් පාලනය පිළිබඳව පැහැදිලි දැක්මක් සහ අවබෝධයක් තිබුණු නායකයෙක් කියලා මේ රටේ සියලු දෙනා පිළිගන්නවා. අපට මතකයි ග්‍රාමීය නායකයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය එතුමා ඇඹිලිපිටියේ හැදුවා. හදලා පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයෝ ගෙනිහිල්ලා පුහුණු කරලා, පළාත් පාලන බලය භුක්ති විඳීම පිළිබඳව දැවැන්ත කාර්ය භාරයක් එතුමා විසින් කළා. එතුමා මේ පනතට සංශෝධන දෙකක් ගෙන ආවා. එකක් ගෙන ආවා 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරී සංශෝධන පනත කියලා.

ඒ වාගේම තවත් පාරක් සංශෝධනයක් ගෙන ආවා. ඒ සංශෝධනය 1984 අංක 44 දරන නාගරික සංවර්ධන අධිකාරී විශේෂ විධිවිධාන සංශෝධන පනත. මේ පනත් දෙක හරහාම එතුමා සිද්ධ කළේ, නාගරික සංවර්ධන අධිකාරී පනතේ තිබුණු බලතල පළාත් පාලන ආයතනවලට භුක්ති විඳින්න පුළුවන් නීතිමය ප්‍රතිපාදන සකස් කිරීමයි. ඒ නීතිමය ප්‍රතිපාදන තමයි 1985 මාර්තු මාසේ 01 වැනිදා චක්‍රලේඛයක් හරහා පළාත් පාලන ආයතනවලට යවලා, ඒ බලතල භුක්ති විඳීමේ අයිතිය දුන්නේ. මේකේදී බලතල රාශියක් දුන්නා. ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීම. ඒවා සම්බන්ධයෙන් නීතිමය ප්‍රශ්න එනවා නම් අධිකරණයට නඩු ඉදිරිපත් කරන්න, ඒ නඩුවලට අවශ්‍ය නීතිමය කටයුතු සලස්වන්න. සියලු බලතල දුන්නා. මේ බලතල තමයි දිගින් දිගට පළාත් පාලන ආයතන භුක්ති විඳගෙන ආවේ. මේක පළාත් පාලන ආයතන සතු විය යුතු බලතලයක්. හැබැයි අවාසනාවකට පළාත් පාලන ආයතන විසින් එවකට නාගරික සංවර්ධන අධිකාරී පනත කොයි විධියට සම්මත කරලා තිබුණත්, පළාත් පාලන ආයතන විසින් තමන්ගේ බල ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් විධියට සභා සම්මත කරපු යෝජනාවක් අනුව තමයි නාගරික සංවර්ධන අධිකාරී නීතිය වැළඳ ගන්නේ.

අපේ රටේ විශේෂයෙන්ම බස්නාහිර පළාතේත් 75% ක් බල ප්‍රදේශ අද නාගරික සංවර්ධන අධිකාරී නීතිය යටතට යන බල ප්‍රදේශ විධියට පත් කරගෙන තිබෙන්නේ පළාත් පාලන ආයතන විසින්මයි. පළාත් පාලන ආයතන විසින්මයි ඒ කටයුත්ත කරලා තිබෙන්නේ. එහෙම කරලා තිබෙන්නේ කාර්යක්ෂම සේවයක් දෙන්න තමයි. කාර්යක්ෂම සේවයක් ලබා දෙන්න අවශ්‍ය නිසා තමයි පළාත් පාලන ආයතන ඒ කටයුත්ත කළේ. ඒ නිසාම තමයි මේ ප්‍රශ්නය මතු වෙන්නෙත්. නාගරික සංවර්ධන අධිකාරිය නැවත වතාවක් ඒක අහෝසි කරලා, 2016.12.06 වැනිදා රැස් වුණු කළමනාකරණ මණ්ඩලය ගත්තු තීන්දුවක් මේක. ඒ තීන්දුව තමයි ඒ අය ලිපියක් විධියට එවන්නේ. චක්‍රලේඛයක් විධියට එවන්නේ. ඒ තීන්දුව අරගෙන මේක එවන්න පුළුවන් වෙලා තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතට වැටෙන බල ප්‍රදේශ විධියට මේ බල ප්‍රදේශ අප විසින්ම පත් කර ගත්තු නිසා. දැන් අද ඒ භුක්ති විඳින දැවැන්ත බලය මේ චක්‍රලේඛය නිසා අහෝසි වෙලා තිබෙනවා. හැබැයි මම විශ්වාස කරන්නේ නැහැ මේක පාර්ලිමේන්තුවට තිබුණු උවමනාවක් කියලා. මේක නාගරික සංවර්ධන විෂයය භාරව හිටපු ඇමැතිතුමාට තිබුණු උවමනාවකුත් නොවෙයි. නාගරික සංවර්ධන අධිකාරියට අද පත් වෙලා ඉන්න සභාපතිවරයාට තිබෙන පෞද්ගලික උවමනාවක් මත තමයි මේක සිද්ධ වෙලා තිබෙන්නේ. එතුමාගේ ඉඩම් කට්ටි සැලසුම අනුමත කර ගන්න පළාත් පාලන ආයතනයකට ගියාම එතුමාට පෞද්ගලිකව කරපු හිරිහැරයක් නිසා, එතුමා පෞද්ගලිකව පලිය ගන්න මේ කාරණය ඉෂ්ට කළා කියන මතය තමයි නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළේ තිබෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළේ ඉන්න නිලධාරීන් කිසිම කෙනෙක් මේ චක්‍රලේඛය ක්‍රියාත්මක වෙනවාට කැමැති වෙන්නේ නැහැ. ඒකට ප්‍රධාන කාරණය තමයි මේ චක්‍රලේඛය හරහා ක්‍රියාත්මක වෙන්න තිබෙන සියලු කාරණා ඉෂ්ට වෙන්න පුළුවන් Mechanism එක, යාන්ත්‍රණය තිබෙන්නේ පළාත් පාලන ආයතන ඇතුළේ. පළාත් පාලන ආයතන භාර ඇමැතිවරයා අපේ ප්‍රධාන ඇමැතිවරයා. ඒ නිසා අපේ ප්‍රධාන ඇමැතිවරයා නැවත වතාවක් චක්‍රලේඛයක් එවලා පළාත් පාලන

**0177**

[ගරු මහේෂ් අල්මේදා]

ආයතනවලට කිව්වොත්, මේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන කටයුතු එකකටවත් පළාත් පාලන ආයතනවල ඉන්න නිලධාරීන් සම්බන්ධ වෙන්න එපාය කියලා, මේ චක්‍රලේඛය ක්‍රියාත්මක කර ගන්න බැහැ. මේ චක්‍රලේඛය යටතේ ක්‍රියාත්මක වන සියලු නිලධාරීන් ඉන්නේ පළාත් පාලන ආයතන ඇතුළේ. ඒක නිසා මේක නතර කරන්න අවශ්‍ය කටයුතු මහ ඇමතිවරයා සම්බන්ධ වෙලා කළ යුතුව තිබෙනවා. එහෙම නැත්නම් පළාත් පාලන ආයතන දැඩි අපහසුතාවයකට පත් වෙනවා. පළමුවන එක තමයි ඉඩම් පෙරසවි ගාස්තුව. ඉඩම් ප්‍රඥප්තිය අනුමත කරන්න ආවාම, ගොඩනැගිලි ඉදි කරන්න ආවාම පෙරසවි ගාස්තු විධියට පළාත් පාලන ආයතනවලට ගෙවන ගාස්තුව, මේ චක්‍රලේඛය ක්‍රියාත්මක වුණොත් පළාත් පාලන ආයතනවලට අය කරන්න බැරුව යනවා.

ඒ වාගේම තමයි පළාත් පාලන ආයතනවලට ඉඩම් කට්ටි අනු බෙදුම් කළාට පස්සේ ඒ ගෙවන මුදල්වලින් 1% ක් අයිතියි කියලා නීතියක් සම්මත වෙලා තිබෙනවා. ඒ නීතිය ආපහු අහෝසි කළොත් ඒ ගාස්තුව පළාත් පාලන ආයතනවලට එන්නේ නැහැ. පළාත් පාලන ආයතනවල ආදායම් මේක නිසා බරපතළ විධියට අහෝසි වෙනවා. ඒ වාගේම තමයි නාගරික සංවර්ධන අධිකාරියේ බිම් කට්ටියක් සැලසුම් අනුමත කරන්න ගියාට පස්සේ, ඒක පරීක්ෂා කරන්න යන්න ඒ අයට නිලධාරීන් රට පුරා ඇත්තේ නැහැ. නාගරික සංවර්ධන අධිකාරියට අවශ්‍ය තරම් කාර්මික නිලධාරීන් ඇත්තේ නැහැ. පළාත් පාලන ආයතනවල කාර්මික නිලධාරීන් ඉන්නේ. කොහොමද ගිහිල්ලා නාගරික සංවර්ධන අධිකාරියේ බිම් කට්ටි සැලසුම් පරීක්ෂා කරන්නේ? ඒවා පරීක්ෂා කරන්න අවශ්‍ය කරන යාන්ත්‍රණය නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළේ නැහැ. ඊට සහයෝගය ඉල්ලන්න වෙන්නේ මෙතැනින්. බැරි වෙලා හරි ඒ සහයෝගය නොදීම නිසා ඔවුන් බිම් කට්ටි සැලසුම් අනුමත කරන්න ගියොත්, නියමිත වාර්තා ගන්නේ නැතුව, පාරක් තිබෙන්නේ කොහේද? පොදු පහසුකම් ඉඩමක් තිබෙන්නේ කොහේද? ජලය බහින්නේ කොතැනින්ද? කාණු පද්ධති තියන්න ඕනෑ කොතැනින්ද? ඒ කිසිම කාරණාවක් ගැන සැලකිල්ලක් නැතුව තමයි බිම් කට්ටි සැලසුම් අනුමත කරන්න වෙන්නේ. ඒ නිසා මෙහෙම ඉඩම් සැලසුම් අනුමත කරන්න ගියොත් මහජනතාව බරපතළ අපහසුතාවයකට පත් වෙයි. ඒ නිසා

**0178**

බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. කවුද මේ සැලසුම් අනුමත කළාට පස්සේ ඒ පාරවල් නඩත්තු කරන්නේ. පළාත් පාලන ආයතන නොවේ නම්. කොතැනද අපි පොදු පහසුකම් ඉඩම හොයා ගන්නේ? අපි දන්නවා. පළාත් පාලන ආයතන ගිහිල්ලා පරීක්ෂා කරද්දී ගොඩක් වෙලාවට එහි තිබෙන හොඳම ඉඩමක් සොයා ගන්නවා පොදු පහසුකම් සඳහා. දරුවන්ට ළමා ක්‍රීඩා පිටියක් හදලා දෙන්න. ප්‍රජා ශාලාවක් හදා ගන්න. ජනතාවට එකතු වෙන්න පුළුවන් තැනක් හදා ගන්න. ක්‍රීඩා පහසුකම්වලට තැනක් හදා ගන්න. මේ පොදු පහසුකම් ඉඩම බලපානවා. එහෙම පහසුකම් සහිත ඉඩමක් හදලා දෙන්නේ නැතුව බිම් කට්ටි සැලසුමක් හදලා, එතැන ජනාවාසයක් ඇති වුණොත් ඒ ජනාවාසය ඇතුළේ ජනතාවට ක්‍රීඩා කරන්නේ, ජනතාවට එකතු වෙන්න, දරුවන්ට සෙල්ලම් කරන්න තැන් නැති, ඉතාම සංකීර්ණ ඉඩම් සැලසුම් අනුමත කිරීමක් බවට ඒ තැන් පත් වෙනවා. ඒ නිසා විශාල විධියට අර්බුද, ගැටළු රාශියක් පරිසරය මත බිහි වන අවස්ථාවක් විධියට තමයි මේ චක්‍රලේඛය ක්‍රියාත්මක වීම තුළ නිර්මාණය වෙන්නේ. ඒ නිසා මේ චක්‍රලේඛය අහෝසි කරන්න ආණ්ඩුව මැදිහත් වෙලා කටයුතු කරන්න සිද්ධ වෙනවා.

අපි දන්නවා අද පළාත් පාලන ආයතන විසුරුවලා තිබෙන්නේ. එක පළාත් පාලන ආයතනයකවත් මහජන නියෝජිතයෝ නැහැ. මහජන නියෝජිතයෝ නැති වෙලාවේ ඇයි මේ චක්‍රලේඛය පළාත් පාලන ආයතනවලට ඇරියේ. අපට සැකයක් එනවා මෙතැනින් ඉස්සරහාට තව තව චක්‍රලේඛ හරහා පළාත් පාලන ආයතන සතු බලතල සියල්ල උදුරාගෙන ඊට පස්සේ තමයි ආණ්ඩුව මැතිවරණ තියන්න යන්නේ කියලා. ඒ කියන්සේ හිස් වුණු, බොල් වුණු පළාත් පාලන ව්‍යුහයක් රට ඇතුළේ නිර්මාණය කරන්න යනවා. ඒත් එක්කම දේශපාලන ප්‍රශ්නයක් මතු වෙනවා. අද මේ ආණ්ඩුව සංහිඳියා දේශපාලනයක් ගැන කථා කරනවා. මේ ආණ්ඩුව බලය බෙදීමේ දේශපාලනයක් ගැන කථා කරනවා. බලය බෙදීමේ දේශපාලනයේදී, බලය බෙදීමේ ඉතාම ශක්තිමත් ආයතනය බෙදුණු බලය ජනතාවට වඩා ශක්තිමත්ව භුක්ති විඳින්න තිබෙන ආයතනය තමයි පළාත් පාලන ආයතනය. මේක අකර්මන්‍ය කරලා, මේකේ අඩු කඩලා දාලා, මේ ආයතනය දියාරු කරලා නම් බලය බෙදීම මේ රට ඇතුළේ ස්ථාපිත කරන්න හදන්නේ, ඒ බලය මහජනතාවට භුක්ති විඳින්න හම්බ වෙන්නේ නැහැ. මම දන්නේ නැහැ මේ සහෝදර

ජාතීන් මේක වැළඳ ගන්නේ කොහොමද කියලා. අපේ රටේ ජාතීන් ගණනාවක් ඉන්නවා. සමහර ජාතීන්වලට වෙන් වුණු බල ප්‍රදේශ තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය උතුරේ පළාත් පාලන ආයතනවලට මේ චක්‍රලේඛය යැව්වාට පස්සේ, නාගරික සංවර්ධන අධිකාරිය කොළඹ ඉඳලා නම් යාපනයේ පළාත් පාලන ආයතන පාලනය කරන්න යන්නේ, මේ රටේ නැවත වතාවක් දැවැන්ත අර්බුදයක් නිර්මාණය වෙනවා. ඒ නිසා දේශපාලනය ගැන කල්පනා කරන්නේ නැතුව, රටේ ජනයාගේ සංහිඳියාව ගැන කල්පනා කරන්නේ නැතුව මේ චක්‍රලේඛය නිකුත් කිරීම බරපතළ දේශපාලන වැරැද්දක් විධයට අපි මතක් කරලා දෙන්න ඕනෑ. ඒ නිසා මේක විශාල අර්බුද ගණනාවකට රට ගෙන යන චක්‍රලේඛයක්. මෙවැනි චක්‍රලේඛ ඔළුවක් තිබෙන, මනසක් තිබෙන, සංහිඳියාව ගැන කල්පනා කරන ආණ්ඩුවක්, නායකයෙක්, දේශපාලඥයෙක්, පුරවැසියෙක් ඉදිරිපත් කරපු චක්‍රලේඛයක් විධියට මෙය පිළිගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යවරු ප්‍රධාන අමාත්‍ය සම්මේලනයේදී සාකච්ඡා කරලා මේ කාරණයට මැදිහත් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් මේක දේශපාලනික වශයෙන් මහා පාපයක් කරපු අවස්ථාවක් විධියට රට පුරා ක්‍රියාත්මක වෙනවා කියන කාරණය අපි දේශපාලන ක්‍රියාවලියේදී දේශපාලන වශයෙන් මතක් කරන්න ඕනෑ.

ඒ නිසා මේක බලය භුක්ති විඳින්න, පළාත් පාලන ආයතනවල මහජනයාට සමීපව සේවය කරන්න තිබෙන අවස්ථාවක් නැති කිරීමේ අවස්ථාවක් විධියට තමයි අපි දකින්නේ. අර මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අවිස්සාවෙල්ල එහා කෙළවරේ ඉන්න මිනිස්සුන්ට ඉඩම් සැලැස්මක් ඉදිරිපත් කරන්න කොළඹට එන්න සිද්ධ වෙනවා මේ අයගේ විරෝධතාවයක් මතු වුණොත් - අපි දන්නවා ඉඩම් කට්ටි සැලසුමක් අනුමත කරන්න යනකොට විරෝධතා පරීක්ෂණ අනන්ත අප්‍රමාණ ප්‍රමාණයක් එනවා. මේ විරෝධතා පරීක්ෂණ සියල්ල දැන් කරන්න වෙන්නේ කොළඹ. යාපනයේ මහ නගර සභාවේ ප්‍රශ්නයක් මතු වුණොත් විරෝධතාවය ඉදිරිපත් කරන්න කොළඹට එන්න වෙයි. කොළඹින් යන්න වෙයි විරෝධතාවය පරීක්ෂා කරන්න. කොළඹට ඇවිල්ලා කරුණු කියන්න වෙයි. ඒ නිසා මේ බලය එක තැනකට ඒකරාශී කරන තැනකට කිට්ටු වන චක්‍රලේඛයක් තමයි මේ නිකුත් කරලා



තිබෙන්නේ. මේක චක්‍රලේඛයක්. ඒ නිසා මේක වඩා බලසම්පන්න එකක් විධියට අපි සලකන්නේ නැහැ. ඒ නිසා අපේ ප්‍රධාන ඇමැතිවරයාට, රටේ පළාත් සභාවල ඉන්න පළාත් පාලන විෂයය භාර ඇමැතිවරුන්ට මේ චක්‍රලේඛයෙන් නිශේධනය කළ හැකි චක්‍රලේඛ නිකුත් කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා අපි මේ වෙලාවේ කියනවා මේ චක්‍රලේඛය නිශේධනය කරන්න පුළුවන් චක්‍රලේඛ පළාත් පාලන ආයතනවලට යවලා මේ චක්‍රලේඛ උපදෙස්වලට විරුද්ධව පළාත් පාලන බලය භුක්ති විඳින්න පුළුවන් විධියට තමන්ගේ බලය පාවිච්චි කරන්න නියෝග යැව්වොත්, මේ චක්‍රලේඛය අහෝසි කරන්න පුළුවන්. මේ චක්‍රලේඛය ක්‍රියාත්මක වීම දේශපාලනික වශයෙනුත්, මහජනතාවට ලැබෙන්න තිබෙන සේවා නොලැබී යෑමේ අවස්ථාවක් විධියටත් මේ චක්‍රලේඛය කටයුතු කරනවා. ඒ නිසා මේක අහෝසි කරන්න අපි සියලු දෙනා මැදිහත් විය යුතුයි කියන යෝජනාව සම්මත කරලා ආණ්ඩුවට යවලා මේ කාරණය කියලා දෙන්න ඕනෑ කියන එක මතක් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කවුරු හරි කියනවා නම්, මේ පළාත් පාලන ආයතන දීර්ඝ කාලයක් තිස්සේ හොරකම් කරපු නිසා, ඉඩම් කට්ටි සැලසුම් කරන්න මිනිස්සුන්ගෙන් සල්ලි ගත්තු නිසා තමයි මේ යෝජනා වෙන්නේ කියලා, ඒක කාගේ හරි අකාර්යක්ෂමතාවයක්. කාට හරි බැරි නම් කවුරු හරි මිනිස්සුන්ගෙන් සල්ලි ගන්න අය අල්ලා ගන්න, ඒ මිනිස්සුන්ට දඬුවම් කරන්න ඒක මේ චක්‍රලේඛය තිබුණත් කරන්න පුළුවන්කමක් නැහැ. අපි කියනවා නම් පළාත් පාලන ආයතනවල සල්ලි ගන්න අය නතර වෙලා දැන් මිනිස්සුන්ට සේවය සලසනවා කියලා, ඊට එහා කාරණයක් වෙයි. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ කථාවේ කිව්වා UDA එකේ ෆුට් බයිසිකලයේ ආපු කෙනා කාර් එකේ තමයි යන්නේ කියලා. ඒක තමයි නැවත නිර්මාණය වෙන්නේ. පළාත් පාලන ආයතන ඇතුළේ වුණු එක දැන් UDA එක ඇතුළේ වෙයි. කොළඹට එන්න තිබෙන නිසා, වැඩේ කරගන්න තිබෙන අමාරුව වැඩි නිසා වැඩි මුදලක් UDA එකේ නිලධාරීන් ගනියි. ඉඩම් කට්ටි සැලසුම් අනුමත කරලා දෙන්න. ඒ නිසා ජනතාව කබලෙන් ලිපට වැටෙන අවස්ථාවක් විධියට තමයි මේ චක්‍රලේඛය අපි දකින්නේ. ඒ නිසා මේක අහෝසි කරන්න සියලු දෙනා එක්සත්ව මැදිහත් විය යුතුයි කියන යෝජනාව කරමින්, මේ යෝජනාව සම්මත විය යුතුයි කියන කාරණය මතක්

[ගරු මහේෂ් අල්මේදා]

කරමින්, අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොමත්ම ස්තුතිය ගරු මන්ත්‍රීතුමා. මේ යෝජනාව සම්බන්ධව විශාල පිරිසක් අදහස් දක්වන්න ඉන්නවා. මොකද, පළාත් පාලන ආයතන නියෝජනය කරපු මන්ත්‍රීවරු විශාල පිරිසක් ඉන්න නිසා. ඒ නිසා සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා කාලය පිළිබඳව සැලකිලිමත්ව කථා කරන්නය කියන ඉල්ලීම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා. මේ අවස්ථාවේ සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 11.44]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ බොහොම කාලයකට පස්සේ මේ පළාත් සභාවේ වටිනා යෝජනාවක් ඉදිරිපත් වුණා. පළාත් සභාවට සෘජුව මැදිහත් වෙලා කථා කරන්න පුළුවන් යෝජනාවක්. පෞද්ගලික මම සන්තෝෂ වෙනවා. මාත් සමග සමකාලීනව සභාපති ධූරය දරපු මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉතා හොඳ වටිනා අදහසක් මේ සභාවට ඉදිරිපත් කළා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, මේ දැනුවත් කිරීම පිළිබඳව. විශේෂයෙන්ම එතුමාගේ කථාවේදී කිව්වා වාගේ අපි පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු, සභාපතිවරු හැටියට පත් වනකොට රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වයෙන් එදා තිබුණු රජය මේ පුහුණු කිරීම - මම හිතන්නේ විධිමත් ආකාරයෙන් පුහුණු කළා. ඒ පුහුණුව නිසා තමයි ආරම්භයක් හැටියට මහ නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත වාගේම අලුතෙන් බිහි වුණු 1987 අංක 15 කියන ප්‍රාදේශීය සභා පනත හරහා මහජනතාවට විධිමත් සේවාවක් ඉෂ්ට කරන්න පුළුවන් විධියට මේ සභාපතිවරු, මන්ත්‍රීවරු දැනුමෙන් සන්නද්ධ වුණේ. ඒක ආරම්භය. නමුත් කාලාන්තරයක් තිස්සේ එනකොට අර මෙතුමා කිව්වා වාගේ අපි දන්නෙත් නැහැ. සමහර අවස්ථාවලදී නාගරික සංවර්ධන අධිකාරියට අදාළ පළාත් පාලන බල ප්‍රදේශයේ, යම් යම් ප්‍රදේශ නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියට යටත් කරන්න සිද්ධ වුණා. ප්‍රාදේශීය සභාවේ, නගර සභාවේ මන්ත්‍රීවරුන්ගේ යෝජනාවලින්. ඒකේ ප්‍රතිවිපාකයක් හැටියට තමයි මේක අද අපි භුක්ති විඳින්නේ. සමහර අවස්ථාවලදී අපේ බල ප්‍රදේශයේ තිබෙන නගරය හොඳට නිර්මාණය කරගන්න ඕනෑ වුණාම, මේ ප්‍රදේශය අපට diktat කරලා, නාගරික සංවර්ධන අධිකාරියට දුන්නා. අර කිව්වා වාගේ මහජන නියෝජිතයෝ අද වන කොට මේ පළාත් පාලන ආයතනවල නැහැ. පළාත් පාලන ආයතනවල ඉන්නේ නිලධාරීන්. මේ නිලධාරීන් හරහා වෙන දේම, නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් හරහාත් ඉදිරියේ සිද්ධ වෙයි කියන බියක් අපට තිබෙනවා. මොකද, විශේෂයෙන්ම සාමාන්‍ය මිනිස්සුන්ට, පළාත් පාලන ආයතනය කියන්නේ, උත්පත්තියේ සිට මරණය දක්වාම ජනතාවට සමීප ආයතන යයි. දැන් මහජන නියෝජිතයනුත් නැති අවස්ථාවක මෙවැනි කටයුත්තක් කරන්න ගියාම, කොළඹින් පාලනය කරන පිරිසක් එක්ක කටයුතු කරන්න ගියාම මේ රටේ සාමාන්‍ය ජනතාව, පුරවැසියන් මේ ප්‍රාදේශීය සභාවෙන්, නගර සභාවෙන්, පළාත් පාලන ආයතනයෙන් සේවාව බලාපොරොත්තු වන ජනතාව මොනතරම් අසීරුතාවයට පත් වෙනවාද කියන එක ආයේ අමුතුවෙන්, දෙපාරක් කථා කරන්න උවමනාවක් වන්නේ නැහැ.

අද මේ රටේ, විශේෂයෙන්ම මේ බස්නාහිර පළාතේ දැවෙන ප්‍රශ්නයක් තිබෙනවා. කුණු ප්‍රශ්නය. කැළි කසළ ප්‍රශ්නය පිළිබඳව අපි අවුරුදු ගණනාවක් තිස්සේ දිගින් දිගට, දිගින් දිගට කථා කරගෙන එනවා. නාගරික සංවර්ධන අධිකාරියවත්, එහෙමත් නැත්නම් අද වන කොට මහ නගර සංවර්ධන අමාත්‍යාංශය හරහාවත්, පහත් බිම් සංවර්ධන මණ්ඩලය අයිති අමාත්‍යාංශය. මේ ගැන පළාත් සභාවට සහයෝගයක් දෙන්නේ නැහැ. තවම මීතොටමුල්ලේ කුණු ගොඩ එහෙම්මමයි. තවමත් එහෙම්මමයි. මේ පළාත් පාලන ආයතන සතුව නිවැරදිව ක්‍රියා කරන්න ඕනෑ කරන බලතල පාවිච්චි කරලා ක්‍රියා කරන්න, ඒ දෙන උපදෙසක්වත් අපට දෙන්නේ නැහැ. ඒ නිසා විශාල අසීරුතාවයකට පත් වෙලා තිබෙනවා. නමුත් අද වෙනත් මාර්ගයකින් - මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ. කිසිම කරීකාවක් මේ සම්බන්ධයෙන් කළේ නැහැ. මහජන අදහසක් විමසුවේ නැහැ. මහජන නියෝජිතයන් හිටියාට අද ඉන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුයි මේ පළාත් සභාවේ නියෝජිතයනුයි විතරයි. පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු නැහැ. මම හිතන්නේ මේ පිළිබඳව ඒ ආයතන

දෙකෙන්වත්, අඩුම තරමින් මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගෙන්වත් මෙය කරන එක හොඳද නරකද කියලා අදහසක් විමසුවේ නැහැ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වේ, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාට වුණු පෞද්ගලික හේතුවක් නිසා එතුමා මේ කටයුත්තට හරියට නිකන් හිට්ලර් වාගේ මැදිහත් වෙලා ඉන්නවා. එතකොට අදාළ ඇමැතිවරයා දන්නේ නැත්නම්, අදාළ පළාත් සභාවේ මහ ඇමැතිවරයා දන්නේ නැත්නම්, පළාත් පාලන විෂයය භාර ඇමැතිවරයා දන්නේ නැතුව නිලධාරියෙකුට උවමනා විධියට මේ විධියට නීතිරීති සකස් කර මෙය ගන්නවා නම්, ඒක ඉතාම බරපතළ වරදක්. අර කිව්වා වාගේ මේකේ සමහර දේවල් තිබෙනවා, පළාත් පාලන ආයතනවලට අවශ්‍ය නැති දේවල්. එහෙම නැත්නම් ඒ පිළිබඳව උවමනා කරන නිලධාරීන් නැහැ, තාත්ෂණ දැනීම තිබෙන. එහෙමත් නැත්නම් පළාත් පාලන විෂයෙහි - ඒ වාගේ දේවල් මේකට සාකච්ඡා කරලා ඒ බලතල පවරා ගත්තාට කමක් නැහැ. මේකේ තිබෙනවා - දැන් විශේෂයෙන් අපේ පළාත ගත්තොත්, වත්තල ප්‍රාදේශීය සභාව. තොටලඟ පැලියගොඩ සිට මුහුදුබඩ තීරයේ, සම්පූර්ණ මායිමක් යන්නේ මුහුදුබඩ තීරයේ. එතකොට අනුමැතියක් නැතිව වෙරළ සංරක්ෂණයේ සහයෝගයක් නැතිව පළාත් පාලන ආයතනයට ඒක ක්‍රියාත්මක කරන්න අමාරුයි. ඒ වාගේ දේවල්වලට සහයෝගය ගත්තාට කිසි ප්‍රශ්නයක් නැහැ.

නමුත් මේක හිතන්න. ඉඩම් කට්ටි කරන කොට, සාමාන්‍ය ජනතාවගේ ගොඩනැගිලි ඉල්ලුම් පත්‍රය මාස ගණනක් පරක්කු වන එක තවත් මාස හයකින් විතර දීර්ඝ කරන කොට මොනතරම් අපහසුතාවට මිනිස්සු පත් වෙනවාද? මට තේරෙන්නේ නැහැ, මේක විධිමත් විධියට මේ සභාවට දාලා සාකච්ඡා කරන්නේ නැතිව අත්තනෝමතික විධියට මේ කටයුතු කරන්න සභාපතිවරයා හෝ නිලධාරී ක්‍රියාත්මක වුණේ ඇයි කියලා. මොකද, දැනටත් UDA එක සම්බන්ධයෙන් අපේ ආයතනවල තිබෙන්නේ එපමණ හොඳ චිත්‍රයක් නොවෙයි. සාමාන්‍ය ජනතාව තමන්ගේ ඉඩමක් කැබලි කර ගන්න, තමන්ගේ දරුවන්ට දෙන්න, තමන්ගේ දරුවන්ට ඒ ඉඩම දෙන්න - මම හොඳටම පැහැදිලිව දන්න දෙයක් කියන්නේ. දරුවෝ තුන් දෙනෙක්, හතර දෙනෙක් ඉන්න පියෙක් - ඒකත් යනවා. මාස ගණනක් පරක්කු කරනවා. ගොඩනැගිල්ල අනුමත කරගන්න ගියාම මාස ගණනක් පරක්කු කරනවා. දැන් සමහරවිට කියයි පළාත් පාලන ඡන්ද තිබුණා නම්, මෙහෙම ප්‍රශ්න වෙන්නේ නැහැයි කියලා. හැබැයි, මේ තත්ත්වය ඇති වන්නත් පසුගිය කාලයේ හිටපු පළාත් පාලන ආයතනවල සභාපතිවරු මූලිකවම වගකියන්න ඕනෑ. නායකයෝ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නිලධාරීනුත් ඉන්නවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නිලධාරීනුත් ඉන්නවා. මහජන නියෝජිතයනුත් ඉන්නවා. ඒක නිසා තමයි මේ කරීකාවක් නිර්මාණය වෙලා, මේ විධියට යන්නේ. ඒකට උවමනා කරන උඩගෙඩි ටික ලබා දුන්නේ අපිම තමයි. ඒක නිසා මේ පිළිබඳව මම හිතන්නේ පළාත් සභාවේ මහ ඇමැතිවරයාට කරන්න පුළුවන් නීතිමය බලතල තිබෙනවා. මෙතැන නීතිමය බලතල දාලා අනුමත කර ගත්තාට පළාත් සභාවක් හැටියට පළාත් පාලන ආයතනයකට කරන්න පුළුවන් විධිවිධාන තිබෙනවා. ඒ විධිවිධාන කියන්න ගියොත් එහෙම විශාල කළබගෑනියක් වෙන්නේ. මේක තවත් කබලෙන් ලිපට වැටීමක්.

ඒක නිසා පෞද්ගලිකව පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙක් හැටියට - දැන් මේකේ සමහර දේවල් තිබෙනවා. අධිවේගී මාර්ගය සම්බන්ධයෙන් ඉඩම්වලට, මධ්‍යම පරිසර අධිකාරියේ තැනකට ජාතික ගොඩනැගිලි පර්යේෂණ - ඒ වාගේ දේවල් පවරා ගත්තා කියලා - සම්පූර්ණයෙන්ම නොවෙයි. ඒක පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා හෝ ඉන්න අයත් එක්ක සම්බන්ධ වෙලා කරන්න ඕනෑ. තනිකර ඒකාධිකාරී බලයක් නාගරික සංවර්ධන අධිකාරියට දීම ගැන මම සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ඒක නිසා මම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. සමහර වෙලාවට මේකේ හොඳ දේවල්, නරක දේවල් කියලා දෙකක් තිබෙනවා. හැබැයි,සමස්තයක් විධියට ගත්තාම ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ සංකල්පය වුණේ ග්‍රාම රාජ්‍ය හදන්න. ඒ ග්‍රාම රාජ්‍ය හදන්න ඕනෑ නිසා තමයි ඉඩම් ටික විකිණෙන කොට ඒකේ තිබෙන ප්‍රතිශතය පළාත් පාලන ආයතනයට

[ගරු සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා]

ලැබෙන්න සැලැස්සුවේ. උසාවියේ දඩ ගහන කොට ඒකේ තිබෙන ප්‍රතිශතය ප්‍රාදේශීය සභාවට ලැබෙන්න සැලැස්සුවේ. සමහර වෙලාවට අපි ඒවා පළාත් සභාවට දුන්නා. ඒක වෙනම කතන්දරයක්. නමුත් ප්‍රාදේශීය සභා, නගර සභා පළාත් පාලන ආයතන ශක්තිමත් කරන්න ඕනෑ කරන මූලික වැඩ පිළිවෙළ එදා හැදුවා. ඒක තමයි ග්‍රාම රාජ්‍ය සංකල්පය. ඒ තුළින් තමයි ඇත්ත වශයෙන්ම අද ඔය පාර්ලිමේන්තුවේ ඇමැතිකම් දරන මන්ත්‍රීවරු, මේ පළාත් සභාවේ ඉන්න බොහෝ දෙනෙක් මෙතැනින් පටන් ගත්ත අය. සමහර අය එතැන්ට ගියාට පස්සේ, මේක පිළිබඳව කථා කරන්නේ, ඉතාමත් දෝෂ දර්ශීව. ඒක නිසා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලනවා. මේ සභාවේ විවිධ දේශපාලන මතිමතාන්තර දරන්න පුළුවන්. නමුත් මේ ප්‍රශ්නය, මහජනතාව කෙළින්ම පීඩාවට පත් වන ප්‍රශ්නයක්. ඒ නිසා පළාත් සභාව හරහා අපේ යුතුකමක් තිබෙනවා. අපේ තිබෙන බලතල කොහේටවත් දෙන්න උමනාවක් නැහැ. මේ පළාත් සභාව ඒක අවස්ථා කිහිපයකදීම කළා. පසුගිය අවස්ථාවලදී.

විශේෂයෙන්ම පළාත් සභාව සතු බලතල නිකන් වට්ටියේ තියලා පූජා කෙරුවා. ඒවාට කවුරුත් කථා කළේ නැහැ. නමුත් හරි දේ හරි වෙලාවට කරන්න, තීරණය කරන්න ඕනෑ. ඒ නිසා මම ඉල්ලා සිටිනවා. කවුරු කොයි විදියට ආණ්ඩු කෙරුවත්, කොයි ඇමැතිවරයා සිටියත් අපි දන්නවා, අපට වම්පික රණවක ගරු ඇමැතිතුමා පිළිබඳව ඉතා හොඳ චිත්‍රයක් තිබෙනවා. ඔහුගේ වැඩ පිළිවෙළ පිළිබඳව. (බාධා කිරීමක්) එතුමාගේ වැඩ පිළිවෙළ පිළිබඳව ඇත්ත වශයෙන්ම මේ පළාත් පාලන ආයතනත් එක්ක සම්බන්ධ වෙලා කරන්න පුළුවන් වැඩ හුඟක් එතුමාගේ අමාත්‍යාංශය හරහා තිබෙනවා. හැබැයි, ඒකාධිපති බලයක් පාවිච්චි කරලා, එතුමා යටතේ තිබෙන ආයතනයකට මේ සියලු බලතල පවරනවා කියන එක පිළිබඳව මම හිතන්නේ එතුමා මේ ගැන හරියට දන්වා නම් කොයිම අවස්ථාවකවත් එතුමා ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා අපි පළාත් සභාව හරහා නිසි දැනුවත් කිරීමක් කරන්න ඕනෑ. පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස් මේ විදියට ඉදිරිපත් වුණා. මේවා මේ හැන්සාඩ් එකේ පුස් කන්න නොවෙයි. ජනතාව අතරට ගිහිල්ලා වැදගත් විදියට කතිකාවක් ඇති කරලා, මොකක්ද දෙන්න ඕනෑ දේ? සීසර්ගේ දේ සීසර්ටයි දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේට දෙන්නයි කියලා තමයි එදා කිව්වේ. ඒ නිසා මේක සීසර්ට අයිති දේ ද, දෙවියන් වහන්සේට අයිති දේ ද කියලා තීරණය කරලා, ඒ පිළිබඳව සාකච්ඡාවක් කරලා මේ තීරණය ගන්නය කියලා ඉල්ලීමක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි. සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට නැවත නැවතත් කියනවා කාලය පිළිබඳව හිතන්න කියලා. ගරු සභානායකතුමාටයි, ගරු සභා කටයුතු අමාත්‍යතුමාටයි මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. බොහොම වටිනා කියන කතිකාවතක් මේ සභාවේ යන්නේ. ඒ නිසා අනික් ගරු ඇමැතිවරුන්ගෙත් අවධානය යොමු කරවන්න ඔබතුමන්ලා කටයුතු කරයි කියලා මම විශ්වාස කරනවා. මූලාසනය වශයෙන් මම එය හිතනවා. උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.54]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් අපේ මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව සම්බන්ධයෙන් එතුමාට අපේ ප්‍රශංසාව පුද කරනවා. සාමාන්‍යයෙන් කථාවට අපි ආරම්භ කරන්නේ, පණ්ඩුකාභය රජ යුගයේ තිබුණු මේ පාලන ක්‍රමය නැවත ගම තුළට ගේන්නට ඕනෑ. බලය බෙදා හරින්න ඕනෑ කියලා තමයි මේ ක්‍රමය ආරම්භ වුණේ. 1987 අංක 15 දරන පනත යටතේ මේ පළාත් පාලන ආයතන පිහිටෙව්වා. හැබැයි පිහිටවපු දවසේ සිටම මෙය කඩාකප්පල් කිරීම, යම්කිසි කප්පාදු කිරීම් තමයි සිද්ධ වුණේ. තිබුණු නගර සභා ක්‍රමය අහෝසි වුණා. සුළු නගර සභා ක්‍රමය අහෝසි වුණා. ජලය ටික අහිමි වුණා. විදුලිය දෙන එක අහිමි වෙලා මෙහෙම කරුණු කාරණා ගණනාවක් ගැලවිලා මේ පළාත් පාලන ආයතනයේ යම් ප්‍රමාණයකට නිරත වෙමින් තමයි ඉදිරියට ගලාගෙන ගියේ. ඒ නිසා අද අපි කනගාටු වෙනවා, ඒ පළාත් පාලන ආයතනවල හිටපු අයත්, සමහර අනික් අයත් කරන චෝදනා පිළිබඳව. ඒ චෝදනා කරන කොට අපටත් යම්කිසි හැඟීමක් තිබෙනවා. අපි හොරු බවට පත් වෙමින් තමයි මේ කථා කරන්න වෙලා තිබෙන්නේ. මොකද, අපිත් මේ පළාත් පාලන ආයතනවල ඉඳලා,

මහජනතාවගේ විශ්වාසය දිනාගෙන අද මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. හැබැයි, ඇඟිල්ල දික් කරන කොට අපටත් ඇඟිල්ල දික් වෙනවා. හොරු නිසා තමයි මේ දේ වුණේ කියලා. ඒ නිසා මේ දේශපාලන වශයෙන් හෝ මේ උඩින් අත ගාලා මේ ප්‍රශ්නය දිහා බලන්න පුළුවන්කමක් නැහැ. රටක වරදක් වෙනවා නම්, වැරැදි වෙනවා නම්, ඒවා නිවැරැදි කරන්න ආයතන තිබෙනවා. ඒ තුළින් කටයුතු කරනවා ඇරෙන්න. හැබැයි මට තිබෙන කනගාටුව තමයි, ප්‍රාදේශීය සභා අර්ථකථනය වන කොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා කියන්නේ, විධායක බලය හොබවන පුද්ගලයා. විශ්වාසභංග යෝජනාවකින්වත් ඔහුව ගෙදර යවන්න බැහැ. ඒ තරම් බලතල තිබෙන කෙනෙක් තමයි ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා. ඔහුට අභිමතයක් තිබෙනවා. ඒ අභිමතය ප්‍රදේශයේ ජනතාව කෙරෙහි පාවිච්චි කරන්න පුළුවන්. සානුකම්පිත භාවය ඔහුට තිබෙනවා. ජනතාව වෙනුවෙන් ඒක පාවිච්චි කරන්න පුළුවන්. අපට අභිනියෝජන බලයක් තිබුණා. අපි නොදැන හෝ දැනුවත්ව මේ නාගරික පනතට මේ ප්‍රදේශ ගත්තාට පස්සේ අභිනියෝජන බලය අපට තිබුණා. අපි ඒ අභිනියෝජන බලය පාවිච්චි කරමින් ප්‍රදේශයේ ජනතාවට ඒ සේවය ලබා දුන්නා. ගැටුමක් ඇති නොවෙන්නට.

නමුත් මේ වන විට ඒ අභිනියෝජන බලය, ඔවුන් විසින් පවරපු බලය නැවත අරගෙන තිබෙනවා. ඒක නිසා පවරපු දෙයක් ආපසු ගැනීම සම්බන්ධයෙන් අපට සදාචාරාත්මක වශයෙන් ගැටලුවක් තිබුණත් රටක් වශයෙන් සංවර්ධනය උදෙසා ඒ අය නෛතික වශයෙන් යම් තීන්දුවක් ගන්න පුළුවන්. අපට යම් කනගාටුවට කාරණය තමයි, මේ හද්දා පිටිසර ගම්මාන තිබෙන මේ ගම්පහ දිස්ත්‍රික්කයේ, එහෙම නැත්නම් මේ කොළඹ දිස්ත්‍රික්කයේ කඳු මුදුන්වල ඉන්න මිනිස්සු පවා අද මේ නාගරික සංවර්ධන පනතට යටත් වෙනවා. යන්න පාරක් නැති, ඇළෙන් ගොඩ වෙලා, වෙලෙන් ගිහිල්ලා මඩ නාගෙන යන මිනිස්සුත් තමන්ගේ ගේ අනුමත කරගන්න යන කොට කඳු මුදුනේ ඉන්න කෙනාත් නාගරික සංවර්ධන පනතට යටත් වෙන්නට ඕනෑ. මීගමුවේ ඈත කෙළවරේ ඉන්න කෙනාත්, යක්කල නගරයේ තිබෙන මේ නාගරික සංවර්ධන අධිකාරියට එන්නට ඕනෑ. ඒවා එන කොට ජනතාව දැනුවත් වෙන්නේ නැහැ. නාගරික සංවර්ධන පනත ක්‍රියාත්මක වන්නේ කොහොමද? මේ ගන්න තිබෙන යම් යම් කරුණු කාරණා මොනවාද? අපි කොයි විධියට මේකේ අර්ථ නිරූපණය කර ගන්නේ. මේ මිනිස්සුන්ට අවබෝධයක් නැහැ. හැබැයි මේ නාගරික සංවර්ධන ප්‍රදේශ ගැසට් කිරීම හරහා ඒ හා එන සහෝදරයාට වරිපනම් ගෙවන්න වෙනවා. අපේ අත්තනගල්ල ආසනය ගත්තොත් එහෙම වරිපනම් තිබෙනේත් ඉතා කුඩා ඒකක ප්‍රමාණයක්. නමුත් බල ප්‍රදේශය වර්ග කිලෝ මීටර් 151 ක්. අති දුෂ්කර කඳු මුදුන්වල ඉන්න මිනිස්සු පවා අන්තිමට වරිපනම් ගෙවන්නට අර්ථ කථනයක්, හොඳ නිර්මාණයක් වෙනවා. මොකද, නාගරිකයි කියන්නේ, සංවර්ධනයි කියන යම්කිසි තැනක ඉන්න පුළුවන් නිසා.

අපට පූර්වාදර්ශ තිබෙනවා. මේ බස්නාහිර පළාත් සභාව මේක ප්‍රතික්ෂේප කරන්නට ඕනෑ. මේකට හොඳම පූර්වාදර්ශය වත්තල ප්‍රාදේශීය සභාව. එදා 2000 ගෙනෙන ලද මේ නාගරික සංවර්ධන බලය, නාගරික ප්‍රදේශ ගැසට් කිරීම, එදා වත්තල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා පිළිගත්තේ නැති නිසා. අදටත් වත්තල ප්‍රාදේශීය සභාව නාගරික සංවර්ධන ප්‍රදේශයෙන් බැහැර වෙලයි කටයුතු කරන්නේ. ඒ නිසා අපට ඒ පූර්වාදර්ශය අරගෙන මේ එවන ලියුමට අනුගත නොවී කටයුතු කරන්න පුළුවන්කමක් තිබෙනවා. රටක බලය බෙදා හැරීම වෙනුවෙන්, ආණ්ඩුක්‍රම සංශෝධනය තුළින් යම්කිසි පනතක් තුළින් එන බලය, පළාත් පාලන ඇමැතිවරයා හරහා, මහ ඇමැතිවරයා හාරහා අදාළ පළාත් පාලන ආයතනයට ලැබෙන බලය, මේ පළාත් පාලන ආයතන විසුරුවා හැරලා තිබෙන වෙලාවක නිලධාරියාට ලබා දීමෙන් එකඟතාවය ලබා ගන්න උත්සාහ කරන්නේ, මම හිතන්නේ පාළු ගෙයි වළං බිඳිනවා වාගේ වැඩක්. ඒ නිසා මේ පනත හෝ මොන හෝ ලියවිල්ලක් එනවා නම් එන්නට ඕනෑ මේ ප්‍රාදේශීය සභා කියන බලය තිබෙන සභා ගැබක් ආරම්භ වුණු වකවානුවකට ඇවිල්ලා, ඒ සභාවට දාලයි. ඒ සභාවට දාලා සභා සම්මුතියක් ගන්නේ නැතිව කිසි කෙනෙකුට ඒ බල ප්‍රදේශය පිළිබඳව තීන්දුවක් ගන්නට බැහැ. ඒ නිසා අපට මේ පිළිබඳව විවාදයක් නැතිව මෙය බැහැර කරන්නට පුළුවන්. ඔවුන් ගත්ත බලයේ සමහරවිට යම් ප්‍රමාණයකින් ඔවුන්ට ගන්න පුළුන් වෙයි. එනමුත් බල ප්‍රදේශයක අභිමතය තිබෙන්නේ ඒ ප්‍රදේශයේ මහජන ඡන්දයෙන් පත්වන සභාපතිවරයාට හා ඒ සභාවට. ඒ නිසා සභාව අභිබවා යන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැයි කියන එකයි මගේ පෞද්ගලික අදහස.

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

ඒ වාගේම තමයි මේක ආරම්භයක් විතරක් නොවෙයි. මේක විවිධ තලවලින් මේ ප්‍රාදේශීය සභාවේ බලතල හැල්ලු කිරීම සිද්ධ වෙනවා. ඒ නිසා අපි ඒ පිළිබඳව අවධානය යොමු කරන්නට ඕනෑ. ඒ අවධානය ගන්නවා වාගේම අපි කල්පනා කරන්න ඕනෑ. දැන් මේ නාගරික බල ප්‍රදේශයක් කළාට පස්සේ එතකොට මේ ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා තිබෙනවා. ජලය බැස යාම සම්බන්ධයෙන් ගැටලු ඇති වෙනවා. විවිධ මහජන පීඩාවන් පිළිබඳව ගැටලු ඇති වෙනවා. විවිධ ඉදි කිරීම් සම්බන්ධයෙන් ගැටලු ඇති වුණාම මහජනතාවට අවබෝධයක් නැහැ. මහජනතාව දුවන් එන්නේ ප්‍රාදේශීය සභාවට. ප්‍රාදේශීය සභාවට දුවගෙන ආවාට පස්සේ අර අහිංසක පීඩනය ලක් වුණු මිනිහාට කියන්න වෙනවා, ඔබ යන්නට ඕනෑ ගම්පහ නගරයේ තිබෙන නාගරික සංවර්ධන අධිකාරියට. මේකට නඩුව දාන්න වෙන්නේ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ. එතකොට මේවා කියන්න නොවෙයි, ප්‍රාදේශීය සභාවක් පිහිටුවලා තිබෙන්නේ. එහෙමනම් ප්‍රාදේශීය සභාව තිබෙන්නේ කුණු ටික අදින්න විතරක් නොවෙයි.

මා ඇතුළු මගේ මන්ත්‍රීතුමන්ලා 18 දෙනෙක් අදටත් උසාවි යනවා. අත්නගල්ල ආසනයේ නිවාස 480 ක් හදනවා. නිවසක පළල අඩි 10 යි. දිග අඩි 30 යි. මේ වාගේ ගෙවල් 480 ක් හදන කොට මම සභාපතිවරයා වශයෙන් විරුද්ධ වුණා. විරුද්ධ වුණාට පස්සේ, බලාත්මක කියලා නිලධාරියෙක් අත්සන් කරලා මේ ගෙවල් 480 හදන්න අනුමැතියක් දුන්නා. ඒකට විරුද්ධව කටයුතු කළා කියලා අදටත් මම මගේ මන්ත්‍රීතුමන්ලා 18 දෙනෙක් එක්ක උසාවි යනවා. මෙහෙම දෙයක් කරන්න සිද්ධ වුණේ, ප්‍රාදේශීය සභා නොසලකා හැරියා. නාගරික සංවර්ධන අධිකාරියේ පහළ නිලධාරියා නොසලකා හැරියා. මේවා ඉදි කරන්න ඉතා ඉහළින් අනුමැතියක් දුන්නා. අද ඉදි කරලා තිබෙනවා. අපි උසාවියට යනවා. හැබැයි, ඒ ගෙවල් ගත්තු මිනිස්සු අද සභාව වට කරලා කෑ ගහනවා. කුණු ටික අදින්න. වතුර ටික දෙන්න. පහසුකම් සපයන්න. මේ ස්වාධිපත්‍යය වෙන්න පුළුවන්. එහෙම නැත්නම් මේ නාගරික සංවර්ධන අධිකාරිය හරහා ගෙනෙන්නා වූ මේ කටයුතු නිසා අර ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව මහා හැල්ලුවකට ලක් වෙනවා. මන්ත්‍රීතුමා හැල්ලුවට ලක් වෙනවා. සභාපතිවරයා හැල්ලුවකට ලක් වෙනවා. අපි ඉන්නේ කුණු අදින්නද? මහජන ඡන්දයෙන් පත් වෙන අපි පත් වෙන්නේ, මේ කුණු ටික අදින්න විතරද? ඒකට විතරද අපට බලය තිබෙන්නේ? අපට අභිමානය තිබෙන්නට ඕනෑ. අත්තනගල්ල ආසනයේ සිට පැමිණි සභාපතිවරයා වශයෙන් මට අභිමානයක් තිබෙනවා. ඒ නගරයේ තිබෙන තට්ටු පහක ගොඩනැගිල්ලක් දැක්කොත් මට කියන්න පුළුවන්, මේක මගේ කාලයේ හැදුව ගොඩනැගිල්ලක්. මේකට අනුමැතිය දුන්නේ මම. මමයි ඒ කාලයේ සභාපති කියලා මට කියන්න පුළුවන් අභිමානයක් තිබෙන්න ඕනෑ. එහෙම නැතිව මේ පර්චස් 40 ක්, එහෙම නැත්නම් මේ කොහේ හරි තිබෙන පුංචි ගෙයක් අනුමත කරන්න සභාපතිවරයෙක් ආයතනයකට පත් වෙන්න අවශ්‍ය නැහැ. විධායක බලතල තිබෙන කෙනෙක් පත් කරන්නේ, ඔහුට අභිමතය පරිදි කටයුතු කරන්න පුළුවන් සභාවක් තිබෙනවා. ඒ නිසා ඒ අභිමානයන් නැති කරන්න දෙන්න එපා. කෙනෙකුට තිබෙන සතුට තමයි තමන්ගේ නිල කාලය තුළ ඒ ප්‍රදේශයට කරන සේවය. ඒ නිසා මේ හරහා එන්නා වූ කරුණු කාරණා තිබෙනවා.

ප්‍රාදේශීය සභාවට අනතුරු දායක ගස් කපන්න පුළුවන් කියලා අපට යම්කිසි හැඟීමක් තිබෙනවා. උසාවියේ තිබෙන ගහක් වුණත් කපා බිම හෙලන්න අපට පුළුවන්. ඒකට නැවත ගස් හෙළීමේ පනත කියලා පනතක් ආවා. අද වන කොට ප්‍රාදේශීය සභාවේ සභාපතිට කොස් ගහ කපන්න පුළුන්කමක් නැහැ. දෙල් ගහ කපන්න පුළුවන් කමක් නැහැ. ගැහැණු තල්ගහ කපන්න පුළුවන්කමක් නැහැ. කොස් ගහක් කපන්න අණ කළා කියලා මම දවසක් කූඩුවටත් ගියා. ඒ නිසා මේ දවසින් දවස කරන්නේ ප්‍රාදේශීය සභාවේ ඉන්න මිනිස්සු හොරකම් කරපු එක නොවෙයි. මේ බලතල දීලා, බලතල බෙදා හැරපු ප්‍රාදේශීය සභාවේ බලය අඩු කරමින්, මේ ගොඩනැගෙන දේශපාලන නායකත්වයන් පල්ලෙහාට දාන එක තමයි මේ ඉටු කරනු ලබන්නේ.

අද බලන කොට ප්‍රදේශයේ කුඹුරු ටික ගොඩ කරලා දානවා. කුඹුරු ගොඩ කරන්න කාගෙන්ද අහන්නේ? අපි කෘෂිමාර්ගයක් ගොඩ කරන්න ගියා නම්, උසාවියෙන් තමයි නවතින්න වෙන්නේ. අද ගොවිජන එකෙන් අහන්නේ නැහැ. ගොවි සංවිධානයෙන් අහන්නේ නැහැ. තමන්ගේ කෘෂිකර්ම නිලධාරියාගෙන් අහන්නේ නැහැ. කුඹුරු අක්කර 10, 12 ගොඩ කරනවා. වත්තල කුඹුරු ගොඩ කරන එක සම්බන්ධීකරණ කමිටුවට ගෙනාවා. අයිතිකාරයෙක් නැහැ. පහත් බිම් ගොඩ කිරීම් එක කියනවා, අපි දන්නේ

නැහැ. පොලිසිය කියනවා, අපි දන්නේ නැහැයි කියලා. කෘෂිකර්මය කියනවා, අපි දන්නේ නැහැ. ගොවිජන සේවා කියනවා, අපි දන්නේ නැහැ. කරන්නේ කවුද? අවසානයේ වෙන්නේ වග කියන්නේ නැති, අර කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දු දෙන යුගයක් තමයි මේ බිහි වෙමින් පවතින්නේ. ඒ නිසා තමන් මේ හැම දෙයින්ම ඇඟ බේරා ගන්න - මේ නාගරික සංවර්ධන පනත ගෙනාවේ අපේ කුඹුරු ටික ගොඩ කරලා දාන්න. මහ නගර සැලැස්ම එන්නේ මේ ප්‍රදේශයේ තිබෙන කුඹුරු ටික ගොඩ කරලා මේ අයගේ යම් යම් ඉලක්කයන් සපුරාගන්නයි. ඒ නිසා මම මේ සභාවට ගෞරවයෙන් කියනවා. අනාගතය වෙනුවෙන් මෙන්න මේ තිබෙන පනත පරාජය කරන්නට ඕනෑ. ගමක තිබෙන ගැමිකම රකින්නට වෙනවා. ඒ තිබෙන සරුසාරත්වය රකින්නට ඕනෑ. මිනිස්සුන්ට සේවය නිදහසේ ලබා ගන්නට අවශ්‍යතා ඉටු කර දෙන්නට ඕනෑ.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පනතේ තිබෙන විවිධ දේවල් දිහා බලන කොට අනාගතයේ ප්‍රාදේශීය සභාවට වෙන දේ මොකක්ද කියන එක අපට හොඳින් තේරෙනවා. ඒ නිසා මේ අනවශ්‍ය දේවල් තිබෙනවා නම්, ඒවා අපි දෙන්නට ඕනෑ. අපට වැඩක් නැහැ. RDA එක අපි හොඳින් අවබෝධ කරගෙන තිබෙනවා. හැබැයි, අද අපි දකින දේ තමයි අද මේ දේශපාලන වෙනස්වීමත් එක්ක ප්‍රාදේශීය සභාවේ තමයි ගමේ පාර පිළිබඳව සියලු විස්තර තිබෙන්නේ. ප්ලෑන් එක තිබෙනවා. කාණු කොහෙන්ද තිබෙන්නේ. ජල බස්සනා මේ සියල්ල තිබෙනවා. නමුත් අද කරන්නේ, පාරවල් ටික ඔක්කෝම හදන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දෙනවා. ඔවුන් කොන්ක්‍රීට් කරනවා. අන්තිමට සභාවට සෙනඟ එනවා. අහවල් කාණු වැහුවා. වතුර බස්නා වැහුවා. එතකොට සම්බන්ධීකරණ කමිටුවට ගෙනැල්ලා පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ඉන්නවා. අර ප්‍රාදේශීය සභාවේ ලේකම්ට තර්ජනය කරනවා, තමුසේ මේ දේ කරන්නය කියලා. එදා ගම්පහ ප්‍රාදේශීය දිස්ත්‍රික් කමිටුවට ගෙනැල්ලා මේ ප්‍රදේශයේ බලවත් ඇමතිවරයෙක් වත්තල ප්‍රාදේශීය සභාවේ ලේකම්ට කියනවා, තමුසේ දැන් ගිහිල්ලා අර කඩ ටික කඩන්න කියලා. මම කිව්වා, එහෙම කඩ කඩන්න මෙහේ ලේකම්ලා පත් කරලා නැහැ. ලේකම්ට කඩයක් කඩන්න ඕනෑ නම් උසාවියට යන්නට ඕනෑ. ඒ නිසා නීති නොදන්න ඇමැතිලා අන්තිමට කරන්නේ අර නිලධාරීයාව සම්බන්ධීකරණ කමිටුවට ගේනවා. එතැනට ගෙනැල්ලා හය කරලා, හිර කරලා, බෙල්ල මිරිකලා නීති රීති ක්‍රියාත්මක කරන්න තමයි කටයුතු කරන්නේ. ඒ නිසා මේ පාළු ගෙයි වළං බිඳින ක්‍රම නැති කරලා වඩා නිවැරදි සාකච්ඡාවකට ගිහිල්ලා යම් කරුණු කාරණා තිබෙනවා නම්, ඒවා අවබෝධයට අරගෙන - අපි එකමුතු වෙලා තීන්දු ගන්නේ කොහොමද? අපට වගකීමක් තිබෙනවා. ඒ නිසා මේ කාර්යය කරන්න උත්සාහ කළොත් - මා අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති වශයෙන් දන්නවා, ගම්වල ඉන්න අහිසංක මිනිස්සුන්ට මේකෙන් වන හානිය අතිවිශාලයි. ඒ නිසා මේ වෙනුවෙන් අපි ජනතාවත් එක්ක අරගලයකට යන්න වුණත් ඕනෑ වෙලාවක සූදානම්. ඒ දේ කරන්නට ඕනෑ. තිබුණු බලය ප්‍රාදේශීයව ලබා දෙමින් මන්ත්‍රීතුමෙක් සතුටින් කටයුතු කරන්නේ, මේ තුළින් තමන්ට කරන්න පුළුවන් යම් යම් කරුණු කාරණා කරන්න. එහෙමත් නැත්නම් මේ කුණු ටික අදින්නවත්, අර කැළෑ කපන්නවත් නොවෙයි මන්ත්‍රීතුමන්ලා බිහි වන්නේ. ගරු මන්ත්‍රීතුමාට ඉටු කරන්න යම් යම් කරුණු කාරණා තිබෙනවා. අර ප්‍රාදේශීය සභාවට අයත්ව තිබෙන හිස් ඉඩම් කට්ටිවල අපට ගමේ අයට ප්‍රජා ශාලා හදලා දෙන්න පුළුන්කම තිබෙන්නට ඕනෑ. ඉතින් මේ වාගේ කරුණු විශාල වශයෙන් තිබෙනවා.

ඒ නිසා මේ වන කොට මහ ඇමැතිතුමා යම්කිසි ප්‍රසාදයක් දිනාගෙන තිබෙනවා. පළාත් පාලන ආයතන ටික නියාමනය කරනවා. ඒවාට සහයෝගය දක්වනවා. එතුමා යම් යම් කරුණු කාරණා ඉටු කරනවා. ඒ නිසා ගරු මහ ඇමැතිතුමා මේ පළාත් පාලන ආයතන ටික යම් ප්‍රමාණයකට හොඳින් පවත්වාගෙන යන්න උත්සාහ කරනවා. ඒ වාගේම ගරු මහ ඇමැතිතුමාට දවසක ඇඟිල්ල දික් වෙන්න පුළුවන්. පළාත් පාලන ආයතන විසුරුවා හැර තිබෙන වෙලාවක මේ පළාත් පාලන බලය හිමි ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා මේ බලය අහිමි කරලා, මේ නාගරික සංවර්ධන අධිකාරියට ඕනෑ විධියට කටයුතු කරන්න දීලා, තව තව ආයතනවලට කටයුතු කරන්න දීලා, ප්‍රාදේශීය සභාවක් සතු අභිමානවත් බලයක් විනාශ කළොත් කවදා හරි දවසක ඒකේ ඇඟිල්ල දික් වෙන්නේ අපේ ගරු මහ ඇමැතිතුමාට. ඒ නිසා අපි ගරු මහ ඇමැතිතුමාත් එක්ක එක කථාවට, එක මිටට ඉන්නවා. ඉඳගෙන අපි පළාත් සභාවක් වශයෙන් ඒ තීන්දුවට එකඟතාවය දක්වනවා. කවදාවත් මේ නාගරික සංවර්ධන අධිකාරී පනත

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

ඒ ආකාරයෙන් ඉටු කරන්න ඉඩ දෙන්න එපා. ඒ තුළින් විශාල වශයෙන් අපේ ප්‍රදේශයේ ඉන්න ජනතාව අගතියට පත් වෙනවා. මෙයට තවත් දිගින් දිගට කථා කරන්න තිබුණා. ඔබතුමාට ගරු කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 12.06]

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද හවස තුනට තිබෙන රැස්වීමේ, මධ්‍යම පර්යන්ත සබඳතා අනුකාරක සභාවේ නිර්දේශ යටතේ දක්වලා තිබෙනවා, මේ පළාත් පාලන ආයතන සඳහා දෙන කාර්යයන් පිළිබඳව. මේකේ දෙවැනි කොටසේ තිබෙනවා, *"පළාත් පාලන ආයතනවලට වඩාත් බලතල සහ අධිකාරී බලය පැවරීම"*. බලය පැවරීම සඳහා තමයි මෙහි දෙවැනි කොටසේ සඳහන් කරලා තිබෙන්නේ. දැන් බලය දෙනවා කියලා, ඒ පළාත් පාලන ආයතනවල තිබෙන බලය කප්පාදු කරන්න තමයි මේ උත්සාහ කරන්නේ. අපි පළාත් පාලන ආයතනවලින් පැමිණි මන්ත්‍රීවරු. දීර්ඝ කාලයක් අපි නගර සභාවක මන්ත්‍රීවරයෙක් විධියටත්, විපක්ෂ නායක විධියටත් කටයුතු කරපු පුද්ගලයෝ හැටියට අපි ඇත්තටම මේ වේලාවේ හඬක් නැගිය යුතුයි. මූලික වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතන අක්‍රියව තිබෙන අවස්ථාවේ තමයි මේ කටයුත්ත කරන්නේ. ඉතින් ඒ නිසා පළාත් පාලන ආයතන අක්‍රිය තත්ත්වයේ තිබෙන අවස්ථාවේදී මෙවැනි දෙයක් ගෙන ඒම තුළින් සිද්ධ වෙන්නේ පළාත් පාලන ආයතන තුළ තිබෙන ඒ ඉන්නා වූ සාමාජිකයින්ට, සභිකයින්ට මේ පිළිබඳව විරෝධතාවයක් දක්වන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඉතින් ඒ නිසා මේ නාගරික සංවර්ධන අධිකාරිය හරහා මේ ගෙන එන්නා වූ මේ කාර්යභාරය සුදුසු ස්ථානෝචිත දෙයක් හැටියට අපි කල්පනා කරන්නේ නැහැ.

නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නාගරික සංවර්ධන අධිකාරිය සුදු ආයතනයක් හැටියට සලකන්න බැහැ. එදා දූෂිත ආයතන අතරින් එක්තරා ඉහළ ස්ථානයක තිබුණු ආයතනයක් තමයි නාගරික සංවර්ධන අධිකාරිය. මම දන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාත් හොරණ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා හැටියට මේ නාගරික සංවර්ධන අධිකාරී බලය 1985 දී පළාත් පාලන ආයතනවලට පවරා දුන්නාට, සමස්ත බලය පවරා දීමක් කළේ නැහැ. මේ බලය පළාත් පාලන ආයතනවලට මුදා හැරි යයි කිව්වාට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාත් ඒකේ සිටියා. සම්පූර්ණ බලය දුන්නේ නැහැ. මේකේ තිබුණේ, පළාත් පාලන ආයතනය තුළ ඉඳගෙන නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයන් දෙදෙනෙක් එනවා. ඒ නියෝජිතයෝ දෙන්නා ඇවිල්ලා කාමරයක සැලසුම් කමිටුවේ ඉඳගන්නවා. සභාපතිවරයා, එහෙම නැත්නම් නියෝජ්‍ය සභාපතිවරයා සහභාගි වෙනවා. අර දෙන්නාගේ උවමනාව මත කටයුතු කරනවා. එතකොට අපි ඔය කොච්චර කිව්වත් පළාත් පාලන ආයතනයට මේ අයිතිය තිබුණේ නැහැ. මේ අයිතිය තිබුණේ, කෙළින්ම අර එන නියෝජිතයන්ටම තමයි. එදත් මේ බලය ඒ අයට අයිති වෙලා තිබුණේ. නමුත් පසුගිය කාලයේදී නාගරික සංවර්ධන අධිකාරිය අයිති වෙලා තිබුණේ මූලික වශයෙන්ම රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු මන්ත්‍රීතුමා, අත්සන් කළේ සභාපතිවරයා.

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

අත්සන් කිරීම පමණයි. අරයා තමයි නිල වශයෙන් දෙන්නේ. එයා කිව්වොත් බැහැයි කියලා සභාපති කිව්වත් බැහැ. අවුරුදු 12 ක්, 13 ක් ඔය ක්ෂේත්‍රයේම සිටියා නේ. ඕක අරයා බැහැයි කිව්වොත් දෙන්නේ නැහැ. ඒ දවස්වල ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මේ නාගරික සංවර්ධන අධිකාරියේ බලය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට හිමි කර ගන්නත් මූලික හේතුව තමයි - මේ එකක්වත් එදා හෙව්වේ නැහැ. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට අවශ්‍ය වුණා නම්, ඕනෑම දෙයක් කළා. මේවා මොකුත් හෙව්වේ නැහැ. නාගරික සංවර්ධන අධිකාරිය කාගේ හරි ඉඩමක් - දැන් අපේ ඥාතියෙකුට අයිත් ඉඩමක් මේ පාරෙන් එහා පැත්තේ පර්චස් 06 ක් ගත්තා. මොකුත් නැහැ. ඇවිල්ලා බෝඩ් එකක් ගහලා ගියා. මේක නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට තිබෙන නිසා මෙහි සංවර්ධන කටයුත්තක් කරන්න එපාය කියලා. ඒ කෙසේ වෙතත් අපි කිසිදු අවස්ථාවක ගරු සභාපතිතුමනි, මේ ලඝු කොට සලකන්නේ නැහැ. මේක පළාත් පාලන ආයතනයක තිබෙන අයිතිය අඩු කිරීමක් හැටියට. මේකේ දැන් අඩු කරලා තිබෙන්නේ දෙකක්. පළමුවෙන්ම තිබෙන්නේ මහල් හතරකට වඩා වැඩි සියලු ඉදි කිරීම් සඳහා

නාගරික සංවර්ධන අධිකාරියේ අවසරය ලබා ගත යුතුයි. මම දන්න තරමින්, දැනටත් එහෙම තමයි. දැනටත් නගර සභාවකට, ප්‍රාදේශීය සභාවකට තීරණය කරන්න බැහැ, තට්ටු හතරකට වඩා වැඩි ඒවා. එතකොට ඒක තිබුණු බලයම තමයි. ඒක වෙනසක් වීමක් වෙලා නැහැ. නමුත් ඔතැනදී සිද්ධ වෙලා තිබෙන්නේ මන්ත්‍රීවරයෙක් - දැන් නගර සභාවක මන්ත්‍රීවරයෙක් වාගේ එක්කෙනෙක් ගියොත් එහෙම, එහෙම නැත්නම් පළාත් පාලන ආයතනයක නියෝජිතයෙක් ගියොත් එහෙම මොනවා හරි කියලා ඔතැනදී යම්කිසි කටයුත්තක් කර ගැනීමේ හැකියාව ලැබුණා.

ඒ හැරුණාම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පර්චස් 40 ට වඩා කට්ටි බෙදීම. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ තුළ තමයි නගර සභාවක සිදුවන දූෂිතම කොටස. මම මහරගම නගර සභාවේ දීර්ඝ කාලයක් හිටපු විපක්ෂ නායකවරයෙක් හැටියට, මහර නගර සභාව තරම් දූෂිත නගර සභාවක් ලංකාවේ තිබුණේ නැහැ. ලංකාවේ දෙවැනි ස්ථානය වෙලා තිබුණේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඒ දවස්වල කථා කළේ නැද්ද?

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

කථා කළා. අපි ඒ කථා කරපු හඬ නිසා තමයි මෙතැනට ආවේ. දූෂිතයි කියලා කියන්නේ, ගරු මන්ත්‍රීතුමා මම මේ කාටවත් නරක විධියට නොවෙයි කියන්නේ. නගර සභාවක් හැටියට ගත්තාම මේ බිම් කට්ටි කැඩුවාම අනිවාර්යයෙන්ම එක කොටසක් එක්කෙනෙකුට දෙන්න ඕනෑ. මම දන්නේ නැහැ, කවුරු හරි එක්කෙනෙකුට මේක දෙන්න ඕනෑ. දුන්නේ නැත්නම් මේක අනුමත කරන්නේ නැහැ. යම් යම් ආකාරයේ දූෂිත දේවල් සිද්ධ වුණා. අද මේ පර්චස් 40 ට වඩා ඒ කිරීම. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක ඉල්ලීමක් කරන්න ඕනෑ. අපේ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා, නැත්නම් අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ කටයුතු සඳහා සහභාගි වන නිලධාරීන්ගේ වත්කම් ඉස්සෙල්ලා සොයා බලන්න ඕනෑ. මම එක උදාහරණයක් කියන්නම්. කලල්ගොඩ පැත්තේ රොජර් සෙනෙවිරත්න



ගරු මන්ත්‍රීතුමා හිටපු ගෙවල්වලට පොඩ්ඩක් පල්ලෙහා එක කොරටුවක ගෙයක් හදන්න ගියා. හදලා එයා විකුණන්න. මේකට ගියාට පස්සේ සැලසුම් කමිටුවේදී අහනවා, ඔයා දැන් මොකක්ද මේ කරන්න හදන්නේ? මට මේක විකුණන්න ඕනෑ. විකුණන්නේ කීයටද? පර්චස් එක ලක්ෂ තුනයි. ලක්ෂ තුනට නොවෙයි. මට 2 ½ ට දෙන්න. මට දෙන්න 2 ½ ට. එතකොට අරයා කියනවා, මට දෙන්න බැහැ. මේක 2 ½ ට දෙන්න බැහැ. එහෙමනම් දෙකයි හැත්තෑපහට මට දෙන්න. මම මේක අනුමත කරලා මේවා කරගන්නම්. අන්න එවැනි තත්ත්වයක් ඔය ආපු නිලධාරීන්ගේ තිබුණා. හැම දෙයටම ඉස්සෙල්ලා ඒ නිලධාරීන්ගේ වත්කම් සොයා බැලීමක් කරන්න ඕනෑ. දැන් මේ හැමෝම කථා කළා වාගේම මේ තත්ත්වයට ගියොත් එහෙම නැවත වතාවක් නාගරික සංවර්ධන අධිකාරියට අර අහිංසක මන්ත්‍රීවරුන්ට, නගර සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ගිහිල්ලා යම්කිසි දෙයක් කරලා දෙන්න තිබෙන අවස්ථාව නැති වෙලා යනවා.

ඒ වාගේම තමයි මෙතුමන්ලා කියපු පෙරහැරි ගාස්තු, 1% ක මුදලක් අඩු වෙනවා. ඒ අඩුවන සියල්ලම නගර සභාවේ. ඊට පසුව මේ අය බිම් කට්ටි සැලසුම් කළාට පස්සේ, ඒවායේ ගෙවල් එහෙම හැදුවාට පස්සේ, පාරවල්, නඩත්තු කිරීම් ඒවා සියල්ලම කරන්න සිද්ධ වන්නේ, පළාත් පාලන ආයතනවලට. ඒ නිසා මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ද කොහේ දෝ හොඳ යෝජනාවක් ගෙනාවා. ඒ අය කරන මුදලින් 70% ක විතර මුදල් ප්‍රමාණයක් පළාත් පාලන ආයතනවලට ලබා දෙන්නය කියලා. ඉතින් මේ බලය මෙතැනට උදුර ගන්නට උත්සාහ කරන්නේ ඔතැන ඉන්නේ මේ පළාත් පාලන ආයතනවලට වඩා හොරකම් කරන පිරිසක්. හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පළාත් පාලන ආයතනයක දීර්ඝ කාලයක් හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට මම දකින එක්තරා දෙයක් තිබෙනවා. මේ කොටසත් එක්ක, දැන් සෞඛ්‍ය කටයුතු, මේ ඩෙංගු පිළිබඳව උපාලි කොඩිකාර හිටපු අපේ ගරු අමාත්‍යතුමා කථා කළා. දැන් ඩෙංගු පිළිබඳව එහෙම සොයා බලන්න ඕනෑ, පළාත් පාලන ආයතන තුළ කවුද? PHI මහත්වරු. අද PHI මහත්වරු බහුතරයක්ම මේ කාර්යයේ නියැලෙන්නේ නැහැ. ඒ සෞඛ්‍යමය, පරිසරමය කටයුතු පිළිබඳව සොයා බැලීමක් කරන්නේ නැහැ. උදේ පාන්දර සිට කරන්නේ සැලසුම් හදන එක. සැලසුම් නිර්මාණය කරන එක. ඒ නිසා ඒ අයට

[ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්]

අයිති කාර්ය භාරය, මේ ගැටලුවත් එක්ක පුංචි ප්‍රශ්නයක් එනවා. මොකද හේතුව ඒ ගොල්ලන්ට යම්කිසි දෙයක් ලබා ගැනීමේ හැකියාව නැති වෙලා යනවා. ඒ නිසා අපි පළාත් සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට, පළාත් පාලන ආයතනවලින් පැමිණි මන්ත්‍රීවරු හැටියට අපි විශේෂයෙන්ම කනගාටුව ප්‍රකාශ කරනවා, අපේ බලයක් තුළ දී, පළාත් පාලන ආයතන සතු වෙලා තිබෙන මේ බලය නැවත වතාවක් පවරා ගැනීම් පිළිබඳව.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ කටයුතු වලදී නාගරික සංවර්ධන අධිකාරිය යම් ආකාරයකින් මේ බිම් කට්ටි අනුමත කරලා, ඒ ප්‍රදේශවල තිබෙන සංවර්ධන කටයුතු, මං මාවත් ඉදි කිරීම, ලයිට් දැමීම, කුණු කසළ ඉවත් කිරීම, මේ කටයුතු භාර ගන්නවා නම් කමක් නැහැ. එහෙම කරනවා නම් කමක් නැහැ. එහෙම නැතිව ඒ සියලුම කටයුතු ඒ අය භාර අරගෙන අපට මේ කටයුත්ත දෙනවා නම්, ඒ කියන්නේ පළාත් පාලන ආයතනවලට ඒකෙන් සිදු වන්නේ, විශාල හානියක්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මූලික රැඳීම මේකම නොවෙයි. ඒ කියන්නේ පළාත් පාලන ආයතනයක මූලික ආදායම මේකම නොවෙයි. වරිපනම් බදු, ඒ වාගේම මුද්දර ගාස්තු, ඒ වාගේම දඩ මුදල් මේවාගෙන් තමයි යැපෙන්නේ. මේ 1% ක මුදලින් බොහෝ අවස්ථාවලදී ලැබෙන්නෙත් නැහැ. ඒකත් මුදා හැරීම් වාගේ සිද්ධ වෙනවා. ඉතින් ඒ නිසා මේ නාගරික සංවර්ධන අධිකාරිය තුළ සිදු කරන්නට උත්සාහ කරන්නා වූ මේ කටයුත්තෙන් ජනතාවට සුභ සිද්ධියක් සිද්ධ වන්නේ නැහැ. හේතුව තමයි, දිස්ත්‍රික්කයකට තිබෙන්නේ එක කාර්යාලයයි. මේ දිස්ත්‍රික්කයකට එක කාර්යාලයක් කේන්ද්‍ර ගත වුණොත් එහෙම යම් යම් දේවල්, මේ කටයුත්තේදී මේ දැනුත් නගර සභාවක් ගත්තොත් එහෙම විශේෂයෙන්ම මහරගම නගර සභාව. මම නියෝජනය කරන පැත්ත. නගර සභාවේ සැලසුමක් අනුමත කරගන්න සමහර අවස්ථාවලදී අවුරුදු දෙක ගිය අවස්ථා තිබෙනවා. ඒ අවුරුදු දෙක තුළත් සභාපතිනිය හරි ඒ ඉන්නා වූ තැනැත්තිය සමහර අවස්ථාවලදී අත්සන් කරන්නේ නැහැ. ඒ නිසා එහෙම කටයුත්තක් ඔහොම සිද්ධ වෙනවා නම්, මේ වාගේ තනි තැනකට අරගෙන, එක දිස්ත්‍රික්කයට එකක් - දැන් එතකොට දිස්ත්‍රික්ක තුනට, කළුතරට එකක්. කොළඹට එකක්. ගම්පහට එකක්. ඒ නිසා මිනිස්සුන්ට සිදු වෙන්නා වූ මේ කාර්යය ඉතාමත් අහිතකරයි. ඒ නිසා මම නම් මන්ත්‍රීවරයෙක් හැටියට මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.

[අ.භා. 12.17]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මගේ ගෞරවණීය ස්තුතිය පුද කරනවා. මෙම නාගරික සංවර්ධන අධිකාරිය විසින් පළාත් පාලන ආයතන සතුව තිබෙන මෙම බලතල නැවත මධ්‍යගත කිරීමට දරන උත්සාහය පිළිබඳව මම හිතන්නේ පොදුවේ අපි කා අතරත් දැඩි අප්‍රසාදයක් තිබෙනවා. 1948 නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතින් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත නිර්මාණය වෙලා, ඒ තුළින් ඔවුන් සතුව තිබුණු බලය මේ පළාත් පාලන ආයතනවලට විමධ්‍යගත කිරීමේ කටයුත්ත ඉන් අනතුරුව සිද්ධ වෙනවා. දැන් මේ පිළිබඳව හොඳ විග්‍රහයක් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් කරනු ලැබුවා. එතුමාට අපි කාගේත් ගෞරවය හිමි වෙන්න ඕනෑ. ඉතාමත් පැහැදිලිව එතුමා මේ සිද්ධ වෙමින් පවතින කාරණාව පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ පණ්ඩුකාභය රජතුමාගේ රාජ්‍ය සමයේ බිහි වුණු පළාත් පාලන ව්‍යුහය වැඩි දියුණු වෙමින් ලෝකයේ විවිධ රටවල්වල ජනී ජනයාගේ යහපත උදෙසා මෙවැනි අණපනත් පාර්ලිමේන්තුවල සභා සම්මත වෙලා, ඒවා විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් ජනතාවගේ උන්නතිය, යහපත වෙනුවෙන් ක්‍රියාත්මක වුණා. අද දවසේ මේ සිදු වන වෙනස්වීම්, විපර්යාසයන් සිදු වන්නේ ජනතාවගේ සුභසිද්ධිය උදෙසාද? එසේත් නැත්නම් විමධ්‍යගත කරපු ප්‍රජාතන්ත්‍රීය රාජ්‍යයක රාජ්‍ය පාලනය නැවත මධ්‍යගත කරමින් ඒකාපධිත්වය කරා යන ගමනක ආරම්භයක්ද කියන ප්‍රශ්නය පසුගිය දවස් ටිකේම පළාත් සභාවට ආපු මෙවැනි පාර්ලිමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද අණපනත්වලින් අපට සැකයට තුඩු දෙන කාරණාවක් මතු වෙනවා. වරෙක පළාත් සභාව සතු බලය මධ්‍යගත කිරීම. වරෙක පළාත් පාලන ආයතන සතු බලය මධ්‍යගත කිරීම. ආදී වශයෙන් විවිධ අණපනත් මගින් සියලු ව්‍යවස්ථාපිත ආයතන සතුව තිබෙන බලතල මධ්‍යගත කිරීමේ ස්වභාවය යහපාලන ආණ්ඩුව බිහි වීමත් සමඟම අපට වරින් වර දකින්නට ලැබෙන කාරණාවක් බවට පත් වෙලා තිබෙනවා.

**0**227

පළාත් පාලන ආයතනවල මැතිවරණ දිගින් දිගටම කල් දමමින්, මේ මැතිවරණය ප්‍රජාතන්ත්‍රීය වශයෙන් තිබෙන ජනතා අයිතිවාසිකම්වලට අතුල් පහර එල්ල කරමින්, රජය මෙවැනි යෝජනා තුළින් අපේක්ෂා කරන්නේ, මහජන අප්‍රසාදය තුළ මේ ආයතන පිහිටුවනවා නම් ඒ ආයතනවල බලය කප්පාදු කිරීම යන්න තමයි අපට සාමාන්‍යයෙන් ගම්‍ය වන හැඟීම වන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා - නගර සභා, මහ නගර සභා ආඥා පනත් පැරැණි වුවත් පැවැතියා. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා ආඥා පනත මේකට එකතු වෙනවා. මේ ආයතන තුළ සාමාන්‍ය ජනතාවට මාතෘ සායනයේ සිට සුසාන භූමිය දක්වා සේවා පැවැත්වීමේ වගකීම භාර අරගෙන කටයුතු කරනවා. ජීවිතයේ හැම වැදගත් අවස්ථාවකදීම පළාත් පාලන ආයතනය ජනතාව සමඟ එකට සිටගෙන කටයුතු කරනවා. විමධ්‍යගත කරපු බලතල මොවුන් අයථා ආකාරයෙන් පරිහරණය කරනවා නම් ඒවා නිවැරැදි කිරීමට කටයුතු කරන ආයතන ලංකාවේ ස්ථාපිත වෙලා තිබෙනවා. මෙවැනි ආයතනවල සේවා තත්ත්වයන් දුර්වල වූ තැන තමයි මේ බලය අයථා විධියට පරිහරණය කරන්න කැමැති පුද්ගලයන් යම් යම් තැන්වල නායකත්වයට පත් වුණාට පස්සේ, ඒ කටයුතු කරන්නේ. එසේ පවතිද්දී පළාත් පාලන ආයතනවලට බිහි වන සභාපතිවරුන් සහ මන්ත්‍රීවරුන් මේ බලය අයථා ආකාරයන් පරිහරණය කරනවා කියන මූලික සිද්ධාන්තය පදනම් කරගෙන මේ බලය මධ්‍යගත කිරීමට යම්කිසි සභාපතිවරයෙක් වෙන්න පුළුවන්. ඇමැතිවරයෙක් වෙන්න පුළුවන්. වෙනත් පුද්ගලයෙක් වෙන්න පුළුවන්. එසේ ක්‍රියා කරනවා නම් ඒ ක්‍රියා කිරීම පැහැදිලිවම, මේ ප්‍රජාතන්ත්‍රවාදී බල ව්‍යූහයට ගහන අතුල් පහරක් කියන එක තමයි අපට පැහැදිලිව දකින්න පුළුවන්කම වෙන්නේ. ඒ නිසා අපි කවුරුත් පොදුවේ මම හිතන්නේ ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් අපි කවුරුත් දරන පොදු මතය වෙලා තිබෙනවා, මෙය නොකළ යුතු කටයුත්තක් හැටියට. ඉතා පැහැදිලිව මේ මොහොත වන විට අපි එය දකිනවා.

ඒ වාගේම අපි ඒ කාලයේ සිද්ධාන්තයක් සිහිපත් කර ගත්තා. 1987 අංක 15 දරන පළාත් සභා ආඥා පනත ස්ථාපිත කළ මොහොතේ, ඒ වාගේම මධ්‍යම රජය සහ අනිකුත් ආයතන සතුව තිබුණු බලතල විමධ්‍යගත කරන

**0**228

කොට විමධ්‍යගත කරන බලය නැවත මධ්‍යගත කිරීමට ඒ ආයතනවල එකඟතාවයක් නැතිව කළ නොහැකි කියන කාරණාව. දැන් ඒ අනුව තමයි මේ පළාත් පාලන ආයතන විවිධ පළාත් සභාවලට අපේ පළාත් පාලන අමාත්‍යවරයා හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් විමසීමක් කරන්නේ. මේ පළාත් සභාවේ එකඟතාවය මේ කටයුතු සඳහා තිබෙනවාද? නැද්ද? කියන කාරණය. එතකොට පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා පළාත් පාලන ඇමැතිවරයා හැටියට මහා දැවැන්ත වගකීමක් තිබෙනවා. මේ පළාත් පාලන ආයතන සතු බලය සුරක්ෂිතව ආරක්ෂා කරලා මේ විමධ්‍යගත වූ බලය තුළ වඩාත් ප්‍රජාතාන්ත්‍රීයව සහ පහසුකම් ඇතිව ජනතාවට තමන්ගේ කටයුතු කරගන්න අවස්ථාව සලසා දීම සඳහා ක්‍රියාත්මක වීමට. මේක තමයි අතිශයින්ම වැදගත් කාරණාව. දැන් මේ කාරණාව පැහැදිලිව දකින්න තිබෙද්දී කළු සුදු වාගේ කාරණාව ඉතාමත්ම පැහැදිලියි. වෙමින් පවතින්නේ කුමක්ද කියන කාරණාව ඉතාමත් පැහැදිලියි. රජය ජනතාවගේ සහයෝගයෙන්, ඔවුන්ගේ ප්‍රසාදය මත, ඔවුන්ගේ එකඟතාවය මත, ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට ගරු කරමින් ක්‍රියාත්මක කිරීමට තිබෙන අපහසුතාවය මඟහරවා ගැනීමට, සියලු බලතල තමන්ගේ අතමිට මොලවා ගැනීමට දරන උත්සාහයන් තමයි මේ තුළ කැපිලා පෙනෙන්නේ. මම මේ දේශපාලනය කථා කරනවා නොවෙයි. මේක පැහැදිලිව දකින්න තිබෙන කාරණාවක්. ඒ නිසා මේ පළාත් පාලන ආයතන සතුව පවතින්නා වූ සියලු බලතල ඔවුන් සතුව රඳවා ගැනීමට අප කවුරුත් මේ මොහොත වන විට සහයෝගය දෙන්න අවශ්‍ය වෙනවා. මේක තමයි පැහැදිලි කෙටි කථාව.

මම දන්නවා, ඔබතුමා මා දෙස බලන ආකාරයෙන් මගේ කාලය අවසන් වෙලයි කියලා. කොහොම වුණත් මම විශ්වාස කරන්නේ. මේ නාගරික සංවර්ධන ආඥා පනත යටතේ දුන්නු බලය - දැන් අපට මේක ආපසු උදුරා ගන්න පුළුවන්. මේක ගන්න පුළුවන්. ගන්න බැරිකමක් නැහැ. පැහැදිලිව 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතෙන් අපට බලය දුන්නේ 1982 අංක 04 සහ 1984 අංක 44 දරන පනත්වලින් පළාත් පාලන ආයතනවල බලය විමධ්‍යගත කරනවා. ඒ විමධ්‍යගත කරපු බලය, භෞතික සැලසුම්කරණය සම්බන්ධයෙන් වන බලතල නාගරික සංවර්ධන අධිකාරියේ පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දුන්නු බලය පළාත් පාලන ආයතනවලට පවරා දීමයි.

[ගරු ජගත් අංගගේ]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම 1991 ප්‍රාදේශීය සභාවේ සභාපති වුණු වෙලාවේ මගේ ප්‍රධාන ගිණුමේ ඉතුරු වෙලා තිබුණේ රුපියල් 22,364/- යි. ප්‍රධාන ගිණුමේ ඉතිරි කරලා ගිහිල්ලා තිබුණේ. ඒ මාසයේ සභාව විසින් වැටුප් ගෙවිය යුතු තනතුරුවලට වැටුප් ගෙවන්නවත් සල්ලි තියලා ගියේ නැහැ. මම රාක්කවල තිබුණු ගොඩනැගිලි අයදුම්පත්‍රවලට තිබුණු අනුකූලතා සහතික ටික සුමාන දෙකක් ඇතුළත ගන්නය කියලා ලියුම් දාලා තමයි සල්ලි එකතු කරලා ඒ මාසයේ පඩි ගෙව්වේ. ඉතින් මේවා මේ ආදායම. මේ අදායම පළාත් පාලන ආයතනවලට අවශ්‍යයි. එහෙම නැතිව මේ ආයතන දුවන්න බැහැ. මම කිව්වා වාගේ මාතෘ සායනයේ සිට සුසාන භූමිය දක්වා ජනතාවගේ සේවා කටයුතු පවත්වාගෙන යාමට රජයෙන් දෙන ප්‍රදානවලින් විතරක් පළාත් පාලන ආයතනවලට යැපෙන්න බැහැ. ඔවුන්ගේ තිබෙන ආදායම් මේ ආකාරයෙන් කප්පාදු කළාම මේ ආයතනත් පළාත් සභා මට්ටමට වැටෙනවා. දැන් පළාත් සභා 52% ක් කැපුවාම පළාත් සභා මන්ත්‍රීවරයා කට උඩ බලාගෙන ඉන්නවා, ඊළඟ අවුරුද්දේ මොනවාද කරන්නේ කියලා. පළාත් පාලන ආයතනත් මෙතැනට තමයි ඇදලා දාන්න හදන්නේ. ඉතින් මම දන්නේ නැහැ, මේ ප්‍රජාතන්ත්‍රවාදී රටක ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ජීවත්වන පුරවැසියන්ට දෙයියන්ගේම පිහිටයි මෙහෙම ඉස්සරහාට ගියොත්. අනාගතයක් නම් නැහැ. ඉස්සරහාට විනාශයක් තමයි දකින්නට තිබෙන්නේ. ඒ නිසා හෙට උපදින දරුවන්ට අනේ යහතින් ජීවත්න පුළුවන් රටක් නිර්මාණය වේවායි කියලා ප්‍රාර්ථනය කරමින් ඔබතුමාට අවනත වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.25]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. මම පළමු කොටම එකම කරුණු ප්‍රතිරාවය කරන්න අදහස් කරන්නේ නැහැ. මා විශේෂයෙන්ම කියන්න ඕනෑ. මෙවැනි යෝජනාවක් ගැන අදහස් දක්වද්දී, මෙවැනි අලුත් සිද්ධිමය තත්ත්වයන් ගැන අදහස් දක්වද්දී අපි නියෝජනය කරන පක්ෂයවත්, නැත්නම් රටේ තිබෙන දේශපාලන වාතාවරණයවත් නොවෙයි. පසුගිය කාලයේ පළාත් සභා පිහිටුවන කොට සුදු අලි කියලා පෙළපාළි ගිහිල්ලා දැන් සියලු දෙනා මේවා වර්ණනා කරනවා. එක කාලයක් තිබුණා, සයිටම් විශ්ව විද්‍යාල පිහිටුවන්න දීලා විපක්ෂයට ගියාම, ඒකට විරුද්ධ වෙනවා. ඒ මත ඉඳගෙන නොවෙයි මම මේක කථා කරන්නේ. මේ රටේ පුරුවැසියෙක් හැටියට, මේ රටේ ජනතාවගේ ප්‍රශ්නයක් හැටියට පමණයි කථා කරන්නේ. ඒ එක්කම මම ආණ්ඩු පක්ෂයේ අයට කියනවා. මිනියක් මරලා ආවත් අපේ පක්ෂයේ ඉන්න එක, ඒක එහෙම නොවෙයි කියලා කියන අදහසින් ඉන්නේ නැතිව විවෘතව අදහස් දක්වීම පිළිබඳව මම අපේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් ස්තුතිවන්ත වෙනවා. මේක ඇත්ත වශයෙන්ම තිබෙන්නේ, පිඹුරු pass කිරීමේ සිට ඒ කියන්නේ ප්ලෑන් අනුමත කිරීමේ සිට සියලුම කටයුතු සම්බන්ධයෙන් පරිපාලනයක් අපේ නාගරික සංවර්ධන අධිකාරිය කරන්න හදනවා. මා විශේෂයෙන්ම කියන්න ඕනෑ. බලය බෙදා හරින කොට ජනතාව දවසින් දවස අධික රාජකාරී බහුල පිරිසක් හැටියට මේ ජනතාව ආයේ තව තැනකට ගෙනහිල්ලා රස්තියාදු කරන්න යන වැඩ පිළිවෙළක් කියලා මට නම් පළමුවෙන්ම පේනවා. විශේෂ කොට ජනතාවට සහනයක් වන ආකාරයේ වැඩ කොටසක් තමයි මේ පළාත් පාලන ආයතනයකින්, පළාත් සභාවකින්" රජයකින් වෙන්න ඕනෑ. ඒ නිසා කිසිම නිවාස ඉදි කිරීමක් සම්බන්ධ පිඹුරක් අනුමත කරන්න තවත් පුද්ගලයින්ගේ පස්සේ යනවා කියන එක නම් අපි කිසිසේත් අනුමත කරන්නේ නැහැ. මේක මහජනතාව දැනගත්ත ගමන්ම ඉතාම ප්‍රකෝප තත්ත්වයට පත් වෙනවා.

ඒ වාගේම මම විශේෂයෙන් කියන්න ඕනෑ. නාගරික සංවර්ධන අධිකාරිය. ඒ වාගේම මේ සෑම ආයතනයකම පුද්ගලයන් රැස් වෙලා තමයි නිවාස අනුමත කරන්න, ප්‍රාදේශීය මට්ටමේ කමිටුවලින් තමයි මේවා අනුමත වෙන්නේ. ඒකට මේ නාගරික සංවර්ධන අධිකාරියක් සම්බන්ධ වෙනවා. ඉතින් ඒක අමුතුවෙන් නැවත වෙනස් කරන්න දෙයක් නැහැ. ඒක එකක්. දෙවනුව මේ බලතල ඒකාරාශී කරගන්න ගියාම වෙන්නේ මොකක්ද? දැනට වුණත් ඇමැතිවරයෙක් හමුවන්න දහ දොළොස් සැරයක් යන්න ඕනෑ. ලේකම්වරයෙක් හමු වන්න දහ දොළොස් සැරයක් යන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැනුත් එහෙමද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

බණ කියන්නේ නැතුව අහගෙන ඉන්න. මම කියනකන්. මම පටන් ගත්තේ කියලා. ඒ නිසා අහගෙන ඉන්න. එදා වැඩ කරපු හැටි කියලයි මම පටන් ගත්තේ. ඒ නිසා මම කියනවා. මම දැනුත් නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මම ප්‍රායෝගික තත්ත්වය කියන්නේ. මම කිව්වා, සයිටම් වාගේ නොවෙයි කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමිය මූලාසනයට කථා කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

හොඳද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මම කියන්නේ, මේක ලංකාවේ එදා විතරක් නොවෙයි. අදත් නොවෙයි. හෙටත්. තව දශකයක් යනතුරු මේ ක්‍රමය වෙනස් වෙන්නේ නැහැ. ඒ කියන්නේ මේ බලතල හරි තැනට ගිහිල්ලා, මේ සෑම රාජ්‍ය නිලධාරියෙක්ම, සෑම මන්ත්‍රීවරයෙක්ම, මේ රටේ උපන් සෑම පුරවැසියෙක්ම හරියට වැඩ කටයුතු කරන්න පටන් ගන්න තුරු ඔය ක්‍රමය වෙනස් වන්නේ නැහැ. ඒකට තව කාලයක් ගත වෙනවා. ඒ නිසා මම විශේෂයෙන් කියන්න ඕනෑ. රාජ්‍ය නිලධාරීන්ගේ පැත්ත ගත්තොත් පොඩි තැනේ සිට ලොකු තැනට ඒ තනතුරට පත් වුණු දවසේ සිටම කීප දෙනෙක් හොඳයි. අවංක නිලධාරීන් ඉන්නවා. හැම කෙනාම හිතන්නේ, සල්ලි හම්බ කරන්න ලයිසන් හම්බ වුණාය කියලා. ඕක තමයි ඇත්ත කථාව. කවුරු පිළිගත්තත්, නැතත් දහ පහළොස් දාහක් ඊට අඩු වැඩි වශයෙන් සාක්කුවට වැටෙනවා, මොනවා හරි දෙයක් රජයෙන් ඇවිල්ලා කර ගන්න ගියාම. ඕක බොරු කථාවක් නොවෙයි. ඒක එහෙම නැහැයි කිව්වොත් තමයි බොරු වෙන්නේ.

ඒ නිසා අපි කල්පනා කරන්න ඕනෑ. මා විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ, අගමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. මේ නාගරික සංවර්ධන අධිකාරී පනත් පිහිටුවලා අපි මේ ආයතන ඇති කරලා එක නගරයක්, නැත්නම් එක ආදර්ශ ගම්මානයක් හැටියට ගමක් අරගන්න. මේකේ හෙක්ටයාර 50 ක් තිබෙනවා. මේකෙන් හෙක්ටයාර දෙකයි වගා කරන්නේ. මේකෙන් හෙක්ටයාර දෙකක නිවාස හදනවා. මේකෙන් හෙක්ටයාර දෙකක කර්මාන්ත කරනවා. පරිසරයට හෙක්ටයාර දෙකක් වෙන් කරනවා. මෙන්න මේ විධියේ එකක් හදලා පෙන්වන්න. මේ අයට බැරිව ගියා. ඉතින් එහෙම කරලා ආදර්ශ ගම්මානයක් පෙන්නුවා නම්, අපිට කියන්න පුළුවන්, ඔන්න අපේ ආසනය, අපේ කොට්ඨාශය දෙනවා. මේක කරලා මේ විධියට පෙන්වන්න කියලා. අන්න ඒ ටික වෙන්නේ නැතිව මේ බලතල එහාට මෙහාට රෝල් කරන්න යන එක තේරුමක් වන වැඩක් නොවෙයි. ඒ නිසා මම විශේෂ කොට කියනවා. අපි කියන්නන් වාලේ, අහන්නන් වාලේ දේවල් කියලා අහලා තේරුමක් වන්නේ නැහැ. පක්ෂ දේශපාලනය නිසා කාට හරි බැණලා ගියා කියලා වැඩක් වෙන්නෙත් නැහැ. මේකේ සැබවින්ම වෙන්න ඕනෑ මොකක්ද?

දැන් සමහර අය කුඹුරු ගොඩ කරනවා කියලා කෑ ගහනවා. දැන් මෙතැන කෑ ගැහුවා, බොරළු කැපීම්. වැලි මැටි කැපීම්. ඇත්ත වශයෙන්ම වෙන්න ඕනෑ මොකක්ද? මිනිරන් තිබෙන තැනින් තමයි මිනිරන් ගන්නේ. මැණික් තිබෙන තැනින් තමයි මැණික් ගන්නේ. ගල්, වැලි, බොරළු තිබෙන තැනින් තමයි ගන්න ඕනෑ. හැබැයි, ඒක පරිසරයට හානි වෙනවාද? වැරැදි කරනවාද? කියන එක සොයන්න තමයි නිලධාරීන් ඉන්නේ. මේවා කොහෙන්වත් 100% ක් නවත්වන්න බැහැ. එහෙමනම් ප්‍රාදේශීය සභාවල කවුරු හරි වැරැදි කරනවා කියලා වහලා දාන්නේ නැහැ. ඒකට හොඳ කෙනෙක් පත් කරන්න තමයි ඡන්දය තිබෙන්නේ. ඒවාට තමයි රටේ ක්‍රමවේද තිබෙන්නේ. මේවා උඩින් ගිහිල්ලා එක්කෙනෙක් හොරකම් කරනවා කියලා මේක වහලා මේ බලය තව කාටවත් පවරාගෙන හරි යන්නේ නැහැ.

ඒ වාගේම දැනට මේ පළාත් පාලන ඡන්ද නොතිබීම ගැනත් මම කියන්න ඕනෑ. ඡන්ද තියලා ඉවර වෙලා මේවා හරියට ක්‍රියාත්මක වුණා නම්, මෙවැනි නීති රීති හදන්න වෙන්නේ නැහැ. එතකොට අපේ ප්‍රදේශයේ ජනතාව තමයි

[ගරු රෝස් ප්‍රනාන්දු]

දන්නේ පාරවල් කොහේද තිබෙන්න ඕනෑ. ඇළ මාර්ගය කොහේද තිබෙන්න ඕනෑ. ගොඩ කරන්න ඕනෑ කොතැනද? කපන්න ඕනෑ කොතැනද? ඒවා දන්නේ ප්‍රදේශයේ කට්ටිය. එතකොට මේක කොහෙවත් අයට පවරාගෙන හරි යන්නේ නැහැ. මම මේකේ එකම එක දෙයක්ට නම් එකඟයි. මේකේ එක වාක්‍යයක් තිබෙනවා. පස්වැනි අංකයේ තිබෙනවා.

පොදු මහජනතාවගේ යහපතට අවහිර වන ආකාරයේ යම්කිසි ඉදි කිරීමක් කරලා තිබෙනවා නම්, නීතිමය කටයුතු කරනවා කියලා. අන්න ඒකට කමක් නැහැ. අපි හිතමු කෝ නගර සභාවේ සභාපති එක්ක හිතවත් කෙනෙක් වැරදි වැඩක් කරන නිසා නඩු නොදා ඉන්නවා. අන්න ඒක කවුරු හරි නාගරික සංවර්ධන අධිකාරියට පැමිණිලි කරනවා. එයා නඩු දාලා කඩලා දානවා. අන්න එහෙම සිද්ධියක් කමක් නැහැ. නීති කටයුතු කරන්න බලය ගන්න. එතකොට ප්‍රාදේශීය සභාව හරි, නගර සභාව හරි හරියට වැඩක් කරන්නේ නැහැයි කියලා පැමිණිල්ලක් භාර ගන්න. නීති කටයුතු කරන්න. අන්න ඒකට අපි එකඟයි. ඒ එකඟතාවයට යටත්ව අනික් සියලු දේට මම නම් විරුද්ධයි. ඒ නිසා මගේ කථාව අවසන් කරනවා. බුද්ධිමත්ව මේ දිහා බලන්න කියලා හැමෝගෙන්ම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.32]

**ගරු ලලිත් එල්ලාවල**
**Hon. Lalith Ellawala**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ රසික මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමාට ඇත්තටම මම ස්තුතිවන්ත වෙනවා. මොකද, කාලෝචිත යෝජනාවක් ගෙන ඒම පිළිබඳව. අපි ප්‍රාදේශීය සභාවල හිටපු සභාපතිවරු හැටියට විශේෂයෙන්ම මේ චක්‍රලේඛයට අපේ සම්පූර්ණ විරෝධය පළ කරනවා. මොකද අපි එහෙම කියන්නේ. ඇත්තටම මෙය මීට වඩා කරන්න ක්‍රමවේද තිබුණා. මේක ජනතාවට වැඩි සේවාවක් සලසන්න නම්, නාගරික සංවර්ධන අධිකාරියට මේ ප්‍රාදේශීය සභාවේ දීලා තිබෙන බලතල ටික ගන්න එක නොවෙයි වැඩේ. මේවායේ අඩුපාඩු තිබෙනවා නම් සොයා බලලා, මේ අඩුපාඩු හදන්න තමයි නාගරික සංවර්ධන අධිකාරියට තිබෙන්නේ. ඉතින් මම හිතන්නේ, කවදාවත් පළාත් පාලන ආයතනයට පයක් තියපු නායකයෙක් කරන වැඩ නොවෙයි මේ කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ටික ගත්තාට පස්සේ ජනතාවට පීඩාකාරී දෙයක් වෙන තවත් නැහැ. මොකද, අපි පළාත් පාලන ආයතනවල සිටිය නිසා දන්නේ. අපි ගොඩනැගිලි අයදුම් පත්‍රයක් අනුමත කරගන්න ගියාම අපි දන්නවා, කොහොමද ඒක? කොපමණ ප්‍රමාද වෙනවාද කියලා නිලධාරීන්ගෙන්. ඒ වාගේම අපි දන්නවා, නාගරික සංවර්ධන අධිකාරියේ - අද රටේ ගත්තාම පළාත් පාලන ආයතනයකට ක්ෂණිකව ඒ ගොඩනැගිලි අයදුම්පත්‍රය හෝ ඉඩම් අනුමත කරලා දෙන එක ප්‍රමාද වෙලා තිබෙන්නේ, පළාත් පාලන ආයතනවල නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරියා නිසා. පැහැදිලිවම. අද නාගරික සංවර්ධන අධිකාරියේ ගොඩක් නිලධාරීන්ට සල්ලි දෙන්නේ නැතිව ඉඩමක් අනුමත කරගන්න බැහැ. අද ගොඩනැගිල්ලක් අනුමත කරගන්න බැහැ. ඒකට හොඳම උදාහරණය දැන් සතියකට, දෙකකට පෙර බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ - මම අපේ ගරු මහ ඇමැතිතුමාටත් මේ ගැන කිව්වා. ගරු මහ ඇමැතිතුමා ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව දැනුවත් කළා. දැනුවත් කළාට පස්සේ නාගරික සංවර්ධන අධිකාරිය අපි සියලු දෙනාට එතැනට එන්න කිව්වා. ඉඩම්වලට. නාගරික සංවර්ධන අධිකාරිය ආවේ නැහැ. අපි කොමසාරිස් කාර්යාලයෙන්, පළාත් පාලන ආයතනයෙන්, ප්‍රදේශයේ නියෝජනය කරන සියලුදෙනා ගිහිල්ලා කොන්දේසි වගයක් දුන්නා. නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරියා කියනවා, ඒ කොන්දේසි වැඩක් නැහැ. ඔයගොල්ලෝ වැඩේ කරගෙන යන්න කියලා. ඒ කියන්නේ වෙන මොකුත් නොවෙයි. ඒ ඉඩම් හිමියන් ගමේ මිනිස්සු එක්ක කියනවා. අපි නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරියාට සල්ලි දීලා තිබෙන්නේ කියලා. අද මෙන්න මේකයි යථාර්ථය. මේකයි තත්ත්වය.

ඒකත් එක්කම ඊයේ පෙරෙයිදා අපි ගියාම ඉඩම කට්ටි කඩනවා. ඒවා සියල්ල කරන කොට පොදු කටයුතුවලට වෙන් කරන්නේ නැහැ. නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරියා තමයි උපදෙස් දෙන්නේ අක්කර 14 අක්කර දෙකට, දෙකට කඩන්න කියලා. එතකොට අක්කර 2 ½ ට අඩුයි. එතකොට පොදු කටයුතුවලට වෙන් කරන්නේ නැහැ. අද මේ වන කොට අක්කර 14 ක් කට්ටි කඩලා මේවා වෙන්නේ නැති වන කොට අපි ගිහිල්ලා බැලුවාම - ඒ හරිය සාමාන්‍යයෙන් පර්චස් එකක් ලක්ෂ හතරයි, පහයි විකිණෙන්නේ. අද මහා විශාල විධියට මුදල්

හම්බ කරනවා. මේ පළාත් පාලන ආයතනවල අද තත්ත්වය මේකයි. ඒ නිසා මම හිතනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ බලතල නාගරික සංවර්ධන අධිකාරියට ගත්තොත් මේක තවත් ජනතාවට ප්‍රමාද වෙනවා. මහා විශාල අකටයුත්තක් වෙනවා. අපේ ප්‍රදේශය ගත්තාම කළුතර දිස්ත්‍රික්කයේ විශාල ප්‍රමාණයක් අද නාගරික සංවර්ධන අධිකාරියට යටත්. අගලවත්ත, මතුගම වාගේ ප්‍රදේශවල මිනිස්සු එන්නේ කොහොමද? බුලත්සිංහල පැතිවල වාගේ මිනිස්සු එන්නේ කොහොමද? මේවා හිතන්න ඕනෑ. ඇත්තම කතන්දරය මේ අය තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගිය ආණ්ඩුව පරාජය කළේ. හරිද? මේත් මේ ආණ්ඩුව පරාජයට කරන වැඩ පිළිවෙළක් මට පෙනෙන්නේ. ඒක මම හිතනවා, එක්සත් ජාතික පක්ෂයේ යහපාලනයේ අය පොඩ්ඩක් හිතන්න ඕනෑ කරුණක්. මේවා කළාම පොඩි මිනිස්සුන්ට තමයි මේක තදටම දැනෙන්නේ. මේ චක්‍රලේඛය අදට දැනෙන්නේ නැහැ. වැඩ කරගන්න ගියාම තමයි ජනතාවට දැනෙන්නේ. අන්න එදාට තමයි ජනතාව පාරට බහින්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ තිබෙන සියලු කරුණුවලට, මේවා ගැනීම සම්බන්ධව අපේ විරෝධය පළ කරනවා.

හැබැයි, මේවා කරන්න පුළුවන් ක්‍රම තිබෙනවා. අපි සභාපතිවරු කාලයේ අපි ක්‍රමවේද හැදුවා. අපි බෝඩ් ගහලා තිබුණා. ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සතියෙන්. වීථි රේඛා සහතිකයක් පැයෙන්. එහෙම අපි හදලා තිබුණා. මේ වීථි රේඛා සහතිකය, නොපවරා ගැනීමේ සහතිකය මේවා දෙන්න ගියොත් එහෙම ආයේ ජනතාවට මේවා කරගන්න ලැබෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නාගරික සංවර්ධන අධිකාරිය භාර ගරු ඇමැතිතුමාට පැහැදිලිව අපි මතක් කරන්න ඕනෑ. ඇමැතිතුමා පොළවට බහින්න. බැහැලා ජනතාව අතරට යන්න. ජනතාව අතරට ගිහිල්ලා තීන්දු ගන්න කියලා. මෙහෙම වුණොත් එහෙම පැහැදිලිව අපි මතක් කරන්න ඕනෑ. මේ රජය ගත්ත දවසේ සිටම වැඩ එකින් එක අනාගත්ත එක තමයි කළේ. මේකත් දැන් මේ අනාගන්න වැඩක්. හැබැයි, අපි පැහැදිලිව කියනවා. මේක කරන්න ගියොත් එහෙම, මේක ගත්තොත් එහෙම අපි නාගරික සංවර්ධන අධිකාරිය ඉදිරියට මුළු රටටම ගෙන්වනවා. ගෙන්නලා හරි මේක නවත්වනවා කියන එක මතක් කරනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එසේ මතක් කරමින් මේ වැඩ පිළිවෙළට, මේ චක්‍රලේඛයට අපේ සම්පූර්ණ විරෝධය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

[අ.භා. 12.39]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ මේ යෝජනාව සභාවට ගෙන ඒම මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා කරපු හොඳ සත්කාරයක් වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම එක කාරණයක් මතක් කරන්න ඕනෑ. මේ ආණ්ඩුව එදා වේල හරි හම්බ කරන් කන ආණ්ඩුවක්. මේ ආණ්ඩුවේ මෙගා පොලිස් ඇමැති දැන ගන්න ඕනෑ, මේ සමහර දේවල් මේ Items යටතේ තිබෙන ඒවා හරියාකාර අධ්‍යයනයකින් තොරව තමයි මේ චක්‍රලේඛයකට නතු කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අට වන උපලේඛනයේ හතර තුන වගන්තියට මේ මෙගා පොලිස් ඇමැතිතුමාගේ අවධානය යොමු කරන්න. මේ අද නොවෙයි. විශේෂයෙන්ම පළාත් සභා පනත 1987 ගෙනෙන වෙලාවේ එවකට රජයන් විසින් ඒ පළාත් සභා පනත ගෙනෙන වෙලාවේත් සීමාවක් පනවලා තිබෙනවා, පළාත් පාලන ආයතනවලට විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාව, නගර සභාව, මහ නගර සභාව සම්බන්ධයෙන් එක වගන්තියක් සඳහන් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වගන්තිය මොකක්ද කියලා දන්නවාද? ඒකේ කියනවා, මම ඒකෙම තිබෙන අර්ථය කියන්නම් කෝ? ඒකේ කියනවා,

*පවත්නා නීතිය යටතේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට තියෙන්නේ ය.*

මේ පන ගෙනෙන වේලාවේ. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ඒ ආයතනවලට තියෙන්නේ ය.

*මහ නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත යටතේ මහ නගර සභාවලට සහ නගර සභාවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට තියෙන්නේ ය.*

ඒ කියන්නේ අත තියන්න බැහැයි කියන එකයි මේ කියන්නේ. හරිද?

[ගරු සුනිල් වටගල]

*පවත්නා නීතිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රාදේශීය සභාවලට තිබෙන්නේ ය. පළාත් සභාවක් විසින් පළාත් පාලන ආයතන වෙත අතිරේක බලතල පවරාදීම කළ හැක්කේ ය.*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඕනෑ නම් පුළුවන් ඒ පනතේ තිබෙන බලතලය මදිනම් තව දෙන්න. තේරුණාද? ගන්න බැහැ. හරිද? මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙගා පොලිස් ඇමැති කියවන්න ඕනෑ.

*එහෙත් එකී සභාවල බලතල අහිමි කිරීම කළ නොහැක්කේය.*

මේක ගිහිල්ලා කියවන්න. මේ කඩිමුඩියේ චක්‍රලේඛ උස්සන් එනවා. ගේන්නේ මොකටද? මම කියන්නම්. මේ චක්‍රලේඛයේ බළලා මල්ලෙන් එළියට පැනලා තිබෙනවා. මොකක්ද දන්නවාද?

*නාගරික සංවර්ධන අධිකාරිය මගින් හඳුනාගනු ලැබූ හා ඉදිරියේදී හඳුනා ගනු ලබන ජාතික හා ප්‍රාදේශීය වශයෙන් වටිනාකම් ඇති ස්ථානවල කරනු ලැබීමට යෝජිත සංවර්ධන කටයුතු.*

මොනවද මේ? දැන් හඳුනාගෙන තිබෙන ඒවා. අනාගතයේ දී හඳුනා ගන්නා ඒවා. මොනවාද ඒ? මේක චක්‍රලේඛයකින් cover කරන්න පුළුවන් දෙයක්ද? මේ එන්නේ මොකටද කියලා අපි දන්නවා. දැන් රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා, එකකට එතුමිය එකඟ වන්නේ නැහැයි කියලා.

පොදු මහජනතාවගේ යහපතට අවහිර වන ආකාරයේ වශයෙන් දක්වනු ලැබිය හැකි අනවසර ඉදි කිරීම්.

මේක අස්සේ තිබෙන්නෙත් ලොකු බිල්ලෙක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ එන්නේ මොකටද කියලා අපි දන්නවා. මේ එන්නේ ඉඩම් ටික අත්පත් කරගන්න. නාගරික සංවර්ධන අධිකාරිය තමන්ගේ බලය මෙහෙයවලා - පසුගිය ආණ්ඩුව කාලයේ නාගරික සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක වුණු ආකාරය අපි දන්නවා. ඒ ආකාරයට ක්‍රියාත්මක කරන මේ යහපාලන ආණ්ඩුවත් නීත්‍යානුකූල ලයිසන් එකක් ගන්න හදනවා. අපි මේවාට විරුද්ධයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ එන්නේ ඒකට. මම ඔබතුමාගේ අවධානය යොමු කරන්නම්. අපි ඒකෙන් අදහස් කරන්නේ නැහැ, මේ පළාත් පාලන ආයතන හරී හොඳයි. ඒ අය ක්‍රියාත්මක වන විධිය හරිම හොඳයි. දැන් රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා කිව්වා, මහරගම පළාත් පාලන ආයතනය ගැන. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප්පිරියා හිතෙනවා. මේ පළාත් පාලන ආයතනවල වැඩ ගැනත් අපි ප්‍රසාදයක් නැහැ. මිනිස්සුන්ගෙන් අල්ලස් ගන්නවා. ඒ සියල්ල සිද්ධ වෙනවා.

කොළඹ විශේෂඥ වෛද්‍යවරයෙක්. එතුමාගේ මාදිවෙල ප්‍රදේශයේ සැලසුම අනුමත කරගන්න මාස හතක් දැන් බඩ ගාලා තිබෙනවා. එතුමා විවෘතව කියලා තිබෙනවා, මම ශත පහක් TO මහත්වරුන්ට දෙන්නේ නැහැ. කිසිම කෙනෙක් මගෙන් ශත පහක් ඉල්ලන්න එපා. මම විශේෂඥ වෛද්‍යවරයෙක් ලෙස වෙනත් අයට වඩා වෙනස් පුද්ගලයෙක්. මම හම්බ කරන හැම ශතයටම මේ රටේ බදු ගෙවන ජනතාව මට උගන්වලා තිබෙනවා. ඒකට මම විශේෂඥ සේවය සපයනවා. මහරගම නගර සභාවට ගිහිල්ලා කෑ ගහලා කිව්වා, එක තඹ ශතයක් ගෙවන්නේ නැහැයි කියලා. දැන් ඊයේ එවලා තිබෙනවා. පිඹුරේ සටහනක් ගහලා තිබෙනවා. මිනින්දෝරු මහත්මයාට කියලා පසු පස ඇති කාණුවට මීටර් තුනක සලකුණක් තබාගෙන එන්න කියලා. මිනින්දෝරු මහත්මයා ළඟට එතුමාත් එක්ක මම ම ගියා. එතුමා කියනවා, සල්ලි දුන්නේ නැද්ද? TO මහත්මයාට සල්ලි දුන්නේ නැද්ද? දුන්නා නම් මෙහෙම අනුමතයක් නැහැ. මම TO මහත්මයාගෙන් Call කරලා ඇහුවා, නාගරික සංවර්ධන අධිකාරියේ ඔයාගේ තිබෙන රෙගුලාසිය කියන්න. එහෙම රෙගුලාසියක් නැහැ. එතුමා කිව්වා, එහෙම එකක් ප්‍රැක්ටිස් එකේ තිබෙනවා කියලා. මේ විශේෂඥ වෛද්‍යවරයෙකුට මේ වැඩේ මහරගම සභාවට ගිහිල්ලා කරගන්න බැරි නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගමේ ඉන්න අපේ සාමාන්‍ය සයිමන් මුදලාලි මේ වැඩේ කරගන්නේ කොහොමද? ගමේ ඉන්න තංගමනී මේ වැඩේ කරගන්නේ කොහොමද? ඒක පිළිබඳ විවේචනයක් අපේ තිබෙනවා. හැබැයි ඒ විවේචනය පිටින් දාලා මේ ගොනා එන පාර අපට පේනවා. මොන පැළේ කන්නද කියලා. මේ එන්නේ ඊට වඩා බිල්ලෙක් මවන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක අපි දන්නවා. මේ නාගරික සංවර්ධන අධිකාරිය දැනුත් තිබෙනවා. දැනුත් සැලසුමක් අනුමත කරගන්න

ගියාම - අපි ප්‍රායෝගිකව දන්නවා. ඔයාගේ සැලසුම හෙට අනුමත කරනවා. හෙට කමිටුව තිබෙනවා. අන්න දෙකෙන් පස්සේ සැලසුම ගන්න යනවා. කියන උත්තරය මොකක්ද? අද නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයා ආවේ නැහැ. ඒ නිසා ඒක ඊළඟ කමිටුවට දානවා. මෙන්න කථාව. ඕක තමයි ඇත්ත. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක තමයි ඇත්ත කථාව. එතකොට මේක පිටින් දාලා මේ යන්නේ වෙන ගමනක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් බලන්න කෝ. මේකේ තිබෙනවා. එක, හිනා යන වගන්තියක් දාලා. මේකේ තිබෙනවා, ස්වාධිදිපත්‍ය අයිතිවාසිකම්වලට අදාළ වන ගොඩනැගිලි. මොනවද ස්වාධිපත්‍ය. ස්වාධිදිපත්‍ය දේපළවලට මේ අයට අත ගහන්න බැහැ. ස්වාධිපත්‍ය දේපළවලට අදාළ පනතක් තිබෙනවා. ඒ පනත යටතේ ස්වාධිපත්‍ය අධිකාරියක් පිහිටුවලා තිබෙනවා. ඒ අය අධීක්ෂණය වෙනවා. අන්න පුළුවන් නම් ගිහිල්ලා මත්තේගොඩට ගිහිල්ලා බලන්න. මත්තෙගොඩ ප්‍රශ්න පිරිලා. මේ සාදිපත්‍ය අයිතිවාසිකම්වලට අදාළ ගොඩනැගිලි යටතේ අන්න ඒ ප්‍රශ්න ටික පුළුවන් නම් බේරලා දෙන්න. මුලින්ම ඒක කරන්න. ජයවඩනගමට ගිහිල්ලා. මොන විහිළු කථාද? මේවා අස්සේ තිබෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා පෙන්නලා මිනිස්සුන්ව භය ගන්නවලා, අර ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක්ම කිව්වා. අම්පාරේ ඉන්න මිනිහා එන්නේ කොහොමද? අගලවත්තේ ඉන්න මිනිහා එන්නේ කොහොමද? සීතාවකපුර ඉන්න මිනිහා එන්නේ කොහොමද? මේ මිනිස්සුන්ව මඩවන්න. පළාත් පාලන ආයතනවල TO මහත්වරු පගාව ගන්නවා. හැබැයි, මේ පගාව වෙන තැනකට විතැන් කරගන්න මේ හදන්නේ. අර මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා හරි අපූරු කථාවක් කිව්වා. මේ කාර්මික ශිල්පීන් එතැන නැහැ. අර විශේෂඥ වෛද්‍යවරයාට පාර්ලිමේන්තුවේ අනුමැතියක් ගන්න වුණා. මොකද, පාර්ලිමේන්තුවට කිට්ටු නිසා. නාගරික සංවර්ධනයට ගියා. Site visit එකක් කරන්න සති තුනක් ගියා. මේ නාගරික සංවර්ධන අධිකාරිය කරන්නේ මොනවාද? මේ මෙගා පොලිස් ඇමැතිට පිස්සුද? මේ කරන වැඩේ මොකක්ද? ඒක නිසා අපි කියනවා, මේක අස්සේ එන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එකම කාරණයයි. මම හැමදාම කියන කාරණය. මේ ඉඩම් ටික අත්පත් කර ගන්න එන්නේ. මේ ඉඩම් ටික අත්පත් කරගෙන ඉන්දියාවට, චීනයට, වෙනත් බහුජාතික සමාගම්වලට මේ ක්‍රියාවලිය නතු කරන්න හදන්නේ. මේ අත්පත් කර ගත්තු ඉඩම්වලට වෙන්න යන දේ අපි දන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරියට වෙන කාර්යභාරයක් තිබෙනවා. ඒ කාර්යභාරය මොකක්ද කියලා තමුන්නාන්සේ දන්නවාද?

1988 නාගරික සංවර්ධන අධිකාරී පනත හඳුන්වලා දුන්නාට පස්සේ අවුරුදු තුනක් හතරක් ඇතුළත රට සංවර්ධනය කරන්නේ කොහොමද කියලා, නගරය සංවර්ධනය කරන්නේ කොහොමද කියලා සැලසුම හදලා ඒක අනුමත කරලා ඉවරයි. කිරිබත්ගොඩ නගරය හදන්නේ කොහොමද කියලා නාගරික සංවර්ධන අධිකාරියේ තිබෙනවා. කැස්බෑව නගරය හදන්නේ කොහොමද කියලා නාගරික සංවර්ධන අධිකාරියේ තිබෙනවා. මතුගම නගරය හදන්නේ කොහොමද කියලා නාගරික සංවර්ධන අධිකාරියේ තිබෙනවා. හැබැයි, දන්නේ කවුද? මේ රටේම නගර සැලසුම නාගරික සංවර්ධන අධිකාරිය සිද්ධ කරලා ඉවරයි. ඒ වැඩේ කරන්නේ නැහැ. මේ එක එක්කෙනාගේ උවමනාවට, අල්ලසට, දූෂණයට යට වෙලා කුට්ටිය කඩා ගන්න ඕනෑ වුණාම එක එක චක්‍රලේඛ එවනවා. එතකොට අපි කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ඉතාමත්ම පහත් ගණයේ වැඩක්. අපට හෙළිදරව් කරන්න නාගරික සංවර්ධන අධිකාරියේ නගර සැලසුම. අර රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය හොඳ ප්‍රවේශයක් ගත්තා. නිවාස හදන තැන කොතැනද? නගරයේ වාහන ගමනාගමනය කොතැනින්ද වෙන්නේ? තට්ටු නිවාස හදනවා නම් තට්ටු නිවාස හදන්නේ කොතැනින්ද? ඒ සැලසුම ඉදිරිපත් කරන්න. ජනතාවත් එක්ක සාකච්ඡා කරන්න. නාගරික සංවර්ධන අධිකාරිය තිබෙන්නේ වෙන වෙන බහුබූත වැඩ කරන්න නොවෙයි. දැන් මේකේ නීතිමය කටයුතු තිබෙනවා. අපි දන්නවා. අපි කියවලා තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරී පනතේ 25 (1) වගන්තිය යටතේ ඒ අයට නීතිමය කටයුතු කරන්න පුළුවන්. ආයිත් අමුතුවෙන් චක්‍රලේඛයකින් අනුමත කරන්න දෙයක් නැහැ. මේ චක්‍රලේඛය පෙන්නලා සාමාන්‍ය ජනතාව බය ගන්වනවා. ඒකයි මේ කරන්නේ. 25 (1) වගන්තිය යටතේ අපි කියවලා තිබෙනවා. දැන් මහේස්ත්‍රාත් උසාවියේ තිබෙන නඩු සැලකිය යුතු සංඛ්‍යාවක් නාගරික සංවර්ධන අධිකාරී පනතේ 25 (1) වගන්තිය යටතේ නඩු. හැබැයි මේ අනවසර ඉදි කිරීම් කියන්නේ, ඒ අයට කන්න ඕනෑ වුණාම

[ගරු සුනිල් වටගල]

කබරගොයා, තලගොයා න්‍යාය කරන්නේ. ඒ අයට ඉඩමක් ගන්න ඕනෑ වුණාම 25 (1) වගන්තිය පාවිච්චි කරනවා. එහෙම නැතුව මහජනතාවගේ යහපතට අවහිර වන ආකාරය කියලා නොවෙයි. ඒ අයට ඉඩම ඕනෑ වුණාම, ඉඩම ගන්න 25 (1) වගන්තිය පාවිච්චි කරනවා. අපි කියනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ පැහැදිලි වැරැද්දක් තිබෙනවා. මේ නගරය හදන්න ඕනෑ. නාගරීකරණය හදන්න ඕනෑ. නියම සැලසුමකට එන්න ඕනෑ. ඒ සැලසුම තිබෙන්නේ, නාගරික සංවර්ධන අධිකාරියේ බව අපි දන්නවා. හැබැයි මේ කථාව සිද්ධ වෙන්නේ නැති එකයි මේ තිබෙන්නේ. ඒ නිසා අපි විශේෂයෙන්ම දැන් මේ යෝජනාවේ අන්තිමට තිබෙන බලය බෙදීමේ මූලික සිද්ධාන්තයට පටහැනියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බලය බෙදීම නොවෙයි. මේක සාමාන්‍ය චක්‍රලේඛයක්. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බලය බෙදීමේ සංකල්පයට ජනතා විමුක්ති පෙරමුණ - බලය බෙදීම නොවෙයි. මේ පළාත් සභා සංකල්පයට පවා අපි විරුද්ධ වෙලා හිටියා. අපි කියන්නේ පරිපාලනය විමධ්‍යගත විය යුතුයි කියලා. ගමේ මිනිහාට මේ ප්ලෑන් එක අනුමත කර ගන්න, ගමේ මිනිහාට අදාළ පරිපාලන සහනය ලබා ගන්නයි මේ පළාත් පාලන ආයතනය තිබෙන්නේ. ඒක නිසා මේ පළාත් පාලන ආයතනයේ පරිපාලන සහන ටික ලබා ගන්න මිනිස්සුන්ට ගමේ ඉඳන් පයින් ඇවිදගෙන එන දුරට හදන්න. ඒ තත්ත්වය නිර්මාණය කරන්න. ඒක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ නැති තත්ත්වයක් මේ මෙගා පොලිස් ඇමැති කරන්න යන්නේ. 13 වැනි සංශෝධනයේ එදා කියනවා, මේ බලතල දෙන්නය කියලා. මේක තවත් ශක්තිමත් කරන්න ඕනෑ. නාගරික සංවර්ධන අධිකාරිය ඒක ශක්තිමත් කරනවා වෙනුවට, ඒකේ තිබෙන බලය අරගෙන තමන්ගේ සාක්කුවේ දාගන්න හදන්නේ. මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් පටහැනියි. මේ තත්ත්වය ඉදුරාම පරාජයට ලක් කළ යුතුයි කියන එක මම මේ අවස්ථාවේ කියනවා.

[අ.භා. 12.52]

**ගරු උපාලි කොඩිකාර**
**Hon. Upali Kodikara**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් මම සතුටු වෙනවා, සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මගේ කථාව ලැබීම සම්බන්ධව. මේකේ තිබෙනවා, ජනවාරි 08 වැනිදා මෛත්‍රීපාල සිරිසේන එක්ක ජනතා විමුක්ති පෙරමුණේ ටිල්වින් සිල්වා මහත්තයා ගහපු ගිවිසුම. මේකේ තිබෙනවා ජනවාරි 08 වැනිදාට පෙර අපේ චම්පක රණවක ඇමැතිතුමා හෙළ උරුමයත් එක්ක ගහපු ගිවිසුම. එතකොට චම්පක රණවක ඇමැතිතුමාගේ පක්ෂය නියෝජනය කරන අපේ හිතවත් නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා. ජනාධිපතිතුමාගේ උපදේශක. මෙගා පොලිස්.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
**Hon. Nishantha Sriwaranasinghe**

ඔබතුමා හරියට උච්චාරණය කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
**Hon. Upali Kodikara**

මෙගා පොලිස් උපදේශක නේද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
**Hon. Nishantha Sriwaranasinghe**

චම්පික රණවක.

**ගරු උපාලි කොඩිකාර**
**Hon. Upali Kodikara**

චම්පික රණවක. හරි. දැන් මේ දෙන්නාම ඉන්න ඕනෑ හවුල් ආණ්ඩුවේ පාර්ශවකාරයෝ දෙන්නත් එක්ක මේ ගෙනැල්ලා තිබෙන පනත ගැන කථා කරන කොට, මේගොල්ලෝ විරුද්ධව කථා කරලා එදා මේ පනත් ගේනවා කියලා දැනගෙන අත්සන් කරපු අය. මේවා දැනගෙන නේ අත්සන් කළේ? දැන් මාධ්‍යයට පේන්න බොරුවට කයිය ගහනවා. මේ රට විශාල -

**ගරු සරත් පතිරණ**
**Hon. Sarath Pathirana**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු උපාලි කොඩිකාර**
**Hon. Upali Kodikara**

මේ රට විශාල ලෙස සංවර්ධනයට යවලා, යුද්ධය අවසන් කරලා මේ රට සංවර්ධනයකට ගෙන එන වෙලාවේ තමයි -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ පක්ෂයේ ප්‍රධාන ලේකම්තුමා තමයි ටිල්වින් සිල්වා මහත්තයා කියලා කියන්නේ. එතකොට එතුමා මෛත්‍රීපාල සිරිසේන මහත්තයාත් එක්ක ගිවිසුමක් අත්සන් කළා කියලා මේ සභාවේ මේක හැන්සාඩ්ගත වෙන්න දෙන්න බැහැ. එහෙම ගිවිසුමක් අපි අත්සන් කරලා නැහැ. පක්ෂයක් හැටියට අපි අත්සන් කරලා නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඔය එහෙම නම් කියන්නේ.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

නැහැ, නැහැ. ඔය ගිවිසුම්, කොලකෑලි, කැලෑ පත්තර ගෙනැල්ලා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා කැලෑ පත්තර ගෙනැල්ලා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මාධ්‍ය රටටම ප්‍රකාශ කරපු කථාවක් තිබෙනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මේ කැලෑ පත්තර ගෙනැල්ලා මේ සභාව හැල්ලු කරන්න එපා. අපි එහෙම ගිවිසුමක් අත්සන් කළේ නැහැ.



**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෛත්‍රීපාල සිරිසේන එක්ක, එක්සත් ජාතික පක්ෂයත් එක්ක -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අපි එහෙම ගිවිසුමක් අත්සන් කළේ නැහැ. හැබැයි අපි මහින්ද රාජපක්ෂ පරාජය කරන්න වැඩ කළා. ඒකයි මේ රිදෙන්නේ. මහින්ද පරාජය කරන්න අපි වැඩ කළා. ඒක ඇත්ත. හැබැයි අපි හොර ගිවිසුම් ගහලා නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෛත්‍රීපාල සිරිසේනගේ ප්‍රකාශය එහෙම නම් බොරුවක් කියලා දාන්න -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

අපේ පක්ෂයේ ප්‍රධාන ලේකම්තුමාගේ නම මේ හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කථාව කරනවාද? නැත්නම් කාත් එක්ක හරි රණ්ඩු කර කර ඉන්නවාද? ඔබතුමාගේ කාලය ඉවර වෙනවා. එච්චරයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රකාශය රාජ්‍ය නායක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ජනවාරි 08 වැනිදාට කලින් ගහපු ප්‍රකාශයේ මේක තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ ප්‍රකාශය එතුමන්ලා ප්‍රතික්ෂේප කරනවා නම් -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ පින්තූර ප්‍රතික්ෂේප කරන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමා ප්‍රතික්ෂේප කරනවා. කාගේ හරි පොතක තිබෙන පින්තූරයක් එතුමාට ප්‍රතික්ෂේප කරන්න -

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මේගොල්ලෝ කැලෑ පත්තර පප්පලා. ඒ නිසා මේක වලංගු පත්‍රිකාවද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා නියෝග කරන්න හැන්සාඩ් එකෙන් අපේ ප්‍රධාන ලේකම්ගේ නම ඉවත් කරන්න කියලා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගිව්සුමේ මේගොල්ලොත් ඉන්නවා. නැහැ කියන්නේ කොහොමද? පක්ෂ 47 ක් එකතු වෙලා ගහපු ගිව්සුමේ මේගොල්ලොත් ඉන්නවා. නැහැ කියන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කාලය අවසන් වෙනවා. ඔබතුමා මාතෘකාවට අදාළව කථා කරන්න. මූලාසනයට කථා කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

දැන් මේ පනතේ කියනවා. මෙතැන වැඩි පිරිසක් ඉන්නේ, අපේ ප්‍රේමදාස ජනාධිපතිතුමා. එදා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා. මේ රටේ තිබෙන පළාත් පාලන මැතිවරණය කල් දාලා තිබෙන වෙලාවේ ප්‍රේමදාස ජනාධිපතිතුමා 91 පළාත් පාලන ආයතන තියලා, මේ සභාවට ආපු වැඩි පිරිසක්, අද පාර්ලිමේන්තුවේ ඉන්න, කැබිනට් එකේ ඉන්න මන්ත්‍රීවරු වැඩි පිරිසක් පළාත් පාලන ආයතනවලින් තමයි ආවේ. ප්‍රේමදාස ජනාධිපතිතුමා මේ නාගරික සංවර්ධන අධිකාරී පනත ඉතාම හොඳට, ලස්සනට ගෙන ආවා. මොකද, රටකට අවශ්‍ය දේ අපේ වටගල මන්ත්‍රීතුමා කියපු දේ ටිකක් හොඳ කොටසක් තිබෙනවා. එතකොට ගමකට අවශ්‍ය දේ කරන්නේ කොහොමද? කොහේද ගෙවල් හදන්නේ? කොහේද නගරය හදන්නේ? කොහේද පිට්ටනියක් හදන්නේ? කොහේද Swimming Pool එකක් හදන්නේ? කොතැනද ඉස්කෝලය? කොතැනද ජාතික පාසල? මුළු ලංකාවේම ප්‍රධාන නගරවලට මෙහෙම Town Plan එක්ක තිබුණා. මේ පනත අනුව තිබෙන්නේ, අන්න විධියට තමයි මේ සැලසුම කරන්න නාගරික සංවර්ධන අධිකාරියට බලය දීලා තිබුණේ. මේකේ තිබෙනවා නගර සභා ආඥා පනත. පළාත් පාලන ආඥා පනත. එතකොට මේකේ බලතල ගන්න ඕනෑ නම්, තමාගේ පළාත් පාලන ආයතනයෙන් විමසලා, පළාත් සභාවෙන් විමසලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය යටතේ බෙදූ බලතල යටතේ නැවත ඕනෑම අධිකාරියකට පවරා ගන්න නම් 2/3 ක බලයක් සහිතව පවරා ගන්න ඕනෑ. එහෙම දාලා තිබෙනවා, ප්‍රේමදාස මහත්තයා. මම හිතන්නේ මේ නීතිඥ මහත්තයා මට වඩා හොඳට මේක කියවලා ඇති. මෙතැන තවත් නීතිඥ මහත්මයෙක් ඉන්නවා. එතකොට දැන් අපි -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පිටිපස්සෙත් එක්කෙනෙක් ඉන්නවා. එයා ජේන්නේ නැද්ද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

උසාවියේ බොරු කියන්නේ නැති කට්ටිය. බොරු කියන කට්ටියයි කියලා දෙගොල්ලක් ඉන්නවා. ඒ ඉන්නේ බොරු නොකියන කට්ටිය. ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා. නඩු කල් දාන්නේ නැහැ. එතකොට දැන් ඉසුර දේවප්‍රිය අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා - අපි නගර සභාවේ සභාපති. අපේ ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා, අපේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා, අපි සියලු දෙනාම පළාත් පාලන ආයතනවල ඉඳලා ආපු මිනිස්සු. එතකොට පළාත් පාලන ආයතනයක කරුණු 472 ක් තිබෙනවා. වැඩ කරන්න ඕනෑ කරුණු. උපදින දරුවාගේ ඉඳලා බල්ලා, හරකා, පූසා, මීයා, මදුරුවා මේ වාගේ කරුණු ගණනක් තිබෙනවා. සිරිකමල් ගරු මන්ත්‍රීතුමා දන්නවා. එකේ තිබෙනවා. හවසට මොන්ටිසෝරිය, නෝනා මහත්මිය, සීයා ඔක්කෝම මේ පනතේ තිබෙනවා. දැන් මේ අනුව මොකක්ද උදුරන්න යන්නේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් බෙදපු බලය කොටස් කොටස් උදුරනවා. දැන් මේ මෙගා පොලිස් එකේ අපේ උපදේශක මහත්තයා ඉන්නවා. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා.

**0**227

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමා සම්පූර්ණයෙන්ම බොරු ප්‍රකාශයක් කරන්නේ. මෙගා පොලිස් අමාත්‍යාංශයේ කිසිම තනතුරුක් මම දරන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

Sorry මට වැරදුණා. ජනාධිපති උපදේශක බස්නාහිර පළාතේ. බස්නාහිර පළාතේ ජනාධිපති උපදේශක.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒකත් වැරදියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එයාගේ ගුරුන්නාන්සේ තමයි මෙගා පොලිස් එකේ ඇමැතිවරයා. Sorry. මට ඒක පොඩ්ඩක් වැරදුණා. මෙයාගේ ගුරුන්නාන්සේ තමයි මොග පොලිස් එකේ ඇමැතිතුමා. එතකොට දැන් මේ ඇමැතිතුමාට මේකේ දීලා තිබෙනවා. මොකක්ද කියන්නේ? ලෝක පරිසර පනත. ජීනිවා මානව අයිතිවාසිකම් කොමිසම. එතකොට මේ පනතට මේවාත් ඇතුළත්. තියෙනවා. මේකේ කොටසක් නේ අපට දීලා තිබෙනවා. මේකේ අනෙක් ටිකේ තිබෙනවා. එතකොට ඒකේ කියනවා, දැන් මේකෙන් මොකක්ද වෙන්නේ? දැන් අපේ පළාත්වලට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා රට හදමුයි ගොවිතැන දියුණු කරමුයි කියලා මේකේ යෝජනා ගෙනැල්ලා, හාල් දැන් 110 ට නැහලා තිබෙනවා. වී ටික 20 ට අරගන්න කාලයක් වෙලා තිබෙනවා. එතකොට ඉතුරු කුඹුරු ටික පුරවන්න තමයි මේ පනත ගෙන එන්නේ. මේ උදුර ගන්න එකෙන් මොකක්ද කරන්නේ? අපි කම්වුවේ වාඩි වුණු මිනිස්සු. අපේ ගුරුතුමා මෙතැන නැති එක ගැන මට කනගාටුයි. අපේ රොඩ්නි ෆ්‍රේසර් ගුරුතුමා. එතුමා ඉංග්‍රීසියෙන් නේ ළමයින්ට උගන්වන්නේ. එතුමාට සිංහල තේරෙන්නේ නැහැ. ඒ නිසා තමයි මහරගම නගර සභාව ලංකාවේම පළාත් පාලන ආයතනවලින් තුන්වැනියාට පත් වුණේ. තුන් සැරයක් නගර සභාවට ඉල්ලුවා. දිනා ගන්න බැරි වුණා. තැන් සැරේම එක්සත් ජාතික පක්ෂය මහරගම නගර සභාව පරාදයි. ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන ඇමැතිතුමයි, මමයි එක සැරයක් දිනලා නගර සභාව ගත්තා. දිගටම අපි පළාත් පාලන ආයතන හොඳට කරපු නිසා තමයි ඒ තත්ත්වයට අද මහරගම නගරය විශාල දියුණුවක් ඇති වෙලා තිබෙන්නේ. අද බලන්න මහරගම නගරයේ සැලැස්මක් තිබුණු නිසා තමයි කොට්ටාව නගරයේ එදා මම ප්‍රවාහන ඇමැතිවරයා හැටියට -

**0**228

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

බලන්න කෝ ඔබතුමාව මෙල්ල කරගත්තු හැටි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අහගෙන ඉන්න සිරිකමල් මන්ත්‍රීතුමා. ප්‍රවාහන ඇමැතිතුමා හැටියට නගර සභාවත් එක්ක එකතු වෙලා, නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක එකතු වෙලා අපි පානදුර නගරය, මෙතුමාගේ ගම. ඊළඟට මීනුවන්ගොඩ ප්‍රදේශය. එතකොට අපේ හාමුදුරුවන් වැඩ වාසය කරන ප්‍රදේශය. බේරුවල ප්‍රදේශය. අපි හැදුවා Plan එකක්. මෙන්න Bus Stand එක හදන තැන. මෙන්න පොළ. මෙන්න වෙළඳ සංකීර්ණය. මෙන්න පේව්මන්ට් එකේ විකුණන තැන. මේ අයට මෙතැන ස්වයං රැකියා දෙන්න කියලා අපි හැදුවා. (බාධා කිරීමක්) නැහැ, බුද්ධදාස එච්චර හැදුවේ නැහැ. ඒ බොරු. කඩුවෙල එහෙම Plan එකක් තිබුණේ නැහැ. මොකද, UDA එක තියෙන්නෙත් ඒකෙම නේ? දැන් මේ පනතෙන් මොකක්ද වෙන්නේ? ගමේ ඉන්න නෝරිස් අයියා, ජුවානිස් අයියා කුඹුර කොටලා උදැල්ලත් කරේ තියාගෙන යනවා නාගරික සංවර්ධන අධිකාරියට. තමන්ගේ දුවට ගේ හදාගන්න. වර්ග අඩි 400 ට තිබෙන තට්ටු දෙකේ ගොඩනැගිල්ලක් හදාගන්න. දැන් වැඩට ගිහිල්ලා එන කුසුමා. ආණ්ඩුවේ රස්සාව කරලා නිවාඩු දාලා හත් සැරයක්, අට සැරයක් එනවා. Transport වලට මෙපමණයි. මට වුණු දේ. මම මගේ ඉඩම හදාගන්න පරිසර අධිකාරියට ගිහිල්ලා හෝටලේ හදාගන්න යවනවා. කීයද? මේක පරීක්ෂා කරන්න එන්න 10,500/- යි. නාගරික සංවර්ධන අධිකාරියේ ඉඳලා අල්ලපු වැටේ තිබුණු ඉඩම. දැන් අම්පාරේ මනුස්සයෙක් එනවා කියන්න කෝ? එතකොට මොකද

[ගරු උපාලි කොඩිකාර]

වෙන්නේ? අම්පාරේ මනුස්සයෙක් එනවා. අම්පාරේ මනුස්සයා කුණු කෙළ පෙරාගෙන ඊ තිස්සේ බස් එකේ ඇවිල්ලා, පෙට්‍රල්, ඩීසල් ටිකක් ගහගෙන බත්තරමුල්ලේ තිබෙන නාගරික සංවර්ධන අධිකාරියට එනවා. පනතේ තිබෙන නීතිරීති ටික අනුමත කර ගන්න. එතකොට දැන් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, යහපාලන ආණ්ඩුවේ බලය බෙදන, බලය පහළට ගෙන එන්නය කියලා මහා විපර්යාසයක් කරපු අය. ප්‍රජාතන්ත්‍රවාදය රකිනවා. මානව අයිතිවාසිකම් රකිනවා කියලා ගෙනාපු ආණ්ඩුව තමයි මේ කටයුතු කරන්නේ.

එතකොට දැන් අපි කියන්නේ මේ පනතට අපි විරුද්ධ වෙන්න ඉස්සෙල්ලා ගෙනාවා තිරසාර පනත. මමයි, ජගත් ගරු මන්ත්‍රීතුමා විතරයි එදා මේකට විරුද්ධ වුණේ. දැන් ඊට පස්සේ කෙළිනවා කුණු ටිකට. දැන් යනවා කුණු සාකච්ඡාවක්. UDA එකෙන් ගහනවා. කුණු ටිකට ගහනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අහන්න කැමැතියි මහ ඇමැතිතුමාගෙන් අහලා මෙගා පොලිස් එකට අවසරයක් අරගෙන තිබෙනවාද? දැන් මෙගා පොලිස් එකෙන් පාරවල් කීයක් හදනවාද? මෙගා පොලිස් එකෙන් මහ පරිමාණ වැඩ කරන, පාරවල් හදන නගර සභාවක වැඩ කරන එකක්ද මේ? ඒ නිසා තමයි මේ උදුරන්නේ. දැන් තාර දානවා. මහ ඇමැතිතුමා නම් කරපු පාරට කාපට් කරන්න මෙගා පොලිස් තාර දානවා. මේ මහජනයාගේ සල්ලි. එතකොට දැන් මේ විධියට මේ පනතෙන් මේ තිබෙන බලතල ගත්තොත් වෙන්නේ පළාත් සභාව සහ පළාත් පාලනය දෙකම ඉවරයි. බලතල නැහැ. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් වැඩක් නැහැ. අපට නිකම් පෙන්දෝ ගාණට මේකේ ඉන්න වෙනවා. වෙන කිසිම මේවා එකක් නැහැ. විග්නේෂ්වරන් ඇමැතිවරයා උතුරේ. විග්නේෂ්වරන් ඇමැතිවරයා කියනවා නැහැ. එහේට ඕනෑ මොකක්ද? ස්වයං පාලනය. එතැනදී ඒක හරි. ඇයි හේතුව? දැන් මේ පස්සේ යන්න ඕනෑ නැහැ. යාපනේ මිනිහා UDA එකට එන්න ඕනෑ නැහැ. ස්වයං පාලනය දීලා ඒක දුන්නාම එතැන බලතල එතැනට බෙදන නිසා විග්නේෂ්වරන් මේක ගන්නවා. තනියෙන් හදනවා. මෙගා පොලිස් එකට UDA එකට අත ගහන්න බැහැ. මෙන්න මේක තමයි 13 වැනි සංශෝධනයෙන් වෙලා තිබෙන්නේ. අපි මේ මන්ත්‍රීවරු මීට වඩා මේ පනත් ගෙන එනකොට 13 වැනි සංශෝධනයේ බලය අරගෙන අපි මීට වඩා බුද්ධිමත්ව අත උස්සන්න පුරුදු වෙන්න. මේ මහජනයා ඇහුවේ. අපේ කිදෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපේ ප්‍රධාන ඇමැතිතුමා ප්‍රකාශ කළා, මේ බලය බෙදීම සම්බන්ධව තිබෙන ප්‍රශ්නය පිළිබඳව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධව. දැන් කාවද දැනුවත් කරලා තිබෙන්නේ? මුළු ජනගහනයෙන් මිලියන 2 ක් විතර ඉන්නවා. මේ මිනිස්සුන්ගෙන් 4442 ක් තමයි (බාධා කිරීමක්) එතකොට මේ හාරදහස් ගණනකින් කරුණු අරගෙන තමයි මේක කරන්නේ. අධ්‍යක්ෂ මණ්ඩලය දේශපාලන පත්වීම්වලට ඒ පුටුවලට ඇවිල්ලා මහජනයාගේ අයිතිවාසිකම් උදුරනවා. අන්න ඒ නිසා මේ පනතට මේ ගෙන එන බලතලවලට මහ ඇමැතිතුමා ප්‍රධාන, මහ ඇමැතිතුමාගේ සාකච්ඡාවලදී මීට වඩා බුද්ධිමත්ව මේ දිහා බලලා කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.07]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා. කාලීන සහ සාකච්ඡාවට බඳුන් විය යුතු ආකාරයේ කරුණක් පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කිරීම පිළිබඳව. වටිනා කියන අදහස් ගණනාවක් ඉදිරිපත් කළා. ඒ සෑම අදහස් ඇතුළේම තිබෙන්නේ මේ ඉදිරිපත් වෙලා තිබෙන චක්‍රලේඛය මත පළාත් පාලන ආයතනවල දැනට පවතින බලය යම් ආකාරයකට සීමා කිරීමකට ලක් කරලා, පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වීමේදී ඇති විය හැකි යම් යම් අඩුපාඩුකම් සහ ආදායමේ යම් වෙනසක් වේද කියන කාරණය මේ තුළ තිබෙනවා. විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ මා කරුණු තුනක් දකිනවා. එකක් තමයි සේවය ලබා ගැනීමට තිබුණු පහසු මාර්ග අවහිර වෙනවා කියන කාරණය කියනවා. දෙවැනි කාරණය විධියට ආදායම අඩු වෙනවා කියන එක කියනවා. තුන්වැනි කාරණය විධියට එතුමා මේ යෝජනාව තුළ කියනවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බලය බෙදීමේ මූලික සිද්ධාන්තයට පටහැනියි කියලා. එතකොට මෙන්න මේ කියන කාරණා තුන සිද්ධ වෙනවා නම්, මේ කාරණයට පළාත් සභාවක් විධියට අපි මැදිහත් විය යුතු වෙනවා. හැබැයි දැන් අපට පත් කරපු යෝජනාවේ ඒ සමග අදාළ චක්‍රලේඛයේ පිටපතක් තිබෙනවා. මේ චක්‍රලේඛය ආරම්භ කරන්නේ අධිකාරියේ

කළමනාකරණ මණ්ඩලය විසින් මේ තීරණය ගත්තා කියලා. එහි අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා විධියට, මේ සභාපතිවරයා මේ චක්‍රලේඛය අත්සන් කරලා තිබෙනවා.

එහෙම නම් ගරු සභාපතිතුමනි, බලන්න කළමනාකරණ මණ්ඩලය විසින් නම් මේ තීරණය අරගත්තේ නාගරික සංවර්ධන අධිකාරී පනත සහ සංශෝධිත පනත් අනුව මේ කළමනාකරණ මණ්ඩලය සමන්විත වෙන්නේ කාගෙන්ද? කවුරුන්ද කියන කාරණය පිළිබඳව. එහෙම නම් මේ තීරණය ගත්තේ කළමනාකරණ මණ්ඩලය නම් එතකොට තනි පුද්ගලයෙක් නොවෙයි මේ තීරණය අරගෙන තිබෙන්නේ. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කියපු විධියට එතුමාගේ බිල්ඩින් අයදුම්පත්‍රයක් අනුමත කරගන්න ගිහිල්ලා ඇති වුණු අලකලංචියේ ප්‍රතිඵලයක් විධියට නොවෙයි මේක වෙන්නේ. මේ කළමනාකරණ මණ්ඩලයේ තීරණයක් විධියට. කළමනාකරණ මණ්ඩලයේ පනතේ හතරවැනි වගන්තියේ කියනවා කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරායා වෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියේ එහෙම නැත්නම් මහ නගර සභා, මෙගා පොලිස් අමාත්‍යාංශයේ සභාපතිවරයා. ඊට පස්සේ ලංකාවේ පළාත් පාලන ඇමැතිවරයා විසින් පත් කරන නියෝජිතයෙක් මේ කළමනාකරණ මණ්ඩලයේ ඉන්නවා. ඉඩම් විෂයය භාර ඇමැතිවරයා විසින් පත් කරන නියෝජිතයෙක් මේ කළමනාකරණ මණ්ඩලයේ ඉන්නවා. අධ්‍යාපන විෂයය විසින් පත් කරන නිලධාරියෙක් මේ කළමනාකරණ මණ්ඩලයේ ඉන්නවා. කර්මාන්ත, සෞඛ්‍ය, ප්‍රවාහන, අධ්‍යක්ෂ නගර සහා ග්‍රාම නිර්මාණ එකේ නියෝජිතයෙක් මේකේ ඉන්නවා. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙක් මේ කළමනාකරණ මණ්ඩලයේ ඉන්නවා. මෙන්න මෙහෙමයි කළමනාකරණ මණ්ඩලය සමන්විත වෙන්නේ. අන්න ඒ කළමනාකරණ මණ්ඩලය විසිනුයි මේ තීරණය අරගෙන තිබෙන්නේ. මේ තීරණය අරගන්න අපි කවුරුත් කරපු කියපු දෑ ඉතිහාසයේ ඉඳලා අද වර්තමානය වනකල් බලපාලා තිබෙනවා. අද මේ තීරණය හුදෙක්ම යහපාලනයට ඇඟිල්ල දික් කරලා, මහින්ද රාජපක්ෂ මහත්තයා වේවා, ගෝඨාභය රාජපක්ෂ මහත්තයා වේවා ඒ පැත්තට ඇඟිල්ල දික් කරලා මේ එක්තරා සීමාවකදී නතර කරන්න පුළුවන් තැනක නොවෙයි මේකේ ඇඟිල්ල තිබෙන්නේ. අපි හැමෝම අඩුවැඩි වශයෙන් ලෝකය දිහා බලන්නේ නැතුව, ජනගහන වේගය දිහා බලන්නේ නැතුව, අක්‍රමවත් සංවර්ධන ව්‍යාපෘති දිහා බලන්නේ නැතුව, පරිසර දූෂණය දිහා බලන්නේ නැතුව නිසි කලට වැසි වසින්නේ නැහැ. නිසි කලට පැවිල්ල නැහැ. නිසි කලට වර්ෂාව නැහැ. ගොයමට වන හානිය පිළිබඳව, කෘෂිකර්මාන්තයට වන හානිය සහ මහජන දිවි පැවැත්මට සිද්ධ වන හානිය පිළිබඳව නොතකා කරපු කියපු බොහෝ දේවල්වල ප්‍රතිඵලය නිසයි මේ වෙන්නේ. අද ලංකාවේ ජනගහනය නගරය කේන්ද්‍ර කර ගන්න ප්‍රතිශතය 2010 වනකොට 35% ක් වෙලා තිබුණා. නගරයට ඇදී එන ජනගහනය 2010 දී 35% ක් වෙලා තිබුණා. උදාහරණ විධියට මේකේ ආයතන විසින් පෙන්වා දෙනවා 2035 දී මේ රටේ මුළු ජනගහනයෙන් 50% ක් නගරය කේන්ද්‍ර කර ගත්තු, නගරයත් එක්ක ජීවත් වන නාගරීකරණයට ලක් වුණු මිනිස්සු බවට පත් වෙනවා කියලා. එහෙම නම් දූර දක්නා රජයක්, දූර දක්නා ඇමැතිවරුන්ගෙන් අපි මේ රටක පුරවැසියෝ විධියට බලාපොරොත්තු වෙන්න ඕනෑ, අද ගැන හිතලා ගන්න තීරණවලට වඩා අනාගතය ගැන හිතලා ගන්න තීරණ සම්බන්ධයෙන් . එයයි අද ලංකාවේ තිබෙන ප්‍රධානතම කාරණය වෙලා තිබෙන්නේ. ප්‍රාදේශීය සභාවේ ඉඳලා පාර්ලිමේන්තුව දක්වා පත් කර ගන්න මහජන නියෝජිතයන්ගෙන් පුරවැසියා බලාපොරොත්තු වෙන්නේ, මළ ගෙදර එන එක, මඟුල් ගෙදර එන එක, දානේ ගෙදර එන එක විතරයි.

හැබැයි සියලු මහජන නියෝජිතයන්ගෙන් සිදු විය යුත්තේ අනාගත මතු පරම්පරාවට ජීවත් වීමට සුදුසු රටක්, ගමක්, ප්‍රදේශයක් නිර්මාණය කිරීම සහ හරකා බානා, සතා සිව්පාවා, ගහ කොළ රැක දීමයි. එහෙම නම් මෙන්න මේ 2035 දී නාගරීකරණය වෙලා රටේ ජනගහනයෙන් 50% ක් නගර කරා ඇදී ආවට පස්සේ නාගරික සංවර්ධනයේ වැදගත්කම අපට බලපානවා. මීට කලින් කථා කරපු සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාත්, තවත් කතික මන්ත්‍රීවරු කිව්වා ප්‍රේමදාස ජනාධිපතිතුමා පිළිබඳව. ප්‍රේමදාස ජනාධිපතිතුමා පළාත් පාලන ඇමැතිවරයා විධියට මේ සංකල්පය මේ රටේ දියත් කරන්නට, ක්‍රියාත්මක කරන්නට ගත්තු පළමුවැනි උත්සාහය ඇස් පනාපිට අපට දකින්න ලැබෙන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර නරගය හරහා. වටරවුම් 18 ක් තිබෙනවා. ඒ වටරවුම් 18 න් කොයි තැනට ගියත් එකම වටරවුමක් විධියට තමයි අනුරාධපුරය අපට දකින්න ලැබෙන්නේ. ඒක සැලසුම් 6 ක් යටතේ ප්‍රේමදාස ජනාධිපතිතුමා, අංග 6 ක් යටතේ, කොටස්

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

6 ක් යටතේ, අවස්ථා 6 ක් යටතේ, වැඩමුළු 6 ක් යටතේ නගරය සංවර්ධනය කරන්න, ආදර්ශ නගරයක් විධියට, නියමු ව්‍යාපෘතියක් විධියට -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

තමුන්නාන්සේ සභාව නොමඟ අරිනවා. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

බණ්ඩාරනායක ශ්‍රීමතාණන් පටන් ගත්තා නම් ප්‍රේමදාස මහත්තයා වැඩේ කළා. ඔබතුමාට ස්තුතියි. ඒ නගර නිර්මාණ සැලැස්ම අනුරාධපුරයෙන් පටන් ගත්තේ මෙන්න මේ විධියට දූර දක්නා නුවණකින් මේ කටයුත්ත කරන්න ඕනෑ නිසා. නාගරීකරණයේ වේගය සහ විශාලත්වය, තිරසාර නාගරික සංවර්ධනය, නාගරික ප්‍රදේශයන් සඳහා මූලික පහසුකම් ලබා දීම, ප්‍රතිපත්ති සහ උපාය මාර්ගික සැලසුම් සැකසීම කියන වශයෙන් තමයි මෙන්න මේ කටයුත්ත දියත් වෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1978 අංක 41 පනතේ තුන්වැනි වගන්තියට අනුව මේක UDA ප්‍රදේශයක් විධියට, නාගරික සංවර්ධන අධිකාරියට අයිති බල ප්‍රදේශයක් විධියට අපි ජීවත් වන බහුතර ප්‍රාදේශීය සභා, පළාත් පාලන ආයතන ප්‍රදේශ නම් කරලා තිබෙනවා. ඒ නිසා සභාවට ලැබුණු ආදායමක් තිබෙනවා. සභාවට ලැබුණු වටිනාකමක් තිබෙනවා. ඒ සභාවට ලැබුණු වටිනාකම නාගරික සංවර්ධන අධිකාරී පනත තුළින් නියාමනය කරනවා. ඒ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 1982 සංශෝධනය අනුව කියනවා, UDA එකට සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ භෞතික සංවර්ධන කටයුතු සඳහා අධිකාරී බලය තිබෙනවා කියලා. ඒ 1982 සංවර්ධනයෙන් කියන්නේ. නාගරික සංවර්ධන අධිකාරියට තිබෙන බලය මොකක්ද කියන එක මේ කටයුතු සම්බන්ධයෙන්. සංවර්ධන සැලසුම් සකස් කිරීමට, ඒ වාගේම භෞතික සංවර්ධන කටයුතු සඳහා අධිකාරී බලය තිබෙන්නේ, මේ නාගරික සංවර්ධන අධිකාරියට. එහෙම නැත්නම් චම්පික රණවක ඇමැතිතුමාගේ අමාත්‍යාංශයට. මම විශ්වාස කරන විධියට මේ රටේ අනාගතයේ බිහි විය යුතු ජාතික නායකයෙකුගේ ලක්ෂණ පෙන්නුම් කරන ඇමැතිවරයා තමයි චම්පික රණවක ඇමැතිතුමා. එතුමා විතරයි මේ අමාත්‍යාංශ කාගේ යටතේ තිබුණත්, යහපාලන ආණ්ඩුවේ හිටියත්, වෙනත් ආණ්ඩුවක හිටියත් අමාත්‍යවරයෙක් විධියට - අරගෙන බලන්න අමාත්‍යාංශ වාර්තා. අමාත්‍යාංශයක් විධියට, ඇමැතිවරයෙක් විධියට තමන්ට පැවරුණු කාර්ය භාරය නිසි ලෙස ඉෂ්ට කරපු එකම ඇමැතිවරයා. මහින්ද මහත්තයා ළඟ හිටියත්, චන්ද්‍රිකා නෝනා ළඟ හිටියත්, රනිල් මහත්තයා ළඟ හිටියත් පසුගිය ඉතිහාසයේ ඇමැති කෙනෙක්ගේ වගකීම හරියට ඉෂ්ට කරපු ප්‍රධානතම ඇමැතිවරයා තමයි චම්පික රණවක. (බාධා කිරීමක්) සිල් බිඳ ගත්තා. ඒක වෙනම එකක්. චම්පික රණවක ඇමැතිතුමා. ඒ නිසා මම විශ්වාස කරනවා මේ ක්‍රියා මාර්ගය හරහා මේ රටට යහපතක් වන ප්‍රතිපත්තිමය තීරණයකට එතුමා -

[සභාවේ ඝෝෂා]

දැන් මොනවද මේකේ තියෙන්නේ? ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන ප්‍රදේශයන්හී අනු ඉලක්කම් එකේ සිට එකොළහ දක්වා කරුණු එකොළහක් සඳහන් කරනවා. සිරිකමල් හිලේෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී පැහැදිලි කළා, රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා දැනටමත් මහල් හතරකට වැඩි ගොඩනැගිලි අනුමත කිරීමේ බලය ප්‍රාදේශීය සභාවේ පළාත් පාලන සභාපතිවරයාට නැහැ. ඒක මේ මොහොතේ තිබෙන්නෙත්, මේ චක්‍රලේඛය එන්න කලිනුත් තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියටයි. ඒ අනුව UDA එකට යොමු කරන්න ඕනෑ. ඒක දැනටත් අපි ළඟ නැති එකක්. මේකේ දෙවැනියාට මොකක්ද තිබෙන්නේ? පරිසර දූෂණයට සහාය දෙන සියලුම කර්මාන්ත සහ ඉන්ධන පිරවුම්හල්. අපට විරුද්ධ වෙන්න පුළුවන්කමක් තිබෙනවාද? යම් ආයතනයක්, යම් ඉන්ධන පිරවුම් හළක්, කර්මාන්ත ශාලාවක් පරිසර දූෂණයට ලක් වෙනවා නම් දේශපාලන අධිකාරියෙන් ඔබ්බට ගිය රාජ්‍ය නිලධාරීන්ගේ මැදිහත්වීම තුළ නාගරික සංවර්ධන අධිකාරිය මැදිහත් වෙලා මේ පරිසරය අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කරන ක්‍රියා මාර්ගයක් නම් ඔබට මට විරුද්ධ වෙන්න පුළුවන්කමක් නැහැ. තුන්වැනි එක. ස්වාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන්. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා ස්වාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් කිව්වා. ස්වාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් යම් පනතක් ක්‍රියාත්මක වෙනවා. ඒ පනතේ තිබෙන්නේ ස්වාධිපත්‍ය දේපළ

ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? දේපළ පවරන්නේ කොහොමද? ඒ කියන කාරණා තිබෙන්නේ - හැබැයි ස්වාධිපත්‍ය දේපළ මේ ඔබයි මමයි ජීවත් වන ප්‍රදේශයේ අද නැති වුණාට, හෙට දවසේ මේ පර්චස් 05, 06, 10, 20, 25 බිම් කට්ටි කඩන එක නොවෙයි. මේ රටට ගැළපෙන නිවාස ඉදි කිරීම බවට පත් වෙන්නේ ස්වාධිපත්‍ය දේපළ තුළ තට්ටු නිවාස ඉදි කරන එක. එහෙම නම් හෙට දවසේ මගෙයි, ඔබෙයි කියා ගත්තු පර්චස් 20, 30 ඉඩම් කැලි වෙනුවට අස්සක් මුල්ලක් නැර ලංකාව පුරා ඉදි වෙන්න ඕනෑ ස්වාධිපත්‍ය දේපළ.

එහෙම නැත්නම් තට්ටු නිවාස ක්‍රමය තමයි මේ රටට ගැළපෙන දේපළ ක්‍රමය. ඒක කළමනාකරණය කිරීම, අනාගත මතු බලාපොරොත්තුව නම්. ඒ බලාපොරොත්තුව මුදුන් පමුණුවා ගැනීමට නාගරික සංවර්ධන සංවර්ධන අධිකාරිය අද ක්‍රියාත්මක වීම, මම වරදක් විධියට දකින්නේ නැහැ. රටේ අනාගතය උදෙසා ගන්න ක්‍රියාමාර්ගයක් විධියට. පර්චස් 40 ට වැඩි ඉඩම් කට්ටි කර විකිණීම. මේකෙන් යම් බලපෑමක් තිබෙනවා. අද පළාත් පාලන ආයතනවලට මුද්දර ගාස්තුව සහ ඔප්පුවලින් ලැබෙන මුද්දර ගාස්තුව, උසාවි දඩ මුදල් සහ මේ බිම් කට්ටි කැඩුවාට පස්සේ ලැබෙන 1% මුදල සභාවට විශාල ශක්තියක් ලැබිලා තිබෙනවා. ඒ නිසා මේ ආයතනයට අපේ පළාත් පාලන නියෝජිතයෙක් ඉඳලා තිබෙනවා කළමනාකරණ මණ්ඩලයේ. ෆයිසර් මුස්තාපා ඇමැතිතුමා නියෝජිතයෙක් නම් කරලා අපි වෙනුවෙන් පළාත් සභාවේ නියෝජිතයෙක් එතැන කළමනාකරණ මණ්ඩලයේ ඉඳලා තිබෙනවා. එහෙම නම් එයා හරහා බලපෑමක් ඇති කරන්න. එහෙම නැත්නම් මේක වෙනත් සාකච්ඡාවකට ගෙනැල්ලා 1% කට වන දේ - 87 ප්‍රාදේශීය සභා පනතේ පැහැදිලිවම කියනවා, අනු කට්ටි බෙදීමේදී 1% ක් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා කියලා. ඒ නිසා පනතෙන් දීපු දේ UDA මේ චක්‍රලේඛයකින් අරගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මේ 1% ප්‍රාදේශීය සභාවට නැති වෙන්නේ නැහැ. ඒක පනතෙන් ලැබුණු දෙයක්. මේක චක්‍රලේඛයකින් ලැබුණු දෙයක්. පනත චක්‍රලේඛය අභිබවන්නේ නැහැ. ඒ නිසා 1% ට වන හානියක් නැහැ. හැබැයි අද ගම්වල කඩන්න පර්චස් 40 ට වැඩි ඉඩම් තිබෙනවාද? පසුගිය කාලයේ විශාල වශයෙන් කට්ටි කඩලා, කඩලා රබර් ඉඩම් ටික කැඩුවා. පොල් ඉඩම් ටික කැඩුවා. මෙන්න මේ පොල් ඉඩම් ටික කඩන එක පාලනය වෙනවා. රබර් ඉඩම් ටික කඩන එක පාලනය වෙනවා නම්, තේ ඉඩම් ටික කඩන එක පාලනය වෙනවා නම් ඒකට ඔබට, මට විරුද්ධ වෙන්න බැහැ. කෘෂිකාර්මික අර්ථ රටාවක් තිබෙන්න ඕනෑ කියලා කියනවා නම්, මේ රටේ කෘෂිකර්මය තුළ යම් දියුණුවක්, ප්‍රබෝධයක් බලාපොරොත්තු වෙනවා නම්, මේ රටේ ප්‍රධාන බව බෝග සම්පත් වුණු අද අක්කර 05 ක 06 ක පොල් ඉඩමක් අපේ ගම්වල තිබෙනවාද? අද අපේ ගම්වල රබර් ඉඩමක් තිබෙනවාද? මේ කට්ටි කඩන එක පාලනය වෙන්න පර්චස් 40 ට වැඩි ඉඩමක් කට්ටි කැඩීමේදී අනුගමනය කරන්නට UDA එක බලාපොරොත්තු වෙනවා නම්, මම එතැන වැරැද්ද දකින්නේ නැහැ. 1% අපෙන් අයින් කරන්න බැහැ. ඊළඟ කාරණය තිබෙන්නේ මොකක්ද? පූජා භූමි තුළ යෝජිත සංවර්ධන කටයුතු. මම හිතන්නේ ඒ කාරණය එපමණ ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඊට පස්සේ යුනෙස්කෝ ආයතනයෙන් කියන ලෝක උරුම. ලෝක උරුම කියන දේවල් මගේවත්, කාගේවත් ඒවා නොවෙයි. ඒවා මේ ජාතිකය සිංහල බුද්ධාගම වේවා, ක්‍රිස්තියානි වේවා, මුස්ලිම් වේවා අපි ඔක්කෝගෙම ලෝක උරුම. (බාධා කිරීමක්) එක රටේ ප්‍රධාන තැන වගකීම. ඒ ලෝක උරුම ආරක්ෂා කරන්න නම් මේක බලපාන්නේ නැහැ. මෙතැන එක කාරණයක් තිබෙනවා.

මේ හත්වැනි කාරණය. නාගරික සංවර්ධන අධිකාරිය මගින් හඳුනා ගනු ලැබූ සහ ඉදිරියේදී හඳුනා ගනු ලබන ජාතික සහ ප්‍රාදේශීය වශයෙන් වටිනාකම් ඇති ස්ථානවල කරනු ලැබීමට යෝජිත සංවර්ධන කටයුතු. මෙන්න මේ කියන කාරණය සම්බන්ධයෙන් තවම නිශ්චිතව හඳුනා ගත්තු බිමක් නැති නිසා, මේකේ නිශ්චිත තැනක් නැති නිසා, නිශ්චිත මායිමක් සහ සීමාවක් නැති නිසා මෙන්න මේ කාරණය මේ 11 ඇතුළත අපි සාකච්ඡා කළ යුතුයි කියන තැන මමත් ඉන්නවා. මේක නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයත් එක්ක, එහෙම නැත්නම් ඇමැතිතුමාත් එක්ක සාකච්ඡා කරලා ප්‍රාදේශීය සභාවේ, පළාත් පාලන ආයතනයේ අපේ බලය මොකක්ද? එතැනදී අපට වන කාරණය මොකක්ද කියන එක පිළිබඳව. ඊළඟ එක වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව. සුනාමි ආවාට පස්සේ මොනතරම් උත්සාහ කළාද වෙරළේ ඉඳලා මීටර් 100 ක් ඇතුළත තිබෙන පැල්පත් ටික ඉවත් කරන්නට. තවමත් බැරි වුණා. ඒවායේ ආධාර අරගෙන මොරටු ප්‍රදේශයේ ලක්ෂ 3 1/2 , 4 අරගත්තු මිනිස්සු ගිහිල්ලා ආපහු ඇවිල්ලා පදිංචි වෙලා ඉන්නවා අර වෙරළ සීමාවේම. ඒ නිසා වෙරළ සංරක්ෂණය කියන එක, මුහුදු බාදනය

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

ගත්තාම, ජාතික සම්පතක් විධියට මේ රටේ ඊළඟ අවධානමක් විධියට වෙරළ සංරක්ෂණය ඉතාම වැදගත් වෙනවා. වෙරළ ආශ්‍රිත ඉදි කිරීම් පාලනය කිරීම කියන එක මේ රටේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වෙනවා. ඒක නියාමනය කිරීම වැදගත් වෙනවා. ඊළඟට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය. NBR එක මොකක්ද කරන්නේ? ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය තමයි ලංකාවේ භූමිකම්පා සහිත, හෙල්ලුම් සහිත, නාය යන ස්ථාන පිළිබඳව අධ්‍යයනය කරන ලංකාවේ පිහිටි එකම ආයතනය. මේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් යම් භූමි ප්‍රදේශයක් හඳුන්වා දීලා තිබෙනවා නම් ඒ ප්‍රදේශයේ ඉදි කිරීම් කරන්න බැහැයි කියලා. ඒ ප්‍රදේශය අවධානම් කලාපයක් විධියට, ඒක පාලනය කරන එක, සම්බන්ධීකරණය කරන එක ප්‍රාදේශීය සභා, පළාත් පාලනයත් එක්ක කරනවාට වඩා යුතුකමක්, වගකීමක් විධියට පවරා දෙන එකමයි හොඳ. මේ අවධානම් සහිත මිනිස්සුන්ගේ කලාපවලදී ඒ මිනිස්සුන්ගේ ජීවිතවලට වන හානිය වළක්වා ගන්න.

එහෙම නම් ඊළඟ එක මොකක්ද? පාරිසරික සංවේදී ප්‍රදේශ. පාරිසරික සංවේදී ප්‍රදේශ කියලා කියන්නේ මුතුරාජවෙල වාගේ, බෙල්ලන්විල තෙත් බිම වාගේ පාරිසරික සංවේදී බිම්. මේ බෙල්ලන්විල තෙත් බිමේ ඉදි කිරීම් කළොත් එහෙම, අද බලන්න සමහරු කැඳ කඩ ගහගෙන. කැඳ කියලා ගහලා, නෙලුම් කොළේ ඇඳලා, පාට ටිකක් ගහගෙන කරන්නේ මොකක්ද? සම්පූර්ණයෙන් වෙල ගොඩ කරගෙන තමන්ගේ ව්‍යාපාර කර ගන්න එක. ඒ නිසා මේ පාරිසරික සංවේදීකමකින් යුත් ස්ථාන, මීට වඩා තිබෙන මට්ටමට ඉහළින් කළමනාකරණය වෙනවා නම්, මටයි ඔබටයි විරුද්ධ වෙන්න පුළුවන්කමක් නැහැ. අනෙක් එක අධිවේගී මාර්ගයන්හී ආරක්ෂිත ස්ථාන පිළිබඳව. මේ මහ පාර නොවෙයි. අධිවේගී මාර්ගයන්හී ආරක්ෂිත කලාප පිළිබඳව කියන්නේ - යෝජිත ඉඩම් අනු බෙදුම් සඳහා අනුමැතිය ලබා දීම, භාවිතය වෙනස් කිරීමට අනුමැතිය, පොදු මහජනතාවගේ යහපතට අවහිර වන සේ අනවසර ඉදි කිරීම් ඉවත් කිරීමේ නීතිමය කටයුතු කිරීම දැනටමත් මගේ මිත්‍ර ගරු මන්ත්‍රීතුමා කිව්වා පනතේ 25 නොවෙයි, පනතේ 28 වගන්තිය. 8 ඒ වගන්තියෙන් පටන් අරගෙන 28 වගන්තිය දක්වා දිව්විලා, තවත් නාගරික සංවර්ධන අධිකාරියට මේ අනවසර ඉදි කිරීම් ඉවත් කරන්න බලය තිබෙනවා. ඒක ප්‍රාදේශීය සභාව හරහා ක්‍රියාත්මක කරවනවා. මූලික වැඩ පිළිවෙළ. නමුත් නාගරික සංවර්ධන අධිකාරියේ බලය, නාගරික සංවර්ධන අධිකාරී පනත තමයි ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කරන්නේ. පනතේ 8 ඒ (1) වගන්තිය යටතේ ලියුමකින් දැනුම් දීමක් කරලා 28 වගන්තිය එනකොට අධිකරණ නියෝගයක් අරගෙන කඩා ඉවත් කරන්න බලය තිබෙනවා.

අනුකූලතා සහතික නිකුත් කිරීම. මෙතැන ඉන්නවා ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීතුමන්ලා, අපි. හදවතට එකඟව කථා කරලා කියන්න. අපි අනුමැතිය දීපු මොන ඉඩම්වලට නැවත ඇවිල්ලා අනුකූලතා සහතිකය ලබා ගත්තේ. මේ අනුකූලතා සහතිකය ලබා ගැනීම කියන එක ක්‍රියාත්මක භාවයේ තිබෙන කාරණයක් නොවෙයි. ඒ නිසා මහ නගර සැලසුම් සහ නාගරික සංවර්ධන අධිකාරියේ විෂයය පථය ඇතුළේ, නීති කෘත්‍ය ඇතුළේ තිබෙන කාරණය මෙන්න මෙහෙමයි තිබෙන්නේ. මොනවාද කර්තව්‍ය?

"*නාගරික ප්‍රදේශවල ආර්ථික, භෞතික සහ සමාජයීය සංවර්ධනය ඒකාබද්ධව විධිමත් ලෙස පවත්වාගෙන යෑම.*"

අන්න එතැනදී පළාත් පාලන ආයතනයත් එක්ක ඒකාබද්ධ වීම ඒගොල්ලෝ ප්‍රතිපත්තියක් විධියට පිළි අරගෙන තිබෙනවා. අරමුණක්, දැක්මක් විධියට පිළිඅරගෙන තිබෙනවා. මහ පෙන්වීම කියන කාරණය, සැලසුම් පිළියෙල කිරීම කියන කාරණය, මෙහෙයවීම සහ නියාමනය කියන කාරණා නාගරික සංවර්ධන අධිකාරිය මෙහිදී පිළිඅරගෙන තිබෙනවා. ඒ නිසා මේ ස්මාර්ට් නගර සඳහා යන්න හදන ගමනක් අපි යන්නේ. මෙගා පොලිස් ව්‍යාපෘතිය හරහා කොළඹ දිස්ත්‍රික්කයේ, කළුතර දිස්ත්‍රික්කයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි. මේ ලංකාවේම නගර නාගරීකරණය වෙලා ස්මාර්ට් නගර බවට පත් කරන්න පුළුවන් වැඩ පිළිවෙළකයි මහ නගර සහා සැලැස්ම ක්‍රියාත්මක වෙන්නේ. ඒ අරමුණයි මේ රටේ තිබෙන්නේ. ඒ අරමුණ ක්‍රියාත්මක වෙන්නේ මේ රටේ හරකා බාන, සතා සිව්පාවා දක්වාම මිනිසාගේ ඉඳලා පල්ලෙහාට එනකල්. මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාවේ වටිනාකමක් තිබෙනවා. ඒ තිබෙන්නේ, මෙහෙමවත් කථා නොකළොත් එහෙම පසුගිය කාල වකවානුවේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා කළා වාගේ ඉඩම්නුත් නැහැ.

වන්දිත් නැහැ. මිනිහාත් නැති වෙන තැනට පත් වෙන්න කලින් කථා කරපු එක වටිනවා. මේ යෝජනාව පසුගිය කාලේ ගෙනාවා නම් තවත් වටිනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Sirikamal Filician de Silva M.P.C took the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතැන Wi-fi රවුටරයක් තිබෙනවා. මේවා තිබුණාට මේ එකක්වත් දැන් දවස් ගණනක් තිස්සේම වැඩ කරන්නේ නැහැ. හැබැයි, බිලක් යනවා. ඒ නිසා ලේකම්තුමා මාර්ගයෙන් සභා කටයුතු කාරක සභාවේදී හරි කථා කරන්න. මේ එකක්වත් වැඩ කරන්නේ නැහැ. රවුටරයේ ලයිට් එක විතරක් වැඩ කරනවා. මේ එකක්වත් වැඩ කරන්නේ නැහැ.

[අ.භා. 01.26]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා විසින් මේ සභාවට රීති අත්සිටුවමින් ගෙන එනු ලැබූ යෝජනාව පිළිබඳව මෙවැනි සංවාදයක් ඇති කිරීම මම හිතන්නේ වඩාත් ඵලදායී කියලා අපි කල්පනා කරනවා. නමුත් මම හිතන්නේ, ඒක වඩාත් ඵලදායී වෙන්නේ, විධිමත් සාකච්ඡාවක් සිදු වුණොත් පමණයි. ආවේගශීලී කථාවලින් හරි, පුරසාරම්වලින් හරි, තර්ජන ගර්ජනවලින් හරි, වාචාල කථාවලින් හරි මේ රටේ අනාගතය හා අනාගත සංවර්ධනය තීරණය කරන්න බැහැ. සමහරු තලියේ කිඹුල්ලු දකිනවා. සමහරු විවිධ පුරෝකථනයන් කරනවා. අනාවැකි පළ කරනවා. ඉතින් නැති දේවල් පෙන්වන්න උත්සාහ කරනවා. රට වටේ මේක පටලවන්න උත්සාහ කරනවා.

ඒ වාගේම අපේ සිරිකමල් ෆිලීෂියන්ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී ප්‍රකාශ කළා, දෙවියන් වහන්සේට අයිති දේ දෙවියන් වහන්සේට දෙන්න. සීසර්ට අයිති දේ සීසර්ට දෙන්නය කියලා. එතකොට දෙවියන් වහන්සේට අයිතිව තිබුණු යම් යම් දේවල් සීසර්ට පැවරුවාම සීසර් හරියට ඒ කටයුත්ත කරන්නේ නැත්නම්, ඒක අවභාවිතාවේ යොදවනවා නම්, නැවැත දෙවියන් වහන්සේ බලය තමන් සතු කර ගන්නවා. ඒ නිසා පැහැදිලිව කියන්න ඕනැ. 1978 දී නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපිත කරලා, ඒ හරහා මේ රටේ නගර සැලසුම්කරණය, නාගරික සංවර්ධනය, ඒවා විධිමත් කිරීම සඳහා වූ සැලැස්මක් රටට ඉදිරිපත් කළා. දැන් ඒ සැලැස්ම අනුව තමයි කටයුතු කර ගෙන ගියේ. එහිදී මේ බලය පැවරුවාය කියලා කියනවා. බලය පැවරීම කියන එක. ව්‍යවස්ථාපිතව කිසිදු ආකාරයක බලය පැවරීමක් පළාත් පාලන ආයතනවලට මේ සම්බන්ධයෙන් කරලා නැහැ. මේක චක්‍රලේඛයක් මගින් ලබා දීපු බලයක් පමණයි. තමන්ගේ ව්‍යවස්ථාපිත බලයක් නොවෙයි. ඒ නිසා ඕනෑම අවස්ථාවක ඒ චක්‍රලේඛයකින් පවරපු බලය, එහි යම්කිසි ගැටළු සහගත තත්ත්වයක් පැන නැගිලා තිබෙනවා නම්, ඒවා අවභාවිතාවේ යොදවනවා නම්, අනිසි ආකාරයට යොදවනවා නම්, ඒ පිළිබඳව පැමිණිලි ආවාම, ඒ පැමිණිලි සාකච්ඡාවට ලක් කරලා, ඒ වාගේම රට සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්න, කැබිනට් මණ්ඩලය, පාර්ලිමේන්තුව තුළ මේ පිළිබඳව පැමිණිලි, යෝජනා, අදහස් ආවාම ඒවා සැලකිල්ලට අරගෙන ඒ අනුව කටයුතු කරන්න සිදු වෙනවා. ඒ අනුව තමයි මේ චක්‍රලේඛය නිකුත් කරලා, නැවත ඒ බලය පවරාගෙන තිබෙන්නේ.

අද විශේෂයෙන්ම කියන්න ඕනැ දෙයක් තමයි, මේ බලය දෙන්න දෙන්න කියලා බලය ඉල්ලනවා. උතුරු පළාත් සභාවත් ඉල්ලනවා. පළාත් පාලන ආයතනවලටත් බලය දෙන්නය කියනවා. දැන් ඒ සම්බන්ධව සාකච්ඡාවක් අද සවස පැවැත්වෙනවා කියලත් කියනවා. දැන් මේ බලය ඉල්ලීම පිළිබඳව වැඩියෙන්ම අදහස් ඉදිරිපත් කරන්නේ ලංකාවේ වමේ ව්‍යාපාරයයි. දැන් මේ වමේ ව්‍යාපාරයේ

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

ඉන්න බුද්ධිමතෙක්, විද්වතෙක්, විද්‍යාඥයෙක් වන මහාචාර්ය කුමාර ඩේවිඩ් මේ උතුරු පළාත් සභාවේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් මොකක්ද කියලා තිබෙන්නේ?. *"උතුරට විග්නේෂ්වරන් පත් වුණාම අපට බලාපොරොත්තුවක් ඇති වුණා. අන්තිමට විග්නේෂ්වරන් කාවඩි නටන්න පටන් ගත්තා. උතුරේ මහ ඇමති අයවැයෙන් 90% ක් පමණ වියදම් කරලා නැහැ."* මේ රාවය පත්තරේට දුන්න ඉන්ටර්වීව් එකක්. මේ වාමාංශික විද්වතුන් කියන කාරණය. ඒ නිසා අද මේ බලය ලබා දෙන්න, ලබා දෙන්න කියනවා. හැබැයි, ඒ බලය පාවිච්චි කරලා මොනවාද කරලා තිබෙන්නේ?

දැන් අපි දැක්කා, පසුගිය කාලයේ ප්‍රාදේශීය දේශපාලනයේ මේ පළාත් පාලන ආයතනවල හිටපු ප්‍රධානීන්ගේ ක්‍රියාකලාපය. මම මේ සියලු දෙනා කියලා කියන්නේ නැහැ. අතලොස්සක් ඉතාම අශීලාචාර තත්ත්වයට පත් වුණා. ප්‍රාදේශීය දේශපාලනයේ තිබුණු පිරිහීම අපි දැක්කා. ජරාජීර්ණ තත්ත්වය අපි දැක්කා. ඉතාම අවලස්සන, අශෝභන තත්ත්වයක්. නූරි වත්තේ අත කොටා හිටියා. ඒ වාගේම අකුරැස්සේ හිටියා ස්ත්‍රීන් අවභාවිතාවේ යොදවලා ඒ වෙනුවෙන් සාද පවත්වපු අය. තංගල්ල ප්‍රාදේශීය සභාවේ හිටියා, මුළු ජාත්‍යන්තරයම අපකීර්තියට පත් කරපු ඒ සිදුවීම කළ අය. විදේශිකයෙකු ඝාතනය කළා, පුරාම් සෙයික් කියලා. ඒ වාගේම තවත් සමහර සභාපතිවරු හිටියා සභාපතිවරුන්ගෙන් අල්ලස් ඉල්ලපු අය. අල්ලස් ගත්ත අය හිටියා. ඉතින් මේ වාගේ ඉතාමත්ම අශීලාචාර, අශෝභන තත්ත්වයට පසුගිය කාලයේ මේ රටේ පළාත් පාලන ආයතන පිරිහුනා. ඒකෙන් මම අදහස් කරන්නේ නැහැ සියලු දෙනා මේකට වගකියන්න ඕනෑය කියලා. ඒ නිසා මේ පළාත් පාලන ආයතන හරහා සිදු වුණු ක්‍රියාකලාපය සම්බන්ධයෙනුත්, මේවාට අනුමැතිය ලබා දුන් ආකරය සම්බන්ධයෙනුත් බරපතළ තත්ත්වයක් මතු වෙලා තිබුණා. ඒ වාගේම අද වන විට කොළඹ නගරයේ, විශේෂයෙන්ම කෝට්ටේ නගර සභා බල ප්‍රදේශය තුළ මේ අවිධිමත් ඉදි කිරීම් සඳහා අනවසර, අවිධිමත් ඉදි කිරීම් සඳහා විශාල වශයෙන් අනුමැතිය ලැබිලා තිබෙනවා. ඒ නිසා විශාල ගැටළු ප්‍රමාණයක් මතු වෙලා තිබෙනවා.

ඒ වාගේම දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය. අලුතෙන් ඉදි කරලා තිබෙන මේ කොන්ඩමීනියම් සඳහා, මහල් නිවාස සඳහා ලබා දීලා තිබෙන අවසරය. ඒ නිසාත් විශාල ගැටළු ප්‍රමාණයක් ඇති කරලා තිබෙනවා. ඒ වාගේම මහනුවර නගරය. මහනුවර නගරය කියලා කියන්නේ, ඓතිහාසික නගරයක්. දැන් ඒ නගරයේ යුනෙස්කෝ ආයතනය මගින් ලෝක උරුම භූමි ලෙස නම් කර ඇති ප්‍රදේශවල අපි දන්නවා, යම් යම් අවිධිමත් ඉදි කිරීම් කරලා තිබෙනවා. අනවසර ඉදි කිරීම්, නීති විරෝධී ඉදි කිරීම් කරලා තිබෙනවා. ඉතින් මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන් කටයුතු කරන්න අපට සිදු වෙනවා. දඹුල්ල නගරයේ එවැනි අවිධිමත්, අනවසර, නීති විරෝධී ඉදි කිරීම් කරලා තිබෙනවා. රට පුරාම මේ තත්ත්වය දකින්න පුළුවන්. ඒ නිසා පැහැදිලිව අපි කියන්න ඕනෑ. මෙවැනි චක්‍රලේඛයක් ඉදිරිපත් කළේ මේ බලතල නැවත පවරා ගැනීම හරහා විධිමත් සැලසුම්කරණයක් මේ වන විට සිදු කරලා තිබෙනවා. ඒ විධිමත් සැලසුම්කරණයට අනුව අනිවාර්යයෙන්ම ඒ නගරවල ඉදිකිරීම් කටයුතු සිදු වෙන්න ඕනෑ. ඒක ඉදිරි කාලයේදී නැවත පළාත් පාලන ආයතනවලටම ඒ කාර්යය පවරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සැලසුම් කිරීම අවසන් කළාට පස්සේ. ඒ සැලසුමට අනුකූලවයි අනුමත කිරීම් කරන්න ඕනෑ. ඒ පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්, ඒ සම්බන්ධව වගකියන නිලධාරීන් ඒ සැලැස්මට අනුව කටයුතු කරන්න ඕනෑ. එහෙම නැතිව මේ අවිධිමත් ආකාරයට තම තමන්ගේ අභිමතය පරිදි, කැමැත්ත පරිදි මේ අනුමැතිය ලබා දෙන්න, ඒවායෙන් අයුතු විධියට මුදල් උපයන්න කටයුතු කරලා තිබෙනවා. අරගෙන බලන්න මේ සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව. විගණකාධිපතිවරයා ඉදිරිපත් කරලා තිබෙන වාර්තාවෙන් පැහැදිලිව පෙන්වලා දීලා තිබෙනවා, මේ තුළ සිදු වෙලා තිබෙන අවභාවිතාවන් මොනවාද කියන එක. දූෂණ, වංචා මොනවාද කියන එක.

ඒ නිසා පැහැදිලිව මම කියන්න කැමැතියි. අද මේ රටට අවශ්‍යයි විධිමත් සංවර්ධන සැලැස්මක්. ඒක අනාගතය දකින්න පුළුවන් සැලැස්මක් වෙන්න ඕනෑ. ඒ වාගේම පරිසර සංවේදී කලාප තිබෙනවා. විශේෂයෙන්ම වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා අපි බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන්ම මේ වෙරළ ආශ්‍රිතව කරන ඉදි කිරීම් සම්බන්ධ කටයුතු. එතකොට මේවා පිළිබඳව අනිවාර්යයෙන්ම සැලකිල්ලට ගන්න සිදු වෙනවා. විධිමත් සැලැස්මකින් තොරව අපට නගර ගොඩ නගන්න බැහැ. ඒ නිසා විධිමත් සැලැස්මක් අද අවශ්‍යයි.

අන්න ඒ සැලැස්ම අපි සකස් කරලා, ඉදිරි කාලයේදී මේ පළාත් පාලන ආයතන එක්කත් සාකච්ඡා කරලා ඔවුන්ට නැවත වතාවක් මේ වගකීම, මේ කාර්යභාරය පවරන්න බලාපොරොත්තු වෙනවා. මේ තුළ මේ සමහරු කියනවා, මේ ඉඩම් විකුණන්න යනවා. ඉඩම් විකුණන්න දෙයක් නැහැ. නාගරික සංවර්ධන අධිකාරියට බලය තිබෙනවා, රටේ ඕනෑම තැනක ඉඩමක් පවරා ගන්න. කොළඹ නගර සහා බල ප්‍රදේශය තුළ විතරක් බිලියන අටකට ආසන්න වටිනාකම් සහිත ඉඩම් පවරාගෙන තිබෙනවා. ඉතින් අපේ මේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා. එතුමා නිකම් අලුත් දෙයක් සොයා ගෙන කියනවා වාගේ. මේ නාගරික සංවර්ධන අධිකාරී පනතේ පැහැදිලිව මේ බලය තිබෙනවා. ඉතින් අපි පවරා ගෙනත් තිබෙනවා. ඒ ඉඩම්. ඒ ඉඩම් රටේ සංවර්ධන කටයුතු සඳහා, ආයෝජනය සඳහා, ඕනෑම කටයුත්තකට යොදවන්න පුළුවන්. ඉතින් අද මේ පිළිබඳව විවෘතව සාකච්ඡා කරන්න පුළුවන් ප්‍රජාතන්ත්‍රවාදී වට පිටාවක් ඇති වෙලා තිබෙනවා. එදා ඔය කවුරුවත් වාද විවාද කරන්න ගියේ නැහැ. සාකච්ඡා කරන්න ගියේ නැහැ. හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඔය කටයුතු කර ගෙන යන කොට කිසිදු කෙනෙක් ඔහුට විරුද්ධව අදහස් දක්වන්න ගියේ නැහැ. විරෝධය පළ කරන්න ගියේ නැහැ. සාකච්ඡා කරන්න ඕනෑ. අපේ අදහස් යෝජනා තිබෙනවා කියන්න ගියේ නැහැ. එතුමාගේ අභිමතය පරිදි කටයුතු කර ගෙන ගියේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

හොඳ දේට මොකටද විරුද්ධ වෙන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හොඳ දේට විරුද්ධ වෙන්නේ ඇයි?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

දැන් එතුමා කරපු දේවල් ඔක්කොම හොඳ නම් අද ගිහිල්ලා බලන්න අර පිටකොටුවේ ෆ්ලෝටීන් මාර්කට් එකට මොකද වෙලා තිබෙන්නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒක පාවිච්චි කරන්න දන්නේ නැහැ නේ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔබතුමාත් එක්ක වාද කරන්න නොවෙයි මම ආවේ. මගේ අදහස් පළ කරන්න. ඒ නිසා කොළඹ නගරයේ මේ කරපු සංවර්ධනයේ ප්‍රතිලාභ රටට ලැබිලා තිබෙනවාද? මේ සල්ලි වක් කරලා, වක් කරලා කරපු සංවර්ධනයක් තිබෙනවා. හැබැයි, ඒවා විධිමත් සැලසුම්කරණයක් ඇතිව කරපු දේවල්ද? ඒවායින් රටට ප්‍රතිලාභ ලැබිලා තිබෙනවාද? ඒවායින් රටේ ප්‍රශ්න විසඳිලා තිබෙනවාද? කොළඹ නගරයේ තදබදය විසඳන්න පුළුවන් වුණාද? කොළඹ නගරයේ ගමනා ගමනය තුළ ඇති වෙලා තිබෙන මේ තදබදය පිළිබඳ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වෙලා තිබෙනවාද? නැහැ. ඒ නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. අද විධිමත් සැලසුමකට අනුව ඒ කටයුතු කර ගෙන යනවා. එක එක්කෙනාගේ මේ තිබෙන පෞද්ගලික න්‍යාය පත්‍ර හෝ තමන්ට ඒකෙන් යම්කිසි අගතියක්, අහිමි වීමක් වෙනවාය කියලා ඒවා මත මේ රටේ ජාතික සංවර්ධන සැලැස්ම ආපස්සට හරවන්න පුළුවන්කමක් නැහැ. රටේ නාගරික සංවර්ධන සැලැස්ම ආපස්සට හරවන්න පුළුවන්කමක් නැහැ. රටම ආවරණය වන විධියට භෞතික සැලැස්මක් සකස් කරලා තිබෙනවා. ඒ සැලැස්ම සෑම නගරයකටම ඉදිරි කාලයේදී අපි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. අන්න ඒ ක්‍රියාත්මක කරන සැලැස්මට අපි සියලුම ආයතන සම්බන්ධ කර ගනිමින්, මහජන නියෝජිතයින් සම්බන්ධ කර ගනිමින්, නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් ඉතාම පාරදෘශ්‍ය භාවයකින්, විවෘතභාවයකින් අපි කටයුතු කරනවා. ඒ නිසා මේක තුළ බොරු බිල්ලෝ හදා ගෙන, නිකම් තමන්ගේ පටු දේශපාලන වාසි ලබා ගෙන කටයුතු කරන්න එපාය කියලා අපි ඉල්ලා සිටිමින්, ඒ වාගේම කාගේවත් බොරු තර්ජන, ගර්ජනවලට භය වෙන්නේ නැහැයි කියන එකත් ප්‍රකාශ කරමින් මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනියන්න අමාත්‍යවරයා විධියට පාඨලී චම්පික රණවක මැතිතුමා කටයුතු කරනවා. ඒ වාගේම ඕනෑම කෙනෙකු එක්ක මේ පිළිබඳව සාකච්ඡා කරන්න, වාද විවාද කරන්න, අදහස්වලට ඇහුම්කන් දෙන්න සූදානම් කියන එකත් මේ වෙලාවේ ප්‍රකාශ කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 01.36]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි -

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නක් මතු කරන්න අවස්ථාව 36(1) යටතේ ලබා දෙන්න. මම මේ සභාවෙන් ශරීර කෘත්‍යයක් සඳහා එළියට යද්දී, මගේ අතට ලිපියක් ලැබෙනවා. ඒ ලිපියේ සඳහන් වෙනවා, මාසික වැටුප් ලබා ගැනීම පිළිබඳව. මම දෙවන පළාත් සභාවේ සිට මේ ගරු සභාව නියෝජනය කරනවා. කෙටි අවස්ථාවක් හැර. කිසි දවසක අපි වැටුප් ලබා ගැනීමේදී - අපට වැටුපක් ලැබෙන්නේ නැහැ. ජනතා නියෝජිතයෝ විධියට අපට ලැබෙන්නේ දීමනාවක්. ඒ එක්කම මේක අත්සන් කරන්නය කියන ඉල්ලීමක් තමයි සභා ලේකම්තුමාගේ අත්සනින් මේ ලිපිය ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ නිසා දශක ගණනාවක් තිස්සේ පළාත් සභාව තුළ එදා මෙදා තුර නොතිබුණු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයකට අත තැබීම පිළිබඳව කනගාටු වෙනවා. ඒ එක්කම කාර්ය මණ්ඩලය පිළිබඳවත් එහි සඳහන් වෙනවා. ඒ නිසා මේ ලිපිය ගරු මන්ත්‍රීවරු සියලු දෙනාගේම වරප්‍රසාද කඩ වීමක් වෙනවා. ඒ නිසා මම නම් මේ පළාත් සභාවේ නොසිටියත් - එකක්, මට වැටුප් ලැබෙන්නේ නැහැ. අපට ලැබෙන්නේ දීමනාවක්. අපි අත්සන් කරන්න සූදානම් නැහැයි කියලත් මතක් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ගරු සභාපතිතුමාට යොමු කරලා, එතැනින් කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නාගරික සංවර්ධන අධිකාරිය පිළිබඳව මේ පළාත් සභා රැස්වීමේදී සාකච්ඡා කරන අතරතුර මම හිතනවා, ප්‍රාදේශීය සභා පිළිබඳව සහ නගර සභා පිළිබඳව අපි කථා කළා. විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමනි, අපි පළාත් පාලන ආයතනවල සිටි මන්ත්‍රීවරු වශයෙන් අපි දැක්කා. පසුගිය කාල සීමාව තුළදී මේ ප්‍රාදේශීය පළාත් පාලන ආයතන පිළිබඳව ක්‍රියා කරපු ආකාරය. ඒ එක්කම අපේ මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා ඉතාමත්ම කාලෝචිත යෝජනාවක් ගෙන ඒම පිළිබඳව මම එතුමාටත් ස්තුති කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාගරික සංවර්ධන අධිකාරිය කියන්නේ, මේ රටේ ඉදිරි අනාගතය සැලසුම් කරන, අපේ රටේ සංවර්ධන ඉලක්ක කරා මෙහෙයවන ආයතනයක්. මේ ආයතනය පසුගිය කාල සීමාව තුළදී අපි දැක්කා, ප්‍රාදේශීය සභාවලට ඇවිල්ලා, නගර සභාවලට ඇවිල්ලා, මහ නගර සභාවලට ඇවිල්ලා ඒගොල්ලන්ගේ නියෝජිතයෙක් අනිවාර්යයෙන්ම ඒ ආයතනවල ඉන්නවා. අපි දැක්කා, සැලසුම් අනුමත කරන කොට ප්‍රාදේශීය සභාවල ඒ සැලසුම් කමිටුවේ ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, ලේකම්තුමිය, කාර්මික නිලධාරීට අමතරව නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙක් ඉන්නවා. අනිවාර්යයෙන්ම ඒ සැලසුම අනුමත කරන කොට ඒ පස් දෙනා එක කාමරයකට ගිහින් ඒ පස් දෙනා තමයි මේක අනුමත කරන්නේ. මේ සැලසුම අනුමත කරන කොට අපි සමහර අවස්ථාවලදී අදාළ නිලධාරීන්ගෙන් අහනවා, අපි දැම්ම සැලසුම අනුමත වුණාද කියලා. ඊට පස්සේ කියනවා, නාගරික සංවර්ධන අධිකාරියේ කෙනා විරුද්ධ නිසා මේක අනුමත කරන්න බැහැයි කියලා. අන්න එතැනම තිබෙනවා, ඒ කාලයේ ඉඳන් මේක ආවේ නාගරික සංවර්ධන අධිකාරියේ ඒ එන නිලධාරියාගේ අභිමතය පරිදි තමයි මේක අනුමත කළේ. ප්‍රාදේශීය සභාවේ සහ නගර සභාවේ නිලධාරීන් හතරක් හිටියත්, ඒ නිලධාරීන් හතර දෙනාම යටත් වෙනවා, අර නගර නිර්මාණ ශිල්පියාට. ඔබතුමා කිව්වේ ඇත්ත. ඒ නිසා මේ චක්‍රලේඛයකින් අද ආවාට, මේක එදා සිටම ක්‍රියාත්මක කළේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාගරික සංවර්ධන අධිකාරියේ බලය මත. අපි පසුගිය කාල සීමාව තුළදී දැක්කා. මමත් බියගම ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් අවුරුදු නවයක් හිටියා. විපක්ෂ නායක වශයෙන් අවුරුදු හතරක් හිටියා. අපි දැක්කා. මේක මෙහෙයවන කොට මේක යටින් මොකක්ද වුණේ කියලා. මෙතැන ප්‍රධාන වශයෙන්ම නාගරික සංවර්ධන අධිකාරියෙන් එවලා තිබෙනවා ලිපියක්.

මේ ලිපියේ කරුණු කිහිපයක් තිබෙනවා. මේ කරුණු කිහිපය ගැන ගැටළුවක් නැහැ. මෙතැන වර්තමානයේ ලේකම්වරුන්ට සහ අනිකුත් අයට ගැටළුවක් වශයෙන් තිබෙන්නේ එක කරුණයි. පර්චස් 40 ට වැඩි ඒවා බෙදන කොට තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. පර්චස් 40 ට වැඩි ඒවා වෙන්දේසි කරන කොට අක්කර පහ, දහය, පහළොව, විස්ස එන කොට මේක ලොකු ප්‍රශ්නයක් වෙනවා. ඉතින් ඒ නිසා කෙළින්ම මේ ෆයිල් එක යන්න ඕනෑ නාගරික සංවර්ධන අධිකාරියට. ඉස්සර මේක එන්නේ ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුවට. සභාවේ සැලසුම් කමිටුවට ආවාම, නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරී මහත්තයා ඉන්නවා. සභාවේ පෝලිමේ ඉන්නවා. පෝලිමේ ඉන්න කොට පර්චස් 10 ක් තිබෙන මිනිහාත් පෝලිමේ ඉන්නවා. තමන්ගේ ෆයිල් එක හවසට ගන්න. එතැනට ටයි එකක් දා ගෙන වෙන්දේසිකාරයෙක් ආවොත් ඒ ටයි එක තිබෙන මනුස්සයාගේ ප්ලෑන් එක තමයි ඉස්සෙල්ලාම අනුමත කරන්නේ. අර පර්චස් 10 තිබෙන අහිංසක මනුස්සයා දවස් පහක්, හයක් සභාවට එනවා. ඒක අනුමත කරන්නේ නැහැ. ඒකාධිකාරිය තිබෙනවා, නාගරික සංවර්ධන අධිකාරියේ. නමුත් ප්‍රාදේශීය සභාවේ ඉන්න නිලධාරී මහත්වරුත් කියනවා, UDA එකෙන් බැහැයි කියපු නිසා මේක කරන්න බැහැයි කියලා. ඒක තමයි ඇත්ත කථාව. අපි හෘදය සාක්ෂියට එකඟව, මෙතැන ඉන්න මන්ත්‍රීවරු, හිටපු සභාපතිවරු ඉන්නවා. මම කියන්නේ නැහැ මෙතැන ඉන්න මන්ත්‍රීවරු එහෙම කළා කියලා. නමුත් පසුගිය අවුරුදු හතර, පහ, හය, හත ඇතුළත අහිංසක මිනිස්සුන්ගේ පර්චස් 10 දුන්නේ නැහැ. අක්කර පහ, දහය, පහළොව වෙන්දේසි කරන්න අවසර දුන්නා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔබතුමා හිටපු අවුරුදු නවය ඇතුළත සාධාරණය කළාද?

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ඔව්. සාධාරණය කරපු නිසා නේ මෙතැන ඉන්නේ. නැත්නම් ඉන්න බැහැ නේ? මම තව පටන් ගත්තේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට කථාවක් තිබෙනවා.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ඔබතුමාට කථාවක් තිබෙනවා නේ? නැත්නම් අපි ගෙදර ඉන්නේ. හොරු නම් මෙතැන ඉන්න බැහැ නේ? හැබැයි, හොරු කිහිපයකුත් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ නාගරික සංවර්ධන අධිකාරිය කියන්නේ, විශාල වශයෙන්ම මේ රටේ නගර නිර්මාණ ශිල්පයට ශක්තියක් දුන්න ආයතනයක්. ඒ නිසා අපි ඒ ආයතනයෙන් ඉල්ලීමක් කරනවා. මේ ප්‍රාදේශීය සභාවට ගහපු චක්‍රලේඛය තිබෙනවා. මේ චක්‍රලේඛයේ සමහර අඩුපාඩු තිබෙනවා. මේ චක්‍රලේඛයේ කියලා නැහැ, මේගොල්ලන්ගේ කොමිටිය කොහේද තිබෙන්නේ කියලා. ඔක්කොම මිනිස්සු ටික, ජනතාව කොළඹට ආවොත් එහෙම ඒක ලොකු ප්‍රශ්නයක් වෙනවා. ගම්පහට ආවොත් ලොකු ප්‍රශ්නයක් වෙනවා. අපි ඉල්ලීමක් කරනවා. මේ පිළිබඳව නැවත සාකච්ඡා කරලා, මේකේ ඉඩම් වෙන්දේසි කිරීම පිළිබඳව. අනික් ඒවා නම් ලොකු ප්‍රශ්න නොවෙයි තිබෙන්නේ. වර්ග අඩි 4000 ක් තිබෙන ඒවා. වර්ග අඩි 5000 ක් තිබුණු ඒවාත් ගියපාර දුන්නා. ඒගොල්ලෝ තමයි ඒක කළේ. ඒවා අපි අත්සන් කළේ නැහැ. ඒ නිසා මේකේ ලොකු ප්‍රශ්නයක් තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙන්දේසි කරන ඉඩම් සම්බන්ධයෙන් ගැටළුව. ඒ පිළිබඳව මම හිතනවා, ඉඩමක් වෙන්දේසි කරන කොට අනිවාර්යයෙන්ම පළාත් පාලන ආයතනය වග කියන්න ඕනෑ. ඒකේ පාරවල්වලට තාර දාන්න ඕනෑ. කාණු බඳින්න ඕනෑ. ලයිට් දාන්න ඕනෑ. නමුත් මම දැක්කා, පසුගිය අවුරුද්දේත් බියගම ප්‍රාදේශීය සභාව තුළ වෙන්දේසි කරන කොට මම මේ සභාවේදීම යෝජනා කළා. අපේ අක්කර පහ, හය ඉඩම් වෙන්දේසි කළා. තාර දාලා තිබුණේ නැහැ. ලයිට් දාලා තිබුණේ නැහැ. කාණු බැන්දේ නැහැ. නමුත් ඒවා ප්‍රාදේශීය සභාවෙන් අනුමත කළා. නමුත් මේක මේ අලුතෙන් ආපු දෙයක් නොවෙයි. UDA එකට මේක ගත්තාය කියලා මේක මහා ලොකු ප්‍රශ්නයකුත් නොවෙයි. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. පසුගිය කාලයේ අපි දැක්කා. ආරක්ෂක ලේකම් වශයෙන් ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ඉන්න කොට, එතුමා UDA එක භාරව හිටියේ. එතුමා බියගම ජොගින් ට්‍රැක් එකක් හැදුවා. සභාව දන්නෙත් නැහැ. එකපාරටම උදේ ගල් ගෙනාවා. පස් ගෙනාවා. වැලි ගෙනාවා. ඒක හැදුවා. ඒකට කවුරුවත් විරුද්ධ වුණේ නැහැ. ඒ එක්කම ගරු මන්ත්‍රීතුමනි, මල්වාන ප්‍රදේශයේ

[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

බැසිල් රාජපක්ෂ මහත්තයාගේ ගෙයක් තිබෙනවා. එතුමා ගේ හැදුවා. ඒකේ අත්සන් කරලා තිබෙන්නේ, UDA එකේ Chairman. ඉතින් ඒවාට කවුරුවත් ප්‍රශ්න දාන්නේ නැහැ නේ? ඒකේ UDA එකේ Chairman තමයි අත්සන් කළේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

අයිතිකාරයෙක් නැහැලු නේ?

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

අයිතිකාරයෙක් නැති වුණාට එතුමා තමයි ඒක - ඉතින් මේ වාගේ හොඳ දේවල් එන කොට UDA එකෙන් තව කට්ටියකට හා කියන්නයි, නරක දේවල් එන කොට බැහැයි කියන්නයි මම හිතන්නේ, ඒක අපි නීති විරෝධීයි. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, මේ බස්නාහිර පළාත් සභාව කියන්නේ, මේ ලංකාවේ තිබෙන ලොකුම පළාත් සභාව. මේ පළාත් සභාවේදී මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව, අපි ඔබතුමාට ස්තූති කරනවා. ඒ එක්කම මම මතක් කරනවා. අපි දැක්කා පසුගිය කාලයේ බියගම සහ කැලණිය යා කරන පාලම හැදුවේ පෝල් පෙරේරා මැතිතුමා සහ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. දැන් ඒ පාලමෙන් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක යා වෙනවා. අපි පුන පුනා කිව්වා, පසුගිය පළාත් පාලන ආයතනවලට අනාගතයේදී මෙතැන අලුතෙන් පාලමක් ඉදි වෙනවා. මෙතැන ගොඩනැගිල්ලක් ගහන්න දෙන්න එපාය කියලා. බියගම පැත්තේ. ගොඩනැගිල්ලක් හැදුවා. අද බලන්න. පාලම හදනවා. ගොඩනැගිල්ල අයිනෙන් තමයි පාලම යන්නේ. ඉතින් නාගරික සංවර්ධන අධිකාරිය මේවා බැලුවේ නැහැ. ප්‍රාදේශීය සභාව බැලුවෙත් නැහැ. මේ ආයතන දෙකම බැලුවේ නැහැ. ඒ නිසා මේ වාගේ කොපමණ ආයතන දැම්මත්, මහජනතාවට සහනයක් නැත්නම් මේ ආයතන එකකින් වත් වැඩක් නැහැ. ඒ නිසා ඉල්ලීමක් කරනවා. මේ පනතකට අපි මෙතැන කෑ ගහගෙන වාද කර ගෙන වැඩක් නැහැ. නමුත් මේක රටේ ඉදිරි සංවර්ධනය කරා ගන්නා ක්‍රියාමාර්ගවලට පළාත් සභා වශයෙන් මේකේ අඩුපාඩු ඇති. මේකේ අඩුපාඩු සාකච්ඡා කරලා, මම හිතන්නේ විශාල වශයෙන් ඉඩම් වෙන්දේසි කරන කොට තිබෙන පළාත් පාලන ආයතනයෙන් එන බලය අහිමි වෙන එක සාකච්ඡා කරලා, මේ රට සංවර්ධනය කිරීමට අපට දෙන්න පුළුවන් උපරිම ශක්තිය සහ සහයෝගය ලබා දෙනවා. ඒ එක්කම ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවටත්, ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරියට මේ බලය ගැනීම සම්බන්ධයෙනුත් යම්කිසි ප්‍රශ්න තිබෙනවා නම්, අපි අදාළ අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කරලා, විසඳ ගනිමුයි කියලා ඉල්ලීමක් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 01.46]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තූතියි. මෙතුමාට මම කියන්න ඕනෑ. එතුමා කිව්වා, පැරදිලා තමයි ඉන්නේ හොරකම් කළා නම් කියලා. මම හිතන්නේ, එතුමා පැරදිලා, කට්ටිය පාර්ලිමේන්තු ගියාම තමයි ආවේ. භාගෙට තියලා එව්වේ, හොරකම් කරපු හින්දා.

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු මන්ත්‍රීතුමා, මම පළාත් සභා මැතිවරණයට ඉල්ලන්න හිටියේ නැහැ. හරි නේ? එකපාරටම තමයි මාව දැම්මේ. මම ගම්පහ දිස්ත්‍රික්කයේ 12 වැනියා වුණා. අපේ පක්ෂයේ 42 ක් තරඟ කළා. මම 12 වුණා. මුල් වතාවට. ඒක පැරදීමක් නොවෙයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කමක් නැහැ. ගෙදර ඉඳලා එව්වේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාගේ කථාව කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ සම්බන්ධව ලොකු දැනීමක් නැහැ. මම අධ්‍යයනය කළේ නැහැ. ඇහෙන කථාවලින් තමයි බැලුවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ගමේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා හරහා, ගමේ මනුස්සයාට ප්‍රාදේශීය සභාව හරහා ගන්න තිබුණු ලොකු උපකාරයක්. ඉස්සර අපි ප්‍රාදේශීය සභාවේ

ඉන්න කාලයේ ප්ලෑන් එකක් පාස් කරන්න දැම්මත් අපට ඇවිල්ලා කියනවා. අපි උදව් පදව් වෙලා ඉක්මන් කරලා කරලා දෙනවා. මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේක අන්තිමට පොඩි මිනිහා ඉහළටම ගේන වැඩක්. දැන් මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරියෙක් අනිවාර්යයෙන්ම හිටියා නේ? මේ හොරකම් කරන්න සභාපතිලා පටන් ගත්තේ, හොරකම් කළේ එයත් එක්ක නේ? මෙතෙක් කාලයක්.

ඉතින් මෙතෙක් කල් ඒ සභාපතිවරු, ලේකම්වරු හරි බෙදා ගෙන කෑවා නම් දැන් මේ තනියෙන් කන්න ඉල්ලන්නේ. මේ ආකාරයට බලය එතැනට දුන්නාම තව ටික කාලයකින් යෝජනාවක් එයි, මේ පළාත් සභාවේ සභාවල සභාපතිවරු, ගරු මහ ඇමතිවරු කරන දේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා මේ පළාත් සභාවේත් යම් යම් දේවල් මධ්‍යම රජයට පවරන්න කියලා. දැන් කියනවා, මේ නාගරික සංවර්ධන අධිකාරියෙන් ප්‍රාදේශීය සභාවට ලබා දීපු දේවල් ක්‍රියාත්මක නොකරන නිසා ගන්නවාය කියලා. එහෙම නම් පාර්ලිමේන්තුවේ පළාත් පාලන අමාත්‍යවරයා - පාර්ලිමේන්තුව ඒ ජනතාව ලබා දීපු බලය ක්‍රියාත්මක කරනවාද? නැහැ නේ? රට ණය කරලා, අපිව ණය කරලා, රට විනාශ කරලා, යුද්ධය ඇති කරලා, ඡන්දය තියන්නේ නැතිව දැන් මේ ජනතාවගේ ඡන්ද අයිතිය නැති කරලා තිබෙනවා. එහෙම නම් මේ පාර්ලිමේන්තුවත් ජනතාවගේ බලය ක්‍රියාත්මක කරන්නේ නැහැ. එහෙම නම් ඒ පාර්ලිමේන්තුවත් ගෙදර යන්න ඕනෑ. ඇයි? ජනතාව දීපු බලය ක්‍රියාත්මක කරලා නැහැ නේ? ප්‍රාදේශීය සභාවලට දීපු බලය ක්‍රියාත්මක කරන්නේ නැහැයි කියලා ආයිත් ගන්නවා නම්, මේ ජනතාව රජයට දීපු බලය. පාර්ලිමේන්තුවට. රට ණය කරලා. මොනවාද නොකර ඇත්තේ. රට විනාශ කරලා. රට විකුණලා. ඒ හැම දේම කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අහනවා. එතකොට නාගරික සංවර්ධන අධිකාරිය තිබුණා නේ. එහෙම නම් මෙතෙක් කාලයක් පොල් ගෑවාද? නාගරික සංවර්ධන අධිකාරියේ කට්ටිය මොනවාද කළේ? ප්‍රාදේශීය සභාව, නගර සභාව නම් මේවා ක්‍රියාත්මක කළේ, ඔය නිලධාරීන් මෙතෙක් කල් මොනවාද කළේ? අඩු ගණනේ සැලැස්මක් හදලා ප්‍රාදේශීය සභාවට එව්වාද? එහෙමත් නැහැ නේ? එහෙම නම් මෙතෙක් කල් මුන් නිකම් පඩි අරගෙන. අනික මෙගා පොලිස්. දැන් අවුරුදු දෙකක් වෙනවා. කොස් පැළයක්වත් හිටවලා නැහැ. මුල් ගලක් තියලා නැහැ. දැන් මේ බලය ඉල්ලනවා. රට හදන්න. නේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වක්‍රලේඛ විතරයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

වක්‍රලේඛ විතරයි. මෙගා පොලිස් මුල් ගලක් තියලා නැහැ. කොස් පැළයක් හිටවලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කුට්ටිය, කන්න තිබෙන ඒවා නාගරික සංවර්ධන අධිකාරියට අරගෙන, ප්‍රාදේශීය සභාවට කියනවා කුණු ටික ඇදපන්. ලයිට් ටික දාපන්. තිබෙන ඔක්කොම කුණු කන්දල් ප්‍රාදේශීය සභාවට දීලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රාදේශීය සභා දිය කරන්නයි යන්නේ. මේ ප්‍රාදේශීය සභා දිය කරලා, මේ පළාත් පාලන ක්‍රමය නැති කරන්නයි යන්නේ. දැන් ඡන්ද තියන්නේ නැහැ නේ? මන්ත්‍රීවරු ඕනෑ නැහැ. ඊළඟට කියනවා, පළාත් සභාත් කල් දානවා. පළාත් සභා ඕනෑත් නැහැ. ඡන්ද ඕනෑත් නැහැ. මුන්ට ඕනෑ උතුරේ කෑල්ල ලියා දෙන්න විතරයි. ලියා දුන්නායින් පස්සේ, මේ බෙදුම්වාදී ප්‍රශ්නය කියනවා නම් ඒ ප්‍රශ්නය ඉවරයි. මේක කාලා කාලා විකුණලා ඉවර කරන්න පුළුවන්. මෙතුමා ඇහුවා, ගෝඨාභය රාජපක්ෂ මොනවාද කළේ කියලා. මම දන්නේ නැහැ. ඒ කාලයේ පිස්සෝද කියලා ජාත්‍යන්තරයේ ඉන්නේ. ලෝකයේ වේගයෙන්ම දියුණු වන නගරය කොළඹ නගරය කියලා ජාත්‍යන්තරය පිළිඅරගෙන තිබුණා. ඒ නිසා දැන් එතුමා කරපු ඒවා ක්‍රියාත්මක කරන්න හයියක් නැහැ. කොළඹ ෆ්ලෝටින් මාර්කට් එක කොහොමද ක්‍රියාත්මක කරන්නේ? කොළඹ මීගමුව පාරේ තිබෙන හයි වේ එක අයිනේ තිබෙන ඇළ. ඒ ඇළ කැපුවේ බැසිල් රාජපක්ෂ මහත්තයාට පිස්සු හන්දා නොවෙයි. ඔබතුමාගේ ගමේ වත්තල, කළුගල හරහා වතුර ටික අරගෙන ගිහිල්ලා මුහුදට දාන්න. පොඩ්ඩක් හයියෙන් වැස්සත් මෙතුමන්ලාගේ ගම් පළාත යට වෙනවා. ඒ වතුර හයි වේ එක දිගේ ලස්සන ඇළක් කපලා අරගෙන ගියේ. ඒ ඇලේ බජිරි ටික අයින් කර ගන්න බැහැ මේ ආණ්ඩුවට. බජිරි පිරිලා. ඉතින් කොහේද ෆ්ලෝටින් මාර්කට් එක ක්‍රියාත්මක කරන්නේ? වැඩ බැරිකමට මේ අහිංසක පළාත් පාලන ආයතනවල තිබෙන බලය

[ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා]

ගන්න එපා. අනික, අර පාලු ගෙයි වළං බිඳිනවා වාගේ, මේ වෙලාවේ ගන්න එක වැරදියි. කවුරුත් නැති වෙලාවේ. සභාපතිවරු පත් වුණාට පසුව ප්‍රජාතන්ත්‍රවාදීව ඒ සභාවල මතය විමසලා, ලංකාවේ මතය විමසලා එහෙම නම් කැමැත්තෙන් ගන්න ඕනෑ. කවුරුවත් නැති වෙලාවේ, මන්ත්‍රීවරු නැති වෙලාවේ ඡන්දය තියන්නේ නැතිව මන්ත්‍රීවරු ගෙදරට කරලා තියලා මේ බලය ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා නොවෙයි කරන්න ඕනෑ. ඉක්මණට ඡන්දයක් තියලා ජනතාවගේ වැඩ කරන්න පළාත් පාලන ආයතනවලට මන්ත්‍රීවරු පත් කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් අපි අහලා තිබෙනවා, වැස්ස කාලයට තමයි ඩෙංගු එන්නේ කියලා. දැන් පට්ට පායනවා. හැබැයි, ඩෙංගු. ඇයි? කුණු ටික අදින්නේ නැහැ. කාණු ශුද්ධ කරන්නේ නැහැ. පළාත් පාලන ආයතන ක්‍රියාත්මක නැහැ. නිලධාරීන් හයයි. FCID යනවා. ඒගොල්ලෝ රාජකාරි කරන්නේ තමන්ගේ තනතුර බලාගෙන. ඒකට හයේ. මන්ත්‍රීවරු නැහැ. ගම බලන්න මිනිහෙක් නැහැ. ඩෙංගු පිරිලා. ඉතිහාසයේ වැඩිම ඩෙංගු රෝගීන් ඉන්නේ දැන්. පායන කාලයේ කොහේද ඩෙංගු? ඒ නිසා මේ කාලකණ්ණි ආණ්ඩුවට තමන්ට වැඩ බැරි හන්දා මේ පළාත් පාලන ආයතනවල බලය ගන්න එපාය කියන එක මම කියනවා. මේකට අපේ මහ ඇමතිතුමා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මහ ඇමතිතුමා තමයි අද ප්‍රධානියා. බලන්නේ එතුමා. TO මහත්වරුන්ට කියන්න ඕනෑ, මේවාට ක්‍රියාත්මක වෙන්න එපාය කියලා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අර කාටානේ ඉඩම් කඩන කොට සල්ලි දුන්නේ කාටද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මම හිටියේ නැහැ නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාම නේ මාත් එක්ක කිව්වේ -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ බලය පාවිච්චි කරලා, ඔය නාගරික සංවර්ධන අධිකාරියට ඕනෑ විධියට නටන්න දෙන්න එපා. TO මහත්වරුන්ට කියන්න, බලය ගත්තා නම් ඇවිල්ලා ගම්වලට ගිහිල්ලා, කාණු බලලා, ඉඩම් බලලා, ඒවා අනුමත කරන්න කියලා. එතකොට වැඩේ ඉවරයි.

[අ.භා. 01.54]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙතුමා ගැන කනගාටු වෙනවා. මෙතුමාම මට දවසක් කිව්වා. සමාවෙන්න. යාළුකමට කිව්ව එකක් ද දන්නේ නැහැ. මෙතුමාම මට දවසක් කිව්වා, මචං මේ කටානේ ඉඩම් ටික කඩනවා. ලොක්කෙක් සල්ලි ගන්නවා. මොනවා හරි කරපන් කියලා. එහෙම කියපු මන්ත්‍රීතුමා, අද මේ වෙන මොකක්ද කථා කරනවා. දැන් මම අහන්නේ, ඒවා -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

සල්ලි ගත්තේ මේ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කවුද ගත්තේ? පළාත් සභාවේ කවුද ගත්තේ. එදා ඔබතුමා මට කිව්වා නේ කවුද ගත්තේ කියලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ප්‍රාදේශීය සභාවේ ලොක්කා සල්ලි ගත්තේ නාගරික සංවර්ධන අධිකාරියත් එක්කලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඒක දෙන්නා හොරෙන් කර ගත්තු කථාවක් නේ?

**0**227

### ගරු සුසිල් කිඳෙල්පිටිය
Hon. Susil Kindelpitiya

නැහැ. ඔබතුමා වචන වෙනස් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත ගේන්නේ ඇයි? මේ පනත ගේන්නේම මේ රටේ නාගරික සංවර්ධනය විධිමත් කරන්න. අනාගතය දැකලයි මේක ගේන්නේ. ඒ නිසා මේ දෙන බලය ආපහු ගත්තාද? නැද්ද? කියන එක නොවෙයි ප්‍රශ්නය. නාගරික සංවර්ධන කටයුත්තේදී මේ වැඩේ හරියට වෙනවාද කියන එක අධීක්ෂණය කිරීම, ප්‍රමුඛ කාර්යභාරයයි. ඒ නිසා දැන් මෙතැන මේ විමධ්‍යගත කිරීම ගැන කථා කරනවා. විමධ්‍යගත කළ බලය ආපහු ගන්නවාය කියලා. හැබැයි, විමධ්‍යගත කළ අත යට ගනුදෙනු මේකෙන් නතර කරලා තිබෙනවා. විමධ්‍යගත කළ අත යට ගනුදෙනු මේකෙන් නතර වෙනවා. ඒ අතින් බැලුවාම මේක ඉතාමත්ම කාලෝචිත චක්‍රලේඛයක් කියලා මම විශ්වාස කරනවා. දැන් බලන්න. අපේ මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව ඉතාමත් වැදගත්. මොකද, අපි සාකච්ඡා කළේ නැත්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණු එළියට එන්නේ නැහැ. අපි හැමෝම කථා කරපු දේවල්වල සාධනීය දේවල් තිබෙනවා. අඩුපාඩු තිබෙනවා. මේකේ අඩුපාඩු නැත්තේ නැහැ. මේ සෑම චක්‍රලේඛයකම අඩුපාඩු තිබෙනවා. දැන් මේ පනත වුණත් 1978 සිට 1984 වනතුරු සංශෝධන ගෙනාවා. මේ සංශෝධන ගෙනාවේ ඇයි? මේකේ අඩුපාඩු තිබෙන නිසා. තවදුරටත් අඩුපාඩු තිබෙන්න පුළුවන්. හැබැයි, මේ මෙතුමාගේ යෝජනාවේ එක තැනක කියනවා, බලතල ආපසු පවරා ගැනීම සිදු කිරීමට කටයුතු කර ඇත්තේ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන් නොමැති අවස්ථාවක කියලා. ඒ කියන්නේ මොකක්ද? පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන් නොමැති අවස්ථාවක තමයි මේ චක්‍රලේඛය ක්‍රියාත්මක කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නැත්නම් මේකට වග කියන්නේ කවුද? පළාත් පාලන ආයතනවල සභාපතිවරු, නියෝජිතයන් සිටියා නම් මේ ඉඩම් කට්ටි කිරීමේ වැඩෙන් ලස්සනට හම්බ කරනවා. මොකද, මේ සම්බන්ධයෙන් අමිහිරි අත්දැකීම් තිබෙන කෙනෙක් මම. මම කොලොන්නාවේ ඉපදුණු කෙනෙක් හැටියට ඉඩම් කට්ටි කිරීම, ඉඩම් පිරවීම තරම් නරක අත්දැකීම් මම දන්නේ නැහැ, වෙන මන්ත්‍රීවරයෙකුට තිබෙනවාද කියලා. ඒ තරමම අප්‍රසන්න තත්ත්වයට මේක ඇදගෙන ගියා.

**0**228

දැන් බලන්න. මෙතුමා කියන්නේ මොකක්ද? මෙතුමා කියන්නේ, මේ වැඩේ මන්ත්‍රීවරු නැති පරිසරයක තමයි වෙන්නේ. මන්ත්‍රීවරු නැති පරිසරයක තමයි මෙය අධීක්ෂණය වන එක පටන් ගන්න ඕනෑ. අපි දන්නවා. පාර්ලිමේන්තුවේදී කියැවුණා. මේ සම්බන්ධයෙන් පැමිණිලි එක් දහස් හත්සිය ගණනක් තිබෙනවා. නීති විරෝධීව මේ පනත උල්ලංඝණය වන විධියට, නාගරික සංවර්ධනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක අනපණත්, නීති උල්ලංඝණය වන විධියට කරපු කටයුතු එක් දහස් හත්සිය ගණනක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැබිනට් මණ්ඩලයේ ඉල්ලීමක් තිබෙනවා. පසුගිය අයවැයේදී ඇමැතිවරු ඉල්ලීමක් කළා. වහාම මේක වෙනස් කරන්න. මට මතකයි, ආචාර්ය හර්ෂ ද සිල්වා ඇමැතිතුමා ඉල්ලීමක් කළා. ඒක නිසා මේ අවිධිමත් වැඩේ විධිමත් කරන්න. වහාම මේ ගැන මැදිහත් වෙන්නය කියලා නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කළා. ඒ නිසා මේක ක්‍රියාත්මක කළ යුතුයි. මගේ පෞද්ගලික අදහස නම් පසුගිය කාලයේ කරපු මේ අවිධිමත් වැඩ සියල්ල යළි නිවැරදි කිරීමේ වගකීම නාගරික සංවර්ධන අධිකාරියට තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරියට මේ චක්‍රලේඛයට දාන්න තිබුණා, පසුගිය අවුරුදු දහයේ, පහළොවේ වුණු කටයුතු සම්බන්ධයෙන් සොයන්න ඕනෑය කියලා. මෙතුමා කිව්වා, මහ නගර සහා සැලසුම් යටතේ වැඩ කෙරෙන්නේ නැහැයි කියලා. මම දන්නේ නැහැ. අපේ පළාතේ නම් වැඩ ගණනාවක් කෙරුණා. වහලා තිබුණු ඇළක් සකස් කරගෙන යනවා. මේ ඇළක් සකස් කරගෙන යන කොට මට එහි නියෝජිතයෙක් පෙන්නුවා, ඔබතුමාට අර තට්ටු දෙකේ ගෙවල් දෙක පේනවාද? මේ ඇළ යන්න ඕනෑ ගෙවල් දෙක උඩින්. එතකොට මම ඇහුවා, මේකට අනුමැතිය දුන්නේ කොහොමද? ඒක තමයි අපටත් තිබෙන ප්‍රශ්නය. මේවා නීති විරෝධීව පළාත් පාලන ආයතනවල නියෝජිතයන් සල්ලි අරගෙන කරපු වැඩක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේකේ එක තැනක පූජා භූමි ප්‍රදේශ සම්බන්ධයෙන් තිබෙනවා. කැලණියේ පූජා භූමිය ආශ්‍රිතව තිබෙන අක්කර 09 ක් ගොඩ කළා. කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ සභාපති

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

සහ ඒ අයගේ ගෝලයන් එකතු වෙලා අක්කර 09 ක් ගොඩ කළා. මුස්ලිම් ව්‍යාපාරිකයෙක් අරගෙන අක්කර 09 ක් ගොඩ කළා. දැන් ඒකේ නිවාස හදන්න හදනවා. මේවාට අනුමැතිය දුන්නා. මේවාට මිනිස්සු විරුද්ධ වුණා. හැබැයි, කාටවත් නතර කරන්න බැරි වුණා. මොකක්ද මේ වුණේ? මේවා අධීක්ෂණයක් නැති නිසයි මෙහෙම සිද්ධ වුණේ. ඒ නිසා මේ ගැන සොයා බලන්න ඕනෑ. ඊළඟට මම කැමැතියි, මෙතුමාගේ පළාතේ. කොහෙද? අත්තනගල්ලේ වීරගුල අක්කර 25 ක්. දුම්කොළ සමාගමට අයිති ඉඩම. බිලූ මවුන්ටන් කියන සමාගම කැලි තුන්සිය ගණනකට කැඩුවා. ඉස්සෙල්ලා පර්චස් 8.5 ගණනේ කඩන්න හැදුවා. විරෝධතාව නිසා පර්චස් 12.5 ට කඩන්න ගත්තා. මේකෙන් වුණු හානියට ඒ නිසා මේ පරිසරයට වන හානිය බලන්න. තවමත් ඒකට විසඳුමක් නැහැ. ඒක පෙත්සම් කාරක සභාවටත් ආවා. පෙත්සම් කාරක සභාවෙන් කිව්වා, මෙන්න මෙවැනි ඉල්ලීම් ජනතාවගෙන් තිබෙනවා. ඒ අනුව කටයුතු කරන්නය කියලා. හැබැයි එකක්වත් සිද්ධ වුණේ නැහැ. සමහර පැතිවල ප්‍රාදේශීය සභාවල ලේකම්වරු කියනවා, අපට පළාත් සභාවේ ඉහළින් පණිවිඩයක් එවලා තිබෙනවා. මෙච්චර ප්‍රමාණයේ ඉඩම් කඩනවා නම් කෙලින්ම මහ ඇමැති කාර්යාලයට එවන්න කියලා. මම මේක මීට කලිනුත් මේ පළාත් සභාවේ දී කිව්වා. මම දන්නේ නැහැ අත්තද බොරුද කියලා . බොරු වෙන්නත් පුළුවන්. මගේ එහෙම අදහසකුත් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වගකීමෙන්ද කියන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බිලූමවුන්ටන් සමාගම. මම මීට පෙර මේ පළාත් සභාවේ කිව්ව එකක් මෙය. බිලූ මවුන්ටන් ගනුදෙනුවේදී මිලියන 06 ක් ගත්තා කියලා චෝදනා තිබෙනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඕවා ඉන්න කොට කියන්න ඕනෑ. නැහැ නේ? බොරු හදලා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගත්තේ කවුද කියලා කිව්වේ නැහැ. කවුද ගත්තේ කියලා මම කිව්වද ගරු මන්ත්‍රීතුමා? එහෙම කිව්වේ නැහැ. හැබැයි, එහෙම පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්ට කියලා තිබෙනවා. ඒවා නිවැරැදි කරන්න -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා ප්‍රධාන ඇමැති කිව්වා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. නැහැ. ගරු මන්ත්‍රීතුමා, වචන වෙනස් කරන්න එපා. වගකීමෙන් මම කියන්නේ. මම ප්‍රධාන ඇමැති කිව්වේ නැහැ. ප්‍රධාන අමාත්‍ය කාර්යාලය කියන්නේ, මහ ඇමැති විතරක් නොවෙයි නේ ඉන්නේ. එතැන තව කට්ටිය ඉන්නවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

නැහැ. නැහැ. ඒ බොරු කථා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කරුණාකර ඔබතුමාගේ දේශපාලනට මේක ලඝු කරන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ, ඉඩම් කට්ටි කිරීම නිසා මේ නීති රීති කැඩෙනවා නම්, පරිසරයට හානියක් වෙනවා නම්, භූගත ජලය නැති වෙනවා නම්, කසළ බැහැර කරන්න ක්‍රමයක් නැතිව, අප ජලය බැහැර කරන්න ක්‍රමයක් නැතිව ඉඩම් කට්ටි කඩනවා නම් මේක වහාම සොයා බලා කටයුතු කරන එක මේ අධිකාරියේ වගකීමක්. ඒ නිසා මේ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුයි කියන එක මා දැඩි ලෙස විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව උදාහරණයක් කියන්නද? මම ඉන්න කොළොන්නාවට අයිති වන්නේ මුල්ලේරියාව සංග්‍රාම භූමිය. ඓතිහාසික භූමිය.මේ ඓතිහාසික භූමිය ගොඩ කළා. හිටපු සභාපති ගොඩ කරලා කට්ටි කරලා විකුණුවා. මේකට ජනාධිපතිතුමාගේ සහෝදරයා සම්බන්ධයි. මම මේ වගකීමෙන් කියන්නේ. සල්ලි මත සියල්ල ක්‍රියාත්මක

කරලා මේවා විනාශ කරලා දැම්මා. මේවාට පළාත් සභාවේ අධීක්ෂණය තිබුණේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කොයි කාලයේද? ජනාධිපතිතුමා කිව්වාම ජනාධිපතිවරු ගොඩක් හිටියා නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ. නැහැ. දැන් ඉන්න ජනාධිපතිතුමාගේ. ඊළඟට කුඹුරු ඉඩම් ටික ගොඩ කරලා ඉවරයි. ඒ නිසා මේ කටයුතු වහාම අධීක්ෂණය කරන්න ඕනෑ. හැබැයි, මම පිළිගන්නවා. මේ කාරණය නිසා පළාත් පාලන ආයතනවල ආදායම අඩු වෙන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක්. හැබැයි, පළාත් පාලන ආයතනවල ආදායම අඩුවීම ගැන මහා ලොකුවට කථා කරනවා. මේ පළාත් සභාවට විශාලම ආදායම ලැබුණු ක්‍රමය නතර වන කොට ඒක ආපසු ගන්න කොයි නායකයා එක්කද අපේ නායකයෝ කථා කළේ. කොයි කෙනාද මේක ආපසු හරවලා එව්වේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

බැසිල් මහත්මයා කෝටි ගණන් දුන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමන්ලා ඒ කාලයේ ඒකට නිහඬව සිටියා. ඒක ආපසු ගන්න දැන් කථා කරන්න කෝ. ඔය තර්ක වැඩක් නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා ඒ කාලයේ ඒකට කටයුතු කරලා නැහැ. ඒ කාලයේ බැසිල් මහත්මයාට භයේ සිටියා. ඇත්ත කතන්දරය කියන්නම්. ඔබතුමන්ලා බැසිල් මහත්මයාටයි, ගෝඨාභය මහත්මයාටයි භයේ සිටියා. ඒ නිසා නාගරික සංවර්ධනය කියලා බලෙන් ඉඩම් කොල්ල කන්න ඉඩ දුන්නා. එතකොට නාගරික සංවර්ධන අධිකාරිය හොඳයි. එතකොට ගෝඨාභය මහත්තයා ඉඩම් අල්ලන කොට නාගරික සංවර්ධන අධිකාරියත් හොඳයි. පනතත් හොඳයි. දැන් තමයි ප්‍රශ්නය තිබෙන්නේ? ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විමධ්‍යගත කළ බලය හා වංචාව හා දූෂණයට එහෙම නැත්නම් මේ කප්පම් ගැනිල්ලට වැට බැඳීමයි අතර ලොකු වෙනසක් තිබෙනවා. ඒ වෙනස අපි තේරුම් ගන්න ඕනෑ. ඒ නිසා මම කියන්නේ මේ සම්බන්ධයෙන් පසුගිය කාලයේ සිද්ධ වුණු මෙවැනි අත යට ගනුදෙනු පිළිබඳව වහාම පරීක්ෂා කරන්න ඕනෑ. ඒ පිළිබඳවත් සොයන්න ඕනෑ. ඒ නිසා විනිවිදභාවය, සාධාරණත්වය, සමානාත්මතාවය සඳහා පවතින නීතිය කැඩීම වැළැක්වීම සඳහා නම් මේ තීරණය ගත්තේ, පැහැදිලිවම ඒක සාධනීය උත්සාහයක් විධියට අපට අර්ථ ගන්වන්න වෙනවා. ඒ නිසා ඒකට සහාය දීම අපේ යුතුකමක් වෙනවා. මොකද, ඉතාම සැලසුම් සහගතව කරන සංවර්ධන කටයුත්තකට සහාය දැක්වීම ජනතා නියෝජිතයන් හැටියට අපේ වගකීමක්. මම කියන්නේ, නාගරික සංවර්ධන අධිකාරිය මේ චක්‍රලේඛයෙන් බලාපොරොත්තු වන්නේ ඒක නම්, අපි ඒකට උදව් කරන්න ඕනෑ. ඇමැතිවරයා සම්බන්ධයෙන් සමහර මන්ත්‍රීවරුන්ට පෞද්ගලිකව ප්‍රශ්න තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ ඇමැතිවරයාගේ ඉතාහාසය බැලුවාම මම හිතන්නේ නැහැ, මේක හානියක් කිරීමේ බලාපොරොත්තුවෙන් ගෙනාපු එකක් කියලා. එහෙමනම් අපි අනික් සියලු දෙනාට කලින් ඒකට විරුද්ධ වෙනවා කියන එක මා යළි යළිත් මතක් කරන්න කැමැතියි.

අවසාන වශයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කල්පනා කරන්න ඕනෑ. මෙහි සඳහන් වන කරුණුවලට යටත්ව කිසියම් අවස්ථාවකදී මේ ඉඩම් ටික ආරක්ෂා කරගන්න, මහජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරගන්න, අපේ භූමිය ආරක්ෂා කරගන්න සහ ඉතාම විධිමත් සංවර්ධනයක් කරා යන්න නම් අපි කළ යුතු දේ කළ යුතුමයි. දේශපාලනික හේතු මත ඒකට විරුද්ධ වීමෙන් අපි වළකින්න ඕනෑය කියලා මා දැඩි ලෙස විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තූතිය පළ කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තූතියි. ජනක දීපාල් වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එතුමා සභාවේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 02.04]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම අපේ මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා කාලෝචිත යෝජනාවක් ගෙනාවා. ඒ වාගේම මේ සභාවේ සමහර වෙලාවට රීති අත්හිටුවලා ගෙනෙන යෝජනා එක්ක බැලුවාම මේක ඇත්තටම ඒ ක්‍රමවේදය අනුවම ගෙනාපු යෝජනාවක් හැටියටයි මම දකින්නේ. හැබැයි, අපි මේ ගැන කථා කරලා මෙහි තීන්දුව මොන තැනකට යයි ද, මොනවා වෙයිද කියන එක අපි දන්නේ නැහැ. නමුත් කාලීන අවශ්‍යතාව අනුව ඒ ගත්තා වූ තීන්දුවට ක්ෂණිකවම යෝජනාවක් ගෙනැල්ලා අපේ අදහස් පළ කරලා එය නිවැරදි කර ගැනීමේ වැඩ පිළිවෙළ තුළ හොඳ යෝජනාවක් අපේ ගරු මන්ත්‍රීතුමා ගෙනාවා කියලා අපි දකිනවා. විශේෂයෙන්ම මේක අපි පක්ෂ භේදයකින් තොරව, ජාති ආගම් භේදයකින් තොරව විය යුතු කාරණාවක්. ඊළඟට පළාත් පාලන මැතිවරණය තිබෙනවා නම් සමහර වෙලාවට පළාත් පාලන ආයතනවල කුමන මන්ත්‍රීවරයෙක් හෝ වෙන්න පුළුවන්. සභාව එක්සත් ජාතික පක්ෂයේ වෙන්න පුළුවන්. සභාපති ඒ පක්ෂයෙන් වෙන්න පුළුවන්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් වෙන්න පුළුවන්. පොහොට්ටුවේත් වෙන්න පුළුවන්. පොදුජන එක්සත් පෙරමුණෙන් වෙන්න පුළුවන්. කවුරු ආවත් බලපාන ප්‍රශ්නයක් හැටියට මේ කාරණාව දකිනවා. මම ඇත්තටම කනගාටු වෙනවා. මේ අවශ්‍යතාවයට මේ රජයේ වැඩ පිළිවෙළ කරගන්න බැරුව, මේ ජනතාවට දුන්නු පොරොන්දු ඉටු කරගන්න බැරුව වෙනත් මාර්ගවලින්, පටලැවිලි වලින් රජය ඉස්සරහාට අරන් යන්න හදන වැඩ පිළිවෙළක් මෙය. පළාත් පාලන ආයතන විසුරුවලා දැන් අවුරුදු දෙකකට ආසන්න කාලයක් වෙනවා. අවුරුදු දෙකකට ආසන්න වෙන කොට ඒකේ තිබෙන දොස් ටික කියලා අද දීපු බලතල ආපසු පවරා ගන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

විශේෂයෙන් මේක කියලා තිබෙනවා, 1985 මාර්තු 01 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛනයෙන් ලබා දීපු දේ ආපසු පවරා ගන්නවා කියලා. හැබැයි, පවරා ගන්නවා කිව්වාට මේකේ චක්‍රලේඛන කථාවක් නැහැ. කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරලා, බස්නාහිර සංවර්ධන ඇමැතිතුමාගේ නියෝගය පරිදි මේ තීන්දුව ගත්තාය කියලා කියන්නේ. එහි නීත්‍යානුකූල භාවය කොපමණද කියලා මම දන්නේ නැහැ. නමුත් කෙසේ වෙතත් මේ මහජන නියෝජිතයන් නැතිව - මේ අකල් මරණ වෙලා, ජනතාවට සමීපම මහජන නියෝජිත ආයතනය තමයි පළාත් පාලන ආයතන. ඒවා තුළින් වෙන්නේ නැති වැඩ පිළිවෙළවල් තුළින් - නිලධාරී වේවා. හැමෝම නොවුණත් යම්කිසි ක්‍රමවේදයක් තුළ අරමුණක් නැතිව යන වැඩ පිළිවෙළක් තුළ ක්‍රියාත්මක වැඩ නිසා තමයි මම හිතන්නේ, මෙහෙම මේ වැඩ පිළිවෙළ මේ ආකාරයට පවරා ගන්නවා කියලා කියන්නේ.

ඇත්තටම දැන් මෙතැන මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම කථා කළා. කථා කරන හැම අවස්ථාවකම - විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල මේ සැලසුම් අනුමත කරන කමිටුවේ නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙක් අනිවාර්යයෙන් සිටිය යුතුයි. ඒ මතය එතැනට ගෙනෙන්න ඕනෑ. ඒ මතයත් එක්ක ඒ සැලසුම හරියාකාරව ක්‍රියාත්මක නම් තමයි අවසරය දෙන්නේ. ඒ දේම තමයි මෙපමණ කල් වෙලා තිබෙන්නේ. මේ දේ එහෙම එපමණ වෙලා තිබිලා දැන් නිලධාරී අතර මේ පළාත් පාලන ආයතන ගිහිල්ලා නිලධාරීන්ට ඕනෑ විධියට කටයුතු කරනවා කියන එක අපි සියලු දෙනාම පිළිගන්නවා. මම මේ සම්බන්ධව සභාවේ ප්‍රශ්න අහලා තිබුණා. මේ සැලසුම් අනුමත කිරීම සම්බන්ධව. මේ නිසා ජනතාවට වන අපහසුතාවන්, ජනතාවට පරණ ඉන්න ඉඩම් කට්ටි කැබලි විශේෂයෙන්ම - මුල් ජනතාවට වන අසාධාරණ. ඒ වාගේම මේවා මිලදී ගන්න ඉන්න ජනතාවට වන අසාධාරණ ගැන අපි කථා කළා. ඉතින් ඒවා නීතිය තුළින් ක්‍රියාත්මක කරලා හරිගස්සනවා වෙනුවට ඒ තිබෙන බලය ආපසු ගන්න එක ගැන නම් අපි ඇත්තටම සතුටු වෙන්නේ නැහැ. මොකද, මේකට එකම විසඳුම තිබෙන්නේ, පළාත් පාලන ඡන්දය තියලා ඒ එන මන්ත්‍රීවරු, ඒ එන සභාපතිවරුන්ගෙන් ඒ කාර්ය ඉටු කරගන්නයි. මහජන නියෝජිතයන්ට ඇඟිල්ල දික් කරලා, ඔවුන් වැරදි නම් ඔවුන්ට දඬුවම් දීම, ඔවුන්ගේ තනතුරු අවලංගු කිරීමේ වැඩ පිළිවෙළ තුළ හරි ඒ කටයුතු ක්‍රියාත්මක කරන එකයි ඇත්තටම විය යුතු කාරණාව හැටියට අපි දකින්නේ.

අපි මේක හොඳයි කියලා ගමු කෝ. අද ඉන්න නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති තව ටිකක් කල් ගිහිල්ලා වෙනස් වෙන්න පුළුවන්. ඇමැතිවරයා වෙනස් වෙන්න පුළුවන්. හැබැයි, ඊළඟට ඒ ගන්න තීන්දුවලට වග කියන්නේ කවුද? හැබැයි, මහජන නියෝජිත ආයතනයක් හැටිය ඒ බලය ප්‍රාදේශීය සභාව තුළ තිබෙනවා නම්, මහ නගර සභාව තුළ, නගර සභාව තුළ තිබෙනවා නම් ජනතාවට ගිහිල්ලා ඇඟිල්ල දික් කරන්න, ඒ වෙනුවෙන් පෙනී සිටින්න, උද්ඝෝෂන කරන්න, ඒ වෙනුවෙන් කථා කරන්න අයිතිය තිබෙනවා. අද කථා කරපු බොහොමයක් විශේෂයෙන්ම අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා ගැන කනගාටු වෙනවා. එතුමා හිටපු සභාපතිවරයෙක් හැටියට එදා ඔය තීන්දුව ආවා නම් එතුමා කථා කරන්නේ, ඔය විධියට නොවෙයි. අද කථා කරපු විධියට නොවෙයි, එතුමා එහෙමනම් එදා කථා කරන්නේ. ඒ වාගේම සමහර මන්ත්‍රීවරු ඉන්නවා. පළාත් පාලන ආයතනයකවත් නොසිට කෙළින්ම මෙතැනට ඇවිල්ලා මේවායේ කිසිම වගකීමක් නොදන්න අය ඉන්නවා. ඒ වෙනුවෙන් කථා කරනවා. තමන්ගේ අරමුණ එකක් වෙන්න පුළුවන්. කාට හරි ගැහිල්ලක්. කාව හරි විවේචනය කිරීමක්. නැත්නම් පෞද්ගලික විවේචනයක් වෙන්න පුළුවන්. ඒ තුළ කථා කරන අය ඉන්නවා. එහෙම නොවෙයි. මේක පොදුවේ විය යුතුයි. ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මහජන නියෝජිත ආයතන හතරයි තිබෙන්නේ. පළාත් පාලනය, ඒ වාගේම පළාත් සභාව, පාර්ලිමේන්තුව, ජනාධිපති. මේ ආයතන ඍජුවම මේ ජනතාව වෙනුවෙන් පෙනී සිටිනවා. මේ ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු කරනවා.

ඒ නිසා ඒවාට තිබෙන බලය අඩු කරලා නිලධාරීන් අතර, එහෙමත් නැත්නම් වෙනස් වෙලා යන ඇමැති මණ්ඩල අතර පවත්වාගෙන යන එක ගැන ඒ රටේ ජනතාවගේ අනාගතය ගැන අපට හිතන්න බැහැ. විශේෂයෙන්ම මෙතැන අද අපේ නිශාන්ත ශ්‍රී ගරු මන්ත්‍රීතුමා, හිටපු ඇමැතිතුමා කථා කළා. මේ දූෂිත සභාපතිවරු සිටියා. අල්ලස් ගත්ත අය සිටියා. කාන්තාවන් දූෂණය කරපු අය සිටියා. ඒ නිසා සමහර වෙලාවට මේක ගත්තා කියලා. ඒක මම හිතන්නේ ඒ අයගෙත් අඩුපාඩුවක් වෙන්න ඇති. ඒ අය ගිය ආණ්ඩුවේ සිටියා නම්, ඒ ගිය ආණ්ඩුවේ තීන්දු තීරණ නොගත්තා නම්, ඒ අයට දඬුවම් නොකළා නම් අද ඒ ගොල්ලන්ට තිබෙන්නේ පනත් වලින් මේවා බලය අඩු කරන එක නොවෙයි. ඒ අයට දඬුවම් දෙන



එක. අපි කියන්නේ නැහැ, වැරැදි කළා නම් දඬුවම් දෙන්න එපැයි කියලා. අල්ලස් ගත්තා නම්, අහු වුණා නම් ඒ අයට දඬුවම් දිය යුතුයි. අද ඒක නොකර මේ රජයෙනුත් - මහින්ද රාජපක්ෂ රජය වැරැදියි කියලා, හොඳ නැහැයි කියලා ඊට වැඩිය හොඳ එකක් පත් කළා නම්, ඊට වැඩිය හොඳ තීන්දු එක්ක යන්න ඕනෑ. අද ඒ අයට දඬුවම් දෙන්නේ නැතිව මේ රටේ සමස්ත ජනතාවට සේවය කරන ආයතනවල බලය අඩු කරලා මේ රටේ ජනතාවට ලබා දෙන සේවය අඩු කරන එක තමයි මේ කටයුතු කරන්නේ.

විශේෂයෙන්ම මේ අවස්ථාවේ සභාපතිවරුන්ට ගොඩක් දොස් කිව්වා. මේ අය මෙහෙමයි. වංචනිකයි. මේ අය අල්ලස් ගත්තා කියලා. විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපේ ගරු විපක්ෂ නායකතුමා මංජු ශ්‍රී අරංගල මැතිතුමන්ලා වාගේ අය, ආණ්ඩු පක්ෂය පැත්තක තිබෙද්දී ඒ සභා හොඳට ගෙන ගියා. අද මේ මොහොතේත් අර නව ලෝක හොස්පිටල් එකේ ප්‍රතිකාර ලබනවා. අපි ඉක්මන් සුවය මේ අවස්ථාවේ එතුමාට ප්‍රාර්ථනා කරන්න ඕනෑ. ඇත්තටම එතුමන්ලා වාගේ නම තිබුණු සභාපතිවරුත් ඉන්නවා. ආණ්ඩු කෙසේ වෙතත්. පක්ෂ කෙසේ වෙතත්. ඒ වාගේ දූෂිත අයත් ඉන්නවා. දූෂිත අයට දඬුම් දෙන එකයි කළ යුත්තේ. ඒකයි මේ ආණ්ඩුවෙන් කළ යුත්තේ. මේ යහපාලනය නම් කළ යුත්තේ, ඒ කාර්යයයි කියන එකයි මම මේ අවස්ථාවේ ඇත්තටම මතක් කරන්නේ. මොකද, මේ වැඩ පිළිවෙළ තුළ අපි දන්නවා. නාගරික සංවර්ධන අධිකාරිය තුළ - අපේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා සිටියා නම් හරි. එතුමා දන්නවා. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. මොරගහහේන නගරයේ නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයට යටත් වුණු නිසා අපට අවුරුදු ගණනක් තිස්සේ ප්‍රාදේශීය සභාවට වැසිකිළියක් සාදා ගන්න බැරි වුණා. සම්පූර්ණ ඉඩම තිබෙනවා. සල්ලි තිබෙනවා. ඒ සේවය ලබා දෙන්න පුළුවන්. නමුත් අවුරුදු ගණනක් තිස්සේ වැසිකිළියක් හදන්න අනුමැතිය දුන්නේ නැහැ. මොරගහහේන නගරයේ මේ ජනතාවට අවශ්‍ය පොදු වැසිකිළිය හදන්න දුන්නේ නැහැ. ඉතින් එහෙම තමයි ඒ සේවාව වෙන්නේ. එහෙම තීන්දු ගත්ත ආයතනයකට තමයි නැවතත් මේ ආකාරයට බලය දීලා මේ ආකාරයෙන් කටයුතු කරන්නේ. අපි හැමෝම කථා කළා නම්, BTT බදු ක්‍රමය අපට තිබුණා නම් - අපෙන් ගත්තා නම් මේ පනත වාගේම අපට ඊළඟට පළාත් සභාවට ඒකත් පවරා ගන්න පුළුවන් වෙන්න ඕනෑ. BTT එක ගත්තා නම් අපට ආපසු පවරා

[ගරු ලලිත් වර්ණකුමාර]

ගන්න පුළුවන් වෙන්න ඕනෑ. එහෙම වැඩ පිළිවෙළක් යන්න ඕනෑ. ඒ වාගේම හැමෝම මතක් කළේ, අපේ ආණ්ඩු කාලයේ, අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ ඒවා දුන්නා කියලා. ඒ දීපු නිසා තමයි, වැරැදි කරපු නිසා තමයි පරද්දලා ගෙදර ඇරියේ. ඒ නිසා ඒවා ආපසු ගන්න එක්සත් ජාතික පක්ෂයේ අය කටයුතු කරන්න ඕනෑ. අපට දොස් කියන එක නොවෙයි වැඩේ. ප්‍රේමදාස මහත්මයා 1995 දී මේ බලය දුන්නා නම්, ප්‍රේමදාස මහත්මයා කොහේ හරි ඉඳගෙන බලාගෙන දුක් වෙයි. ඒ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන්ම තමයි ආයේ එම බලය උදුරලා ගත්තේ. මේ ග්‍රාමීය නායකයන් හදන වැඩ පිළිවෙළ, ගම හදන වැඩ පිළිවෙළ හානි කරන්නෙත් එක්සත් ජාතික පක්ෂයම කියලා මම විශ්වාස කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.12]

**ගරු අර්ෂාඩ් නිසාම්ඩීන්**
Hon. Arshad Nizamdeen

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොමත්ම ස්තුතියි. මම නම් කියන්නේ, මේ නාගරික සංවර්ධන අධිකාරියට තිබෙන බලය ඉවත් කිරීම සුදුසුයි කියන එක තමයි මගේ හැඟීම. ඇයි කිව්වොත්, නාගරික සංවර්ධන අධිකාරියට ඉඩම් පවරා ගැනීමේ බලයක් තිබෙනවා. මේ ඉඩම් පවරා ගැනීමේ බලයේ ඵල විපාක වින්ද කෙනෙක් හැටියට මම කියන්නේ. මගේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන්. කොම්පඤ්ඤ වීදියේ ජනතාව වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය මීට පෙර වකවානුවලදී එවකට හිටපු අමාත්‍ය මංගල සමරවීර ගරු අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය තිබුණු කාලයේදී එතුමාගේ කාලයේ පිටකොටුවේ කඩවල් තිබුණා. ඒවා අත්තනෝමතික ලෙස කඩා ඉවත් කරලා අද වනතුරු කුණු දාන්න පුළුවන් ප්‍රදේශයක් බවට තමයි එය පත් කරලා තිබෙන්නේ. ඒ වාගේ නාගරික සංවර්ධන අධිකාරියේ බලය යොදාගෙන කරපු අවස්ථාවන් තිබුණා. ඊට පසුව ආපු නාගරික සංවර්ධන අධිකාරියේ බලය යොදා ගත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ලේකම් වශයෙන් සිටියා. එතුමා කරපු දේවල් අනුව 2008.05.18 වැනිදා ගුණී වීදියේ තිබුණු 500 කට වැඩිය තිබුණු ගෙවල් අත්තනෝමතික ලෙස කඩා ඉවත් කළා. උසාවි නියෝගය නොතකා කඩා ඉවත් කරපු ගෙවල්. ඒ ගෙවල් කඩා ඉවත් කළේ මේ නාගරික සංවර්ධන අධිකාරියේ තිබෙන බලය තියාගෙන. මෙවන් ආකාරයට තමයි මේ නාගරික සංවර්ධන අධිකාරියේ බලය තිබෙන්නේ. ඊට පසුව 2010.05.06 වැනිදා නිවුස් වීදියේ සින්නක්කර ඔප්පු තිබුණු ගෙවල් 21 ක් අර ආරක්ෂක අංශයේ අයගේ ළමයින්ගේ පාසල සඳහා Swim pool එක හදන්න, අවුරුදු 20 කට වඩා පැරණි, ජීවත් වුණු ජන කොටසකගේ ගෙවල් 21 ක් දවස් පහකින් ලියුමක් දීලා කඩා ඉවත් කළා. ඒ නාගරික සංවර්ධන අධිකාරියේ බලය යොදා ගනිමින්. එවැනි ආකාරයටම තමයි මේ දේවල් කළේ. එපමණක් නොවෙයි. නාගරික සංවර්ධන අධිකාරියේ ඒ බලය තියාගෙන මැලේ වීදිය මජ්ජුම්ත් ජාමියා පාර, ගුණී වීදිය ඒ වාගේ ප්‍රදේශවල ගෙවල් පිහිටි ඒ ඉඩම් ටාටා සමාගමට පවරා දුන්නා. දුම්රිය පටුමඟ ඉඩම් පකිස්තානු සමාගමකට පවරා දුන්නා. මෙවැනි ආකාරයකට තමයි නාගරික සංවර්ධන අධිකාරිය බලය යොදාගෙන මේ හිටපු කට්ටිය කරගෙන ආවේ. නැවත මේ මේ නාගරික සංවර්ධන අධිකාරියට බලය වැඩිපුර දෙනවා කියන්නේ - වර්තමාන ඇමැතිතුමා අවංක ඇමැතිවරයෙක් කියලා අපි හිතමු කෝ. ඉන් පසුව එන ඇමැතිවරයෙක්, ලේකම්වරයෙක් හරි ඒකට පත් වුණා නම් මොකක්ද වෙන්නේ? ඒ නිසා නාගරික සංවර්ධන අධිකාරියට බලය ලබා දීම ගැන අපි විරුද්ධ වෙනවා. නාගරික සංවර්ධන අධිකාරියේ තිබෙන ඒ ඉඩම් පවරා ගැනීමේ බලයත් අරගෙන දාන්න කියලා තමයි අපි කියන්නේ. ඒ නිසා මේ කාලෝචිත යෝජනාව ගෙනෙන ලද අපේ මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමාට මගේ හෘදයාංගම ස්තුතිය පුද කරමින්, කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.15]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මංජුල බුද්ධදාස අපේ ගරු මන්ත්‍රීතුමා බලය බෙදා හැරීම පිළිබඳව තිබුණු බලතල නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරා ගැනීම පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරියේ අංක DDGP 01 11 සහ 2017 ජනවාරි මස 23 වැනි දිනැති ලිපිය පිළිබඳව පවරාගත්ත බලතලත් එක්ක ලැබුණු යෝජනාවකට එතුමා රීති අත්හිටුවලා යෝජනාවක් ගෙන ඒම පිළිබඳව මම මගේ ස්තුතිය පිරිනමනවා. මම හිතන්නේ මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු 104 දෙනාටම දැනෙන යෝජනාවක් හැටියට පිළිගන්නවා. අනික් පැත්තෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය වන

ආකාරය, ශ්‍රී ලංකාව සුද්දන්ගෙන් නිදහස ලබා ගත්ත ආකාරය පිළිබඳව ඉතිහාසයක් අපේ රටේ තිබෙනවා. ඒ ඉතිහාසයන් තුළ මේ පළාත් පාලන ආයතන පිළිබඳව දැවැන්ත නායකත්වයක් දරාපු නාගරික මන්ත්‍රීවරයෙක් ශ්‍රී ලංකා දේශපාලනයේ ජනතා නියෝජිතයෙක් හැටියට ජනාධිපතිවරයෙක් දක්වා ගිය ඉතිහාසයක් අපේ රටේ තිබෙනවා. ඒ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා මේ අණපනත් සම්මත කරගෙන මේ චක්‍රලේඛ කියන වචනය යෙදෙව්වේ, අණපනත්වල තිබෙන වැඩ කටයුතුවලට යම්කිසි බාධාවක් ඇති කරන්න, බැම්මක් දා ගන්න දාපු ලියවිල්ලක් තමයි චක්‍රලේඛයක් කියන්නේ. නීතියක් හැටියට මේක බලපාන්නේ නැහැ. පනතක් නම් ඒක නීතියක් හැටියට බලපානවා. ඒ නිසා මෙන්න මේ චක්‍රලේඛය තුළින් ලබා ගත්ත බලතල අනුව මේ නාගරික සංවර්ධන අධිකාරිය මුලින්ම සඳහන් කරන කාරණයක් තමයි මේ රටේ පළාත් පාලන ආයතනවලට තිබෙන බලතල පිළිබඳව මෙතුමන්ලා ගන්න ක්‍රියා මාර්ග මොනවාද කියන එක පැහැදිලිව සඳහන් කරනවා. නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගන්න ක්‍රියාදාම අතරින් පළමුවැනි එක ආරම්භ කරනවා. මහල් හතරයි. G+3 ඊට වැඩි සියලුම ඉදි කිරීම්, වර්ග අඩි 4000 ට වැඩි සියලුම ඉදි කිරීම්, සියලු රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ගොඩනැගිලි මේ නීතිය යටතේ බලපානවා කියලා එතුමන්ලා සඳහන් කරලා අවසාන කරනවා. ඒකෙම කොටස් 11 කින් අධිවේගී මාර්ගය යන ආරක්ෂිත කලාපවල යෝජිත සංවර්ධන වැඩ කටයුතු කියලා ඒකේ අවසන් කරලා අංශ හයකට කඩලා මේ බලතල නාගරික සංවර්ධන අධිකාරියට ජනවාරි මාසයේ 23 වැනිදා දාපු ලිපියකින් පෙබරවාරි මාසයේ 01 වැනිදා සිට ක්‍රියාත්මකයි කියලා.

මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න හේතුව වුණේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "බලගතු ශ්‍රී ලංකාවක් සැලසුම් සහගත ගමනක්, කාටත් යමක් කමක් ලැබෙන ආර්ථිකයක්" ලැබෙන වැඩ පිළිවෙළකට 2017 වසරේදී යහපාලන ආණ්ඩුවේ අතිගරු ජනාධිති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් දැවැන්ත සැලැස්මක් සැලසුම් කරලා මේ රටේ පාලකයින් විසින් ඩී.ඇස්. සේනානායක මහත්මයාගේ සිට අද මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා දක්වාම පාලනය කරපු පාලකයින්ගේ හිත්වල, අදහස්වල, සැලැසුම්වල තිබුණේ, රට දියුණු කරලා, සංවර්ධනය කරලා ජනතාවට ජීවත් වීමේ අයිතිය ඇති කරලා රටේ ඒක පුද්ගලික ආදායම වර්ධනය කරලා යහපත් රටක් හඳුන්වලා දෙන්නයි. ස්වභාව ධර්මයෙන් පිහිටි භූමියක් හැටියට ලංකාව, ඉතාමත් හොඳ පොළොවක් තිබෙන, දේශගුණයක් තිබෙන ප්‍රදේශයක් වුණත් පසුගිය කාලවල එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පාලනය කරපු පාලනයන් තුළ මේ රටේ ජනතාවට, රටේ පරිසරයට දැවැන්ත හානියක් හා අසාධාරණයක් ඒ එක්කම බලහත්කාරයෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබාගෙන නීති විරෝධී වැඩ ක්‍රියාත්මක කරවීමේ වැඩ පිළිවෙළක් අපේ රටේ ආරම්භ වෙලා තිබෙනවා.

ඒ නිසා මේ වැඩ පිළිවෙළ ආරම්භ වුණු වෙලාවේ මේ රටේ පළාත් සභා බිහි කරපු ඉතිහාසය අපට මතකයි. ගම් සභා ක්‍රමය අහෝසි කරලා, පළාත් පාලන ආයතන, නගර සභා වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරපු ආකාරය අපට මතකයි. අන්න ඒ මතක අතීතය තුළ ජනතාවට සහන නොලැබිලා රටේ සංවර්ධනය අයාලේ ගිහිල්ලා, පරිසරය දූෂණය වෙලා, ආර්ථිකය කඩා වැටුණු, ණයට පත් වුණු මිනිසුන් බවට අද වන කොට ශ්‍රී ලංකාව පත් වෙලා තිබෙනවා. එහෙමනම් මෙන්න මේ ශ්‍රී ලංකාව ධනවත් රටක් බවට පරිවර්තනය කරන්න, ශක්තිමත් ආර්ථිකයක් ඇති මිනිසුන් රටේ ගොඩනගාගන්න වැඩ කටයුතු සැලසුම් කරන කොට, නාගරික සංවර්ධන අධිකාරිය මීට අවුරුදු ගණනාවකට කලින් අපේ රටේ ස්ථාපිත කළා. ඒ අධිකාරියට පැවරුණු බලය නගර සංවර්ධනය කිරීම සහ ඒ ගම් සභා ක්‍රමයේ තිබුණු පොඩි කුඩා නගර දැවැන්ත මහ නගර සභා සහ මධ්‍යම නගර සභා සහ ප්‍රාදේශීය සභාවල්වලට වෙන් වෙනවා. එසේ වෙන් වෙන කොට මේ ආයතනවල බලධාරීන්ගේ තිබුණු කැපවීම මත අයථා අයුතු යම්කිසි අයගෙන් ඇති වුණු අඩුපාඩුවක් නිසා තමයි අද මේ පළාත් සභාවට 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලතල දීලා තිබෙනවා. පළාත් පාලන ආයතනවලට ඒ ප්‍රදේශයේ මහ ඇමැති සමඟ වැඩ කරන්නත්. එතකොට මහ ඇමැතිතුමා එක්කම වැඩ කටයුතු කරන්න මධ්‍යම ආණ්ඩුවේ අමාත්‍යවරයෙක් දාලා තිබෙනවා. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තාපා මැතිතුමා. ඊළඟට නාගරික සංවර්ධන අධිකාරිය බස්නාහිර සංවර්ධන මෙගා පොලිස් වැඩ සටහනේ අමාත්‍යවරයෙක් ඉන්නවා චම්පික රණවක ඇමැතිතුමා. එහෙම නම් මෙන්න මේ තුන් දෙනෙක් අතර, අපි පළාත් පාලන ආයතන නියෝජනය කරන දිස්ත්‍රික්ක තුනක් ආවරණය කරන මන්ත්‍රීවරු 104 දෙනෙක් අතර අද

[ගරු කිත්සිරි කහටපිටිය]

මෙම ලියවිල්ල - මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා සොයාගෙන තිබුණා, ඉතාමත් කාලෝචිත වැඩක් හැටියට. එතුමාට මම ස්තුතිය ප්‍රකාශ කරනවා. මේක සභාවේ මන්ත්‍රීවරුන් අතර විවාදයට ගෙනෙන්න එතුමා ඉතාමත් දක්ෂ ලෙස යෝජනාව සකස් කරලා, සභාවට ගෙනැල්ලා න්‍යාය පුස්තකයේ තිබුණු ඔක්කොම නවත්තලා මේක ඉස්සරහාට ගත්තා. ඒ ගත්ත වෙලාවේ මම දැක්කා, මේ සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දක්වන ආකාරය දිහා බැලුවාම ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා එතුමාගේ පක්ෂයේ සහ එතුමාගේ පක්ෂයේ වැඩ පිළිවෙළ පිළිබඳව හිතේ තියාගෙන මේක ගැන කථා කළා. එතුමා කථා කරන කොට එතුමා පෙන්නුවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පෙන්නලා දී ඇති ආකාරයට ප්‍රබලම බලතල තිබෙන ආයතනයක් හැටියට පළාත් පාලන ආයතන. ඒවාට පැවරෙන බලය තව වැඩි කරලා දෙනවා මිසක් ඒවා අඩු කරගන්න බැහැයි කියලා.

හැබැයි ඒක පනතක් හැටියට සම්මත වුණොත් තමයි ඒ බලය තිබෙන්නේ. හැබැයි මේ බලතල නාගරික සංවර්ධන අධිකාරියට ලබා දීලා තිබෙන්නෙත් චක්‍රලේඛයක් මඟින්. ඒ නිසා තමයි අද චක්‍රලේඛයක් මඟින් එතුමන්ලා පළාත් පාලන ආයතනවලට ලබා දීපු බලතල ආපසු පවරා ගන්නේ. එහෙම නම් මේ බලතල පවරා ගැනීමේ වැඩ පිළිවෙළ තුළ අපි දකිනවා, නාගරික සංවර්ධන අධිකාරිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කළාද? නාගරික සංවර්ධන අධිකාරිය කාගේ හරි පුද්ගලයෙකුගේ උවමනාවට මේ චක්‍රලේඛය නිකුත් කළාද? එහෙමත් නැත්නම් අනික් පැත්තේ ඉන්න අපේ මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමන්ලා වාගේ අයට ඒ වාගේම අපේ අනික් පක්ෂ නියෝජනය කරන මහජන නියෝජිතයින්ට හිතෙනවා ඇති ඒකාබද්ධ ආණ්ඩුවේ යම්කිසි ජන්දයක් නොතියා පළාත් පාලන ආයතනවල එහෙමත් නැත්නම් රට කෑලි වලට විකුණලා විදේශිකයන්ට රට දෙන්න යන වැඩ පිළිවළේ කුමන්ත්‍රණයක් හැටියට මේක ආවද කියන එක විවිධ මත මහජන නියෝජිතයින් අතර අද මෙතැන ප්‍රකාශ වුණා.

එහෙමනම් මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පාර්ලිමේන්තුවේ ගැසට් කරලා තිබෙන විෂයය භාර අමාත්‍යවරයා හැටියට ෆයිසර් මුස්තාපා ඇමැතිතුමාත් සමඟ මේ චක්‍රලේඛයෙන් ලබා ගත්ත බලතල පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක් කිරීම අත්‍යවශ්‍යයි. ඒ ෆයිසර් මුස්තාපා අමාත්‍යතුමා චම්පික රණවක අමාත්‍යතුමාත් සමඟ මේ ලබා ගත්ත බලතල පිළිබඳව ආපසු දෙනවාද? එහෙම නැත්නම් මේවා පවරා ගන්නවාද? මේ බලය බෙදා හරින ලංකාවේ ජනතාව ද්‍රවිඩ, මුස්ලිම්, සිංහල ජනතාව ඒ වාගේම අපේ ස්වාමීන් වහන්සේලා, අපේ රජවරු මේ යුද්ධ ඇති කරගෙන මරා ගත්ත බලය විමධ්‍යගත කරන්න ඕනෑය කියන බලතල ආපසු ඒකාධිපති තැනකට ගෙනි යනවාද කියන සංවාදය මේ තුන් දෙනා අතර සාකච්ඡා කරලා අපේ සභාවේ මන්ත්‍රීවරු දක්වපු අදහස්වලට අපට උත්තරයක් ලබා දිය යුතුයි. එහෙමනම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ අපි සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරපු කථිකාව, ඒ වාගේම හැන්සාඩ් ගත වන වාර්තා අධ්‍යයනය කරලා ඒ අමාත්‍යවරුන් දෙපළටත්, ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ඒ වාගේම ව්‍යවස්ථාදායක අග්‍රාමාත්‍යතුමාටත්, විධායක ජනාධිපතිතුමාටත් ලබා දීලා මෙය සාධාරණයක් තුළින් රටේ ජනතාවට දුක් විඳින්නේ නැතිව මේ බලය බෙදා හැරලා කටයුතු ක්‍රියාත්මක කරන ආයතන මඟින් මෙය ක්‍රියාත්මක කරන්න වැඩ කටයුතු කරන්න යොමු කරන්නය කියන එක ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.28]

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ යෝජනාව මා විසින් ඉදිරිපත් කරලා මම හිතන්නේ පැය දෙකකටත් වැඩි ප්‍රමාණයක් පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරුන් දැක් වූ සහ යෝජනා ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මෙතැන වුණු කථා සහ ඒ කථා කරපු දේවල් ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දීර්ඝ අධ්‍යයනයක් කළාට පස්සේ මම දැක්කා, නම් වශයෙන් කිව්වොත් අපේ විපක්ෂයේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අපේ නිශාන්ත වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාත් දැක් වූ අදහස්. ඒ කථා දෙකේම විශේෂයෙන්ම අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා දැක්වූවා කාලයක් තිස්සේ නාගරික සංවර්ධන අධිකාරියේ - මම හිතන්නේ එතුමාගේ කථාවෙන් කෙලින්ම

පෙන්නුවේ පසුගිය ආණ්ඩුව නියෝජනය කරමින් නාගරික සංවර්ධන අධිකාරියේ ඒ ඇතැම් නිලධාරීන්, කෙලින්ම කිව්වොත් ලේකම්තුමා ඇතුළු එතුමන්ලා කරගෙන ගිය සංවර්ධනයේ යම්කිසි අඩුපාඩු. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා පසුගිය අවුරුදු දෙකකට කලින්, අවුරුදු දහයක් ඇතුළත මේ කොළඹ නගරයේ සංවර්ධන කටයුතු කරන කොට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉටු කරපු මෙහෙය. ඒ වාගේම තමයි අපි ජාතියක් වශයෙන් මේ රට සුද්දා නිදහස ලබා දීලා අපි බලය ලබා ගත්තාට පස්සේ මම හිතන්නේ මේ වන තුරු, 2017 වනතුරු මේ පක්ෂ දෙකක් තමයි මේ රට පාලනය කළේ. විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු සභාග රජයත්. මම හිතන්නේ, දීර්ඝ කාලයක් සංවර්ධනය කරගෙන යන කොට පසුගිය දශක තුනක තිබුණු මේ කුරිරු යුද්ධය අවසන් කිරීමෙන් පසුව තමයි අපි ජාතියක් වශයෙන්, අපි කාටත් හුස්ම අරගෙන මේ රට සංවර්ධන මාර්ගයකට අරගෙන ගිහිල්ලා, රට සංවර්ධන කියන track එකට දාගන්න පුළුවන් වුණේ. ගරු මන්ත්‍රීවරුනි, අපි දැක්කා පසුගිය කාලයේ ලෝකයේ විවිධ නගරවල මේ සංවර්ධනය නියාමනය කරද්දී අපේ කොළඹ නගරයට තිබුණු ස්ථානය. අපි දැක්කා සීඝ්‍රයෙන් දියුණුවන නගරයක් හැටියට කොළඹ නගරය නම් කරලා තිබුණා. ඒ ගැන විශේෂ ස්තුතියක් අපි හිටපු නාගරික සංවර්ධන අධිකාරියට ලබා දිය යුතුයි. හිටපු රාජ්‍ය ආරක්ෂක ඇමැතිතුමාටත්, ලේකම්තුමාටත් එය ලබා දිය යුතුයි.

ඒ වාගේම අපි දැක්කා අපේ නිශාන්ත වර්ණසිංහ හිටපු ගරු ඇමැතිතුමා එතුමා කිව්වා, මේ පනත තුළින් වර්තමාන ඇමැතිතුමා චම්පික රණවක ඇමැතිතුමා ක්‍රියාවට නංවන්න යන පිළිවෙළ. අපි දකිනවා, ඉදිරියේදී එතුමාගේ සැලැස්මවල් සමඟ. නමුත් මගේ පෞද්ගලික හැඟීමක් අනුව අපි චම්පික රණවක ඇමැතිතුමාත් එක්ක මේ මතය පිළිබඳව ගැටලුවක් නැහැ. නමුත් සමස්තයක් වශයෙන් මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් වැඩි පිරිසක් පළාත් පාලන ආයතන නියෝජනය කරපු හිටපු සභාපතිවරු. එහෙම නැත්නම් හිටපු උප සභාපතිවරු. එහෙම නැත්නම් මන්ත්‍රීවරු. කොටින්ම ගත්තොත් වර්තමාන ගරු මහ ඇමැතිතුමා අපේ ඉසුර දේවප්‍රිය ඇමැතිතුමා ගත්තොත් මහරගම නගර සභාවේ දෙපාරක් හිටපු සභාපති. ඒ වාගේම තමයි අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා. එතුමාත් එහෙමයි. එතුමා පාර්ලිමේන්තුවට ගියේ පළාත් පාලන ආයතනයෙන් ගත්ත ශක්තියත් එක්ක. ඒ වාගේම හිටපු සභාපතිවරු, මන්ත්‍රීවරු - මම හිතන්නේ මේ පළාත් සභාවේ අතළොස්සක් නොවෙයි. ගොඩක් අය ඉන්නේ පළාත් පාලන ආයතන නියෝජනය කරපු අය. අපිත් ඇත්තටම මේ පළාත් සභාවට එන්න ඒ හුරුව, ආහාෂය ගත්තේ, මේ පළාත් පාලන ආයතන මගින්. අපි දන්නවා, මේ පළාත පාලන ආයතන තුළ මේ බලතල මධ්‍යම රජයට ගියාම නාගරික සංවර්ධන අධිකාරියට ගියාම ගමේ දේශපාලනය කරන, ගමේ ජනතාවත් එක්ක ඉන්න පිරිසක් වශයෙන් අපට තිබෙන අමාරුව. ගැටලුව. ගමේ තිබෙන සංවර්ධන වැඩ එක්ක. ගමේ ඉන්න ජනතාව අපි ළඟට ආවාට අපි පළාත් පාලන ආයතනයට අරගෙන ගිහිල්ලා, ඒ වැඩ කටයුතු කරන්න ගියාම අපට මුහුණපාන්න වෙන ගැටලු. නමුත් ගරු මන්ත්‍රීවරුනි, මම අද සියලුම දෙනාට බෙහෙවින්ම ස්තුති වන්ත වෙනවා. පක්ෂ, විපක්ෂව අදහස් දක්වපු සියලුම දෙනාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාටම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීම
# ADJOURNMENT

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව ප.ව. 02.32 ට, 2017 පෙබරවාරි මස 21 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 02.32 p.m till 9.30 a.m. on 21.02.2017*

0177 0178